

# ක්‍රම විවරණ

12 වැනි වෙළුම 01 වැනි කලාපය
2015 පෙබරවාරි - මාර්තු
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

# නව දේශපාලන සංස්කෘතියක අභියෝගය

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු / නීතිඥ එස්.ජී. පුංචිහේවා / ජ්‍යෙෂ්ට කථිකාචාර්ය රොහාන් එදිරිසිංහ / ආචාර්ය ජයම්පති වික්‍රමරත්න / ආචාර්ය අසංග වැලිකල
ගාමිණී වියන්ගොඩ / නීතිඥ භවානි ෆොන්සේකා / මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න / මහාචාර්ය සුමනසිරි ලියනගේ / නීතිඥ එල්මෝ පෙරේරා
නීතිඥ කේ.ඩබ්ලිව්. ජනරංජන / නීතිඥ චන්ද්‍රපාල කුමාරගේ / වෛද්‍ය රාජා විජේතුංග / ලයනල් ගුරුගේ / ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි
නීතිඥ ඩී.එම්. දිසානායක / ආචාර්ය ධර්මසේන පතිරාජ / ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන / අගමැති රනිල් වික්‍රමසිංහ / විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා
ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක / නීතිඥ වාසුදේව නානායක්කාර / නීතිඥ එම්.ඒ. සුමන්දිරන් / නීතිඥ නිසාම් කාරියප්පර්

සාම විමර්ශී

සංස්කරණය **ලයනල් ගුරුගේ**

ISSN 955-1800-0061

12 වැනි වෙළුම 01 වැනි කලාපය 2015 පෙබරවාරි-මාර්තු

දුරකථනය 94-1-2370801/4
ෆැක්ස් 94-1-2370802
ඊ-මේල් cpa@cpalanka.org
වෙබ් www.cpalanka.org

# ජාතික එක්සත්කම ඔස්සේ නව දේශපාලන සංස්කෘතියක්

දේශපාලන හා සමාජමය වශයෙන් තියුණු විවාදාපන්න පරිසරයක් නිර්මාණය කරමින් 2014 ජනාධිපතිවරණය නිමාවට පත් විය.

පශ්චාත් ජනාධිපතිවරණ සමය ජයග්‍රාහකයන් විසින් පරාජිතයන් මඬිනු ලැබීමේ අශීලාචාර දේශපාලන සම්ප්‍රදාය නිෂේධනය කරමින් සියලු දේශපාලන පක්ෂ නියෝජනය කරන ජාතික ආණ්ඩුවක් නිර්මාණය කර ගැනීම ද රටට ඔබින නව ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීම ද කෙරෙහි දැඩි අවධානය යොමු කරන අවධියක්ව තිබේ.

මෙය රටට ඔබින නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා උචිත වූ අගනා ප්‍රවේශයක් බව කීම යුක්ති යුක්තය.

මෙහිදී අප විසින් වඩා වැදගත් කොට සැලකිය යුතු වන්නේ රට මුහුණ දී සිටින බොහෝ ඛේදවාචක වළක්වා ගත හැකි ඒකායන මාර්ගය වූ ජාතික ඒකාබද්ධතාව ගොඩ නැගීමේ අභියෝගයයි.

මෙවර ජනාධිපතිවරණයේ දී පොදු අපේක්ෂකයා ඉදිරිපත් කළ වැඩසටහනට උතුරු නැගෙනහිර ජනයාගේ අති බහුතර කැමැත්ත ද ප්‍රකාශ විය.

දින 100 වැඩසටහනට ඔවුන්ගේ ප්‍රසාදය හිමිවී ඇත්තේ ද ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම කෙරෙහි එහි ඇති නැඹුරුව සැලකිල්ලට ගැනීමෙන් බව පෙනේ.

එහෙත් උතුරෙහි ජනතාවගේ කේන්ද්‍රීය ප්‍රශ්න හා චිර ජීවනය උදෙසා වැදගත් වන දීර්ඝකාලීන පිළියම් යෙදීම සඳහා මේ උදාවූ අවස්ථාව මඟ නොහැර යෑමේ වගකීම නව ආණ්ඩුව මත පැවරේ.

මේ අනගි අවස්ථාව මීට පෙර ද මඟ හැරී ගියේ ය. එහි අවසාන අවස්ථාව 2009 දී එල්ටීටීඊ ය පරාජය කිරීමෙන් පසුව මඟහැරී ගියේ ය. එය නිරුත්සාහක සිදුවීමකට වඩා මඟ හැර යෑමක් ලෙස අර්ථ දැක්විය හැකිය.

යුද්ධයෙන් පසුව ජාතික ඒකාබද්ධතාව ගොඩනැගීමේ සාධනීය පියවර ගැනීමට අසමත් වීමේ ප්‍රතිඵලය වූයේ ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ පරීක්ෂණයකට මුහුණ දීමේ දිශාවට ශ්‍රී ලංකාව තල්ලුවීම ය.

නව නායකත්වය කිසි විටෙක ආත්මාර්ථය තකා සිංහල මහෝත්තමවාදය නැංවීම ඔස්සේ සෙසු ජනවර්ග අතර සැකයක් ඇති නොකිරීම ආරම්භක පියවරක් හැටියට සතුටු විය හැකිය. මෙය යථාර්ථයක් වීමට නම්, උතුරු නැගෙනහිර ජනතාව සඳහා නිශ්චිත දේශපාලන විසඳුමක් ඉදිරිපත් කර එය ක්‍රියාත්මක කිරීමේ කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ගවලට යා යුතුය.

හිටපු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ (පසුව ඔහුම අත් හළ) සර්වපාක්ෂික කමිටුවේ යෝජනා මෙන්ම ඔහු විසින් පත් කරන ලද උගත් පාඩම් කොමිසමේ යෝජනාවල ද ඉතා වැදගත් නිර්දේශ ඇතුළත් ය.

මේවාට යොදවන ලද ධනය හා විනාශ කරන ලද කාලය අනුව බලන විට නව වැඩ පිළිවෙළක් සකස්කර ගැනීම සඳහා වැය කිරීමට සිදුවන ධනය හා කාලය ඉතිරි කර ගැනීමේ මගක් වනුයේ එම නිර්දේශ ද සැලකිල්ලට ගනිමින් නව අදහස් ද ඇතුළත් යාන්ත්‍රණයක් සකස් කර ගැනීම ය.

පාර්ලිමේන්තුව, පළාත් සභාව හා පළාත් පාලන ආයතනවල නියෝජිතයන් ද නියෝජනය වන පුරවැසි සමාජයන් අතර බිම් මට්ටමේ සිට ඉහළට යන පුරවැසි කතිකාවක් අවශ්‍ය වන්නේ නව ජාතික එක්සත්කමක් ගොඩනැගීමේ සද්කාර්යය වෙනුවෙනි. එහිදී විධායකය යටතේ මෙතෙක් ජාතික එක්සත්කම විනාශ කිරීම සඳහා මෙහෙයවන ලද සිවි වැනි ආණ්ඩුව හෙවත් ජනමාධ්‍ය එම උවදුරෙන් මුදවා ගත යුතුය.

අසල්වැසි ඉන්දියාවේ දූරදර්ශන් හා බ්‍රිතාන්‍යයේ *BBC* යනාදී ස්වාධීන මාධ්‍ය ආයතනවල සම්ප්‍රදායන් සැලකිල්ලට ගනිමින් නව මාධ්‍ය සම්ප්‍රදායක් ගොඩ නැංවීම සඳහා රජය වැඩි බරක් තැබිය යුතු බව අපගේ යෝජනාවයි. ●

විවිධ සහාය **මහින්ද රත්නායක, තිඹිරියාගම බණ්ඩාර**

පරිගණක අක්ෂර / පිට කවරය / පිටු සැලසුම **වාක්‍යා රූ දු.ඇ. 011-2708377** මුද්‍රණය **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 0777-315971**

"සාම විමර්ශී" යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාම හා ගැටුම් විශ්ලේෂණ ඒකකයේ සහ ප්‍රජා සහභාගිත්ව ඒකකයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබූයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

"සාම විමර්ශී" ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳා ගැනීමට බෙහෙවින් අදාළ වන ප්‍රශ්න පිළිබඳ ව, අපගේ සාම හා ගැටුම් විශ්ලේෂණ වැඩසටහන හා පොදු මහජනතාව ද අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇතිකරවීමේ එක් මගකි. මෙහි අන්තර්ගත අදහස් මගින් අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නො වේ.

වැඩිදුරට විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

සංස්කාරක, "සාම විමර්ශී"
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2565304/06 ෆැක්ස් 94-11-4714460 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

# පටුන




**ඓතිහාසික ජයග්‍රහණයක සුවිශාල අභියෝග 3**
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

**පුරවැසිවරණය 8**
නීතිඥ එස්. ජී. පුංචිහේවා

**තුන්වැනි ජනරජ ව්‍යවස්ථාවක් කරා 11**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රොහාන් එදිරිසිංහ

**සංශෝධනය අතරම නව ව්‍යවස්ථාවක් ගැන සිතීමට කාලය ඇවිත් 17**
ආචාර්ය ජයම්පති වික්‍රමරත්න

**ශ්‍රී ලංකාවේ අදහස් පළකිරීමේ නිදහස ආරක්ෂා කිරීම: අත්‍යවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ 22**
ආචාර්ය අසංග වැලිකල

**මහින්ද රාජපක්ෂ ඉවත් කිරීමේ සටනට සාපේක්ෂව දැන් තිබෙන සටන බරපතලයි 29**
ගාමිණී වියන්ගොඩ

**ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය උදෙසා වන මාර්ග සිතියමක් සඳහා උපදෙස් 35**
නීතිඥ භවානි ෆොන්සේකා

**මිලිටරි හස්තයෙන් යහපාලනයේ සිහිලැල්ලට 43**
මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න

**ප්‍රභූ ප්‍රජාතන්ත්‍රවාදය සහ නිර්ප්‍රභූ ප්‍රජාතන්ත්‍රවාදය 47**
මහාචාර්ය සුමනසිරි ලියනගේ

**මැතිවරණ කොමිසම ශක්තිමත් කිරීම 52**
නීතිඥ චිල්මෝ පෙරේරා

**මානව හිමිකම් කොමිසම සවිබල ගැන්වීම 53**
නීතිඥ එස්. ජී. පුංචිහේවා

**සංවරණ හා තුලන මූලධර්ම මත පිහිටීම 54**
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

**තොරතුරු දැනගැනීමේ අයිතිය 55**
රාවය කර්තෘ - කේ. ඩබ්ලිව්. ජනරංජන

**ජාතික පොලිස් කොමිසමේ කාර්යභාරය 56**
නීතිඥ චන්ද්‍රපාල කුමාරගේ

**ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 57**
වෛද්‍ය රාජා විජේතුංග

**යහපාලනය ඇතිකළ හැක්කේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමෙන් 58**
ලයනල් ගුරුගේ

**ප්‍රතිසංස්කරණ කිහිපයක් පාලක ප්‍රභූන්ට මගහැරිය නොහැක 63**
ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි

**යහපාලනය සහ ස්වාධීන කොමිෂන් සභා 69**
නීතිඥ ඩී. එම්. දිසානායක

**ආණ්ඩුව කුමක් වුවත් කලාකරුවන් වන්දිභට්ටයන් කර ගැනීම වරදක් 74**
ආචාර්ය ධර්මසේන පතිරාජ

**නව දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමේ අභියෝගය 81**
තිඹිරියාගම බණ්ඩාර

**සර්වපාක්ෂික ආණ්ඩුවක් අවශ්‍ය වන්නේ ඇයි 85**
ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

**පක්ෂ විපක්ෂ කවරුත් නව දේශපාලන සංස්කෘතියට කැමතියි 87**
අගමැති රනිල් වික්‍රමසිංහ

**මොකක්ද ඔය ස්වාධීනත්වය 89**
විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා

**අපගේ අරමුණ නිෂ්පාදන ආර්ථිකයක් 93**
ජවිපෙ නායක අනුර කුමාර දිසානායක

**ජනතාව තම අභිලාශයන්ට අනුව ඡන්දය දුන්නා මෙය ප්‍රජාතන්ත්‍රවාදයේ ජීවමාන ප්‍රතිඵලයක් 94**
නීතිඥ වාසුදේව නානායක්කාර

**උතුරු නැගෙනහිර ජනතාවට සිවිල් අයිතීන් ලබාදිය යුතුයි 99**
දෙමළ සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී
නීතිඥ එම්.ඒ. සුමන්දිරන්

**ජාතික ආණ්ඩුවේ සිහිනය දිනා ගන්නවා 100**
මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ නියෝජ්‍ය මහ ලේකම්
නීතිඥ නිසාම් කාරියප්පර්



**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය




හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පරාජය බාරගනිමින් අරලියගහ මැදුරෙන් පිටවීම

# චෛතිහාසික ජයග්‍රහණයක සුවිශාල අභියෝග

ජනවාරි 8 වන දින පැවති ජනාධිපතිවරණයේ දී බලයේ සිටි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අභිබවා මෛත්‍රීපාල සිරිසේන මහතා ලැබූ ජයග්‍රහණය හේතු ගණනාවක් නිසා චෛතිහාසික වූවක් වේ. ශ්‍රී ලංකාවේ බලයේ සිටි ජනාධිපතිවරයෙකු ජනාධිපතිවරණයක දී පරාජය වූ පළමු වතාව එයයි. එමෙන් ම ඒ වාර්තා බිඳ හෙළන ලද සියයට අසූ එකක ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කරනු ලැබූ ජනාධිපතිවරණයකදී ය. තවද මෙය බලයේ සිටි ජනාධිපතිවරයෙකු තෙවන ධුර කාලයක් සඳහා ඡන්දයට ඉදිරිපත් වූ පළමු අවස්ථාව ද වේ. පුළුල්තම පරාසයක පැතිරුණු බලවේග රාශියක් බලයේ සිටි ජනාධිපතිවරයෙකුට එරෙහිව සංවිධානගත වූ මැතිවරණය ද මෙය වන බව ඇතැමකු තර්ක කළ හැකියි. එකී පරාසය බහුතර සිංහල බෞද්ධ ජාතිකවාදීන් එක් කෙළවරක ද දෙමළ ජාතිකවාදීන් අනෙක් කෙළවරේ ද වූ ආකාරයේ පෙළගැස්මක් විය. 47.58% ක ප්‍රතිශතයක් ලබාගත්

www.dbsjeyaraj.com



**මැතිවරණ දිනයේ දී සිදුවිය හැකි යයි බොහෝ දෙනා බියට පත් වූ ප්‍රචණ්ඩ ක්‍රියා සහ අක්‍රමිකතා සිදු නොවූ අතර රාජපක්ෂවරුන් බලය අතහැරීමට අකැමැති වනු ඇතැයි පැවති හැඟීම ද එපරිද්දෙන් ම අවසන් විය.**

රාජපක්ෂ මහතාට එරෙහි ව 51.28% ක් ලබාගනිමින් මෛත්‍රීපාල සිරිසේන මහතා ජයගත් අතර දෙදෙනා අතර පරතරය ආසන්න වශයෙන් ඡන්ද 4,50,000 ක් විය.

සුළුතර ජනවාර්ගික කණ්ඩායම් බහුල ලෙස කේන්ද්‍රගත වූ ප්‍රදේශවල මෛත්‍රීපාල සිරිසේන මහතා විශාල ජයග්‍රහණයක් අත්කරගත් අතර සිංහල බහුතර ප්‍රදේශවල මහින්ද රාජපක්ෂ මහතාට ලැබුණු ඡන්ද ප්‍රතිශතය, එල්.ටී.ටී.ඊ ය පරාජය කිරීමෙන් ආසන්න වූ කාලයේ දී පැවති 2010 ජනාධිපතිවරණයේ දී ඔහුට ලැබුණු ඉහළම ප්‍රතිශතය හා සැසඳීමේ දී ඡන්ද අඩුවීමක් පෙන්නුම් කළ ද, මෙවර ද සැළකිය යුතු තරම් ඉහළ මට්ටමක විය. මැතිවරණ දිස්ත්‍රික්ක විසි දෙකෙන් දොළහක් සහ ඡන්ද කොට්ඨාසවලින් කේවල ඡන්ද ක්‍රමය අනුව ගණන් බැලූ කල කොට්ඨාස 70ක් මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් දිනාගනු ලැබූ අතර රාජපක්ෂ මහතා මැතිවරණ දිස්ත්‍රික්ක 10 ක් ජය ගෙන සමස්තයක් ලෙස 160 ක් වූ ඡන්ද කොට්ඨාස අතුරින් 90ක් ද දිනා ගැනීමට සමත් විය. ප්‍රතිඵලවල හරස්කඩක් ගෙන බැලූ කල බහුතර ජාතිකත්ව ප්‍රජාව අතුරින් සැළකිය යුතු තරම් බහුතරයකගේ පක්ෂපාතීත්වය තමන් වෙත පවතින බව මහින්ද රාජපක්ෂ මහතාට හා ඔහුගේ හිතවතුනට කියා සිටිය හැකිය. මීළඟ මාස පහ තුළ දී හෝ උපරිම ප්‍රමාදයකින් පසුව 2016 අප්‍රේල් මස දී පැවැත්විය යුතු වන පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී මෙය දැක ගත හැකි වනු ඇත. මෛත්‍රීපාල සිරිසේන මහතා සියලු ප්‍රජාවගේ ඡන්දයෙන් ජයග්‍රහණය කළ බව, බහුතර ජාතිකත්ව ප්‍රජාවන්ගේ අතර වූ රාජපක්ෂ මහතාගේ ඡන්ද බැංකු 2010 ජනාධිපතිවරණය හා සැසඳු කල 10% කින් පහත වැටී ඇති බව සහ ජනාධිපති ධූරය දිනා ගත හැකි වන්නේ සුළුතර ජන ප්‍රජාවගේ සහයෝගය සහිතව වන බව යනාදිය ද මෙයින් පැහැදිලි වේ.

මැතිවරණ දිනයේ දී සිදුවිය හැකි යයි බොහෝ දෙනා බියට පත් වූ ප්‍රචණ්ඩ ක්‍රියා සහ අක්‍රමිකතා සිදු නොවූ අතර රාජපක්ෂවරුන් බලය අතහැරීමට අකැමැති වනු ඇතැයි පැවති හැඟීම ද එපරිද්දෙන් ම අවසන් විය. හදිසි නීතිය ප්‍රකාශයට පත් කොට එමගින් ඡන්දය ගණන් කිරීම අත්හිටුවා හමුදා රැඳවීමක් තුළින් ඔවුන් බලයේ රැඳී සිටීමට අදහස් කළ බවට වූ වාර්තාවන් පවතී. නීතිපතිවරයා සහ හමුදාපතිවරුන් මීට අනුගතවීම ප්‍රතික්ෂේප කිරීම හා එවකට විපක්ෂ නායක හා වත්මන් අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ මැදිහත්වීම මඟින් මෙය අවහිර කරනු ලැබ ඇත. මෙම චෝදනා දැනට විභාග වෙමින් පවතී. රාජපක්ෂ මහතා රටේ සිටින අතර ඔහු පාර්ලිමේන්තුවට එක්වීමට යන බවට කට කතා පැතිර ඇත. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට ඔහු විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය පවරා දෙනු ලැබ ඇති තත්ත්වය තුළ ඇතැම් විට ඔහුගේ දේශපාලන ක්‍රියාකාරීත්වයේ වත්මන් අවධානය විය හැක්කේ තමන් සතුව ඇති දේශපාලන අභිලාෂයන් කුමක් හෝ වේවා ඒවා සාක්ෂාත් කර ගැනීමට උපයෝගී කොට ගත යුතු වේදිකාවක් හඳුනාගැනීම විය හැකිය.

තීරණාත්මක අවස්ථාවන්හි දී මැතිවරණ ක්‍රියාදාමයේ සුපිළිපන් බව ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ මැතිවරණ කොමසාරිස්වරයාගේ භූමිකාව පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ආණ්ඩුකරණය සම්බන්ධයෙන් වූ ආයතනික හා ක්‍රියාදාම ප්‍රතිසංස්කරණයන් ප්‍රමුඛ අවධානයක් සහිත ව පැවති මැතිවරණයක දී පුද්ගලයෙකුගේ ධෛර්ය හා සුපිළිපන් බව විසින් සිදුවීමට ඉඩ තිබූ අයහපතක් වළක්වනු ලැබීම මඟින් පෙන්වා දෙන සරදම සැළකිල්ලට ගැනීම මෙහි දී වැදගත් වේ. ආයතනික හා ක්‍රියාදාම ප්‍රතිසංස්කරණයෙහි ඇති වැදගත්කම ද මෙමගින් අවධාරණය කෙරේ.

www.newsfirst.lk



# තීරණාත්මක අවස්ථාවන්හි දී මැතිවරණ ක්‍රියාදාමයේ සුපිළිපන් බව ආරක්‍ෂා කර ගැනීමට ක්‍රියා කළ මැතිවරණ කොමසාරිස් වරයාගේ භූමිකාව පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

සැහැල්ලු බව යට ශක්තිය - මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය

මෛත්‍රීපාල සිරිසේන මහතාගේ මැතිවරණ වේදිකාවේ ප්‍රධානම තේමාව වූ ආණ්ඩුකරණයේ ඌනතාවන්ට පිළියම් යෙදීම නම් වූ විෂයය වෙනුවෙන් කැප වූ දුරදිග විහිදෙන ප්‍රතිසංස්කරණ සිදුකිරීමට ඔහු තම දින සියයේ සැළැස්ම මඟින් ප්‍රතිඥා දේ. මෙම කාලසීමාව තුළ දී විධායක ජනාධිපතිවරයාගේ බලතල විශාල ලෙස කප්පාදු කෙරේ. එමෙන් ම විධායක බලතලවල සමතුලනය පාර්ලිමේන්තුවට වාසි සහගත ලෙස ස්ථාපිත කෙරේ. පොලීසිය, රාජ්‍ය සේවය සහ මැතිවරණ ඇතුළත් වන රාජ්‍යයේ අංගෝපාංග සඳහා වන ස්වාධීන අධීක්‍ෂණ කොමිෂන් සභා නැවත පිහිටුවනු ලැබේ. තොරතුරු සඳහා අයිතිය පිළිබඳව වන නීතිකරණයන් හඳුන්වා දිය යුතුව ඇත. එමෙන් ම කේවල ආසන ක්‍රමයේ සහ සමානුපාතික නියෝජන ක්‍රමයේ මිශ්‍රණයක් සහිතව මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇත. වර්තමාන ආණ්ඩුපක්‍ෂ සන්ධානය බිඳ නොවැටී පැවතීම මෙන් ම රාජපක්‍ෂ කඳවුරේ මන්ත්‍රීවරුන් තිස් දෙනෙකුගේ හෝ ඊට වැඩි සංඛ්‍යාවකගේ සහයෝගය ද මත මේ සියල්ල තීරණාත්මක ලෙස රඳා පවතී. එහෙයින් ම එය රාජපක්‍ෂ මහතාගේ දේශපාලන කූඨ යාන්ත්‍රණයන් මත ද රඳා පවතින බවද කිව හැකි ය. විරුද්ධ පක්‍ෂ මන්ත්‍රීවරුන් මේ දක්වා මෙම වැඩසටහනට සහයෝගය ලබාදීමට පොරොන්දු වී ඇත. දින සියය අවසානයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නියමිතව ඇති අතර මහ මැතිවරණයක් ජුනි මුල් කාලයේ දී පමණ පවත්වනු ලැබීමට ඉඩකඩ ඇත.

මේ මොහොතේ මෛත්‍රීපාල සිරිසේන මහතාට මෙය ඓතිහාසික ජයග්‍රහණයකි. එහෙත් ඔහුට ජයගැනීමට ඇති අභියෝග විශාලය. නිම නොවූ විශාල කාර්යභාරයන් ඉතිරිව ඇතත් ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකසනු ඇත.

සැබවින්ම මෙම ජනාධිපතිවරණයේ ප්‍රධාන සරදම වූයේ මෙම රට මුහුණ දෙන ප්‍රධානතම අභියෝගය වන ජාතිකත්ව ගැටුම විසඳීම, යුද අපරාධ සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව වන චෝදනා සම්බන්ධයෙන් වගවීමක් සහිත හා අර්ථාන්විත සමගි සන්ධානයක් පිළිබඳව කිසිදු පැහැදිලි සඳහනක් නොකිරීමට පුළුල් සන්ධානයේ හවුල්කරුවන් අතර පැවති නිහඬ එකඟතාවයි. මෙම සන්ධානයේ නායකයන් නොයෙක් අවස්ථාවන්හි දී ඉහත දෙවන කරුණ පිළිබඳව වන "විශ්වාසය තැබිය හැකි දේශීය යාන්ත්‍රණයක්" ගැන ප්‍රකාශ සිදුකර තිබිණ. එමෙන්ම ඉහත පළමු කරුණ පිළිබඳව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම, නව ආණ්ඩුවේ සාමූහික නැණවත් බව සහ දේශපාලන උපාය මාර්ගය වන්නේ මෙම ගැටලු පාර්ලිමේන්තු මහ මැතිවරණය අවසාන වන තෙක් මහජන කතිකාවතින් සෑහෙන තරම් දුරකින් ඈත්ව තැබීම බව පැහැදිලිය. ඒවා ඇවිස්සීම මඟින් සිදුවනුයේ පුළුල් සන්ධානයේ ඒකාබද්ධකම අනතුරට ලක්වීම යයි ඔවුන් සිතනවා සේ පෙනේ.

මානව හිමිකම් පිළිබඳව වන නව රජයේ ප්‍රතිපත්තිය හා මානව හිමිකම් කෙරෙහි වන ඔවුන්ගේ කැපවීම පිළිබඳව වන පළමු පරීක්‍ෂණය සිදුවනු ඇත්තේ ලබන මාර්තු මසදීය. ඒ 2014 මාර්තු මස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව මඟින් බලය පැවරුණු හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය යටතේ වූ පරීක්‍ෂණ කොමිෂන් සභාවේ වාර්තාව නිකුත් කිරීමේ අවසන් දිනය මාර්තු මසට යෙදී ඇති බැවිනි. මහ මැතිවරණයට පසු කාලය දක්වා වාර්තාව නිකුත් කිරීම ප්‍රමාද කරනු ලැබීම පැහැදිලිවම රජයේ කැමැත්ත වනු ඇත. එනම් අවම තරමේ මානව හිමිකම්



www.timesofisrael.com

# මානව හිමිකම් පිළිබඳව වන නව රජයේ ප්‍රතිපත්තිය හා මානව හිමිකම් කෙරෙහි වන ඔවුන්ගේ කැපවීම පිළිබඳව වන පළමු පරීක්ෂණය සිදුවනු ඇත්තේ ලබන මාර්තු මසදීය.

ජිනීවා මානව හිමිකම් කාර්යාලය

කවුන්සිලයේ සැප්තැම්බර් සැසිවාරය දක්වා කල් දැමීමයි. ඒ අතර වාරයේදී ඔවුන් පොරොන්දු වූ දේශීය යාන්ත්‍රණයක ආකාරයන් පිළිබඳව සොයා බැලීම දිගටම කරගෙන යාමට සහ සමගි සන්ධානය සහ වගවීම (Accountability) සම්බන්ධයෙන් වන තම සද්භාවය ප්‍රදර්ශනය කොට සිටීමට පොරොන්දු වීම සිදුවනු ඇත.

වින්දිතයන් සහ සිවිල් සමාජය පැත්තෙන් ගත් කල වාර්තාව නිකුත් කරනු ලැබිය යුතුය යන කරුණ සම්බන්ධයෙන් කිසිදු ලිහිල් භාවයක් හෝ සම්මුතිකාමී ප්‍රවේශයක් නොතිබිය යුතුය. ඒ අතරම යම් දේශීය යාන්ත්‍රණයක් සැලසුම් කිරීමේ දී සහ එහි අරමුණ සම්බන්ධව රජය විසින් සිවිල් සමාජය සමග එක්ව කටයුතු කළ යුතුය. මේ දෙසට වන පළමු පියවරක් විය යුත්තේ මානව හිමිකම් ගැටළු පිළිබඳව වගකිව යුතු වන කැබිනට් මණ්ඩලවල මට්ටමේ කේන්ද්‍රීය පුද්ගලයකු හඳුනාගැනීමයි. යම් සාධනීය පියවරයන් ගැනීම අරඹනු ලැබ ඇත. මිලිටරි අත්අඩංගුවට ගැනීම් නොමැති හා සමගි සන්ධානය හා බලය බෙදීම පිළිබඳව විශ්වාසදායී සුදුසුකම් සහිත පුද්ගලයන් දෙදෙනෙකු පිළිවෙලින් උතුරු හා නැගෙනහිර පළාත්වල ආණ්ඩුකාරවරුන් වශයෙන් පත්කරනු ලැබ ඇත. යුද හමුදාවන් විසින් අත්පත් කරගනු ලැබූ ඉඩම් ආපසු ලබා දීම සම්බන්ධයෙන් වන ආරම්භක පියවර ඔවුන් පිළිබඳව ප්‍රතිඥා ලබාදෙනු ලැබ ඇත. මාර්ගවල ඇතැම් මුර පොළවල්ද ඉවත්කරනු ලැබ ඇත. මේවා මෙසේ සිදුවන අතර රඳවා තබා ගනු ලැබ ඇති අයවලුන්ගේ ලැයිස්තු නිකුත් කරනු ලැබ නොමැත. එමෙන්ම කිසිදු සාක්ෂියක සේයාවක්වත් නොමැතිව අවුරුදු ගණන් සහ ඇතැම් අවස්ථාවල දශකයකට වැඩි කාලයක් පවා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරගෙවල්වල ජීවිත ගතකරන්නවුන් නිදහස් කිරීමක්ද සිදුවී නොමැත. එමෙන්ම සාගින්නට එරෙහි ක්‍රියාකාරීත්වය (ACF) සංවිධානයේ 17 දෙනා හා ත්‍රිකුණාමලයේ 5 දෙනා සම්බන්ධ සිද්ධීන්හි නඩු පැවරීමක් ද තවම සිදුවී නැත. එල්.එල්.ආර්.සී. වාර්තාව විසින්ද නිර්දේශ කරනු ලැබ ඇති ජාතික ගීය සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම ගායනා කිරීමද තවමත් සිදුවී නොමැත. මෙහි පසුව සඳහන් වූ ක්‍රියාවන් මානව හිමිකම් ආරක්ෂා කිරීම, විශේෂයෙන්ම දඬුවම් නොලබා වරද කිරීමේ සංස්කෘතිය ආපසු හැරවීම යනාදිය අත්‍යවශ්‍ය අංගයන්ව පවතින ආණ්ඩු කරණයක් පිළිබඳව වූ මූලික අදහස් ශක්තිමත් කරන හා ඒ වෙත ඇති කැපවීම ප්‍රදර්ශනය කරන ක්‍රියාවන් වේ. ජාත්‍යන්තර ප්‍රජාව, විශේෂයෙන්ම ඉන්දියාව සහ බටහිර රටවල් විසින් රජය වෙත පළකරනු ලැබ ඇති හොඳ හිත දැනටමත් සිදුවී ඇති ඉහළ මට්ටමේ දූත චාරිකා ගණනාවක් මගින්ද පළවී ඇත. අලුත් ආණ්ඩුවට යම් අවස්ථාවක් දියයුතුය. නැතහොත් එයට එරෙහිව දැනට පවතින දේශපාලන අභියෝග කෙරෙහි සාවධාන ලෙස සංවේදී විය යුතුය යනාදී හේතු මත ඉහත අවශ්‍යතා වසා දැමීමට එම හොඳහිත උපයෝගී විය යුතු නැත.

එමෙන්ම, පුළුල් සංවිධිත දේශපාලන සමාජයේ පැත්තෙන් බලන කල රාජපක්ෂ දූෂණය පිළිබඳව දිනපතා එළිදරව වන චෝදනාවන් සැළකිල්ලට ගත් කල මේ සම්බන්ධයෙන් වැරදි කරුවන් හට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදයකින් තොරව සිදුවිය යුතුය යන්න ප්‍රධාන බලාපොරොත්තුවකි. මෙය දඬුවම් නොලබා වරද කිරීමේ අනෙක් පැත්තයි. ඉහත ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වුවහොත් නව රජයට ඒ සඳහා මහමැතිවරණයේ දී ගෙවීමට සිදුවනු ඇත්තේ අතිවිශාල වන්දියකි. ඒ සමගම අවධාරණය කළ යුතු වන කරුණක් වන්නේ එහිදී නිසි ක්‍රියාදාමයන් අනුගමනය කළ යුතුය යන්නයි. චෝදනා එල්ලවී ඇති ආකාරයට දූෂණයේ පරිමානය අති

www.groundviews.org



ශිරානිගේ නැවත පැමිණීම

**මැතිවරණ පොරොන්දුවක් ද වන දින 100 කාලය සීමාව තුළ ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය නැවත සේවයේ පිහිටුවීම පිළිබඳ ගැටලුවෙහිදී දින 100ක වැඩසටහනට දැඩි ලෙස අනුකූලව ක්‍රියාකිරීමෙහිදී නව රජය මුහුණපාන අභියෝගයන්ද ඉදිරියට පැමිණි බවත් පෙනෙයි.**

විශාලය. එබැවින්ම එහිදී සාක්ෂි හෙළිදරව් කර ගැනීමට යම් කාලයක් ගතවනු ඇත. තවද එහිදී ජාත්‍යන්තර සහයෝගය ද අවශ්‍ය වනු ඇති අතර එය දැනටමත් ඉල්ලා සිටිනු ලැබ තිබේ.

මැතිවරණ පොරොන්දුවක් ද වන දින 100 කාලය සීමාව තුළ ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය නැවත සේවයේ පිහිටුවීම පිළිබඳ ගැටලුවෙහිදී දින 100ක වැඩසටහනට දැඩි ලෙස අනුකූලව ක්‍රියාකිරීමෙහිදී නව රජය මුහුණපාන අභියෝගයන්ද ඉදිරියට පැමිණි බවත් පෙනෙයි. මෙහිදී යොදාගනු ලැබූ ක්‍රියා පිළිවෙල වූයේ මොහාන් පීරිස් මහතා විසින් තත්වාකාරයෙන් (De fecto) දරන ලද තනතුර පිළිබඳව පුරප්පාඩුවක් තිබී නොමැති වන බවට හා සැබැවින්ම ඔහු එය බලහත්කාරයෙන් අත්පත් කර ගත්තකු (usurper) වන බව ජනාධිපතිවරයා විසින් පීරිස් මහතාට දැනුම් දීමයි. මෙය පදනම් වූයේ පළුදු සහිත වූ දෝෂාභියෝග ක්‍රියාදාමය මතය. එහිදී අගවිනිසුරුවරිය දෝෂාභියෝගයකට ලක් කිරීම පිණිස පාර්ලිමේන්තුව විසින් ඡන්දය පාවිච්චි කොට නොමැත. සිදුවී ඇත්තේ එසේ කිරීමට තේරීම් කමිටුවක් පත් කිරීම පිළිබඳ වූ යෝජනාවකට පාර්ලිමේන්තුව විසින් ඡන්දය පාවිච්චි කිරීමය. එම කාලයේ දීම විරුද්ධ පක්ෂය විසින් මෙම කරුණ පෙන්වා දෙනු ලැබුවද කතානායකවරයා විසින් ඔවුන්ගේ විරෝධතා නිෂ්ප්‍රභ කරනු ලැබිණි.

විවේචකයන් විසින් පෙන්වා දෙනු ලබන්නේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් මගින් තාක්ෂණික හා නෛතික පදනම් කරුණු සුජාතකරණයකට ලක්කිරීමට හැකිව තිබුණු බවයි. නමුත් භාවිත කරනු ලැබූ ක්‍රියා පිළිවෙළ මගින් ආණ්ඩුකරණය (governance) කෙරෙහි ඇති රජයේ කැපවීම පිළිබඳව සැක සංකා උපදවනු ලැබ තිබේ. නීතිඥ සංගමය විසින් මේ සම්බන්ධයෙන් පීරිස් මහතාට එරෙහිව පවත්වනු ලැබූ විරෝධතා පෙලපාලි සහ ඔහු ඉල්ලා අස්වුවහොත් ඔහුට රාජ්‍යතාන්ත්‍රික තනතුරු ලබාදීමට ඉදිරිපත්වීම හා ඒ සම්බන්ධව කේවල් කිරීම පිළිබඳ වූ මාධ්‍ය වාර්තා යනාදිය පිළිබඳව ද ඔවුහු පෙන්වා දෙති. මෙහි පසුව සඳහන් වූ දෙය සමාව දිය හැක්කක් නොවේ. ප්‍රතිසංස්කරණ වැඩසටහනට ඔහු බාධකයක් වීමේ අනතුර අනුව බැලූ කල ඔහුගෙන් නිදහස් වීමට රජයට පැවති දැඩි උවමනාව තේරුම්ගත හැකිය. එනමුත් යොදා ගනු ලැබූ ක්‍රියා පිළිවෙල දොස් නැගිය නොහැකි එකක් වන්නට ඉඩ තිබුණු නමුත් නිසැකවම පාර්ලිමේන්තුවේ බහුතරය සම්බන්ධයෙන් රජය වෙත පැවති අස්ථිර බවෙහි හා අනාරක්ෂිත බවෙහි ගොදුරක් බවට එය පත්විය.

දින 100 කාලසීමාවෙන් හතරෙන් එකක් දැන් පසුකරනු ලැබ ඇත්තේ අතිශයින්ම මැතිවරණ හිතකාමී අයවැය ලේඛනයක් ද සමගය. ශිරානි බණ්ඩාරනායක මහත්මිය නැවත සේවයෙහි පිහිටවනු ලැබ ඉල්ලා අස්වීමෙන් පසු දැන් නව අගවිනිසුරුවරයකු ද පත්ව සිටී. දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විවිධාකාරවූ පියවර ගනු ලබමින් පවතී. ජාත්‍යන්තර හොඳහිත ලැබෙමින් පවතින අතර විධායක ජනාධිපති ධුරයේ බලතල ද කප්පාදු කෙරෙමින් පවතී.

දශක දෙකක් පුරා පැතිර පැවති තම ප්‍රතිසංස්කරණ සඳහාවූ න්‍යාය පත්‍රය අද පවතින ආණ්ඩුවේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයම වේ යයි විශ්වාස කරමින් ගිමන් හැරීමට සිවිල් සමාජයට නොහැකිය. ඔවුන් විසින් විවේචනාත්මක සහයෝග යක් ලබාදිය යුතු අතරම එම කටයුතු සිදුවන්නේ වැරදි ආකාරයට නම් මෙම ලැබුණු අවස්ථාව අහිමි නොවන බවට සහතික කරගැනීම පිණිස පූර්ව ක්‍රියාකාරී ලෙස විවේචනාත්මක වීමද කළ යුතුමය. ●



නීතිඥ
**එස්. ජී. පුංචිහේවා**



පුරවැසියා සක්‍රීය වීම

www.srilankaguardian.org

# පුරවැසිවරණය

පසුගිය ජනවාරි අට වැනිදා ඉක්මගියේ ජනපතිවරණයක් නොව පුරවැසිවරණයකි. ජනපතිවරයකු තෝරා ගැනුණා සැබෑවක් වුවද අනියමින් සිදු වූයේ රටට අත්‍යවශ්‍ය පුරවැසියා තෝරා ගැනීමකි. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් කවියෙන් පැවසුයේ, “අලුත් පාලකයන් පත් කරන්නේ නැත්නම් අලුත් ජනතාවක් පත්කළ යුතුය” කියාය. සැබැවින්ම ඒ දෙකම සිදුවී තිබේ. පුරවැසියා නින්දට වැටුණු විට හුදු ඡන්ද දායකයෙක් වේ. ඡන්ද දායකයා අවදිවූ විට පුරවැසියෙක් පහළ වේ. අපට දිගටම අවශ්‍ය වන්නේ අවදියෙන් සිටින පුරවැසියෙකි.

පසුගිය දස වසරක් තුළ සිදුවූ දේ යළි මතක් කිරීම වුවද පිළිකුලටත්, කෝපයටත් හේතුවකි. එහෙත් පක්ෂ ප්‍රතිසංවිධානයක් කොට නැවත බලයට ඒමට කෑදරකමක් දක්වා ඇත. දින 100 කටයුත්ත සඳහා මොවුන්ගෙන් ගතයුතු ප්‍රයෝජනය අත්හළ යුතු නැත. එහෙත් මේ හිටපු මැති ඇමතිවරුන්, ඔවුන්ගේ

www.journalofhumanitarianaffairs.blogspot.com



**බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් කවියෙන් පැවසූයේ, "අලුත් පාලකයන් පත් කරන්නේ නැත්නම් අලුත් ජනතාවක් පත්කළ යුතුය" කියාය. සැබැවින්ම ඒ දෙකම සිදුවී තිබේ. පුරවැසියා නින්දට වැටුණු විට හුදු ඡන්ද දායකයෙක් වේ. ඡන්ද දායකයා අවදිවූවිට පුරවැසියෙක් පහළ වේ. අපට දිගටම අවශ්‍ය වන්නේ අවදියෙන් සිටින පුරවැසියෙකි.**

නිහැඬියාවෙන් පසුව....

හැත්තන් ගැත්තන් කිසිම පාලන ආයතනයකට වැද්ද නොගත යුතු කාපාළුවන් පිරිසකි. මොවුන්ගේ කසළ ආත්මයන් සුදු ඇඳුමින් වසාගෙන තවමත් වියදම් කරන්නේ හොරකම් කළ මුදල් ය. බුක්ති විඳින්නේ වංචනිකව අත්පත් කරගත් දේපළ ය. යළිත් බලයට ඒමට උපාමාරු යොදන්නේ ඒ ටිකම කිරීමට බව පුරවැසියන් අමතක කළ යුතු නැත. මොවුන් අතර කලාතුරකින්වත් යහපත් මිනිසකු සිටියා නම් ඔහුට හිස ඔසවන්නට ඉඩක් ලැබුණේ නැත.

ජාතික ආරක්ෂාව යන වංචනික අඩයාලම යටතේ මිනී මැරුම්, අතුරුදහන් කිරීම්, උතුරේ මිනිසුන්ගේ දේපළ කොල්ලකෑම්, දකුණේ මිනිසුන් බිය වැද්දූ යුගයක් තවත් තිබුණේ නැත. පවුලක් එකතුවී මේ තරම් මහජන සන්තක දේ හොරකම් කළ යුගයක් හොරුන්ගේ ඉතිහාසයේ මිස වෙන කොතැනක තිබිණි ද? ඉංග්‍රීසි, ස්පාඤ්ඤ මුහුදු කොල්ලකරුවන්ට පසු රාජපක්ෂ පවුල ගොඩබිම කොල්ලකරුවන් වශයෙන් ඉතිහාසගත වනු ඇත.

මේ මහා දේශ විපත්තියේ අවසාන විපාකයෙන් රට බේරා ගැනීම ගැන පුරවැසි ජනතාවට කෘතඥවිය යුතු අතර යළි එවැනි විපතක පෙර ලකුණක් දුටු සැණින් නැගී සිටීම අත්‍යවශ්‍යය. මෙය අපේ රට අලුත් ගමන් මගකට ගැනීමේ හැරවුම් ලක්ෂ්‍යයක් සේ සැලකීම සාධාරණය.

සමාජයේ සෑම පැතිකඩක්ම අලුතින් නිර්මාණය කිරීමට සිදුවී තිබේ. එය කළ යුතුමය. ඒ සඳහා ලාබ ලෝබ සැප විහරණ නොතකා කටයුතු කිරීම පාලකයන්ට, නිලධරයන්ට බාරය. ඒ හැම විටම පුරවැසියා ඇස් ඇරගෙන සිටිය යුතුය. එක් ජනකොටසකට සිදුවන අගතියක් ගැන සියලුම ජන කොටස් හඬ නැගිය යුතුය. එක් මනුෂ්‍යයකුට සිදුකරන අයුක්තිය මනුෂ්‍ය වර්ගයාටම එරෙහි සාවද්‍ය ක්‍රියාවක් ලෙස සලකන සංස්කෘතියක් ගොඩ නැගිය යුතුය.

අලුතින් ගොඩ නැගිය හැකි එවන් සමාජයකට මුල පිරීම උදෙසා සිංහල, දෙමළ මුස්ලිම් ජනතාව දැක්වූ එක්සත් බව හා දේශපාලන විඥානය තව දුරටත් එසේම ආරක්ෂා කර ගැනීම පාලනයේ වගකීමය. ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන් කරුණු මනාසේ වටහාගෙන දැක්වූ පුරවැසි පරිණතභාවය බෙහෙවින් භාවිත වන නීතියේ පාලනය යහමින් ආරම්භ කළ යුතුය.

කලක් තිස්සේ එසේ කරුණු වටහා ගනිමින් තීරණාත්මක ප්‍රතිචාර කෙරෙහි ගරු කරමින්, මැතිවරණ ප්‍රතිඵල නිකුත්වීමට ආසන්නයේ සිදුවීමට ගිය මහා බිලි පූජාවකින් රට මුදවා ගැනීමට යුක්තිගරුක ලෙස තීරණගත් කීප දෙනකුට සබුද්ධික ජනයාගේ ප්‍රශංසාව හිමිවිය යුතුය. ඔවුන් අතර, මැතිවරණ කොමසාරිස්, නීතිපති, පොලිස්පති, හමුදාපති ආදීහු ප්‍රමුඛ වෙති.

ජනාධිපතිවරණය ආසන්න දිනවල සියලු ජනමාධ්‍ය සහ රාජ්‍ය දේපළ තම සන්තකයට ගෙන ප්‍රචාරය කළ අමූලික මුසාවාද සහ අගතිගාමී වර්ණනා, බෙදාහළ භාණ්ඩ හා මුදල් නොතකා ජනතාව පෙළගැසීම කිසිවකුටත් යටත් නොවන බවට ගත් පියවරකි. ජනතාවට එවැනි පියවරක් ගැනීමට මුල පටන්ම ක්‍රියා කරමින් ස්වේච්ඡා සහ මානව අයිතිවාසිකම් සංවිධාන ගත් උත්සාහය පල දැරූ බව සතුටින් සිහිපත් කළ යුතුය. එහිදී ඉතා ස්වල්ප දෙනෙක් අපමණ බාධක මධ්‍යයේ සිය යුතුකම ඉටු කළහ.

මෙහිදී ජන විඥානය සකස් කිරීම උදෙසා ඉතා සමීප එහෙත් වැඩි දෙනකකුට නොපෙනෙන කොටසක් සිටිති. ඒ පුවත් පත්වල ප්‍රබල කාටූන් ශිල්පීහුය. දේශපාලන සංසිද්ධීන්ගේ ඇතුළත ඇති සත්‍යය ඉතා පහසුවෙන් හා සිනාමුසුව වටහා ගැනීමට ඔවුන්ගේ කාටූන් මගින් සිදුවූ මෙහෙය අප්‍රමාණය. දේශපාලන යථාර්ථය නැත්නම් වෙනසක මූලික සූදානම පළවූයේ ඔවුන්ගෙනි. ලංකාද්වීපයේ කාටූන් ශිල්පීන් දෙදෙනාට ඒ

www.news.bbc.co.uk



**රට බේරා ගැනීම ගැන පුරවැසි ජනතාවට කෘතඥවිය යුතු අතර යළි එවැනි විපතක පෙර ලකුණක් දුටු සැණින් නැගී සිටීම අත්‍යවශ්‍යය. මෙය අපේ රට අලුත් ගමන් මගකට ගැනීමේ හැරවුම් ලක්ෂ්‍යයක් සේ සැලකීම සාධාරණය.**

තම ඡන්ද අයිතිය භාවිතා කරමින්

සම්බන්ධයෙන් ඉහළම සම්මාන හිමිවිය යුතුය. පාලකයන්ගේ විෂම චර්යාවන් ගැන ඔවුන් දක්වා ඇති සංවේදීත්වය අහසේ තුරු ගණින, ලොක්කන්ට වැඳ පුදන අනෙක් කලාකරුවන්ටත් ආදර්ශයකි. ජනතාව අමතක කොට කඩේගිය කලාකරුවන් ගැන නම් කිව යුතු නැත.

ජනතාවගේ ප්‍රශංසාව නොමසුරුව හිමිවිය යුතු අනෙක් ආයතනය වන්නේ ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමයයි. ඔවුන් මුල සිටම පොදු ජනතාවට අයුත්තක් සිදුවන බව දුටු මොහොතේම, ඊට විරුද්ධව ප්‍රකාශයක් පමණක් නිකුත් කොට නිකම් නොසිට පලදායක ප්‍රායෝගික පියවර ගැනීම නීතිඥ සංගමයෙන් මින් පෙර සිදු නොවූවකි. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට නීතිඥ සංගමයෙන් ලැබුණු දායකත්වය වෙනසක් සිදුවීමට බෙහෙවින් ඉවහල්විය. සභාපති උපුල් ජයසූරිය මහතා නීතිඥ සංගමය නව දියුණුවකට පත් කළේය. එය අනෙකුත් වෘත්තිකයන්ගේ සංවිධානවලටත් මහඟු ආදර්ශයකි. ඒ සියලු වෘත්තිකයන් අධ්‍යාපනයේ සියලු මූලික පහසුකම් ලැබුවේ මහජනයාගේ මුදල්වලින්, බව අමතක කොට නැද්ද ?

එහෙත් මේ යුගයේ ඛේදවාචකයක් වූයේ යුක්තිය අයුක්තිය කෙරෙහි බෙහෙවින් සංවේදී වියයුතු පිරිස වූ කලාකරුවන්ගෙන් ටික දෙනකු හොරුන්ගේ පවුලට ආවැඩීමය. වික්ටර් හාරා, බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් වැනි කලාකරුවන් ගැන සිතෙනවිට මොවුන් මෙතෙක් යෙදී ඇත්තේ බඩගෝස්තර කලාවක බව නොකියමුද? මේ අතර සමහරුන් මේ ලේඛකයන් වශයෙන් ජනතාවගෙන් ලබා ඇති කීර්තිය අසාධාරණ ලෙස උපයාගත් දෙයක් බවට පුළුල් සංවාදයක් ඇතිවිය යුතුය. අනෙක් ජාතීන්ට වෛර කරමින් පැතිරවූ ද්වේෂ සහගත සංකල්පයන් සාහිත්‍ය චරිත හා වාක්‍ය තුළ වෙන්කරගත නොහැකි තරමට සැඟවී පවතී.

යහපත් සමාජයක් ඉදිරියේ ගොඩ නැගීමට නම්, කලාව හා සාහිත්‍යයේ නව මානයන් සොයා ගැනීම අත්‍යවශ්‍ය ය. ඒ සමග නිසි කලාකරුවන්ද බිහිවනු ඇත. කඩේ ගිය කලාකරුවන් වුවද ඉවත නොදැමිය යුත්තේ එම කාර්යයට සුළු වෙළඳුන් ද අවශ්‍ය වියහැකි බැවිනි. අප අපේක්ෂා කරන යහපත් සමාජය ඊට පෙරාතුව කලාවේ සාහිත්‍යයේ පිළිබිඹු විය යුතුය. ඒ සඳහා අවශ්‍ය චර්යාවන්, පිළිපැදිය යුතු ගුණධර්මයන් පළමුව කලාවෙහි සාහිත්‍යයෙහි නිරූපණය වීම ස්වභාවිකය. එහෙත් ඒ සඳහා නිර්මාණ ස්වාධීනත්වය සහ නිදහස පාලනය මගින් ප්‍රදානය විය යුතුය.

මේ වනවිටත් හිටපු සමහර මැති ඇමතිවරුන් අලුත් ආණ්ඩුවට හෙමින් සීරුවේ රිංගා ගැනීමට උත්සාහ ගැනීම ගැන සැළ වූ විට මහජනයා උද්ඝෝෂණය කිරීම බලාපොරොත්තු විය යුත්තකි. එහි යටි අරමුණ වන්නේ සෑම පක්ෂයකටම යහපත් පුද්ගලයන් තෝරාගත යුතුය යනුයි. ඒ සඳහා යම් පියවර ගැනීම මුලසිටම කළ යුත්තකි.

රාජපක්ෂ ආණ්ඩු කාලය තරම් මිනිස්කම්, සදාචාර ගුණධර්ම පිරිහී ගිය කාලයක් අපි නොදුටුවෙමු. 1931 සර්ව ජන ඡන්ද බලයත්, 1947 නිදහස් අධ්‍යාපනයත් සමග අපට තිබුණේ අපරිමිත ස්වභාවික සම්පත් සමුදායකි. මේ සියල්ල සමග පැරණි බෞද්ධ හින්දු ඉස්ලාම් සංස්කෘතීන්ගෙන් වටිනා මිනිස් සම්පතක හිමිකරුවෝ වූමු අපි. අද මෙහි තිබිය යුත්තේ ලෝකයේ ඉතා දියුණු රටකි. අවාසනාවට අපට උරුම වූයේ ලෝකයේ අසමත් රාජ්‍යයකි. දැන් මේ තත්වය ආපසු හැරවීම පහසු නැත. එහෙත් එම කාර්යය මේ වර ආරම්භ කළේ පුරවැසියාය. ඔහු එය යළිත් පාවාදීමට නොසිතනු ඇත. උදුරා ගැනීමට ඉඩ නොදෙනු ඇත. පාලකයන් විය යුත්තේ පොදු මිනිසාට ගරු කරන ජනතාවගේ මිතුරන් මිස, ජනතාවගේ මුදලින් මහේශාක්‍ය ජීවිත ගත කරන හිස් මිනිසුන් නොවේ. පක්ෂ නාම ලේබල් ආදියෙන් වෙන්කොට දැක්වෙන කොටස් නොව ආණ්ඩුව පුරවැසි වමක් ගොඩ නගා ගත යුතුය. ●





ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**රොහාන් එදිරිසිංහ**


# තුන්වැනි ජනරජ ව්‍යවස්ථාවක් කරා

ජනවාර්ගික ගැටුම් සහිත බහුවාර්ගික රටක් සඳහා ශක්තිමත් විධායකයක් අවශ්‍ය යැයි සමහරු විශ්වාස කරති. එහි පසුබිම සලකා බලමු.

ජේ.ආර්. ජයවර්ධන මහතා 1978 ව්‍යවස්ථාවට විධායක ජනාධිපති ධුරය හඳුන්වා දුන් විට එයට පක්ෂව තර්කයන් දෙකක් ඔහුට තිබුණි. එක් තර්කයක් වූයේ එමගින් ස්ථාවරත්වය ප්‍රවර්ධනය වනු ඇති බවය. දෙවැන්න වූයේ එය ජාතිකත්ව සුළුතරයන්ගේ වාසියට හේතුවනු ඇති බවය. එමෙන්ම රටේ දෙමළ පක්ෂ ගණනාවක්ම එම හේතුව මත පදනම්ව විධායක ජනාධිපති ක්‍රමයට සහයෝගය දුන්හ. නමුත් ශ්‍රී ලංකාවේ අත්දැකීම දෙස බැලුවහොත් ජනාධිපති ක්‍රමය සුළුජාතික කොටස්වලට වාසිදායක වන බවට වන තර්කය දුර්වල එකකි. 70 ගණන්වලදී ජනාධිපති ක්‍රමයට පක්ෂද වූ දෙමළ පක්ෂ දැන් එයට සම්පූර්ණයෙන්ම විරුද්ධ ය.

www.lakhiru.org

www.infolanka.com




**තම ශ්‍රී ලංකාවේ අත්දැකීම දෙස බැලුවහොත් ජනාධිපති ක්‍රමය සුළුජාතික කොටස්වලට වාසිදායක වන බවට වන තර්කය දුර්වල එකකි. 70 ගණන්වලදී ජනාධිපති ක්‍රමයට පක්ෂද වූ දෙමළ පක්ෂ දැන් එයට සම්පූර්ණයෙන්ම විරුද්ධය.**

ජනාධිපති ක්‍රමය සුළු ජාතිකයනට වාසිදායක ලෙස ක්‍රියාත්මක නොවනවා යැයි කිවහැකි ප්‍රධානම හේතුව වන්නේ මැතිවරණ සමයක දී ජනාධිපති ක්‍රමය සුළු ජාතික කොටස්වලට යම් තරමකට තම බලපෑමට හසුකරගත හැකි වූවත් ජනාධිපති තේරීපත්වීමෙන් පසු ඔවුනට කිසිදු බලයක් නොතිබීම ය. ජනාධිපතිවරයාගේ ක්‍රියාකාරිත්වයට හා ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීමට ඔවුනට කිසිදු හැකියාවක් ලැබෙන්නේ නැත. අප ශ්‍රී ලංකාවේ දී දැක්කේ එයයි. අපට ඇත්තේ පාර්ලිමේන්තු විධායක ක්‍රමයක් නම් ප්‍රධාන දේශපාලන ක්‍රියාකාරිකයා ලෙස සිටින්නේ අගමැතිවරයා ය. ඔහු නිරන්තරයෙන්ම පාර්ලිමේන්තුවේ සහයෝගය මත රඳා පැවතීම සිදුවේ. දෙමළ, මුස්ලිම් සහ සුළු ජාතික පක්ෂවලට සැලකිය යුතු ආසන සංඛ්‍යාවක් පැවතිය හැකි අනුපාතික නියෝජනයක් පවතින තත්ත්වයක දී ඔවුනට අගමැතිවරයාට බලපෑම් කිරීමට හැකිවනු ඇත. එසේ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වන සමස්ත කාලය පුරාම ඔවුනට තම අවශ්‍යතා සහ අභිලාෂයන් සඳහා අගමැතිවරයා වග වන බවට සහතික කරගැනීමට මෙමගින් අවස්ථාව සැලසේ. එය අවුරුදු 6 කට වරක් මැතිවරණ සමයක දී ලැබෙන දේශපාලන බලයට වඩා වාසිදායක වන බව කිවයුතු නොවේ.

ජනාධිපති ක්‍රමය සුළුජාතීනට වාසිදායක යයි කීම මිථ්‍යාවක් වන්නේ ඒ නිසා ය.

### ජාතික ආරක්ෂාව


ජාතික ආරක්ෂාව පැත්තෙන් බැලූ විට සහ ත්‍රස්තවාදය වැළැක්වීම වැනි තීරණාත්මක ගැටලු විසඳීම සඳහා වගකීම දැරිය හැකි නායකයකු අවශ්‍ය වන විට විධායක ජනාධිපතිවරයකු සිටීම වඩාත් සුදුසු යැයි ද අදහස් පළවී තිබේ.

ජාතික ආරක්ෂාව සහ සුරක්ෂිතතාව පැත්තෙන් සැලකූ විට එම විෂයයෙහිදී ඉස්මතු වන ගැටලුවලදී ඉක්මණින් ක්‍රියාත්මක වීමේ හැකියාව විධායක ජනාධිපතිවරයකුට තිබේ යැයි සැලකුවද අප ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ එම වාසිය විධායක ජනාධිපති ක්‍රමයේ ඇති අනෙකුත් අවාසි සමඟ සැසඳූ කල එම අවාසි වැඩි නොවන්නේ ද යන්නයි. ඒ සඳහා ගෙවිය යුතු මිලක් ද ඇත. ශ්‍රී ලංකාවේදීත් අප එය අත්දැක තිබේ. තීරණ ගැනීම, යුද්ධ ප්‍රතිපත්ති හැදීම, කළ හැකි නමුත් දිගුකාලීන ලෙස බැලූ කල ජාතික ඒකාබද්ධකම (National Unity), ජාතික සමඟිය, සමානාත්මතාව සහ අභිමානය සැලකූ විට පවා එය යහපත පිණිස හේතු වේ යැයි කිව නොහැක.

දෙවන කාරණය වන්නේ යුද්ධයක් පවතින විට, සැබෑ ජාතික අර්බුදයක් පවතින විට පාර්ලිමේන්තු විධායක ක්‍රමයක දී වුණත් අගමැතිවරයෙකුට ශක්තිමත් ලෙස ක්‍රියාත්මක විය හැක. එක්සත් රාජධානියේ වූවද යුද කැබිනට් මණ්ඩල තිබුණි. ඒ මඟින් විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. එහිදී අගමැතිවරුන් හට අතිරේක බලතල ලැබෙයි.

තුන්වෙනිව වැදගත් වන්නේ අද ශ්‍රී ලංකාවට එවැනි ජාතික ආරක්ෂක මානසිකත්වයකින් ක්‍රියාකරන ජනාධිපතිවරයකු අවශ්‍යව තිබෙනවාද යන්නය. එසේ නැතිනම් සමඟි සන්ධානය (Reconciliation) සිදුවිය හැකි, බලය බෙදා හදා ගැනීම සිදුවිය හැකි, එමෙන්ම සුළුතර ජාතීන්ටත් විධායක බලයෙහි කොටසක් ලැබෙන ක්‍රමයක් අවශ්‍යව තිබෙනවාද යන්න ය. මෙය ජනාධිපති ක්‍රමයේ තවත් දුර්වලකමකි. බලය බෙදාහදා ගැනීම ඉතාම දුෂ්කර ය. එසේ සිදුවන්නේ අගමැතිවරයාට සහ අනෙකුත් ඇමතිවරුන්ට වඩා විශාල බලයක් ජනාධිපතිවරයාට තිබෙන නිසාය. අගමැතිවරයාට සහ අනෙකුත් ඇමතිවරුන් හට ඕනෑම මොහොතක දී තනතුර අහිමිවන්නට පුළුවන. ජනාධිපතිවරයා බලයෙන් සුරක්ෂිතය.

www.shnewsonline.net



**එහිදී අපට යම් ආකාරයක සභාග රජයක් ඇතිකරගත හැකිය. එසේ වීම අවශ්‍ය වන්නේ ශ්‍රී ලංකාව සියලු දෙනා ඇතුළත්කර ගන්නා බලය බෙදාහදාගත් ආකාරයකින් ඉදිරියට ගමන් කළ යුතු නිසාය.**

චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති වී රනිල් වික්‍රමසිංහ මහතා අගමැති වූ විට අපි මෙය දුටුවෙමු. එහිදී බලය බෙදා හදා ගැනීමක් සිදු කිරීම බෙහෙවින්ම දුෂ්කර විය. එයින් හැඟෙන්නේ අද ශ්‍රී ලංකාවට ශක්තිමත් තනි විධායක ජනාධිපතිවරයෙකු අවශ්‍ය නොවන බවයි. එහෙත් වෙනසක් අවශ්‍ය වේ.


එහිදී රජය සහ විධායකය සියල්ලන් ඇතුළත් කර ගන්නා (Inclusive) බහු පාක්ෂික ආකාරයකින් තිබිය යුතුය. එහිදී අපට යම් ආකාරයක සභාග රජයක් ඇතිකරගත හැකිය. එසේ වීම අවශ්‍ය වන්නේ ශ්‍රී ලංකාව සියලු දෙනා ඇතුළත්කර ගන්නා බලය බෙදාහදාගත් ආකාරයකින් ඉදිරියට ගමන් කළ යුතු නිසා ය.

ජනතාව කණ්ඩායම් සහ ආයතනවල විශේෂ තත්වයන් එනම් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වැනි අවස්ථාවලදී ඉක්මන්, ඵලදායක ක්‍රියාමාර්ග ගැනීම සඳහා සහ එවැනි ප්‍රශ්න ඉක්මණින් විසදීම සඳහා විධායක ජනාධිපති ක්‍රමය ප්‍රයෝජනවත් වන බවට ද තර්කයක් තිබේ. එහෙත් මා සිතන්නේ මේ පුරුද්ද හැකි ඉතාම ඉක්මණින් අහෝසි කළ යුතු බවය. මෙය 1977 ට පෙර ලංකාවේ තිබුණු දෙයක් නොවේ. මෙම පුරුද්ද ප්‍රජාතන්ත්‍රවාදය හා සහභාගීත්ව ආණ්ඩුකරණය පිළිබඳව වූ සියලු සංකල්පයන්ට එරෙහිව යන්නකි. ඒ නිසයි එය වෙනස් කළ යුතු වන්නේ. ආණ්ඩුකරණයේ සංස්කෘතිය වෙනස් කිරීම පිළිබඳව අපි කතා කරමු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයට (Constitutionalism) සහ ප්‍රජාතන්ත්‍රවාදයට ආපසු ගමන් කිරීම පිළිබඳව මේ සියලු බලතල සහිත පුද්ගලයා සියලු ප්‍රශ්න විසඳිය හැකි පුද්ගලයා අපට සිටිය යුතුයි යන හැඟීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදයකට කිසිසේත්ම හිතකර වන්නක් නොවේ. මේ පුරුද්ද හැකි ඉක්මණින්ම පිටුදැකීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයට හා ප්‍රජාතන්ත්‍රවාදයට සුබපල ගෙන දෙන්නකි.

ජනතාවාදී සහ ප්‍රගතිශීලී පාලනයක් ඵලදායක ලෙස පවත්වාගෙන යාම සඳහා විධායක ජනාධිපතිධුරය ප්‍රයෝජනවත් මෙවලමක් වන බවට හා එබැවින් එය අත්හැරිය නොහැකි බවට විශේෂයෙන් ලතින් ඇමෙරිකානු කලාපයේ ප්‍රගතිශීලී ආණ්ඩු පිළිබඳව අදාල කරගනිමින් (ආචාර්ය දයාන් ජයතිලක යනාදීන්) ගොඩ නගන තර්කයක් ද තිබේ. එහෙත් එම තර්කයට මා එකඟ නැත.

ලතින් ඇමරිකානු දේශපාලන සන්දර්භය අපට වඩා බෙහෙවින් වෙනස් එකකි. ජූලියස් ලිසස් වැනි දේශපාලන විද්‍යාඥයන් ලතින් ඇමෙරිකාවේ ජනාධිපති ක්‍රම පිළිබඳව සවිස්තර ලෙස ලියා ඇත. මෙම ජනාධිපති ක්‍රමය ලතින් ඇමෙරිකාවේ අධිකාරීවාදී සහ ආඥාදායක පාලනයට එක් හේතුවක් බව ඔවුන්ගේ අදහසයි.

මෙම තර්කයන් ඉදිරිපත් කර තිබෙන්නේ ඇතැම් විට ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ සහ වෙනස්කම් හඳුන්වාදීම සඳහා ශක්තිමත් ජනාධිපති ක්‍රමයක් අවශ්‍යයයි යන පදනමින් විය හැකිය. මෙවැනි ඇතැම් විවේචන සඳහා බොලීවියාව වැනි රටවල් සැලකිල්ලට ගෙන තිබේ. ලතින් ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයේ අර්බුදය මෙවැනි ජනාධිපති ක්‍රමයන් පැවතීම නිසාම ඇතිවූවකි. එහි ප්‍රතිඵල ලෙස අනිවාර්යයෙන් ම ජනාධිපති වූයේ හමුදා ආඥාදායකයන් ය. ශ්‍රී ලංකාවේ සන්දර්භය මීට බෙහෙවින් ම වෙනස්ය. අප පැමිණ තිබෙන්නේ 1970 ගණන්වල පැවති සාපේක්ෂ ලෙස ස්ථාවර වූ තත්වයකින් ඔබ්බටයි. මෙහි දී මම ශ්‍රී ලංකාව 1977 ට පෙර අස්ථාවරව පැවති බවට කියැවෙන ජේ.ආර්. ජයවර්ධන, ඒ.ජේ විල්සන් වැනි අයගේ තර්කය පිළිනොගනිමි. සෑම අවුරුදු 5 කටම හෝ 6 කටම වරක්



srilankanewspapercartoon.blogspot.com

**පාර්ලිමේන්තු විධායක මොඩලයේද යම් මට්ටමක ස්ථාවරත්වයක් පවතින බවට සහතික කර ගැනීමේ තවත් ආකාරයන්ද තිබේ. ස්ථාවරත්වය එක් පැත්තකින්ද ජනතාවට ප්‍රතිචාරශීලීවන බව සහ වග වන බව අනෙක් පැත්තෙන්ද වන ආකාරයට සමතුලනයක් පවත්වාගැනීම වැදගත්ය.**

නිදහස් හා සාධාරණ මැතිවරණයන්හි දී රෙජීමයන් වෙනස් කරනු ලැබීම අස්ථාවරත්වයේ ලකුණක් යැයි මා සිතන්නේ නැත. එය රෙජීමයට අස්ථාවරත්වයක් විය හැකි වුවද එය රටට, ප්‍රජාතන්ත්‍රවාදයට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයට අස්ථාවරත්වයක් වන්නේ නැත. එම නිසා එම මූලික තර්කාංගය (premise)ට මම අභියෝග කරමි. අප ස්ථාවරත්වය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව වඩා සංකීර්ණ අවබෝධයක් ලබා ගත යුතුය. රෙජීමයේ ස්ථාවරත්වය සහ ජාතික ස්ථාවරත්වය අප පැහැදිලිව වෙනස්කොට දැකිය යුතුය. ශක්තිමත් ආණ්ඩුවක් අවුරුදු ගණනාවක් දිගින් දිගටම බලයේ සිටීම ස්ථාවරත්වය යන්නෙන් අදහස් වන්නේ නැත. මා සිතන්නේ එය අස්ථාවරත්වයේ ලකුණක් බවය. පුද්ගලයා, වරෙක ආණ්ඩුවේද ඊ ළඟට විපක්ෂයේ ද කාලය ගතකරන හෙයින් බලය එක් කණ්ඩායමකින් තවත් කණ්ඩායමකට හුවමාරු වන හිතකර වෙනසක සැබැවින්ම සලකුණක් වන්නේ අස්ථාවරත්ව නොව ස්ථාවරත්වයයි.

### පාර්ලිමේන්තු විධායක ක්‍රමය


එබැවින් මා තර්ක කරන්නේ 1977 ට පෙර ශ්‍රී ලංකාව 1977 න් පසු ශ්‍රී ලංකාවට වඩා බොහෝ විට ස්ථාවර වූවක් වන්නටද පුළුවන් බව ය. ලතින් ඇමෙරිකාව යන විෂයයට නැවතත් පිවිසුණ හොත් එම සන්දර්භය බෙහෙවින් වෙනස් එකකි. බොලීවියාව ගතහොත් හමුදාවේ බලයට හා දක්ෂිණාංශික ප්‍රභූ කණ්ඩායම්වල බලයට මුහුණ දීමට සමත් ශක්තිමත් ජනාධිපතිවරයෙක් එහි සිටියේ ය. එමෙන්ම ප්‍රභූ පන්තියේ ගලග්‍රහයෙන් බිඳීයාමේ අවශ්‍යතාවක්ද තිබුණි. එබඳු තත්වයක් ශ්‍රී ලංකාවේ පවතිනවා යැයි මා සිතන්නේ නැත. දකුණු ආසියානු කලාපයේවත් එවැනි තත්වයක් නැත. ඒකාධිපති ක්‍රමයේ වාසි සහ අවාසි පිළිබඳව ඉතාමත් ආකර්ශනීය විවාදයක් දැනට නේපාලයේ සිදුවෙමින් පවතී. මාඕවාදීන්හට ශක්තිමත් ජනාධිපති ක්‍රමයක් අවශ්‍ය විය. නමුත් දැන් එම මනෝභාවය රටින් ඉවතට ගමන් කර තිබේ. ශක්තිමත් ජනාධිපති ක්‍රමයෙහි තිබෙන අනතුරු පිළිබඳව නේපාලයේ ජනතාව බොහෝ දුරට සවිඥානික ය. ශ්‍රී ලංකාවේ සිදුවූයේ කුමක්ද යන්නත් ඔවුන් දැක තිබේ. දැන් පෙනෙන හැටියට නේපාලය ප්‍රතිසංස්කරණය කරන ලද පාර්ලිමේන්තු විධායක ක්‍රමයකට ගමන් කිරීමට ඉඩ ඇත. නමුත් එහිදී පාර්ලිමේන්තුව නිතර නිතර විසිරුවා හැරීම වැනි අස්ථාවරභාවය ඇති කරන තත්වයන් වලක්වන යම් ලක්ෂණයන්ද පවතී.

පාර්ලිමේන්තු විධායක මොඩලයේද යම් මට්ටමක ස්ථාවරත්වයක් පවතින බවට සහතික කර ගැනීමේ තවත් ආකාරයන්ද තිබේ. ස්ථාවරත්වය එක් පැත්තකින්ද ජනතාවට ප්‍රතිචාරශීලීවන බව සහ වග වන බව අනෙක් පැත්තෙන්ද වන ආකාරයට සමතුලනයක් පවත්වාගැනීම වැදගත් ය. ප්‍රජාතන්ත්‍රවාදය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය සහ බහුත්වවාදය අනුව සැලකා බැලූ කල ජනාධිපතික්‍රමය ශ්‍රී ලංකාවට විනාශයක් ගෙන දී ඇති බව පෙනේ.

පළාත්වලට රටේ පාලන කේන්ද්‍රය තුළ හඬක් සහ නියෝජනයක් සහතික කිරීමෙන් තොරව සිදුවන බලය බෙදීමේ ක්‍රමයක් පවත්වා ගැනීමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ඉතාමත් සුවිශේෂී වන බව කිවහැකි ය.

අපට දකුණු අප්‍රිකාවේ මෙන් ඵලදායක වන පළාත්වල කවුන්සිලයක් තිබුණා නම් එනම් පළාත්වලට තමන්ගේ කටයුතු බලාකියා ගැනීමේ ස්වයංපාලනයක් දෙන අතරම ජාතික ප්‍රතිපත්තිය හැඩගැස්වීමෙහි ලා සහභාගී වීම පිණිස කොළඹට නියෝජිතයන්ද එවීමට හැකියාවක් ඇති තත්වයක් තිබුණේ

www.groundviews.org



මෛත්‍රී හා ශක්තිය

**විධායක ජනාධිපති ක්‍රමයේ මෙන්ම විධායක අගමැති ක්‍රමයේ ඇති සංවරණ සහ තුලන ක්‍රමවේදයන් දෙකම මිශ්‍ර ක්‍රමයේ දී අතහැර දැමිය හැකි වන නිසාය. එහිදී අවසානයේ අපට ලැබෙන්නේ ක්‍රම දෙකේම නරකම අංගයයි. ශ්‍රී ලංකාවේ දී මෙම මිශ්‍ර ක්‍රමය විනාශයක් වී තිබේ.**

නම් එය ජනාධිපතික්‍රමයකට වඩා ඒකාබද්ධකම (National Unity) වැඩිදියුණු කරන හා විවිධත්වය තුළ ඒකාබද්ධකම වැඩි දියුණු කරන බෙහෙවින්ම ඵලදායක ක්‍රමයක් වන්නට තිබුණි. ශ්‍රී ලංකාවේ ජනාධිපති ක්‍රමය විසින් 13 වන සංශෝධනය අනතුරට ලක් කර ඇති ආකාරය ඉතාම පැහැදිළි ය. එහිදී ජනාධිපතිවරයා පළාත් සභාවේ තේරී පත් වූ නියෝජිතයන්ගේ කාර්යභාරය අඩපණ කිරීම පිණිස ආණ්ඩුකාරවරුන් උපයෝගී කර ගැනීම පැහැදිළිව දැකිය හැක. ඒ අනුව රටක බලය බෙදීමක් පවතින විටක රටේ ඒකාබද්ධතාව වැඩිදියුණු කිරීමට වෙනත් ආයතන අවශ්‍ය යයි යන අදහස මම නොපිළිගනිමි.

රටක ඒකාබද්ධතාව වැඩිදියුණු කිරීම පිණිස වෙනත් ආයතන හා වෙනත් යාන්ත්‍රණයන්ද භාවිතා කළ හැක. ජනාධිපති ක්‍රමයේ වාසියක් හෝ දෙකක් තිබෙන්නට පුළුවන. නමුත් එහි අවාසි වාසිවලට වඩා බෙහෙවින්ම වැඩිය.

### දෙමුහුන් ක්‍රමයක්

වෙනස් රටවල වෙනස් වෙනස් ක්‍රම පවතී. ඇතැම් රටවල සම්පූර්ණයෙන්ම චාරිත්‍රානුකූල පමණක්ම වන රාජ්‍ය නායකයෝ සිටිති. රාජ්‍ය නායකයා සහ ආණ්ඩුවේ නායකයා අතර යම් ආකාරයක බලය බෙදා හදා ගැනීමක් පවතින රාජ්‍යයන්ද ඇත. මේ විවිධ ක්‍රමවලින් වෙනස්ව ශ්‍රී ලංකාවේ පවතින්නේ ජනාධිපති ක්‍රමයේ හා පාර්ලිමේන්තු ක්‍රමයේ මිශ්‍රණයකි. එනම් දෙමුහුන් ක්‍රමයකි. දෙමුහුන් ක්‍රමය ලෝකයේ තිබෙන නරකම ක්‍රමය වේ. ශ්‍රී ලංකාවට ඇමරිකා එක්සත් ජනපදයේ මෙන් පිරිසිදු ජනාධිපති ක්‍රමයක් තිබීම සුදුසුයයි කියන බොහෝ දෙනාගේ එම තර්කය පිළිබඳව මම බෙහෙවින් සවිඥානිකව සිටිමි. ඇමෙරිකාවේ පවතින්නේ විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර දැඩි බලය බෙදීමකි. ජනාධිපතිවරයා කැබිනට් ඇමතිවරුන් ලෙස පත් කරන්නේ ව්‍යවස්ථාදායකයට පිටින් තෝරා ගත් අයයි. එහි විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පවතින්නේ එදිරිවාදී සම්බන්ධයකි. කොංග්‍රස් මණ්ඩලයේ බලතල ඔබාමා අනතුරට ලක් කළොත් හෝ නොතකා හැරියහොත් ඩිමොක්‍රටික් පාක්ෂික සභිකයෝ පවා දැඩි ලෙස කනස්සල්ලට පත්වෙති. එම එදිරිවාදී සම්බන්ධය ඇතැම් විට පක්ෂ හිතවාදී භාවය සහ පක්ෂ සම්බන්ධතාව පවා ඉක්මවා යන්නකි. එම ක්‍රමය දැනට ශ්‍රී ලංකාවේ පවතින ක්‍රමයට වඩා හොඳ ය. එය එසේ වන්නේ විධායක ජනාධිපති ක්‍රමයේ මෙන්ම විධායක අගමැති ක්‍රමයේ ඇති සංවරණ සහ තුලන ක්‍රමවේදයන් දෙකම මිශ්‍ර ක්‍රමයේ ද අතහැර දැමිය හැකි වන නිසාය. එහිදී අවසානයේ අපට ලැබෙන්නේ ක්‍රම දෙකේම නරකම අංගයන්ය. ශ්‍රී ලංකාවේ දී මෙම මිශ්‍ර ක්‍රමය විනාශයක් වී තිබේ. බොහෝ රටවල් මේ තත්වය පිළිබඳව දැනුම්වත් වීම ආරම්භ වී තිබේ. එක්කෝ අප ජනාධිපති ක්‍රමය ඇමරිකාවේ මෙන් එහි තර්කය හා සංවරණ හා තුලන ක්‍රමවේද සමඟ ගත යුතුය. එසේ නැති නම් අප බ්‍රිතාන්‍ය ක්‍රමය එහි තර්කය හා සංවරණ හා තුලන ක්‍රමවේදයන් සමඟ ගත යුතු ය. ශ්‍රී ලංකාවේ ජේ.ආර් ජයවර්ධන උත්සාහ කළේ විධායකයේ පහසුව සලකමින් සැලසුම් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීමටයි. ජනාධිපති ක්‍රමයකදී නිශ්චිත ලෙස නියම කළ ධුර කාල සීමාවක් තිබේ. පාර්ලිමේන්තු විධායක ක්‍රමයක දී ධුරය දරන අගමැතිවරයාට සුදුසු වන කාල සීමාවකදී මැතිවරණයක් කැඳවීමේ වරප්‍රසාදයක් ඇත. තුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජේ.ආර් ජයවර්ධන මහතා එම වරප්‍රසාදය ද තමන් සතු කර ගැනීමට උත්සාහ කළේය. මෙහි ප්‍රතිඵලය වුණේ කිසිම ප්‍රතිපත්තියක් ස්ථාවර බවක් නැති මිශ්‍රණයක් අපට ලැබීමය. එය ශ්‍රී ලංකාවට ව්‍යසනයක් වී තිබේ.

www.sundaytimes.lk



**ශ්‍රී ලංකාවේ අත්දැකීම වී ඇත්තේ ශක්තිමත් ජනාධිපති ක්‍රමයක් මඟින් ජාතික ආර්ථිකය අනතුරට පත්කර ඇති බවයි. ඩී.බී විජේතුංග මහතා ජනාධිපති ධුරයට පත් වූ තැන් පටන් අපට මේ ඉතාම නරක භාවිතයක් වන ජනාධිපතිවරයා විසින් මුදල් අමාත්‍ය ධුරය වී ඇත. ඇත්තෙන්ම එය ජාතික ආර්ථිකයට නරක ලෙස බලපා තිබේ.**

**ආසියානු දේශපාලන සංස්කෘතිය**

තත්ත්වය එයම වුවත් අප සැලසුම් කළ යුත්තේ දකුණු ආසියානු තත්ත්වයට ගැළපෙන විදියට එහිදී දකුණු ආසියානු දේශපාලන සංස්කෘතිය සැළකිල්ලට ගත යුතුය. ධුරාවලී සංස්කෘතිය, අනුග්‍රාහක දේශපාලන සංස්කෘතිය, දුර්වල ප්‍රජාතාන්ත්‍රික ආයතන යනාදී සන්දර්භයකදී මා තර්ක කරන්නේ බලය තනි පුද්ගලයෙකු වෙත සංකේන්ද්‍රණය වී තිබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැත්තෙන් බැලූ කල බෙහෙවින් අනතුරුදායක වන බවයි.

ශක්තිමත් ජාතික ආර්ථිකයක් පවත්වාගෙන යෑම පිණිස විධායක ජනාධිපති ක්‍රමය අවශ්‍යවන බවට ඇති විශ්වාසයෙහි ද පදනමක් නොවේ.

ශ්‍රී ලංකාවේ අත්දැකීම වී ඇත්තේ ශක්තිමත් ජනාධිපති ක්‍රමයක් මඟින් ජාතික ආර්ථිකය අනතුරට පත්කර ඇති බවයි. ඩී.බී විජේතුංග මහතා ජනාධිපති ධුරයට පත් වූ තැන් පටන් අපට මේ ඉතාම නරක භාවිතයක් වන ජනාධිපතිවරයා විසින් මුදල් අමාත්‍ය ධුරය දැරීම පුරුද්දක් ඇත්තෙන්ම එය ජාතික ආර්ථිකයට නරක ලෙස බලපා තිබේ. මහජන මුදල් පාර්ලිමේන්තුවේ දැඩි අධීක්ෂණයට ලක් කිරීමයි ජාතික ආර්ථිකයට හොඳ වන්නේ. ඩී.බී. විජේතුංග, චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ යන සියලු දෙනාම මුදල් අමාත්‍ය ධුරය දැරීම මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළහ. ජාතික ආර්ථිකයකට හොඳ වන්නේ දක්ෂ මුදල් ඇමතිවරයෙකු, ශක්තිමත් ස්වාධීන ආයතනයන්, තනි පුද්ගලයකු විසින් පනවන්නක් නොවන වාද විවාද හා සාකච්ඡාවලට භාජන වන හොඳ ආර්ථික ප්‍රතිපත්තියක් පැවතීමයි. එසේ වීමට හැකි හොඳම ආකාරය මහජන මුදල් පිළිබඳ කරුණු සම්බන්ධව මහජන සුපරීක්ෂණයක් පවතින පාර්ලිමේන්තු විධායක ක්‍රමයක් පැවතීමය. ජනාධිපති ක්‍රමයක් පැවතීමට වඩා රටේ ආර්ථික සංවර්ධනයට එය බෙහෙවින් වැදගත් වේ.

ශ්‍රී ලංකාව වැනි රටකට ඉතා ම සුදුසු ක්‍රමය වෙට්මිනිස්ටර් ක්‍රමය බවට තර්කයක් තිබේ. එනම් විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කර දමා අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරියට ගෙනයා හැකි ක්‍රමයකි.

එය වෙනසකට භාජනය කළ වෙට්මිනිස්ටර් ක්‍රමයයි. මෙහි දී අප ව්‍යවස්ථා බලය ජාතික රාජ්‍ය සභාව තුළට සංකේන්ද්‍රනය කිරීමේ වරද නොකළ යුතුයි. එසේ කිරීම අනෙක් ක්‍රමය මෙන්ම වැරදි ය. බලය සම්පූර්ණයෙන් ම පාර්ලිමේන්තුව වෙත සංකේන්ද්‍රණය කිරීම ම මෙන්ම බලය සම්පූර්ණයෙන් ම විධායක ජනාධිපති ධුරය වෙත සංකේන්ද්‍රණය කිරීමද එකවගේ ම වැරදිය. නමුත් ප්‍රතිසංස්කරණය කරන ලද පාර්ලිමේන්තු විධායකයක් වැදගත් ය. එනම් අගමැතිවරයා ප්‍රධාන දේශපාලන ක්‍රියාකාරිකයා විය යුතු ය. අගමැතිවරයා තමන් ම පාර්ලිමේන්තුවේ පෙනී සිටිය යුතු ය. අගමැතිවරයා අඛණ්ඩව ම පාර්ලිමේන්තුවට හා ජනතාවට වග කිව යුතුය. කිසිදු පක්ෂයකට හෝ සංවිධානයකට පැහැදිලි බහුතරයක් නොමැති හා එහෙයින් ම අස්ථිර ලෙස දෝලනය වෙමින් පවතින පාර්ලිමේන්තුවක් ඇතිවීම වැළැක්වීමේ හැකියාව තිබිය යුතුය. එම තත්ත්වය දිරි ගන්වන සුලු මැතිවරණ ක්‍රමයක් ද සහිත මෙන්ම අනෙකුත් ස්වාධීන ආයතනයන් ද සහිත නීතිකරණයන් සමාලෝචනයකට ලක් වන සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය සුරැකුනු ක්‍රමයක් සමඟ ඉදිරියට යා යුතුය. ඉදිරියේ දී පැවැත්වෙන මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුව නැවත කැඳවනු ලැබූ විට පළමු සහ දෙවන ජනරජ ව්‍යවස්ථාවන්ගේ වැරදිවලින් පාඩම් ඉගෙන ගෙන තුන්වන ජනරජ ව්‍යවස්ථාවක් කෙටුම් පත් කිරීමේ ව්‍යාපෘතියක් කරා ශ්‍රී ලංකාව ගමන් අරඹනු ඇතැයි සිතමි. ●

(සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි)



ආචාර්ය
**ජයම්පති වික්‍රමරත්න**



රතුපස්වල උද්ඝෝෂණයේ අවස්ථාව මර්දනයට හමුදාව මැදිහත්වී....

# සංශෝධනය අතර ම නව ව්‍යවස්ථාවක් ගැන සිතීමට කාලය ඇවිත්

**1978 සිදුවුණේ ප්‍රජාතන්ත්‍රවාදය තුළින් ම රටේ මූලික නීතිය හෙවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මවලට එරෙහිව සකස්කර ගැනීමක්. මෙහි ප්‍රතිඵලය වූණේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හැකිලීම පමණක් නොව අවසානයේ දී නීතියේ පාලනය ද අහෝසි වීම යි. 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් අසීමිත ජනාධිපති බලතල සංවරණය කිරීමට තැත් කළා. නමුත් එය අසාර්ථක වූයේ ඇයි?**

78 ව්‍යවස්ථාවෙන් ඇතිකරන ලද ඉතාමත් ශක්තිමත් ජනාධිපති ධූරයට අවස්ථා දෙකක දී සීමාවන් වැටුණා. එකක් තමයි 13 වෙනි සංශෝධනයේ දී සමහර කාරණා පිළිබඳ විධායක

kusalperera.blogspot.com



**මෙම පත්කිරීම් පිළිබඳ අවසාන බලතල තිබුණේ ජේ. ආර්ගේ මුල් ව්‍යවස්ථාවට අනුව ඇමති මණ්ඩලයටයි. ඒ සියලු බලතල 17 වෙනි සංශෝධනයෙන් ඉවත් කෙරුණා. ඇත්තෙන් ම ඒ ගැන සාකච්ඡාව ප්‍රමාණවත් නෑ.**

ජේ.ආර්. ගාමිණී සුසංයෝගය

බලය පළාත් සභාවලට පැවරීමට සිදුවීම. ඊ ළඟට 2001 ඔක්තෝබර් මාසයේ දී 17 වෙනි ව්‍යවස්ථා සංශෝධනය මගින් වැදගත් නිලතල සහ ස්වාධීන කොමිෂන් සභාවලට සාමාජිකයින් පත්කිරීමේ බලතලවලට සීමාවක් වැටීම. ඒ 17 වෙනි සංශෝධනයෙන් වූ වැදගත් දෙයක් තමයි රාජ්‍ය සේවයේ පත්වීම්, මාරු කිරීම් සහ උසස් කිරීම් ආදිය පිළිබඳ කැබිනට් මණ්ඩයට තිබෙන බලතල සම්පූර්ණයෙන් ම රාජ්‍ය සේවා කොමිසමට පැවරීම. ඒ අනුව ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කෙරන්නේ රාජ්‍ය සේවා කොමිසම විමසා බලා ජනාධිපතිවරයා විසිනි. මෙම පත්කිරීම් පිළිබඳ අවසාන බලතල තිබුණේ ජේ. ආර්ගේ මුල් ව්‍යවස්ථාවට අනුව ඇමති මණ්ඩලයටයි. ඒ සියලු බලතල 17 වෙනි සංශෝධනයෙන් ඉවත් කෙරුණා. ඇත්තෙන් ම ඒ ගැන සාකච්ඡාව ප්‍රමාණවත් නෑ.

ඇමති මණ්ඩලයේ තිබුණ බලතල සියල්ල 17 වෙනි සංශෝධනයෙන් ඉවත් කෙරුණ අතර ඉන්පසු ඒ බලතල රාජ්‍ය සේවා කොමිසමට සම්පූර්ණයෙන් ලබා දුන්නා. ඒ අනුව සියලු කොමිෂන් සභාවලට සහ වැදගත් තලතල, ඒ කියන්නේ නීතිපති, පොලිස්පති යනාදී අය පත් කිරීමේ බලතල තනි කැමැත්තට ජනාධිපතිවරයාට කිරීමට පුළුවන්කම 17 වෙනි සංශේධනය මගින් වෙනස් කෙරුණා.

17 වෙනි ව්‍යවස්ථා සංශෝධනයේ වැදත්ම ආයතනය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. එම සභාවට ආණ්ඩුවේ සහ විරුද්ධ පක්ෂයේ නියෝජනය ඇතුළත්. උදාහරණ ලෙස විපක්ෂ නායක, අගමැති, කුඩා පක්ෂ වෙනුවෙන් එක් අයෙක්. බුද්ධිමතුන් ද නියෝජනය වන පරිදි ජාතික එකඟත්වයක් තුළින් ඒ පත්වීම් කරන්නට මහන්සි ගත්තා. කොමිෂන් සභාවලට පත්කළ හැක්කේ ඔවුන් නිර්දේශ කරන අය පමණයි. අර ප්‍රධාන නිලතලවලට කරන පත්කිරීම් ව්‍යවස්ථා සභාවෙන් අනුමත කළ යුතු වුණා.

18 වෙනි සංශෝධනයෙන් එය ආපසු හැරුණා. ඒ අතර ම නිකම් පාර්ලිමේන්තු කවුන්සිලයක් කියලා එකක් හැදුවා. නමුත් ඒකට කිසිම බලතලයක් නැහැ. ඒකේ අදහස් විමසීමට පමණයි ජනාධිපතිවරයාට යුතුකමක් තිබුණේ. ජනාධිපතිවරයාට ඔවුන්ගේ අනුමැතිය අවශ්‍ය නොවී ය. ඒක ඒ තත්ත්වයට ගෙනාවා.

ඉතාමත් ම නරක තත්ත්වය ආවේ 2010 න් පසුවයි. ඒක අන්තිමට කෙළවර වුණේ ජනාධිපති රාජපක්ෂගේ පරාජයෙන්. ඊට විරුද්ධව විශාල මහජන මතයක් ඇතිවෙලා අන්තිමට ඒ මහජන මතය අනුව මැතිවරණයෙන් ඔහු පරාජයට පත්වුණා.

**මේ ආකාරයට 17 වෙනි සංශෝධනය ආපස්සට යන්නට හේතු වූ දුර්වලතා මොනවා ද?**

17 වෙනි සංශෝධනයේ දුර්වලතා නිසා නොවෙයි 18 වෙනි සංශෝධනය ගෙනාවේ. නමුත් 17 වෙනි සංශෝධනයේ දුර්වලතා වගයක් තිබුණා. උදාහරණයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලුම පත්වීම් කරන තුරු ව්‍යවස්ථා සභාව රැස්වෙන්නට පුළුවන්කමක් තිබුණේ නෑ. ඒ කියන්නේ එක සාමාජිකයෙකු පත්කර තිබුණේ නැත්නම් රැස්වීමට නොහැක. එයට අමතරව තව කුඩා දුර්වලකම් ද තිබුණා. ඒ දුර්වලකම් ඩියු ගුණසේකර ගේ සභාපතිත්වයෙන් යුතු තේරීම් කාරක සභාවකින් අධ්‍යයනය කර තිබුණා. එහි අවසාන වාර්තාවක් නැතත්, කෙටුම්පත් වාර්තාවක් තිබුණා. සියලු ප්‍රශ්නවලට එම වාර්තාවේ යෝජනා ඉදිරිපත් කර තිබුණා. ව්‍යවස්ථා සංශෝධනයකින් එහෙම විසඳන්නට පුළුවන්කම තිබියදීත්, රාජපක්ෂට ඒක කරන්නට උවමනාවක් තිබුණේ නැහැ. රාජපක්ෂට ඕනෑ වුණේ එම බලතල ආපසු තම අතට ගන්නට. ඒක තමයි 18 වෙනි සංශෝධනය. ඒකෙන් තමයි ඇත්ත වශයෙන්ම රාජපක්ෂ ගේ බැස්ම ආරම්භ වුණේ. ඊට පස්සේ ආවා අගවිනිසුරු ශිරානි

www.onlanka.com



හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා

**ව්‍යවස්ථා සංශෝධනයකින් එහෙම විසඳන්නට පුළුවන්කම තිබියදීත්, රාජපක්ෂට ඒක කරන්නට උවමනාවක් තිබුණේ නැහැ. රාජපක්ෂට ඕනැ වුණේ එම බලතල ආපසු තම අතට ගන්නට. ඒක තමයි 18 වෙනි සංශෝධනය. ඒකෙන් තමයි ඇත්ත වශයෙන්ම රාජපක්ෂ ගේ බැස්ම ආරම්භ වුණේ.**

බණ්ඩාරනායක සිද්ධිය. ඉතාමත් ම අත්තනෝමතිකවයි ශිරාණි බණ්ඩාරනායක සිද්ධියේ දී මහින්ද රාජපක්ෂ කටයුතු කළේ. එතනින් තමයි මහජන උද්ඝෝෂණ පටන් ගත්තේ. ඒ වෙනකොට කටුනායක, වෙඩි තැබීම සිදුවෙලා තිබුණා. ඊට පෙර හලාවත අර ධීවරයාට වෙඩිතබා මරාදැමීම, ඊටපසු රතුපස්වල සිද්ධිය ඇතුළු සියල්ල පෙළ ගැසී තිබුණා. කෙටියෙන් කියන්නේ නම් අවසන් වසර කිහිපය තුළ ඉතාමත් ම අත්තනෝමතිකව තමයි ඔහු කටයුතු කළේ.

ඔහුගේ අධිකාරිවාදී පාලනය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැතිවරණයේ දී අදාල නැති දෙයක් බවට පත්වුණා. හැම එකකට ම ඔහු රාජ්‍යය පාවිච්චිකළා. උදාහරණ වශයෙන් පොස්ටර්ස් සහ කටවුට් ගැසුවේ එක එක රාජ්‍ය ආයතන මගින්. වරාය අධිකාරියෙන් එකක් කරනවා, තව රාජ්‍ය ආයතනයකින් තවත් එකක් කරනවා. ඊ ළඟට ගම්වල ඡන්ද ලැයිස්තු පරීක්ෂා කිරීම, පෙර ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ශාඛාවෙන් කරන එක සමෘද්ධි නිළධාරීන්ට භාරදුන්නා.

කොටින් කියනවා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ රාජ්‍යය අතර තිබුණු වෙනස බොඳවෙලා ගියා. පක්ෂය අදාල වුයේ නැති තැනටයි ගමන් කළේ. එවැනි පසුබිමක තමයි මැතිවරණය පැවැත් වූණේ. මේ අනුව 18 වෙනි සංශෝධනය රාජපක්ෂ පාලනයේ සන්ධිස්ථානයක්.

දැන් ජනතාවගේ අභිලාෂය වන්නේ විධායක ජනාධිපති ධුරය ඉවත් කිරීම, නැත්නම් බලතල අඩු කිරීම. ඒ සමඟ ම කොමිෂන් සභා ස්ථාපිත කිරීම.

**17 වෙනි සංශෝධනයේ දුර්වලතා මගහරවා ගැනීමට 19 ව්‍යවස්ථා සංශෝධනයේ ගෙන ඇති පියවර මොනවා ද?**

18 වෙනි සංශෝධනය අහෝසිකර 17 වෙනි සංශෝධනය නැවත ගෙනෙනවා. එය ගෙනෙන්නේ එහි තිබුණු දුර්වලතා ඉවත් කරලා. ඒ කියන්නේ පැහැදිළිව එහි තිබෙනවා ගණපූර්ණය කීය ද කියලා. ඊ ළඟට යම් කිසි සාමාජිකයෙක් පත්කර නැතත් කටයුතු කරගෙන යන්නට පුළුවන් වන ආකාරයට ඒක සකස්කරන්නේ. ඊ ළඟට ජනාධිපතිවරයා බැඳී සිටිනවා නම් කරන අය පත්කරන්නට. සති දෙකක් ඇතුළත අදාළ පත්වීම් නොකළොත් ඔවුන් පත්කළ හැටියට සැළකෙනවා. මොකද අපට අත්දැකිමක් තිබෙනවා, රාජපක්ෂ සමහර පත්වීම් සඳහා නිර්දේශ කරන නම් පත්කළේ නෑ. ඒ වගේ තිබුණු දුර්වලකම් නැති කරලා ස්වාධින කොමිෂන් සභා නැවත ගෙනෙනවා. ඊ ළඟට දැනට සලකා බලමින් තිබෙනවා ජාතික විගණන කොමිසමක් සැදීමට. ඊ ළඟට සලකා බලමින් සිටිනවා අල්ලස් කොමිසමට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූල තත්ත්වයක් දෙන්නට. දැන් තිබෙන අල්ලස් කොමිසමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල තත්ත්වයක් නෑ. ඊ ළඟට අල්ලස් කොමිසමට. එවිට පරණ විදියට පත්වීම් කෙරෙනවා ව්‍යවස්ථා සභාව යටතේ.

**මැතිවරණ කොමිසම සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කෙසේ ද?**

මැතිවරණ කොමිසම පත්කරනවා. හැකිතාක් ඉක්මනින් මැතිවරණ කොමිසම පත්කිරීම තමයි බලාපොරොත්තුව. ඒ මැතිවරණ කොමිසම පත්කරන්නේ ව්‍යවස්ථා සභාවේ නිර්දේශවලට අනුව.

**එම කොමිසමට ඉන්දියාවේ මැතිවරණ කොමිසමට සමාන බලයක් තිබෙනවා ද?**

නැහැ. මැතිවරණ කොමිසම පත්කරනවා. නමුත් මැතිවරණ නීති වෙනස් කිරීම මේ අවස්ථාවේ කෙරෙන්නේ නෑ. මේකෙ අංග දෙකක් තියෙනවා. මැතිවරණ ක්‍රමය සහ මැතිවරණ නීතිය ඒ

kusalperera.blogspot.com



**දැන් තිබෙන අල්ලස් කොමිසමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල තත්ත්වයක් නෑ. ඊ ළඟට අල්ලස් කොමිසමට. එවිට පරණ විදියට පත්වීම් කෙරෙනවා ව්‍යවස්ථා සභාව යටතේ.**

දූෂණයට විරෙහිව


දෙකයි. මැතිවරණ කොමිසමේ බලතල පිළිබඳව අලුතෙන් සිතා බැලිය යුතුයි. අලුත් පාර්ලිමේන්තුව ඒ ගැන සිය අවධානය යොමු කළ යුතු යි. මේ මැතිවරණයේ දි පෙනුණ එකක් තමයි බලධාරීන්ට තිබෙන බලය ඉතාමත් සීමිත බව. ඒ සීමිත බලය තිබිලත් ලංකාවේ මැතිවරණ කොමසාරිස්වරයා සහ පොලිසිය කටයුතු කළ ආකාරය ප්‍රසංශනීයයි. ඔවුන් නිසයි මැතිවරණය මේ තරමටවත් හොඳින් කරගන්නට පුළුවන් වුණේ. නමුත් රාජ්‍ය දේපොළ හා රාජ්‍ය මාධ්‍ය අවභාවිතය පාලනය කිරීමට තිබෙන බලතල ඉතාමත් අඩුයි. ඡන්ද කාලයේ දී රාජ්‍ය සේවය, පොලීසිය පිළිබඳ ඉන්දීය මැතිවරණ කොමසාරිස්ට තිබෙන බලය අපේ මැතිවරණ කොමසාරිස්ට නෑ. අපේ මැතිවරණ කොමසාරිස්වරයා ඒ ගැන කිහිප වරක් ප්‍රකාශ කරලා තිබෙනවා. ඉන්දියාව සහ වෙනත් රටවල නීති රීති දෙස බලා අලුත් මැතිවරණ නීතියක් හදනවා නම් ඉතාමත් හොඳයි. මම හිතන්නේ ඒක අලුත් පාර්ලිමේන්තුවේ කාර්යයක් විය යුතුයි.

**මැතිවරණයේ දී ප්‍රකාශවුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට. නමුත් දැනට පෙනෙන්නට තිබෙන්නේ බලතල අඩු කිරීමක් නේද ?**

ඒ මතය වැරදියි. මැතිවරණ ප්‍රකාශනය කියවා බැලුවොත් සහ මැතිවරණයේ දී ජනතාවට දුන් පණිවිඩය සහ වේදිකාවේ පැහැදිලි ලෙස කරන ලද ප්‍රකාශ සියල්ල ගත්තොත් විධායක ජනාධිපති ක්‍රමය නැති කිරීම තමයි කිව්වේ. ඒ අනුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා. නමුත් ජනාධිපතිවරයාට 72 ව්‍යවස්ථාවේ විලියම් ගොපල්ලව මහතා හිටපු කාලයේ දී වගේ ඉතාමත් නාමික එකක් ලෙස මෙය හඳුන්වන්නට බැරි බව සත්‍යයක්. ඊට වඩා වැඩි බලතල මේ ජනාධිපතිවරයාට හිමිවෙනවා. උදාහරණයක් වශයෙන් කැබිනට් මණ්ඩලය දෙන උපදෙස් පිළිගන්නෙ නැතිව සුදුසු නැහැයි කියලා හිතෙනවා නම් නැවත කැබිනට් එකට සලකා බැලීම සඳහා යොමු කළ හැකියි. ඒ අනුව දෙවෙනි වර කැබිනට් එක දෙන උපදේශය පිළිගත යුතුයි. ඉන්දියාවෙත් තිබෙන්නේ එහෙමයි. ඊ ළඟට පාර්ලිමේන්තුවේ පනතක් සම්මත වුනාම එය සහතික කරන බලතල දෙන්නේ මීට පස්සේ ජනාධිපතිවරයාට. ඒවාද අවශ්‍ය නම් නැවත සලකා බැලීමට පාර්ලිමේන්තුවට යොමු කළ හැකිය. දෙවෙනි වර සලකා බැලුවට පසු ඉන්දියාවේ මෙන් එය සහතික කළ යුතු යි. ඉන්දියාවේ අත්දැකීම නම් කලාතුරකින් තමයි එවැනි අවස්ථා ඇති වෙන්නේ. නමුත් ඒ බලතල තිබෙනවා. ඊළඟට යහපාලනය පිළිබඳව විශේෂ බලතල ගණනාවක් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ මේ කොමිසන් සභා කටයුතු කරන ආකාරය යම් සුපරීක්ෂා කිරීමේ, අධීක්ෂණය කිරීමේ බලතල ජනාධිපතිවරයාට පැවරෙනවා. ඊ ළඟට මැතිවරණ කොමිසමේ නිර්දේශ අනුව නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීමට වග බලා ගැනීම.

ඊට අමතරව වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට ඔහුගේ ධුරකාලය සඳහා විශේෂ බලතල දීමට බලාපොරොත්තු වෙනවා. මක්නිසා ද යත් මෛත්‍රීපාල සිරිසේන මහත්තයා තමයි මේ වැඩේට නායකත්වය දුන්නේ. ඔහු නැත්නම් මේක කෙරෙන්නේ නැහැ. වෙනත් නායකයොත් දායක වුණා තමයි. ඒ නායකත්වය නැතිවුණා නම් මේක කෙරෙන්නෙත් නෑ. තමන්ගේ ජීවිතය පවා පරදුවට තැබුවා, වෙනස් ප්‍රතිඵලයක් ලැබුණා නම් කුමක් වේද කියන්නට අසීරු යි. අපට ලැබෙන ආරංචිවලට අනුව දිනලත් යම් උත්සහයන් තිබුණු බව පෙනී යනවා. ඡන්ද ගණන් කිරීම නවත්වලා, හදිසි නීතිය පාවිච්චි කරලා යම්යම් දේවල් කරන්නට තිබුණු බවට තොරතුරු ලැබෙමින් පවතිනවා. ඒ පිළිබඳ තොරතුරු සොයන පොලිස් විමර්ෂණයක් තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ

www.dailynews.lk



**ජනාධිපතිවරයාට 72 ව්‍යවස්ථාවේ විලියම් ගොපල්ලව මහතා හිටපු කාලයේ දී වගේ ඉතාමත් නාමික එකක් ලෙස මෙය හඳුන්වන්නට බැරි බව සත්‍යයක්. ඊට වඩා වැඩි බලතල මේ ජනාධිපතිවරයාට හිමිවෙනවා.**

අවසන් ආණ්ඩුකාරවරයා සහ ප්‍රථම ජනාධිපති විලියම් ගොපල්ලව

රටේ කවුරුත් එතුමාගේ ධුර කාලය සඳහා යම් යම් බලතල දෙන්නට විරුද්ධවන එකක් නැහැ. එතුමා දැන් පැහැදිලිව කියලා තිබෙනවා මේ සැරේ විතරයි ඉන්නේ කියලා. ඒක ඉතාමත් ආදර්ශවත් ප්‍රකාශයක්. ඒ නිසා යම් යම් විෂයන් පිළිබඳව අමාත්‍ය මණ්ඩල බලතල ඔහුට තියාගැනීමට අදහස් කරනවා. ඒ පිළිබඳවද සාකච්ඡා වෙමින් පවතිනවා.

**කැබිනට් ආණ්ඩු ක්‍රමයක නම් විධායකය උපදින්නේ පාර්ලිමේන්තුව තුළිනි. එනම් අගමැති ප්‍රමුඛ කැබිනට් එක. නාමික ජනාධිපති පත්කරන්නේ එම විධායකය විසින්. තිබුණු තත්ත්වය තුළ සිරිසේන මහතා පත්වුණේ ජනතාවගේ ඡන්දයෙන්. මින් ඉදිරියටත් ජනාධිපතිවරයා පත්වන්නේ මහජනතාවගේ ඡන්දයෙන් ද?**

මේක පාර්ලිමේන්තු විධායකයක්. මේ සැරේ එන සංශෝධනයෙන් ජනාධිපතිවරයා පත්වන ආකාරයේ වෙනසක් කරන්නේ නැහැ.

**ඇයි කරන්නේ නැත්තේ?**

මූලික හේතුව, ඒකට ජනමත විචාරණයක් අවශ්‍යයි. ජනමත විචාරණයකට මේ වෙලාවේ අති විශාල මුදලක් වැය කරන්නට ඕනේ. අනික් අතට ඒවා කරන්නට ගියොත් දින සියයකින් කරන්නට බෑ. ඒ නිසා ඒක පසුවට තබනවා. අලුත් පාර්ලිමේන්තුවට වෙනවා නේ තව වෙනස්කම් කරන්නට. අලුතෙන් හදන ව්‍යවස්ථාව ජනමත විචාරණයකට කොහොමත් දාන්නට සිදුවෙනවා.

**මේ සංශෝධනය සංක්‍රමණීය අවස්ථාවක් ද? ඒ කියන්නේ ඉදිරියේ දී පූර්ණ ව්‍යවස්ථා වෙනසකට යා යුතු වෙනවා ද?**

නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව කවුරුත් පිළිගන්නවා. මගේ මතය අනුව නම් දැන් සංශෝධන වලින් ම යා නොහැකි යි. දැන් කෙරෙන මේ සංශෝධනය අත්‍යවශ්‍ය යි. නමුත් අලුත් මැතිවරණ ක්‍රමය, අධිකරණ ක්‍රමය, මූලික අයිතිවාසිකම් හා නොයෙකුත් කාරණා පිළිබඳ සංශෝධන වරින් වර ගේනවාට වඩා හොඳයි අලුත් ව්‍යවස්ථාවක් හදන එක. එන මැතිවරණයෙන් පසු නව පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස මේ කාරණය ගන්නට ඉඩ තිබෙනවා. මට පේන හැටියට ඒ පිළිබඳ එකඟත්වයක් තිබෙනවා. මොකද් ද ව්‍යවස්ථාව කියලා සාකච්ඡා කළ යුතුයි.

**ප්‍රතිසංස්කරණ වල තිබුණා ඡන්ද ක්‍රමය ඉවත්කරණ බව. එම සංශෝධනය හැළුණා ද?**

දින 100 ඇතුළත ඒ පිළිබඳව සංශෝධන ඉරිපත් කිරීම තමයි බලාපොරොත්තු වන්නේ. ඉතාම ඉක්මනින් ඒ ගැන කොමිටියක් පත්කරන්න ඕනේ. දැනට දේශපාලන පක්ෂවලින් ඉදිරිපත්කරන අදහස් තමයි තියෙන්නේ. දැන් සාමාන්‍ය එකඟත්වයක් තියෙනවා නේ සමානුපාතික ක්‍රමය සහ කේවල ක්‍රමයේ මිශ්‍රණයක් කියලා. කුමක් ද මිශ්‍රණය, කුමක් ද අනුපාතය. ඒක තීන්දු කළ යුතු යි. ඊ ළඟට සමානුපාතය නියෝජනය කරන්නේ දිස්ත්‍රික්ක මට්ටමින් ද? ජාතික මට්ටමෙන් ද? පළාත් මට්ටමෙන් ද? කියන එක තීරණය කළ යුතු යි. ඊ ළඟට ප්‍රශ්නයක් එනවා අපිට සීමානිර්ණය කිරීමට කල් යනවා නේ. ඒකට කොපමණ කල්යනවා ද ? සීමා නිර්ණය කරගන්නට බැරිවුණොත් මොකද කරන්නේ ? ඊ ළඟ මැතිවරණයට පෙර වර්තමාන ක්‍රමය යටතේ යනවා ද? නමුත් මේ දෙකේ මිශ්‍රණයක් එන බව පැහැදිලියි. පැරණි ක්‍රමය අහෝසි වෙනවා. නමුත් සීමා නිර්ණය කර සියල්ල කරගැනීමට බැරිවුවහොත් මොකද්ද අප කරන්නේ?

සංවාද සටහන - **මහින්ද රත්නායක**



ආචාර්ය
**අසංග වැලිකල**




මාධ්‍ය නිදහස ඉල්ලා...

## ශ්‍රී ලංකාවේ අදහස් පළකිරීමේ නිදහස ආරක්ෂා කිරීම:
# අත්‍යවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ

පොදු විපක්ෂ අපේක්ෂකයාගේ ජනාධිපතිවරණ ප්‍රකාශනයේ 11 වන පරිච්ඡේදය කැප කර තිබෙනුයේ මාධ්‍ය නිදහස උදෙසා ය. අනෙක් ඒවා අතර ඊට විදේශයේ සිට ක්‍රියාත්මක කෙරෙන පුවත් වෙබ් අඩවි පිළිබඳ තහනම් ඉවත් කිරීම වැනි සරල පොරොන්දු ඇතුළත් වේ. එබඳු ළදරු පියවර කලින් පැවති ආරක්ෂක අමාත්‍යාංශයෙන් උපත ලද බාල - අවසාන වශයෙන් ස්වයං පරාජයීය අත්තනෝමතික පාලනයේ ආකෘතික පියවර විය. රාජපක්ෂ රෙජීමය යටතේ නිදහස් මාධ්‍යය හා ස්වාධීන මාධ්‍යවේදීන් භාජනය කර තිබුණු අතිමහත් මර්දනය හා ඊට සේවය කිරීමේ දී රාජ්‍ය මාධ්‍යය ගිලී තිබුණ පිළිකුල් දනවන තරම් ගැඹුරට ගිය තත්ත්වයන් සැලකිල්ලට ගැනීමේ දී ප්‍රකාශනයෙහි වෙනම පරිච්ඡේදයක මාධ්‍ය නිදහස පිළිබඳ අවධාරණය වඩාත් නිවැරදිව ස්ථානගත කිරීමක් විය. අප පෙනී සිටින්නේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් පමණක් නොව ශිෂ්ට සමාජයක් ද නැවත

www.indiamike.com





**මෙම සංවර්ධනයන්ගේ තාක්ෂණික මානයන්හි වඩාත් ප්‍රවීණත්වයෙන් යුතු ඒවා මා මෙහි ඉදිරිපත් කරන ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනාවලට එකතු කරන්නට ද ඒවා වැඩි දියුණු කිරීමට ද සමත් වනු නිසැක ය.**

රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන ලේක්හවුස් ආයතනය

ගොඩ නැගීම උදෙසා නම් එවිට අදහස් පළ කිරීමේ නිදහස සඳහා වන ආයතනික රාමුව - ප්‍රජාතන්ත්‍රවාදී ජීවන මාර්ග යෙහි කේන්ද්‍රීය හා ඉතාමත්ම තීරණාත්මක ආරක්ෂණය- ඉහළම හදිසි කාරණය වශයෙන් ප්‍රතිසංස්කරණය කිරීම හා ශක්තිමත් කිරීම කළ යුතුම ය. මෙම කාරණය සම්බන්ධයෙන් අතීතයේ දී සිවිල් සමාජය හා මාධ්‍යවේදීන්ගේ සංවිධාන විසින් සංවර්ධනය හා ප්‍රවර්ධනය කර තිබූ හා නව ආණ්ඩුව විසින් සලකා බලනු ලැබීමට වටිනා අදහස් ගණනාවක් තිබී ඇත. ශ්‍රී ලංකාව අදහස් පළ කිරීමේ නිදහසට ඇති අයිතිය භුක්ති විඳීම සම්බන්ධ ගුණාත්මක හා ආකෘතික පරිහානියකට ලක්ව තිබූ රාජපක්ෂ රෙජිමයේ සමයෙහි සෙසු ලෝකය විශේෂයෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සංවර්ධනයන් ඔස්සේ විශාල ප්‍රගමනයන් ඇති කරමින් ඉදිරියට ගමන් කර තිබිණ. මෙම සංවර්ධනයන්ගේ තාක්ෂණික මානයන්හි වඩාත් ප්‍රවීණත්වයෙන් යුතු ඒවා මා මෙහි ඉදිරිපත් කරන ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනාවලට එකතු කරන්නට ද ඒවා වැඩි දියුණු කිරීමට ද සමත් වනු නිසැක ය.

අපේ රටේ අදහස් පළ කිරීමේ නිදහස සවිබල ගැන්වීම පිළිබඳව සලකා බැලීමේ දී පැහැදිලි ආරම්භක ලක්ෂ්‍යය වනුයේ එම මූලික අයිතිය සඳහා වන දේශීය ව්‍යවස්ථාමය විධිවිධාන ඊට අදාළ අපේ ජාත්‍යන්තර බැඳීම්වලට අනුව මනින්නේ කෙසේ ද යන්න පරීක්ෂාකර බැලීම ය. මේ සම්බන්ධයෙන් වන අපේ ජාත්‍යන්තර බැඳීම් මූලික වශයෙන් අඩංගු වනුයේ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි (*ICCPR*) ය. සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි 19 වෙනි වගන්තිය අදහස් පළ කිරීමේ හා මතයක් දැරීමේ නිදහසට අදාලවන අතර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තියේ එන භාෂණයට අදාළ අයිතියට වඩා අත පෙවීම්වලින් තොරව අදහස් දැරීමේ, දේශ සීමා නොසලකා පුද්ගලයෙකුගේ තේරීම අනුව එක්කෝ වාචිකව, ලිඛිතව නැතහොත් මුද්‍රිතව, එසේත් නැතහොත් චිත්‍ර ආකාරයෙන් හෝ වෙනත් කුමන වුව මාධ්‍යයක් මගින් අදහස් දැරීමේ අයිතිය ඇතුළත් කිරීමේ පුළුල් කොන්දේසි සහිතව සූත්‍රගත කරනු ලැබ තිබේ. ඊට පරස්පරව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තිය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු නීතියේ ඇති 'අදහස් පළ කිරීම' යන්නෙහි අඩංගුව පිළිබඳ ලිබරල් ප්‍රවේශයක් ගෙන තිබුණ ද එහි තහවුරු කරන්නේ භාෂණයේ හා අදහස් පළ කිරීමේ නිදහස පමණකි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු නීතියට අනුව ඡන්දය දීමේ අයිතිය (නිදසුන් ලෙස ප්‍රධාන ඇමතිවරයාගේ නඩුව) හා දේශපාලන විරෝධය පෑමේ නිර්-භාෂණ ආකාරයන් ද අදහස් පළ කිරීමේ නිදහසේ (ජන ඝෝෂා නඩුව) මෙන්ම විසම්මුතියට ඇති අයිතියේ (යුක්තිය නඩුව) විෂය සීමාව ඇතුළතට අඩංගුවන බව තීන්දු කරනු ලැබ තිබේ. එසේම තොරතුරු දැන ගැනීමේ විශේෂිත අයිතියක් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතියක් ලෙස නොමැත්තේ වුව ද අදහස් පළ කිරීමේ අයිතියට ඇතැම් ආකාර තොරතුරු ලබා ගැනීමේ හා බෙදා හැරීමේ අයිතිය අඩංගුවන බව අධිකරණය පිළිගෙන තිබේ (උදා: විමල් ප්‍රනාන්දු නඩුව). මේ පිළිබඳව වැඩිමනත් කරුණු දැක්වීම පසුව කෙරේ.

කෙසේ වුව ද අධිකරණයේ මෙම තීන්දු ප්‍රකාශන සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය ඇතුළු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අදහස් පළ කිරීමේ නිදහස පිළිබඳව වඩාත් සවිබල පදිතමය සූත්‍රගත කිරීමක අවශ්‍යතාවක් නොමැති යයි හෝ නිෂ්ප්‍රභ කිරීමක් ප්‍රවර්ධනය නොකරයි. එසේම තවදුරටත් ශ්‍රේෂ්ඨාධිකරණයට මේ සම්බන්ධව ඒකාකාර ලිබරල් වාර්තාවක් නොමැති බව ද මතක තබාගත යුතු ය. වැඩිහිටි ප්‍රේක්ෂකයින් සඳහා සුදුසු වූ චිත්‍රපටයක් තහනම් කිරීම හා සම්බන්ධ නඩුවක දී (අක්ෂරය නඩුව) අධිකරණය සංස්කෘතිය



www.edition.cnn.com

ජිනීවා සමුළුව

**කෙසේ වුව ද අධිකරණයේ මෙම තීන්දු ප්‍රකාශන සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය ඇතුළු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අදහස් පළ කිරීමේ නිදහස පිළිබඳව වඩාත් සවිබල පඨිතමය සූත්‍රගත කිරීමක අවශ්‍යතාවක් නොමැති යයි හෝ නිෂ්ප්‍රභ කිරීමක් ප්‍රවර්ධනය නොකරයි.**

හා සදාචාරය පිළිබඳ තමන්ගේම අදහස් මත තීන්දු කළ මෑත නඩුවක් ඇතුළුව බොහෝ අවස්ථාවල එහි විනිශ්චයන් ප්‍රතිගාමී වූ අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නොවීය. එපරිද්දෙන්ම අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීතිය යටතේ වන බලතල සම්පූර්ණයෙන්ම පදනම් විරහිත හා පසුගාමී අන්දමින් යොදා ගැනීම අදහස් පළ කිරීමේ හා මාධ්‍යයේ නිදහස කෙරෙහි ඍජුවම හානිකර බලපෑමක් ඇති කර තිබේ. එසේම පාර්ලිමේන්තුව ද මෑත දී නොවුණ ද අතීතයේ දී පුවත්පත් හා මාධ්‍යවේදීන්ට එරෙහිව මර්දනකාරී අන්දමින් අපහාසය සම්බන්ධයෙන් දඬුවම් කිරීමට එහි බලතල යොදා ගෙන තිබේ.

අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අදහස් පළ කිරීමේ නිදහස ප්‍රකාශකර දක්වන ආකාරයෙහි ප්‍රධාන දුර්වලතාවන්ගෙන් එකක් වන්නේ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි 19 (3) වෙනි වගන්තියෙහි මෙම අයිතිය සීමා කිරීම සඳහා වන 'අනිවාර්යතාව' පිළිබඳ අවශ්‍යතාව සීමා කිරීම් සඳහා වන ශ්‍රී ලාංකීය රාමුවෙහි නොමැති වීම ය. එපරිද්දෙන්ම සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (7) වගන්තියෙහි ගණනයට ගනු ලැබ ඇත්තා වූ සීමා පැනවීමේ අනෙකුත් පදනම්වලට ඉඩ දෙනු ලබන්නේ වුව ද සීමා පැනවීමේ විශේෂ පදනමක් ලෙස 'ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබ සාධනය උදෙසා යුක්ති සහගතව අවශ්‍ය දෑ සපුරාලීම' පිළිබඳව එම වගන්තියෙහි එන විධිවිධානයට ඉඩ සලසා දී නොමැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (2) වගන්තිය වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාසය හෝ වරදකට පෙළඹවීම හා සම්බන්ධ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වැනි අදහස් පළ කිරීමේ නිදහස මත සීමා පනවන විශේෂිත පදනම් නියම කරයි. අපහාසය හා වරදකට පෙළඹවීම හැර සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ පිළිවෙලින් 19 (3) (අ) හා 20 යන වගන්ති මගින් අවරණය කරනු ලබන සීමා කිරීම් සඳහා වන මේ අනෙක් කිසිදු පදනමක් සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය විසින් පිළිගනු නොලබයි. මෙය මෑත දී අදහස් පළ කිරීමේ නිදහස කෙරෙහි බියකරු ප්‍රතිවිපාකයක් ඇති කරනු ලැබ ඇත්තා වූ තවත් ප්‍රශ්නයක් අවධාරණය කරයි: එනම් ශ්‍රී ලංකාවේ අධිකරණයට අපහාස කිරීම හා සම්බන්ධ නීතියේ ව්‍යවස්ථාමය අවිධිමත් ස්වභාවය සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය විසින් අපේක්ෂා කරනු ලැබ ඇත්තා වූ අදහස් පළ කිරීමේ නිදහසට හානිකර ආකාරයකින් මෙම බලතල යොදා ගැනීම කරනු ලැබ තිබෙනවාය යන්න ය. අධිකරණයට අපහාස කිරීමේ පොදු නීතිය සම්බන්ධ මෑත කාලීන ඉතාමත්ම ප්‍රමුඛ අපයෝජකයා වූයේ හිටපු අගවිනිසුරු සරත් එන්. සිල්වා ය. ඔහු සාපේක්ෂ වශයෙන් සුළු අපරාධ වූ වරදවල් සම්බන්ධයෙන් ටෝනි ප්‍රනාන්දු සහ එස්. බී. දිසානායක යන අයවලුන් ලුහුඬුවම සිරගත කළේ ය. එහෙයින් අදහස් පළ කිරීමේ නිදහස පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල උසාවියට අපහාස කිරීමේ පනතක් දැවෙන අවශ්‍යතාවක්ව පවතින අතර මේ සම්බන්ධයෙන් වන්නා වූ යෝජනා නීතිවේදීන්ගේ හා මාධ්‍යවේදීන්ගේ කණ්ඩායම් විසින් මේ වන විටත් සංවර්ධනය කරනු ලැබ තිබේ.

එසේම සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 2 (1) වගන්තිය මගින් නියම කෙරී ඇති පරිදි 14 (1) (අ) යටතේ වන අයිතීන් ශ්‍රී ලාංකීය රාජ්‍යයේ භූමිය ඇතුළත වසන හා අධිකරණ බලයට යටත්වන සියලු පුද්ගලයින්ට නොව ශ්‍රී ලාංකීය පුරවැසියන්ට පමණක් ලැබෙන බව සඳහන් කළ යුතු ය. තියුණු අර්බුද කාල සමයන්හි හදිසි නීති විධිවිධාන මගින් පනවනු ලබන පූර්ව වාරණයන් සමග අදහස් පළ කිරීමේ නිදහස හදිසි නීති තත්ත්වයන් යටතේ විශේෂයෙන්ම අනතුරට පත්විය


en.wikipedia.org

**එසේම සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 2 (1) වගන්තිය මගින් නියම කෙරී ඇති පරිදි 14 (1) (අ) යටතේ වන අයිතීන් ශ්‍රී ලාංකීය රාජ්‍යයේ භූමිය ඇතුළත වසන හා අධිකරණ බලයට යටත්වන සියලු පුද්ගලයින්ට නොව ශ්‍රී ලාංකීය පුරවැසියන්ට පමණක් ලැබෙන බව සඳහන් කළ යුතු ය.**

පුරවැසි අයිතිය

හැකිව පැවතිණ. මේ සම්බන්ධයෙන් ගත් කල ශ්‍රේෂ්ඨාධිකරණය පොදුවේ මූලික අයිතීන් පිළිබඳ නඩුවලදී රාජ්‍යයට පක්ෂ වීමේ ප්‍රවනතාවක් පෙන්නුම් කර ඇත (උදා, සුනිලා අබේසේකර නඩුව). එපරිද්දෙන්ම අදහස් පළ කිරීමේ නිදහසට අදාළව ත්‍රස්තවාදය වැළැක් වීමේ පනතේ (*PTA*) අන්තරායකාරී ස්වභාවය අයුතු රඳවා තැබීම, නඩු පැවරීම, දඬුවම් දීම හා ජේ. එස්. තිසනායගම් සිරගත කිරීම මගින් විචිත්‍ර ලෙස විදහා දක්වා තිබේ. ඔහුගේ දඬුවම සම්බන්ධ අසමානුපාතිකත්වය අන් තැනක "වචන 85 ක්, අවුරුදු 20 ක්, වචනයකට මාස තුනක්" යන මේ වචනවල අමල් ඩි චිකේරා විසින් මනාව ග්‍රහණය කරනු ලැබ තිබේ.

එහෙයින් අපට අදහස් පළ කිරීමේ නිදහස ශ්‍රී ලංකාවේ මූලික අයිතියක් ලෙස ව්‍යවස්ථාමය වශයෙන් ආරක්ෂා කිරීමේ හා බලාත්මක කිරීමේ මාර්ගය විශාල වශයෙන් දියුණු කළ හැකිය යන්න ඉතා පැහැදිලි ය. පොදු විපක්ෂ ප්‍රකාශනය ජනමත විචාරණයක් අවශ්‍ය නොකරන ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයන්ට එය සීමා කරන හෙයින් 14 (1) (අ) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂිත විධිවිධානයක් නොවන බවත් එම නිසා සත්තකින්ම ප්‍රශ්න විසින් හා ඉහතින් හඳුනාගෙන තිබෙන මාර්ගවලින් ඉල්ලා සිටිනු ලබන වෙනස්කම් දින 100 වැඩසටහනේ කොටසක් බවට පත් කළ හැකි බවත් සැලකිල්ලට ගැනීම වටනේ ය. මෙය නිදසුන් ලෙස දින 100 වැඩසටහනට ඇතුළත් කර තිබෙන පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳ ප්‍රතිසංස්කරණයට වඩා වැඩි ප්‍රමුඛතාවක් ගන්නා බව මට පෙනේ.

අත්තිවාරම්වල සිට, අනතුරුව ව්‍යුහයන්ට. රාජපක්ෂ රෙජිමය හුදෙක් ප්‍රතිසංස්කරණ නැවතීමට නොව ස්ටාලින්ගේ උස්සෝෂණ-ප්‍රචාරක (*agitprop*) කොමිසාර්වරුන් ලජ්ජාවට පත් කරන ආකාරයන්ගෙන් මෙම ආයතන යළි නිර්මාණය කිරීමට කටයුතු කිරීමට පෙර සිටම මෙම රාජ්‍ය හිමිකාර හෝ පාලිත මාධ්‍ය ආයතන ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ කාරණය අවුරුදු ගණනාවක් තිස්සේ න්‍යාය පත්‍රයේ තිබී ඇත. මෙම රාජ්‍යමය වශයෙන්-හිමි හා බදු මුදල්වලින් අරමුදල් සැපයෙන ආයතනවල අන්තයටම ගිය අපයෝජනය හා දණ්ඩන මුක්තියේ පළිහ යටතේ ඒවා මෙහෙයවීමට පත් කරන ලද පාක්ෂික කුලී වෘත්තිකයින්ගේ පරක් තෙරක් නැති චර්යාව මෙම අංශයේ ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සඳහාවන හදිසි අවශ්‍යතාව සංයුක්ත කර තිබේ. කෙසේ වුව ද රාජ්‍ය මාධ්‍යයේ ප්‍රතිසංස්කරණය වෙත එළඹීමේ දී අපි අපට මග පෙන්වනු ලබනන්නා වූ මූලධර්ම පිළිබඳව නිරවුල්ව සිටිය යුත්තෙමු.

මේ සම්බන්ධයෙන් වන ප්‍රධාන මූලධර්මවලින් එකක් වනුයේ රාජ්‍ය මාධ්‍යය ප්‍රතිසංස්කරණය කිරීම යන්නෙන් හුදෙක් ඒවා පෞද්ගලිකකරණය කිරීම අදහස් නොවේ ය යන්න ය. සැබැවින්ම අරමුණ විය යුත්තේ මෙම ආයතන මත වන දේශපාලන පාලනය ඉවත් කිරීම හා ඒවා සැබෑ ලෙසම මහජන සේවා මාධ්‍යය ලෙස ප්‍රතිනිර්මාණය කිරීම ය. මෙය ශ්‍රී ලංකාව නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල හොඳම භාවිතයන්ට අනුකූලවන තත්ත්වයට ගෙන ඒම හා එමගින් මහජන සේවා මාධ්‍යය පුරවැසිභාවයේ සිවිල් හා දේශපාලන අයිතීන් සාක්ෂාත් කර ගැනීම උදෙසාවන මූලික උපකරණයක් ලෙස සංස්ථාපනය කිරීම අඩංගු කර ගනී. වෙනත් අකාරයකට ඉදිරිපත් කරන්නේ නම් පෞද්ගලික හිමිකම් ඇති මාධ්‍යයට ධනවාදී වෙළෙඳ පොළෙහි වාණිජ ආයතන ලෙස තරග වැදීමේ සම්පූර්ණ නිදහස තිබිය යුතු අතර රාජ්‍යමය වශයෙන් හිමි මහජන සේවා මාධ්‍ය ආයතන වෙළෙඳ පොළ ආමන්ත්‍රණය නොකරන හිඩැස් පිරවීමට සේවය කළ යුතු ය යන්න ය. එය ජනතාවට අධ්‍යාපනය දෙයි, ජනතාව දැනුවත් කරයි, මතවල බහුත්වවාදයක් සහතික කරයි, පුරවැසිභාවයේ සාරධර්ම ප්‍රවර්ධනය කරයි, ශ්‍රී ලාංකීය සමාජය සංයුක්ත කරන ජාතික විවිධත්වයේ සංස්කෘතික ප්‍රකාශනය දිරි

www.sundaytimes.lk




**එහෙයින් අපට අදහස් පළ කිරීමේ නිදහස ශ්‍රී ලංකාවේ මූලික අයිතියක් ලෙස ව්‍යවස්ථාමය වශයෙන් ආරක්ෂා කිරීමේ හා බලාත්මක කිරීමේ මාර්ගය විශාල වශයෙන් දියුණු කළ හැකිය යන්න ඉතා පැහැදිලි ය.**

අගවිනිසුරු සරත් එන්. සිල්වාගේ පත්වීමට එරෙහිව

ගන්වයි, අවසාන වශයෙන් එය සාමාන්‍යයෙන් වාණිජ මාධ්‍ය ආයතන උනන්දුවක් නොදක්වන සංස්කෘතික හා බුද්ධිමය අදහස් නිෂ්පාදනයට ආධාර කරයි. මේවා ශ්‍රී ලංකාවේ මහජන ගුවන් විදුලි ප්‍රචාරය මුලින් ආරම්භ වූ විට දී පැවැති එහෙත් කටයුතු කෙරී ගෙන යද්දී නැතිවී ගිය රීතින් සාරධර්ම (*Reithian values*) ය.

ආයතන සැලසුම් කිරීම සම්බන්ධ දෙවන ප්‍රධාන මූලධර්මය: ඒවා පාරදෘශ්‍ය හා වගකීමෙන් වැඩ කළ යුතුවා සේම කාර්යක්ෂම ද විය යුතු ය. රාජ්‍ය අයිතිය සමග වගවීම එන අතර පාරදෘශ්‍යභාවය යනු 1970 ගණන්වල සිට මෙම ආයතනවල අප දැක තිබෙන අපයෝජනය වැළැක්වීම ය. එහෙත් එසේම අපි ඒවා කාර්යක්ෂම කළ යුත්තෙමු. නැතහොත් වෙනත් වචනවලින් කියන්නේ නම් පිරිවැය ඵලදායී හා බදු ගෙවන්නාගේ මුදලට හොඳම වටිනාකම පිළිබිඹු කරන සේවාවන් සැපයිය යුත්තෙමු.

එහෙයින් අවශ්‍යතාවය වනුයේ මෙම මූලධර්මයන්ට ප්‍රකාශනයක් දෙන හා අද ශ්‍රී ලංකාවේ රාජ්‍ය මාධ්‍ය ව්‍යුහයන් පාලනය කරන කාලයට නොගැලපෙන උපකල්පනයන්ගෙන් ඉවත යාමක් නියෝජනය කරන යෝග්‍ය ආයතනික ආකෘතියක් සොයා ගැනීම ය. රාජ්‍ය හිමි මාධ්‍ය සම්බන්ධයෙන් ගත් කල අප නව දිසාවක් කරා ගමන් කළ යුතුව තිබේ නම් පහතින් එන පියවර ගනු ලැබීම අනිවාර්ය බව සිවිල් සමාජ හා මාධ්‍යවේදීන්ගේ සංවිධාන නිතරම වාගේ යෝජනා කර තිබේ.

මුල් යෝජනාවල කොටසක් වූයේ අවසානයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වෙනි සංශෝධනය ලෙස බලාත්මක කරන ලද ස්වාධීන මාධ්‍ය කොමිසමකි. සිදුව තිබෙනුයේ එවැනි මාධ්‍ය කොමිසමක් සඳහා වන අවශ්‍යතාවය වැඩිකර තිබීම පමණක් වන අතර දින 100 වැඩ සටහන යටතේ 17 වන සංශෝධනය හෝ සමාන රාමුවක් යළි බලාත්මක කිරීමේ පොරොන්දුව සමග අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ වගන්තියේ *I* වන උපලේඛනයෙහි ලැයිස්තුගත කර ඇති අනෙකුත් ස්වාධීන ආයතන පරිද්දෙන්ම එම ව්‍යවස්ථාමය ස්ථාවරය සමග ස්වාධීන මාධ්‍ය කොමිසමක් පිහිටුවීම ද සහතික කළ යුත්තෙමු. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ස්වාධීන මාධ්‍ය කොමිසමක් පත් කළ යුතු අතර ඒ තුළ අනෙකුත් අය අතර ක්‍රියාකාරී මාධ්‍යවේදීන්, අදාළ ක්ෂේත්‍රයන්හි විද්‍යාර්ථීන්, අයිතිකරුවන් හා දැන් 'නව මාධ්‍ය' වෘත්තිකයින්ගේ ද නියෝජනයට විශේෂ ප්‍රමුඛතාවක් දිය යුතු ය. කොමිසම සංස්ථාපනය කරනු ලැබූ විට මහජන සේවා මාධ්‍ය පිළිබඳව සමස්ත අධීක්ෂණයක් තිබීම ද පාර්ලිමේන්තුවට වගකීම ද අවශ්‍ය වන්නේ ය. එහි ප්‍රාථමික භූමිකාව වනු ඇත්තේ මහජන මාධ්‍ය ආයතන (නව හා සම්ප්‍රදායික) අධීක්ෂණය කිරීම වන නමුදු මාධ්‍ය වෙළෙඳපොළ විධිමත් කිරීම ඇතුළු අනෙකුත් බලතල හා කාර්යයන් ද නව තාක්ෂණය ඔස්සේ අදහස් පළ කිරීමේ නිදහස එහි සියලු ආකාරයන්ගෙන් ප්‍රවර්ධනය කිරීම ද ඇතුළත් කළ හැකි ය.

ව්‍යවස්ථාමය වශයෙන් පිහිටුවන ලද හා බලය පවරන ලද මාධ්‍ය කොමිසමක් විසින් අධීක්ෂණය කරනු ලැබුව ද වෙනස් ආකාරයන්ගෙන් රාජ්‍ය ගුවන් විදුලි විකාශන හා මුද්‍රිත මාධ්‍යය තවදුරටත් ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ. මුලින් අදහස් කරනු ලැබූ පරිදි ස්වාධීන රූපවාහිනී ජාලය (*ITN*) පෞද්ගලීකරණය කළ හැකි ය. රාජ්‍ය - නැතහොත් ඇත්තටම මහජන- හිමිකාරිත්වය යටතේ පවතිනු ඇති ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (*SLBC*) හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (*SLRC*) දේශපාලන පාලනය මාධ්‍ය කොමිසම විසින් පත් කරනු ලබන ස්වාධීන ගුවන් විදුලි විකාශන අධිකාරියක පාලනය හා මෙහෙයවීම යටතේ මහජන ගුවන් විදුලි විකාශන සේවා සඳහාවන නව නෛතික පාලනයක් වෙනුවෙන් වහාම අත්

www.ft.lk



**ශ්‍රී ලාංකීය සමාජය සංයුක්ත කරන ජාතික විවිධත්වයේ සංස්කෘතික ප්‍රකාශනය දිරි ගන්වයි, අවසාන වශයෙන් එය සාමාන්‍යයෙන් වාණිජ මාධ්‍ය ආයතන උනන්දුවක් නොදක්වන සංස්කෘතික හා බුද්ධිමය අදහස් නිෂ්පාදනයට ආධාර කරයි.**

සහජීවන ප්‍රාර්ථනා

හරිනු ලැබිය යුතු ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (*CPA*) හා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (*FMM*) විසින් 1996 තරම් ඈත දී මේ සම්බන්ධයෙන් වන සවිස්තරාත්මක යෝජනා සංවර්ධනය කරනු ලැබ තිබූ අතර එක්සත් ජාතික පෙරමුණු පාලනය සමයේ පනතක් ආකාරයෙන් පවා ඉදිරිපත් කර තිබුණි.

ඊට අමතරව පෞද්ගලීකරණය පිළිබඳව එකඟත්වයක් නොමැත්තේ නම් සීමාසහිත ඒකාබද්ධ ප්‍රවෘත්ති පත්‍ර ලංකා සමාගමේ (ලේක්හවුසිය) අයිතියේ 'පුළුල් පදනමක් ඇති කිරීම' පිළිබඳ සිදත් ශ්‍රී නන්දලෝචන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්නට පුළුවන. මුළුමනින්ම විකුණනවාට වඩා පුළුල් පදනමක් ඇති කිරීම 1990 ගණන්වල ලේක්හවුස් සංගම්වලට පොඩි වාසියක් ගෙන දුන් අතර මෙය ප්‍රතිපත්තිමය වශයෙන් ආරක්ෂා කරනු ලැබිය හැක්කේ හෝ භාවිතයට නැගිය හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව සහතිකයක් කොහෙත්ම නැත. සාමූහිකකරණය කරන ලද පුවත්පත් සමාගම් සම්බන්ධ කිසිදු යුක්ති යුක්ත කිරීමක් ඇත්තා වූ ක්‍රියාත්මක තත්කාලීන ප්‍රජාතන්ත්‍රවාදයක් ඇත්තේ නැත. කෙසේවුව ද ලෙක්හවුසිය පෞද්ගලීකරණය කිරීම මාධ්‍ය වෙළෙඳ පොළෙහි නිසි බහුත්වවාදය හා තරගය සහතික කරන ආකෘතික නීති - යළිදු ඇතැම් විට මාධ්‍ය කොමිසම සම්බන්ධ භූමිකාවක්- සමගින් නෛතික හා පාරදෘශ්‍ය ආකාරයකින් කළ යුතු ය. ප්‍රබල ලෙසම එයින් රාජපක්ෂලාගේ හෝ ඔවුන්ගේ පූර්වගාමීන්ගේ ක්‍රමය, එනම් වටිනාකම් අවප්‍රමාණ කළ පොදු භාණ්ඩ අනුග්‍රහලත් ගජ මිතුරන්ට පවරා දීමේ හා අනතුරුව ඔවුන් කර්තෘ මාණ්ඩලික හා ප්‍රවෘත්තිකරණ නිදහස විනාශ කිරීමේ ක්‍රමය යොදා ගැනීමක් අදහස් නොවේ. සිදුව තිබෙන බේදවාචකය සමාන කිරීම හරිම නොවුව ද (යටත් පිරිසෙයින් සදාදර ලසන්ත සොහොනේ සිට අවසාන ජයග්‍රාහී සිනාව නගන්නට ඇති ජනවාරි 8 වෙනි දිනවත්) කලක දී විශිෂ්ට වූ සන්ඩේ ලීඩර්වරුන් අපට මෙහි දී මග පෙන්විය යුතුය.

මේ සියල්ලට ඔබ්බෙන් පොදු විපක්ෂයේ ප්‍රකාශනය තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය පිළිබඳ නීතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳවූ විශේෂ පොරොන්දුවක් අඩංගු කර ගනී. මේ සම්බන්ධයෙන් වන විවිධ යෝජනා මෑත අතීතයෙහි සංසරණය වෙමින් තිබුණි. යහපත් අභිලාෂයෙන් යුතුව වුව ද බොහෝ විට ආර්ටිකල් *XIX* හි (ලන්ඩනය පාදක කරගත් අදහස් පළ කිරීමේ නිදහස පිළිබඳව වැඩ කරන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයකි) වැනි ආකාරගත නීතිවලින් එහෙන් මෙහෙන් ගෙන ඇලවූ පැලැස්තර වන් මෙම ඇතැම් කෙටුම්පත් ගුණාත්මක බවෙන් ඉතා දිළිඳු ය. ශ්‍රී ලංකාවෙහි එබඳු නීතියක් මුහුණ දී ක්‍රියා කළ යුතු සැබෑ ප්‍රායෝගික හා ප්‍රතිපත්තිමය අභියෝග සම්බන්ධයෙන් ඒවාට ඇත්තේ සුළු සබඳතාවකි. නැතහොත් කිසිදු සබඳතාවක් නොමැත. ඊට වෙනස්ව 2003 දී එවකට එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව (නීතිපති, අධිකරණ අමාත්‍යාංශ ලේකම් හා එවකට සහකාර නීති කෙටම්පත් නිලධාරි විසින් නියෝජනය කෙරිණ), කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මැදිහත් වෙමින් ඉහළ උපදේශන හා විමර්ශනාත්මක ක්‍රියාවලියක් ඔස්සේ මහත් වෙහෙස දරා සාකච්ඡා කර එකඟත්වයට පැමිණ කෙටුම්පත් කරන ලද තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ පනතක් (නිල වශයෙන් 'නිල තොරතුරුවලට ප්‍රවේශය පිළිබඳ පනත' යනුවෙන් හඳුන්වන ලද) වූයේ ය. කෙටුම්පත පිළිබඳව අදහස් දැක්වීමට ආරාධනා කරන ලද ජාත්‍යන්තර විශේෂඥයින් නිරීක්ෂණය කළේ එය ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරා තිබෙන බව පමණක් නොවේ, ඇතැම් පැතිවලින් (නිදසුන් ලෙස ව්‍යතිරේකයන්ගේ පටු විෂය පථය, මහජන යහපත පිළිබඳ පරීක්ෂාව භාවිතයට යෙදීම, ස්වෙච්ඡාමය වගන්ති හා වියදමක් නැති ප්‍රවේශය ඇතුළත් ප්‍රවේශීය පහසුකම්, අධිලේඛනීය ආරක්ෂණයේ කෙටි කාලීන සීමා, අනාවරණය කිරීමේ කටයුතු

vernoncorea.wordpress.com



**ව්‍යවස්ථාමය වශයෙන් පිහිටුවන ලද හා බලය පවරන ලද මාධ්‍ය කොමිසමක් විසින් අධීක්ෂණය කරනු ලැබුව ද වෙනස් ආකාරයන්ගෙන් රාජ්‍ය ගුවන් විදුලි විකාශන හා මුද්‍රිත මාධ්‍යය තවදුරටත් ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ.**

රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

සම්බන්ධ වාර්තා වෙන්කරලීමේ හැකියාව, ප්‍රකාශයට පත් කිරීම සඳහා නොවූ ආරක්ෂිත තොරතුරු පවා ඉල්ලුම් කිරීම මත සැපයීමේ හැකියාව, නිලධාරීන්ගේ වාර්තාකරණ බැඳීම් විස්තරකර දැක්වීම, තොරතුරු නිලධාරීන්ගෙන් අමාත්‍යවරයා වෙත පැවරීම හා දාහත්වෙනි සංශෝධන රාමුව යටතේ ව්‍යවස්ථානුකූලව ස්ථාපිත කරනු ලබන තොරතුරු කොමිසමක් ඇතුළු ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය) ඒවා ඉක්මවා ද තිබෙන බව ය. නීති කෙටුම්පත් නිලධාරි දෙපාර්තමේන්තුව විසින් පනතක් ආකාරයෙන් සකස් කරනු ලැබීමට රනිල් වික්‍රමසිංහගේ කැබිනට් මණ්ඩලය මෙන්ම ජනාධිපතිනි කුමාරතුංග ද විසින් 2004 දී ඊට අනුමතිය දෙනු ලැබුව ද අවාසනාවකට ඉන්පසුව වහාම පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා එය සම්මත කෙරුණේ නැත. නව නීතිය සම්පාදනය සඳහා නව ආණ්ඩුව විසින් කල්පනාවට ගනු ලබන්නාවූ පදනම සංස්ථාපනය කළ යුතුවන කෙටුම්පත් පනත මෙය යි. මගේ අදහස වන්නේ නව ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට මුල පුරනවිට එය ඉතා සුළු සංශෝධනයන් (නිදසුන් ලෙස ඒ කාලයේ ආරක්ෂා කරන ලද්දාවූ සාම ක්‍රියාවලිය හා සම්බන්ධ තොරතුරුවලට දැන් අදාළත්වයක් නොමැත) සහිතව අපේ රටට ඉතාමත්ම යෝග්‍ය තොරතුරු දැන ගැනීමේ නීතියක් වනු ඇති බව ය.

තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ හොඳ පනතකට අමතරව මෙම අයිතිය ශක්තිමත් කරනු ලැබිය හැකි තවත් ඉතාමත්ම සැලකිය යුතු මාර්ගයක් තිබේ. එනම් පනත ව්‍යවස්ථාමය පදනමක් මත පිහිටුවීම ය. මා පෙර සඳහන් කළ පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය ඇතැම් වර්ගවල තොරතුරු ලබා ගැනීමේ සීමිත අයිතියක් පිළිගෙන තිබුණ ද අපේ අයිතිවාසිකම් පිළිබඳ පනත පිළිබිඹු කරන්නේ භාෂණයේ, අදහස් පළ කිරීමේ හා ප්‍රකාශනයේ අයිතියක් පමණකි. මෙය තොරතුරු දැන ගැනීමේ ව්‍යවස්ථාමය අයිතියකින් බෙහෙවින් දුරස්ථ ය (නිදසුන් ලෙස දකුණු අප්‍රිකාවේ එවැනි අයිතියක් තිබේ). යළිදු මා පෙර සඳහන් කළ පරිදි 14 වගන්තිය සවිමත්ව පිහිටුවන ලද්දක් නොවන අතර එම නිසා එය ජනමත විචාරණයකින් තොරව සංශෝධනය කළ හැකි ය. එසේම තොරතුරු දැන ගැනීමේ නිදහස හොඳින්ම ආරක්ෂා කරනු ලැබීමට නම් අදහස් පළ කිරීමට ඇති නිදහසේ විෂය පථය තුළට තොරතුරු දැන ගැනීමේ අයිතිය විශේෂිතව ඇතුළත් කිරීම මගින් හෝ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ වෙනම අයිතියක් ලෙස ඇතුළත් කිරීම මගින් ඊට ව්‍යවස්ථාමය ආධාරකයක් සැපයිය යුතු ය.

මා ඉහතින් යෝජනා කර තිබෙන දෙය සංස්ථාපනය කරන්නේ නව පාලනය කලින් පැවති පාලනය යටතේ ඉතාමත්ම තදින් තලනු ලැබීමට හා පහර දෙනු ලැබීමට පාත්‍ර වූ මෙම අයිතීන්ට ආමන්ත්‍රණය කිරීම පිළිබඳව බැරෑරුම්ව සැලකිලිමත් වන්නේ නම් කළ යුතුම යයි මා විශ්වාස කරන ඉතාමත්ම මූලික ප්‍රතිසංස්කරණවලින් සමහරක් පමණකි. ලෝකය සමග වන අපේ විවෘත ක්‍රියාකාරිත්වය පිළිබඳ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදාය යළි පටන් ගැනීමට හැකිවන සේ ශ්‍රී ලංකාවෙහි අදහස් පළ කිරීමේ නිදහස ප්‍රතිෂ්ඨාපනය හා ශක්තිමත් කරනු සඳහා අපට කළ හැකි හා කළ යුතු බොහෝ දෑ ඇත්තේ ය. එනමුදු ඉකුත් සතියෙහි ශ්‍රී ලාංකිකයින් ඡන්දය දී ගෙන එන ලද ප්‍රජාතන්ත්‍රීය පුනරුදය ආපසු හැරවිය නොහැකිවන සේ හා නිදහස් අදහස් පළ කිරීම එහි සියලු ආකාරයන්ගෙන් හා ප්‍රකාශනයන්ගෙන් පොහොසත් කිරීමට හැකිවන සේ අපි මේවායින් පටන් ගනිමු. අපි යළිදු ඒ සා දිගු කාලයක් පුරා අපේ ජීවගුණයට හා විභවයට හානි ගෙන දීමට ඉඩ සැලසූ අපේ පොදු ජීවිතය හා කතිකාව පාලනය කළ බියට, අවිද්‍යාවට, විදේශික භීතිකාවට හා සත්තකින්ම මිථ්‍යා විශ්වාසයට කිසිදාක ඉඩ නොදිය යුත්තෙමු. ●

http://groundviews.org වෙබ් අඩවියේ අනුග්‍රහයෙනි.



article.wn.com

**ගාමිණී වියන්ගොඩ**

# මහින්ද රාජපක්ෂ ඉවත් කිරීමේ සටනට සාපේක්ෂව දැන් තිබෙන සටන බරපතල යි

පැවති පාලනය ඉවත්කර මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කරගැනීම සඳහා මෑත කාලයේ ගොඩනැගුණු සිවිල් සංවිධාන අතර "පුරවැසි බලය" ට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. මෙහි පළවන්නේ එම සංවිධානයේ ප්‍රමුඛ ක්‍රියාකාරිකයෙකු වූ ප්‍රවීන සාහිත්‍ය විචාරකයෙකු මෙන්ම ග්‍රන්ථ පරිවර්තකයෙකු වූ ගාමිණී වියන්ගොඩ මහතා සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකි.

**පුරවැසි බලයේ ප්‍රධාන අරමුණක් වූයේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කර යහපාලනය ඇති කිරීම සඳහා පවතින පාලනය ඉවත්කර ගැනීම. දැන් ප්‍රථම අරමුණ ඉටු වී තිබේ. ඉන් අනතුරුව පුරවැසි බලයට ඉටු කිරීමට ඇති කාර්යයන් මොනවා ද?**

මෙතනින් එහාට තිබෙන්නේ අප අපේක්ෂා කළ ඉතුරු දේවල් සාර්ථක කරගන්නට වැඩ කටයුතු කිරීම. දැන් දින 100 වැඩ පිළිවෙලක් තිබෙනවා. අපි ඒක දැනගෙනයි සිටියේ. ඒ වැඩ පිළිවෙල ගැන විශ්වාසයක් ඇතිව අපි සිටියේ. ඒ විශ්වාසය දිගටම තබාගත යුතුයි. එසේ තබාගෙන ඒ දින 100 වැඩපිළිවෙල සාර්ථක කරගන්නට හැම ආකාරයකින්ම දායක විය යුතු යි. එහෙම වෙන්නෙ ඇයි? දින 100 වැඩ පිළිවෙල දීර්ඝකාලීන, තිරසාර, කාලීන දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා පදනමක් වෙනවා. රාජපක්ෂ

www.colombogazette.com



සාධාරණ සමාජයක් සඳහා

**දින 100 වැඩ පිළිවෙල දීර්ඝකාලීන, තිරසාර, කාලීන දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා පදනමක් වෙනවා. රාජපක්ෂ ඉවත්කර ගත්තා වගේම මේකත් සාර්ථක ගරගත යුතු යි. ඒක සඳහා තමයි පුරවැසි බලය ඉදිරියේ දි කටයුතු කරන්නට බලාපොරොත්තු වෙන්නේ.**

ඉවත්කර ගත්තා වගේම මේකත් සාර්ථක ගරගත යුතු යි. ඒක සඳහා තමයි පුරවැසි බලය ඉදිරියේ දි කටයුතු කරන්නට බලාපොරොත්තු වෙන්නේ.

**යම් පරිවර්තනයක් කිරීම සඳහා මූලික ව්‍යුහාත්මක වෙනසකට අවශ්‍යවන දේ මේ වන විටත් ආරම්භකර තිබේ. එම ආයතන, එනම් කොමිෂන් සභා ස්ථාපිත කර දින 100ක් ගිය පසු සිවිල් සමාජයේ කාර්යභාරය නිම වන්නේ ද?**

නැහැ. මොකද අපි දන්නවා මීට පෙරත් ඔය කොමිෂන් සභා තිබුණා. ඒ කොමිෂන් සභා ආපසු හැරෙව්ව බව අපිට මතකයි. අපි දන්නවා 78 ව්‍යවස්ථාව තිබුණා. 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒකත් ආපස්සට හැරෙව්වා. ඒ කියන්නේ තිබුණාටත් වඩා නරක තත්ත්වයකට ගෙන ගියා. ඒ අවදානම සෑම වෙලාවේම තිබෙනවා. ඒක නිසා සිවිල් ව්‍යාපාරයක් විදියට අර කියන ස්වාධීන කොමිෂන් සභා පත් කළත් අපි සෑම වෙලාවේ ම විමසිලිමත්ව සිටිය යුතුයි. ඒ කියන්නේ සවිඤ්ඤාණික ව්‍යාපාරයක් විදිහට, ඇතිවන සෑම වෙනස් කමක් ම සැළකිල්ලට ගනිමින්. අපි බලාපොරොත්තු වන අර දේශපාලන සංස්කෘතිය ඇති කරන තුරු ක්‍රියාත්මකව දායක විය යුතුයි. වැදගත් වෙන්නේ ඒ සංස්කෘතියයි. ආයතන ඇති කළ පමණින් සංස්කෘතිය ඇති වෙන්නෙත් නැහැ. ඒ ආයතන යම් කිසි විදියකට ස්ථාවර වෙන්නට ඕනේ. නිකම්ම නමට ආයතන පත් කළා කියලා හරියන්නෙත් නැහැ. ඒ ස්ථාවරවීම තුළ තමයි අර පොදු දේශපාලන සංස්කෘතිය ගොඩනැගෙන්නේ. ඒකට යම් දේශපාලන පරිසරයක් ඕනෑ කරනවා. ඒ පරිසරය විවිධාකාරයෙන් ගොඩනගන්න පුළුවන්. මිනිසුන් දැනුවත් කිරීමෙන්, අපි කථාකරපු දේවල් පිළිබඳව මහජන කතිකාවල් ගොඩනැගීමෙන්, උදාහරණයක් ලෙස යහපාලනය කියන්නේ මොකක්ද? ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මැතිවරණ ද? මැතිවරණයක් කියන්නේ මොකද්ද? ස්වාධිපත්‍ය කියන්නේ මොකක්ද? මේවා පිළිබඳ පොදු කතිකාවක් ඇති කරන්නට ඕනේ. ඒ කතිකාව එක්ක තමයි බද්ධ කරන්න ඕනේ අර ආයතන. ඒක එක පැත්තක්. අනික් පැත්ත තමයි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය. ඒ කියන්නේ විධායක බලතල අහෝසි කිරීම. එවිට ඒ පැත්තෙන් ආපු තර්ජනය වැළකෙනවා. අනික් පැත්තෙන් ස්වාධීන ලෙස කොමිෂන් සභා ටික පත්කෙරෙනවා. සමාජ කතිකාව මේකට සමගාමී ව ගෙන යන්න ඕනේ. පුරවැසි බලය ලෙස දැන් අපි බලන්නේ එම කතිකාව එක දිගටම සජීවීව ඉදිරියට ගෙන යන්න. ඒකට යම්කිසි කාලයක් යනවා. ඒක දින 100ක්, අවුරුද්දක්, දෙකක් කියලා සීමා කරන්න පුළුවන් දෙයක් නොවේ.

මගේ විශ්වාසය අනුව ප්‍රජාතන්ත්‍රවාදී පරිචයක් ඇතිවෙන්න නම් අඩු ගනනේ දශක දෙකක්වත් ඒ අභ්‍යාසය සිද්ධ වෙන්න ඕනේ. ඒක තමයි අපි ඉදිරියේ තිබෙන අභියෝගය. එතකොට මං හිතනවා මේ ඇතිකරගත් වෙනස අර්ථවත් කරගන්නට පුළුවන් වෙන්නේ ඉදිරි දශක දෙකක කාලයක් වත් සමාජයක් විදියට ඒ පිළිබඳ දැනුවත්ව ඒ පිළිබඳ සක්‍රියව ඒ ක්‍රියාවලියේ නිරත වුනොත් පමණයි. ඒකට පුරවැසි බලය වගේ වෙනත් සිවිල් සංවිධානවලට විශේෂ කාර්ය භාරයක් හිමිවෙනවා. එනිසා ඔවුන්ට නිවාඩු ගැනීමට වේලාවක් නැහැ. මම කියන්නේ සිවිල් ව්‍යාපාරයට නිවාඩු ගන්නත් බැහැ. ජනතාවට නිවාඩු ගන්නත් බැහැ. මේ දෙගොල්ල නිවාඩු ගත්තොත් නැවත අවදානමක් තියෙනවා. එනම් අර පරණ ක්‍රමයට නැවත යන්න ඉඩ තියෙනවා. මොකද අපේ දේශපාලනඥයින් ගැන විශ්වාසයක් තැබිය නොහැකි නිසා. දේශපාලනඥයින්ට තමන්ගේ ඒ පරිපාලන රාජ්‍ය පාලන කටයුතු කරගන්නට ඉඩදෙන අතරේම ඒවා නිවැරදිව ක්‍රියාත්මක වන බවට වග බලාගන්නයි මුර බල්ලෙකුගේ භූමිකාව ඉටුකරගතයුතු වන්නේ. එය කළහැකි වන්නේ සිවිල් සංවිධාන හරහා. දැනට ඇති පොදු අභිප්‍රාය ඒකයි.

**දූෂණ, වංචා සහ අපරාධ ගැන හොයන විට එයට සම්බන්ධ දේශපාලකයින් යහපාලනය කියන්නේ මේකද කියලා ප්‍රශ්න කරනවා. එයින් ඔවුන් අඟවන්නේ ප්‍රතිසංස්කරණවලට සහය දෙන්නට නම් මේ අකටයුතුකම් ගැන හොයන එක එයට හිලව් කළ යුතු බව නේ ද?**



# පුරවැසි බලය

**පුරවැසි බලය ලෙස දැන් අපි බලන්නේ එම කථිකාව එක දිගටම සජීවීව ඉදිරියට ගෙන යන්න.. ඒකට යම්කිසි කාලයක් යනවා. ඒක දින 100ක්, අවුරුද්දක්, දෙකක් කියලා සීමා කරන්න පුළුවන් දෙයක් නොවේ.**

පුරවැසි බලය කොන්දේසි විරහිතව පෙනී සිටිනවා පසුගිය දශක දෙකක පමණ කාලය තුළ මේ රටේ මහා පරිමාණයෙන් සිද්ධවුනු දූෂණ සහ අක්‍රමිකතා සොයා බැලීම වෙනුවෙන්. ඒවාට වගකිව යුතු පුද්ගලයින් නීතිය ඉදිරියට කැඳවිය යුතුයි. හැබැයි ලංකාවේ දේශපාලන සංස්කෘතියේ තිබෙන ලක්ෂණයක් තමයි අපි වැරදිකරුවන් සියල්ලන්ම සොයාගෙන ගියොත් අද රටේ දේශපාලනයේ නිරතවෙලා ඉන්න දේශපාලනඥයින්ගෙන් සියයට අනූපහක් අපිට රඳවන්නට වෙන්නේ සිරගෙවල් ඇතුළේ. ඒ නිසා මම හිතන්නේ නැහැ ප්‍රායෝගිකව එවැනි ක්‍රියාවක් සාර්ථක වෙයි කියලා. ඒ නිසා ආරම්භයක් විදියට අපි මෙතනදී සැළකිල්ලට ගන්න ඕනේ කාරණය තමයි ආදර්ශයක් සැපයිය හැකි සංකේතාත්මක වැදගත්කමක් සහිත සිදුවීම් කිහිපයක් සහ පුද්ගලයින් යම් ප්‍රමාණයක් හෙළිදරව් කරමින් ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීම. දැන් උදාහරණයක් විදියට අල්ලස් හා දූෂණ කොමිසම පත්කරපු ගමන් ම දඬුවම් කළේ මුල් ගුරුවරයෙකුට. ළමයෙකු පාසලට ඇතුළත් කරගැනීමට පිඟන් කට්ටලයක් තෑගි වශයෙන් ගැනීමයි වරද. ඒක දැන් අපි අනික් පැත්තෙන් පටන් ගන්න ඕනේ. ඒක හාල් මැස්සාගෙන් නොව මෝරුන්ගෙන් පටන් ගතයුතුයි. එවැනි මෝරු අඩුගානේ දහදොළොස් දෙනෙක්වත් නීතිය ඉදිරියට ගෙනෙන්නට ඕනේ. ගෙනල්ලා දඬුවම් කරන්න ඕනේ. එහෙම තමයි ආදර්ශයක් දියයුතු වෙන්නේ.

ඉතින් ඒක කොච්චර දුරට මේ වෙනස්වෙන තත්ත්වයන් යටතේ සාර්ථක කරගන්න පුළුවන් වෙයි ද කියන එක ස්ථිරව කියන්නට බැහැ. ඒක යම් තාක් දුරට සාර්ථකත්වයක් ලබාගන්න පුළුවන්. මොකද මෙය ආමන්ත්‍රණය කරන්නේ නැතිව මේ පාලනය තුළ ඉදිරියට යන්න බැහැ. ඒ නිසා යම් කිසි ප්‍රමාණයකටවත් මෙය සාර්ථක විය හැකියි. උදාහරණයක් ගත්තොත් දින 100ට පසුව පාර්ලිමේන්තු මැතිවරණයකට යන්නේ කොහොම ද මිනිසුන්ගේ ප්‍රසාදයට හේතුවන දේවල් මේ දින 100 ඇතුළේ කළේ නැත්නම්. ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයට මුහුණ දෙන්නට නම් මිනිසුන් සෑහීමට පත්වන දෙයක් කළ යුතුයි. එක පැත්තකින් මිනිසුන්ට අවශ්‍ය සහන සලසන අතරේම අනික් පැත්තෙන් මේ ඡන්දයේදී මිනිසුන් ඉල්ලා සිටි ප්‍රධානම කාරණාව, ඒ කියන්නේ ශිෂ්ට සම්පන්නබව, වගවීම, නීතිය සහ අධිකරණය වැනි දේවල් නිවැරදි කරන තැනකට මේ අයට යන්නට සිදුවෙනවා. එහෙම නැත්නම් මේ මැතිවරණය මේ ගොල්ලන්ට ජයග්‍රහණය කරන්නට බැහැ. නැවත මහින්ද රාජපක්ෂලා බලයට පත්වෙයි.

ඒ නිසා මගේ විශ්වාශයක් තිබෙනවා දූෂණයට, අක්‍රමිකතාවයට, අසාධාරණයට සහ අයුක්තියට විරුද්ධව විශාල දේශපාලනික සහ සමාජ ව්‍යාපාරයක් තිබිය බවට. ඒකට ඇහුම්කන් දෙන්නට පාලකයින්ට සිද්ධවෙනවා. ඒ නිසා මම හිතනවා දින 100 අතුළත යම් කිසි ආදර්ශයක් දෙයි කියලා. ඒක මේ වැරදි කළ සියලු දෙනා සිරකූඩුවේ දැමීමක් නොවෙයි. ප්‍රායෝගිකව ඒක කරන්නට බැහැ. විශේෂයෙන් ලංකාව වගේ රටකට කරන්නට බැහැ. මේක ඔද්දල් වෙලා තියෙන්නේ වසර 40ක පමණ කාලයක සිට. ඒ නිසා සම්පූර්ණ ශුද්ධ කිරීමක් කරන්නට බැහැ. බොහෝ අය මේකෙන් රිංගලා යාවි. හැබැයි රිංගන්න බැරි මොරු ගණනාවක් ඉන්නවා. ඒ මෝරු කොටු කරගත යුතුයි. ඒක නීතියෙන් කළ යුතුයි. ඒක මිනිස්සුන්ට භාර දිය යුතු නැහැ. දැන් උදාහරණයක් විදියට සජින් වාස්ගේ ගෙට ගිහින් ගහලා පොඩි පට්ටම් කර තිබෙනවා. ඒ දෙවල් නොකළ යුතුයි. ඔහු යම් කිසි වරදක් කර තිබේ නම් නීතිය ඉදිරියට පැමිණවිය යුතුයි. එහෙම නැතිව දේපොළ වලට අලාභ හානි කිරීම හෝ ඔහුට හිංසා පීඩා කිරීම නොවෙයි කළ යුත්තේ. එහෙම දෙයක් නොවෙයි අපි අලුත් දේශපාලන සංස්කෘතියෙන් බලාපොරොත්තු වන්නේ.

**ඉදිරියේ දී එන මැතිවරණය තුළ පුරවැසි බලයේ භූමිකාව කුමක් ද?**

ඒක තීරණය වෙන්නේ මේ දවස් 100 තුළ කොහොම ද මේ ගොල්ලන් කටයුතු කරන්නේ කියන එක උඩයි. මේ දවස් 100දී පොරොන්දුවෙලා තිබෙන පරිදි ඒ කියන දේවල් මේගොල්ලන් ඉෂ්ට කළොත් අනිවාර්යයෙන් පුරවැසි බලය

/www.rivira.lk



**හැබැයි මොන විදියටවත් පුරවැසි බලය යන්නේ නැහැ අර පරණ හොරු ටික ආපසු ගෙනෙන්නට මෙතෙන්ට. මොකද මාස තුනකින් ඔවුන්ට පුනරුත්ථාපනය වෙන්නට බැහැ කොහොමත්.**

දූෂණයට එරෙහි මාධ්‍ය

ඊ ළඟ මැතිවරණයේ දී ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා. එහෙම නොවුනොත් පුරවැසි බලයට සිද්ධ වෙනවා මොකද්ද ඒ මැතිවරණයේ දී කරන්නේ කියලා හිතන්න. හැබැයි මොන විදියටවත් පුරවැසි බලය යන්නේ නැහැ අර පරණ හොරු ටික ආපසු ගෙනෙන්නට මෙතෙන්ට. මොකද මාස තුනකින් ඔවුන්ට පුනරුත්ථාපනය වෙන්නට බැහැ කොහොමත්. අපි විශ්වාස කරන්නේ නැහැ මිනිසෙක් වරදක් කළ පලියට ජීවිත කාලයට හංවඩු ගැසිය යුතුයි කියලා. හැබැයි යම් කිසි කාලයක් අවශ්‍ය වෙනවා මිනිසුන්ට කළ වැරදි නොකර අලුත් ත්ත්ත්වයට ගැලපෙන්නට. මාස 3ක කාලයකින් නම් ඒක කරන්නට බැහැ. ඒ නිසා මහින්ද රාජපක්ෂ ඇතුළු ඒ ජාතිවාදීන්, ඒ ආගම්වාදීන් සහ ගෝත්‍රිකවාදින් නැවත බලයට පත්කර ගැනීමට ඉඩදීමක් නම් පුරවැසි බලයෙන් සිද්ධ වෙන්නේ නැහැ. එතකොට අපිට සිද්ධ වෙනවා දැන් ආණ්ඩු කරන අය පිළිබඳව විවේචනාත්මක ස්ථාවරයකට යන්න. ඒක කොයිවිදියට ද සිද්ධ වෙන්නේ කියන එක තීරණය වන්නේ මේ දවස් 100 වැඩ පිළිවෙල සමඟයි.

**විශේෂයෙන්ම දේශපාලන සංස්කෘතිය පිරිහී ඇති මෙවන් අවධියක මාධ්‍යයට ඇති වගකීම කුමක් ද?**

මෙහි දී මාධ්‍යයට තමයි විශේෂ කාර්යභාරයක් පැවරෙන්නේ. ඒ අයට සිද්ධ වෙනවා මේක පිළිබඳව නිරන්තරයෙන් මැදිහත් වෙන්නට. මේ අභ්‍යාසය ක්‍රියාවෙන් ඔප්පු කරලා පෙන්වන්න. මාධ්‍ය වගකියන්න ඕනේ පසුගිය කාලයේ සිදුවූ මේ සිදුවූ ඇතැම් සිදුවීම් වලට. විශේෂයෙන්ම මේ ගොඩනැගිලා තිබෙන අශිලාචාරකමට මේ මාධ්‍ය දායක වී තිබෙනවා. මර්වින් සිල්වා වීරයෙක් කළේ මාධ්‍යයෙන්. මර්වින් සිල්වා නරක වැඩ කරන තරමට මාධ්‍ය විසින් ඔහුව ඔසවා තබනු ලැබුවා. මුතුහෙට්ටිගම වගේ මැරයෙක්, රස්තියාදු කාරයෙක්, පාදඩකම් කරන තරමට ඒ මිනිහා රටේ වීරයෙක් බවට පත් කළේ මාධ්‍යයි. මාධ්‍ය තුළින් වෙච්ච දේවල් මේවා. මාධ්‍ය කට ඇරගෙන බලාගෙන ඉන්නවා නරක වැඩක් වෙනකල් එතනට ගිහිල්ලා වාර්තා කරන්නට. හොඳ වැඩ වාර්තා වෙන්නේ නැහැ. මොකද මුහුණු දකින්න පුළුවන් පත්තරේ ඒ විදිහටයි. රූපවාහිනියට වැඩිය ප්‍රේක්ෂක පිරිසක් ආකර්ෂණය කරගන්න පුළුවන් ඒ විදිහටයි. ඊ ළඟට ඒ සිද්ධිය වාර්තා කිරීම විතරක් නොවෙයි. ඔවුන්ට ඊට පස්සෙ මාධ්‍ය අවකාශය ඉඩදෙනවා ඔවුන්ගේ අදහස් දැක්වීමට. ඔවුන්ට සුදනන්වීමට, ඔවුන්ගේ නිර්දෝෂී භාවය පෙන්වන්නට, මේ ආකාරයට නොයෙකුත් ආකාරයට මේ මාධ්‍ය උදව් කළා. ඒක නිසා තමයි ඔයවාගේ මිනිස්සු ලංකාවේ ජාතික දේශපාලනඥයින් බවට පත්වෙන්නේ. මුතුහෙට්ටිගම කියන්නේ අපි නොදන්න අයෙක්. මීට අවුරුදු 7කට විතර ඉස්සරවෙලා ඔහු දන්නේ නැහැ කවුද කියලා. ප්‍රාදේශීය දේශපාලනඥයෙක්. මේ පුද්ගලයා දැන් ජාතික දේශපාලනඥයෙක් වෙලා. ඒ මදිවාට කැබිනට් එකටත් එනවා. නියෝජ්‍ය ඇමතිවරයෙක් විදියටයි එන්නේ. මාධ්‍ය විසින් තමයි ඔහුව මේ තත්ත්වයට ගෙනාවේ.

ඉතින් මේ මාධ්‍ය සංස්කෘතිය සම්පූර්ණයෙන් වෙනස් වෙන්න ඕනේ. මාධ්‍ය සලකන්න ඕනේ විකුණාගැනීම සඳහා පමණක් නොවේ. වාර්තා කරන දේ යම් කිසි ප්‍රමිතියක් තියෙන්න ඕනේ. තමන්ගේ පත්තරේ හෝ වෙනත් දෙයක් විකුණා ගැනීමට අමතරව මේ රටේ මිනිසුන්ට ඒකෙන් ලැබෙන ආදර්ශය මොකද්ද කියන එක ඉතා වැදගත්. දැන් උදාහරණයක් විදියට මාධ්‍ය අනික් තැන්වල ගැහැණියක් දූෂණයට ලක්වුණොත් ඒ ගැහැණියගේ පිංතූරය පෙන්වන්නේ නැහැ. නමුත් මුතුහෙට්ටිගම පොදු දේපොළ විනාශ කරද්දී මුල් පිටුවේ ඔහුගේ පිංතූරයක් දානවා. ඔහුගේ ප්‍රකාශයක් දානවා. එතකොට අර කාන්තාව පිළිබඳව සදාචාරයක් අනුගමනය කරන මාධ්‍යය මෙතනදී දේශපාලනඥයා සම්බන්ධයෙන් ඒ සදාචාර මිණුම් දණ්ඩ පාවිච්චි කරන්නේ නැහැ. ඔන්න ඔය ක්‍රමය කනපිට හරවන්නට ඕනේ. මෙවන් අයට ප්‍රසිද්ධිය දෙන්න නරකයි. මොවුන්ගේ නරක විවේචනය කළ යුතු නමුත් ප්‍රසිද්ධියක් නොදිය යුතුයි. ඒ සමඟ ම ඔවුන්ට සුදනෝ වීමට අවස්ථාව සලසන්න නරකයි. මේ මාධ්‍ය අවකාශය තුළ ඒක වෙනස් වෙන්නට ඕනේ.

ඒක නිසා. පෙර ඇසූ ප්‍රශ්නය, එනම් දේශපාලන සංස්කෘතිය

www.col3negshiran.info



**මාධ්‍ය වගකියන්න ඕනේ පසුගිය කාලයේ සිදුවූ මේ සිදුවූ ඇතැම් සිදුවීම් වලට. විශේෂයෙන්ම මේ ගොඩනැගිලා තිබෙන අශිලාචාරකමට මේ මාධ්‍ය දායක වී තිබෙනවා. මර්වින් සිල්වා වීරයෙක් කළේ මාධ්‍යයෙන්.**

හිටපු ඇමති මර්වින් සිල්වා මහතා

කියන එක දවසකින් හෝ මාසයකින් හදන එකක් නොවේ. ඒක භාවිතාවක්. මිනිස් හැසිරීමක්. ඒක මිනිසුන්ගේ ආකල්පමය ප්‍රකාශනයක්. එතකොට ඒ ආකල්ප සාධනීය ලෙස වැඩිදියුණු වෙන්නට ඕනේ. අසාධාරණය නොඉවසන තත්වයට මිනිස් සමාජය පුහුණු කරන්නට ඕනේ. මං හොඳ උදාහරණයක් කියන්නම්. ප්‍රංශයේ පුවත්පතක කාටූන් ශිල්පීන් හතර දෙනෙකු අල් කයිඩාවෙන් ඝාතනය කළ බව අපි දන්නවා මහම්මත් තුමාගේ කාටූන් වගෙයක් ඇඳීමයි චෝදනාව. මේ හතරදෙනා ඇතුළු තවත් පිරිසක් ඝාතනයවුණා ඊට පස්සේ. මේකට දහතුන් ලක්ෂයක් සෙනඟ පාරට බැස්සා. පැරිසියේ විතරක්. තිස් ලක්ෂයකට අධික පිරිසක් ප්‍රංශයේ විවිධ නගරවල පාරට බැස්සා මේ දවස් තුන ඇතුළත. රාජ්‍ය නායකයන් ගණනාවක් සහභාගිවුණා ඒගොල්ලන්ගේ මරණය ය භූමදාන කරන දවසේ. බ්‍රිතාන්‍ය අගමැති, ජර්මනියේ චාන්සලර්වරිය. ඒ වගේ රාජ්‍ය නායකයන් ගණනාවක් ඒකට ආවා. මේ අපේ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කළහම කීදෙනෙක් ද සමාජයේ පාරට ආවේ. කොටුව දුම්රිය පොළ ඉදිරිපිට සියයක් දෙසීයක් පිකට් කරන්න ඇති. ඊට පසු හැම අවුරුද්දේම අපි කොටුවේ දුම්රිය පොළ ඉදිරිපිට පිකටින් කරනවා. දැන් ඔන්න සංස්කෘති දෙකේ වෙනස. අර සංස්කෘතිය තුළ ජනතාව මෙහෙම දෙයක් ඉවසන්නේ නැහැ. ඒ ගොල්ලෝ දශලක්ෂ ගණනින් පාරට බහිනකොට අපේ පනහක් සීයක් කොටුව දුම්රියපොළ ඉදිරි පිට ලසන්ත වික්‍රමසිංහ ඝාතනයට විරෝධය දක්වනවා. අතන සංස්කෘතිය තියෙනවා. ඒගොල්ලන් සෙනඟ බස්වලින් ගෙනාවා නොවෙයි. සංස්කෘතිය කියන්නේ ඒවගේ දෙයක්. මම කියන්නේ ඒ සංස්කෘතිය අපි ඇති කරන්න ඕනේ. මාධ්‍යවේදියෙකුට පහර දෙනකොට දශ ලක්ෂ ගණන් මිනිස්සු පාරට බහින්න ඕනේ. ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතිය කියන්නේ අන්න ඒක. ඒක මේ බණ කියලා, දේශනා තියලා විතරක් හදන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒක මේ මිනිසුන් තුළින් ස්වභාවයෙන්ම ඇතිවිය යුතුයි. පුද්ගලයා දියුණුවිය යුතුයි. ඒ පුද්ගලයාට සමාජ සවිඥානකත්වයක් තිබිය යුතුයි. යුක්තිය අයුක්තිය වැටහෙන සහ අයුක්තියට විරුද්ධව සහ යුක්තියට පක්ෂව පෙනී සිටීමේ ගුණයක් තිබිය යුතුයි. මේක මනෝභාවයක්. සමාජයේ පුද්ගලයින් තුළ ඒක ඇතිවිය යුතුයි. ඒක දීර්ඝ කාලීනයි. ඒක ඇති වෙන්න අඩුම ගණනේ දශක දෙකක්වත් ගතවෙනවා. ක්‍රමය හැදුවාට පස්සේ අපිට යන්නට සිද්ධවෙන්නේ ඒ ක්‍රමයත් සමඟ. අපි මෙච්චර කල් දිව්වේ ක්‍රමයක් නැතිව. වෙනත් ආකාරයකට පවසන්නේ නම් ක්‍රමයක් නැතිව මේ පිළිබඳ උනන්දුවක් දක්වන පිරිස් කථා කළා. ඒකේ ප්‍රතිඵලය ඉතා සීමිතයි. දැන් අපට අවස්ථාවක් ලැබිලා තිබෙනවා ක්‍රමයක් හදන්නට. මේ සිස්ටම් හැදුවට පස්සේ අර කියන කථිකාව ඉස්සරට වැඩිය දැන් සාර්ථක වේවි කියලා මම හිතනවා. ඒවගේ පරමාදර්ශයක් තමයි පුරවැසි බලයේ මූලික අරමුණ.

**මේ සම්බන්ධයෙන් අධ්‍යාපනයට පැවරෙන වගකීම කුමක් ද?**

අධ්‍යාපනය නිකම්ම ඉස්කෝලවලින් විභාග පාස් කිරීම, නැත්තම් විශ්ව විද්‍යාල වලින් උපාධි සහතික දීලා එළියට දැම්ම කියන පටු සීමාවෙන් එහාට යායුතු යි. ඒ අධ්‍යාපනය තුළත් පුරවැසි භූමිකාව ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ ඇති කෙරෙන්න ඕනේ. දැන් උදාහරණයක් විදියට විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඒ ගොල්ලන්ගෙ දේකට හැර එළියට එන්නේ නැහැ. ඒ අයට හොස්ටල් නැතිවෙනකොට ඒ ගොල්ලන් එනවා එළියට. නැත්නම් විභාග මොනවාහරි වෙනකොට එනවා. පහසුකම් නැතිවෙනකොට එනවා. නමුත් සමාජයේ වෙන දෙයක් උනහම ඒ ගොල්ලො එන්නේ නැහැ. දොස්තරවරු එන්නේ දොස්තරවරුන්ගේ ඒවාට විතරයි. නීතිඥයෝ නීතිඥයින්ගේ ඒවාට විතරයි. මේ තත්ත්වය වෙනස් විය යුතුයි. සමස්ත සමාජයක් විදියට මේක ග්‍රහණය කරගන්න පුළුවන් විදියට සෑම සමාජ කොට්ඨාසයක් ම පත්විය යුතුයි. ඒ කියන්නේ මාධ්‍යවේදියාව ඝාතනය කිරීම මාධ්‍යවේදින්ගේ ප්‍රශ්නයක් පමණක් නොවෙයි කියන එක තේරුම් ගතයුතුයි. මේ රටේ ඉන්න වෛද්‍යවරු, නීතිඥයින්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ඇතුළු සියලු දෙනාම තේරුම් ගතයුතුයි ඒක මාධ්‍ය ප්‍රශ්නයක් විතරක්ම




www.thenextweb.com

**ඉතින් මේ මාධ්‍ය සංස්කෘතිය සම්පූර්ණයෙන් වෙනස් වෙන්න ඕනේ. මාධ්‍ය සලකන්න ඕනේ විකුණාගැනීම සඳහා පමණක් නොවේ. වාර්තා කරන දේ යම් කිසි ප්‍රමිතියක් තියෙන්න ඕනේ.**

අපක්ෂපාතී මාධ්‍ය මෙහෙවරක සංකේතය බීබීසී

නොවෙයි කියන එක. අන්න මේ පුරවැසි වගකීම පිළිබඳ ඒ චින්තනය ස්ථාපනය කිරීම තමයි අත්‍යවශ්‍ය වෙන්නේ අර කියන සංස්කෘතිය ගොඩනැගීමට. අධ්‍යපනය එහිදී ඉතාම වැදගත්. ඒ අධ්‍යාපනයෙන් ඇති කරන්න ඕනෙ විභාග පාස්කරන්න කටපාඩම් කරන ගිරව් ටිකක් නොවෙයි, සමාජ වගකීම පිළිබඳ යම් කිසි සවිඥානකත්වයක් තියන පරම්පරාවක්. එවිට ඒ පරම්පරාවට පුළුවන් කලින් පරම්පරාවට වඩා එළඹෙන අභියෝගයන්ට මුහුණ දෙන්න. ඒ නිසා අධ්‍යාපනය පමණක් නොව සෑම අංශයක් ම ඒ විදියට නැවත ප්‍රතිව්‍යුහගත කෙරෙන්නට ඕනෙ. භෞතික වශයෙන් නොවෙයි. මානසිකව ප්‍රතිව්‍යුහගත කෙරෙන්න ඕනේ. ඉතින් ඒක ක්‍රමක්‍රමයෙන් සිද්ධ වියයුතු දෙයක්. ඒකට ලොකු තල්ලුවක් වේවි මේ ආයතන ක්‍රමය ඇතිකිරීම.

**ආයතන ස්ථාපිත කළාට පසු එය තහවුරු කරගැනීමට අදාල මානව ප්‍රාග්ධනය පිළිබඳ ගැටලුවක් තිබෙනවා නේ ද?**

මේ රටේ මානව සම්පත් තිබෙනවා. ඉතාමත් ගෞරවාන්විත පිරිසක් ඒකේ ඉන්නේ. ඒ මිනිස්සුන්ගේ සූදානමක් නැහැ ඉදිරිපත් වෙන්නට මේ පවතින තත්ත්වයේ දූෂිත භාවය නිසා. ඒ නිසා ඒ අය පස්ස ගහනවා. ඒ දූෂිත භාවය අපි නැතිකර ගත්තොත් ඒ මිනිස්සුන්ගේ සහභාගිත්වය මේවාට ගන්නට පුළුවන්. අද වෙලා තිබෙන්නේ ඒ දූෂිත භාවය නිසා ඒ අය කර අරින විට තව දූෂිතයෝ පිරිසක් ඇවිල්ලා අර හිස්තැන් පුරවා ගන්නවා. මේ සිද්ධ වෙමින් යන්නේ ඒකයි. මේකට ක්ෂණික විසඳුමක් නැහැ. ඒකයි මම කියන්නේ අර කොමිෂන් සභා ඇතුළත් ව්‍යුහාත්මක වෙනස ඇතිකර ගතයුතු බව. මේ දින 100 අවසානයේ මෙහි දිශානතිය හඳුනාගත හැකියි. අවාසනාවට එය සාධනීය පැත්තට ගමන් නොකළොත් නැවත කිසියම් ස්ථානයකින් මේ ගමන පටන් ගන්නට සිදුවෙනවා. ඒ කියන්නේ මේකෙම දිගුවක් නොවී අලුත් ගමනක්. නමුත් දැනට මම විශ්වාස කරනවා මේකේම දිගුවක් ලෙස යන්නට පුළුවන් වේවි කියලා.

**මේ පරිහානියට මෙරට අධිකරණය ද වගකිව යුතුයි නේ ද?**

අධිකරණ සේවා කොමිසම බලගැන්වීමට දැන් නියමිත යි. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත්කරන්නේ ජනාධිපතිවරයා නොවෙයි. ඒගොල්ලන් පත්කරන්නේ අධිකරණසේවා කොමිෂන් සභාවෙන්. එතකොට ඒක ස්වාධීන කොමිෂන් සභාවක්. එසේ පත්කරන අය බැඳිලා නැහැ කාටවත්. අධිකරණ සේවා කොමිසමටවත්, ජනාධිපතිවරයාටවත්, කිසියම් දේශපාලන පක්ෂයකටවත්. ඒ අය ස්වාධීනයි. එවැනි අධිකරණයක් තමයි අප ඇතිකරගත යුත්තේ. එතකොට ඒ අය වග කියන්නේ නීතියට විතරයි. එහෙම අධිකරණයක් තමයි අපට අවශ්‍ය කරන්නේ. දැන් තිබෙන අධිකරණය පිරිපහදු කරගත යුතුයි. දැන් ඉන්න අග්‍ර විනිශ්චයකාරවරයා කර ඇති දූෂණ පිළිබඳ ඕනෑතරම් සාක්ෂි තිබෙනවා. මේ මිනිහාට සාමාන්‍ය පුරවැසියෙකුගේ තිබෙන අවම ලැජ්ජාවවත් නැහැ. මේ මනුෂ්‍යයා ජනාධිපතිවරයාගේ ගෙදර යනවා අවුරුද්දට කිරිබත් කන්නට. ජනාධිපතිවරයාගේ ළමුන්ගේ උපන්දින සාදවලට මේ මිනිහා යනවා. එහෙම මිනිහෙක් කොහොමද ශ්‍රේෂ්ඨාධිකරණයේ මුල් පුටුවෙ වාඩිවෙලා රටේ යුක්තියක් පසිඳනවා කියලා අපි විශ්වස කරන්නේ. ඒ නිසා මේවගේ අය වහාම ඉවත් කළ යුතුයි. මිනිහා පත්කළෙත් ව්‍යවස්ථා විරෝධි විදියට. ඒ වගේම ව්‍යවස්ථා විරෝධී විදියට ඔහුව අයින් කරන්නත් පුළුවන්. මේ අය ඉවත් කිරීමෙන් තමයි රටට ආදර්ශයක් දෙන්න පුළුවන් වෙන්නේ. ඒ විතරක් නොවෙයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ පසුගිය කාලයේ ඔහුගේ හැසිරීම පිළිබඳව වෙනම විමර්ෂණයක් ආරම්භ කරන්නට ඕනේ. නීතියට පටහැනිව දුන් තීන්දු ශිෂ්ට සම්පන්න රටවල නම් මෙ අය ඉන්න ඕනේ සිර ගෙවල් වල. මේ ආකාරයේ බරපතල වෙනසක් හැම ක්ෂේත්‍රයකම ඇතිකළ යුතුයි. පුරවැසියාගේ කාර්යය දැන් තිබුණාට වඩා බරපතලයි. මහින්ද රාජපක්ෂ පරාජය කිරීමේ සටනට වඩා බරපතලයි මහින්ද රාජපක්ෂ ඇතිකළ සංස්කෘතිය වෙනස් කිරීම. ●

සංවාද සටහන - **මහින්ද රත්නායක**



නීතිඥ
භවානි ෆොන්සේකා



en.wikipedia.org

උපරිමාධිකරණ සංකීර්ණය - කොළඹ

## ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය උදෙසා වන
# මාර්ග සිතියමක් සඳහා උපදෙස්

නව වසර ශ්‍රී ලංකාවෙහි සැලකිය යුතු වෙනස්කම් සිදු කර තිබෙන සමයකි. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන හා ඔහුගේ ආණ්ඩුව බොහෝ අභියෝගයන්ට හා අවස්ථාවන්ට මුහුණ දෙයි. ප්‍රතිසංස්කරණ පොරොන්දු වී තිබෙන අතර අපේක්ෂා ඉහළ ය. ජනාධිපතිවරණයට ඉතා ආසන්නව රටේ පළමුවන ශාන්තුවරයාට නිලවශයෙන් ශුද්ධවරයට ඔසවා තැබීම සඳහා වූ ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය කැපී පෙනෙන්නක් වූයේ ය. ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය සකස් කිරීමෙහි නියුක්තවන්නන් පහතින් එන වචනවලට විශේෂිත අවධානය යොමු කිරීමෙන් යුතුව උන්වහන්සේගේ **සම්ප්‍රාප්ති දේශනය** මාර්ගෝපදේශයක් ලෙස උපයෝගී කර ගත යුතු ය. **"පැරණි තුවාල පෑරවීම වෙනුවෙන් නොව උදක්ම යුක්තිය, සුවදානය හා එක්සත්භාවය ප්‍රවර්ධනය කරන්නට අත්‍යවශ්‍ය මාර්ගයක් වශයෙන් සුවපත් කිරීමේ ක්‍රියාවලියට සත්‍යය සොයා යාම ද ඇතුළත් කිරීම අවශ්‍ය කරයි."** එවැනි මනෝභාවයන් සිරිසේන ආණ්ඩුවේ

www.lankaegossip.com



තිස්ස අත්තනායක අත්අඩංගුවට ගැනීම

**ස්වාධීන විමර්ශන කර ගෙන යාමේ හා වරද කරන්නවුන් නීතිය හමුවට ගෙන ඒමේ දේශපාලන අධිෂ්ඨානයක අඩුව ශ්‍රී ලංකාවේ දණ්ඩන මුක්තිය පිළිබඳ සංස්කෘතියට දායකත්වය සපයන ප්‍රධාන සාධකයකි.**

නිල ලියකියවිලිවල හා ප්‍රකාශනවල අතුරුදහන්ව තිබේ. මෙම ලිපිය ශ්‍රී ලාංකිකයින් වශයෙන් අප සැබෑ හා දිගුකාලීන සංහිඳියාව කරා අවස්ථාවක් උදාකර ගැනීමට කටයුතු කරන්නේ නම් සත්‍යයට හා යුක්තියට ආමන්ත්‍රණය කිරීම තීරණාත්මක වන්නේ මන්ද යන්න සැකෙවින් විදහා දක්වයි.

### දණ්ඩන මුක්තිය පිළිබඳ සංස්කෘතියට ආමන්ත්‍රණය කිරීමේ උත්සාහයන්

ස්වාධීන විමර්ශන කර ගෙන යාමේ හා වරද කරන්නවුන් නීතිය හමුවට ගෙන ඒමේ දේශපාලන අධිෂ්ඨානයක අඩුව ශ්‍රී ලංකාවේ දණ්ඩන මුක්තිය පිළිබඳ සංස්කෘතියට දායකත්වය සපයන ප්‍රධාන සාධකයකි. තවත් එකක් වනුයේ දෝෂ සහගත නෛතික රාමුවක උරුමය හා මහා පරිමාණ උල්ලංඝනයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සිටින වගකිව යුත්තන්ගේ ධාරිතාවේ අඩුවයි. නිදසුන් ලෙස ජනාධිපති කොමිෂන් සභා පත් කිරීමට අවකාශ සපයන විමර්ශන කොමිෂන් සභා පනත විමර්ශන නියම කිරීමට හා ඒවායේ ප්‍රතිඵල තීරණය කිරීමට විධායකයට පුළුල් බලතල ලබා දෙයි. සාක්ෂි දීමට ඉදිරිපත්වන ජනයාට එරෙහිව බිය ගැන්වීම, තර්ජන හා පහරදීම් මතු කර දක්වන වාර්තාකරණ කොට ගෙන වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කරන යාන්ත්‍රණයක් නොමැති වීම ද විමර්ශනවලට බාධා පමුණුවයි. එළඹෙන සතිවල දී ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන විට නව ආණ්ඩුව ආමන්ත්‍රණය කළ යුතු ක්ෂේත්‍ර සමහරක් වන්නේ මේවා ය. මෙම අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් නිශ්ශබ්දතාවය, අක්‍රියතාවය හා හිස් පොරොන්දු රාජපක්ෂ ආණ්ඩුවේ උරුමය හැඩ ගන්වන ලද අතර ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ජනතාවකගෙ න් එය පිටස්තර කළේ ය. දැන් එවැනි වැරදිවලින් ඉගෙනීම හා සත්‍යය, යුක්තිය හා වගවීම සඳහා හඬ නැගීමට අවධානය යොමු කිරීමට කාලය යි. දණ්ඩන මුක්ති සංස්කෘතියට ආමන්ත්‍රණය කිරීමේ කාලය යි.

සත්‍යය හා යුක්තිය සඳහා වන හඬ නැගීම් යුද්ධයට හෝ දකුණේ කැරැල්ලට හෝ පශ්චාත් යුද සන්දර්භයට හෝ සම්බන්ධිත වුව ද ඒවා ගණනින් බොහෝ හා විවිධ වූයේ ය. අතුරුදහන් වූවන්ගේ පවුල් ඔවුන්ගේ නැති වූ ආදරණීයයන් සෙවීමෙහිලා අවුරුදු ගණනාවක් බොහෝ පොලිස් ස්ථාන, හමුදා කඳවුරු, විමර්ශන කමිටු හා විමර්ශන කොමිෂන් සභා හමුවට ගොස් තිබේ. බොහෝ දෙනෙකු විරෝධය පා තිබෙන අතර ශ්‍රී ලංකාව මුළුල්ලෙහි නිහඬ ආගමික වතාවත් පවත්වා තිබේ. මෙම උත්සාහයන් තිබියදීත් බොහෝ දෙනා තවමත් ඔවුන්ගේ ආදරණීයයන් නැතිව තිබෙන්නේ යයි රජයෙන් නිල පිළිගැනීමක් ලබා ගත යුතුව තිබේ. 2013 දී එවකට ජනාධිපති රාජපක්ෂ විසින් පත් කරන ලද වත්මන් **අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ කොමිසමට** (කොමිසම) පැමිණිලි 20,000 කට වඩා ලැබී තිබේ. සිවිල් සමාජය හා මාධ්‍යය පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග සැකසීම, වින්දිත හා සාක්ෂිකාර ආරක්ෂණයේ අඩුව හා අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ එහි මූලික යොමුව ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම ඇතුළු අනෙක් ඒවාට මාරු කිරීම පිළිබඳව මෙම කොමිසම විවේචනයට භාජනය කරනු ලැබ තිබේ. කොමිසමේ දෝෂ තිබියදීත් පැමිණිලි කර තිබෙන දහස් ගණන් දෙනා අතුරුහන් වීම්වල හා ඒවා ප්‍රජාවන් මත සිදු කෙරෙමින් තිබෙන ප්‍රතිවිපාකයේ බරපතල බව අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ සෙවීම අඛණ්ඩව කරගෙන යා යුතුය යන්න පිළිබඳ සාක්ෂියක් වේ.

එපරිද්දෙන්ම රජය පොරොන්දුවී තිබෙන වරදකරුවන් යුක්තිය හමුවට ගෙන ඒමට මගපාදන හිංසනයන් හා උල්ලංඝනයන් පිළිබඳ අනෙක් බොහෝ සිද්ධීන් පිළිබඳ විමර්ශන කළ යුතුව තිබේ. යමෙකු අතීත උල්ලංඝනයන් පිළිබඳ සිද්ධීන්

www.dailynews.lk



කොමිසමේ සාක්ෂි දෙමින්

**කොමිසමේ දෝෂ තිබියදීත් පැමිණිලි කර තිබෙන දහස් ගණන් දෙනා අතුරුදහන් වීම්වල හා ඒවා ප්‍රජාවන් මත සිදු කෙරෙමින් තිබෙන ප්‍රතිවිපාකයේ බරපතල බව අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ සෙවීම අඛණ්ඩව කරගෙන යා යුතුය යන්න පිළිබඳ සාක්ෂියක් වේ.**

16 විමර්ශනය කර පරීක්ෂා කිරීමට පත් කරන ලද විමර්ශන කොමිසම (උදලාගම කොමිසම නමින් ද ප්‍රකට) දෙස බලන්නේ නම් 2009 දී කොමසාරිස්වරුන් විමර්ශනවල සොයා ගැනීම් පිළිබඳ කරන ලද සොයා ගැනීම් විධායකයට ඉදිරිපත් කර තිබියදීත් මෙම සිද්ධීන් පිළිබඳ තත්ත්වය ගැන කිසිදු ප්‍රසිද්ධ තොරතුරක් ලබා ගැනීමට නැත. එවකට ජනාධිපති රාජපක්ෂ විසින් පත් කරන ලද තවත් කොමිසමක් වූ **උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම** (LLRC) උදලාගම කොමිසම හමුවේ වූ සිද්ධීන් දෙකක්, එනම් 2006 දී ත්‍රිකුණාමලයෙහි සිදු වූ තරුණයින් පස් දෙනෙකුගේ ඝාතනය හා ප්‍රංශ රාජ්‍ය නොවන සංවිධානයක් වූ සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වය (*Action Contre la Faim, - ACF*) සංවිධානයේ ක්‍රියාධරයින් 17 දෙනෙකුගේ ඝාතනය වැඩි දුර විමර්ශනය කිරීම අවශ්‍ය බව සඳහන් කර තිබේ. ඝාතන සම්බන්ධයෙන් වසර නවයක් තුළ හා එවකට ආණ්ඩුවෙන් ලැබුණු පොරොන්දු හා ප්‍රතිඥා බොහොමයකට පසු දිවි ගලවා ගත්තෝ හා පවුල් කිසියම් විශ්වසනීය විමර්ශනයක් සිදු කර තිබේ ද යන්න පිළිබඳව යම් තොරතුරක් ලබා ගැනීමට තවමත් බලා සිටිති.

සත්‍යය හා යුක්තිය සඳහා වූ පෙර මුලපිරීම්වලට අනුව දේශීය විමර්ශන බොහෝ අවස්ථාවල දී සිදුව ඇත්තේ මහජන කෝපයට හා ජාත්‍යන්තර පීඩනයන්ට ප්‍රතිචාරයක් වශයෙන් ය යන්න සඳහන් කිරීම වටනේ ය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හා උදලාගම කොමිසම යන දෙකම එවකට ජනාධිපති රාජපක්ෂ විසින් ස්ථාපිත කරන ලද්දේ උල්ලංඝනයන්ට හා දණ්ඩන මුක්ති සංස්කෘතියට ආමන්ත්‍රණය කිරීමට එල්ල වූ ජාත්‍යන්තර පීඩනයේ ඍජු ප්‍රතිඵලයක් වශයෙනි. නිදහස් වෙළෙඳ කලාපයෙහි හා හලාවත විරෝධතාකරුවන් ඝාතනය කිරීම සම්බන්ධව විමර්ශනය කිරීමට දුන් පොරොන්දු බලය අයථා ලෙස පාවිච්චි කිරීමට එරෙහිව එල්ල වූ මහජන හෙළාදැකීමේ ප්‍රතිඵලයක් වුව ද වරදකරුවන් යුක්තිය හමුවට ගෙන එනු ලැබීමේ විශ්වසනීය ක්‍රියාවලියක් තවමත් සිදු කිරීමට ඉතිරිව තිබේ. එසේම මාධ්‍ය ක්‍රියාධරයින්ගේ ඝාතන හා පැහැර ගැනීම් සම්බන්ධයෙන් ද ඇත්තේ එම ප්‍රතිඵලම ය. බ්‍රිතාන්‍ය ජාතික කුරාම් ෂයික් ඝාතන නඩුව වැනි සිද්ධි කිහිපයක වැරදි කළවුන්ට දඬුවම් කරනු ලැබ ඇත්තේ බොහෝ දුරට ජාතික හා ජාත්‍යන්තර ක්‍රියාකාරකයන්ගෙන් එල්ල වූ දැඩි බලපෑම හේතු කොට ගෙන ය. එහෙත් වරදකරුවන්ට දඬුවම් දෙන ලද එවැනි සාර්ථක නඩු දුර්ලභ ය. බොහෝ අවස්ථාවල දී දිවිගලවා ගත්තෝ හා පවුල් යුක්තිය සොයමින් අවුරුදු ගණන් කාලය ගෙවති.

**ජනතා අවශ්‍යතා සපුරාලීමේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය**

සිරිසේන ආණ්ඩුව බලයට පැමිණ හුදෙක් සතියක් තුළ ජාතික විධායක සභාව පිහිටුවීම හා ගරුකටයුතු හිටපු සිවිල් සේවකයෙකු උතුරු පළාත් ආණ්ඩුකාරවරයා ලෙස පත් කිරීම සාදරයෙන් පිළිගනිමු. එසේ වුව ද ප්‍රතිසංස්කරණ වඩාත් ගැඹුරු මට්ටමක විය යුතු ය. සිරිසේන ආණ්ඩුව අතීත හා දැනට සිදු වෙමින් තිබෙන උල්ලංඝනයන් පිළිගනිමින් සිය ප්‍රතිපත්තියෙහි හැරවුමක් පෙන්නුම් කළ යුතු ය. රාජපක්ෂ ආණ්ඩුව උත්සාහ කළේ ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ප්‍රජාවන්ගේ අනෙකුත් දුක් ගැනවිලිවලට සුළු අවධානයක් යොමු කරමින් ආර්ථික සංවර්ධනය කෝකටත් තෛලයක් බව විදහා පෑමට ය. සිරිසේන ආණ්ඩුව එවැනි ක්‍රියා මාර්ගයක දෝෂ සැලකිල්ලට ගත යුතු අතර ශ්‍රී ලංකාවේ උතුරේ, නැගෙනහිර හා දකුණේ ප්‍රජාවන්ගේ සුජාතමය දුක්ගැනවිලි පිළිගත යුතු ය. ඡන්දදායකයින් බිය ගැන්වීම හා මුළා කිරීම සඳහා වූ ප්‍රයත්න නොතකා ඡන්දය දිනයෙහි උතුරෙහි සුවිසල් ලෙස ඡන්දය ප්‍රකාශ කිරීම කලින්

www.velichaveedu.com



දුක්ගැනවිලි

ක්‍රියාවලිය සියලු අදාළ පංගු පාර්ශ්ව සම්බන්ධකර ගන්නා අතරම අන්තර්ග්‍රාහී හා පාරදෘශ්‍ය විය යුතු ය. එසේම වැදගත් දෙය වන්නේ මුලපිරුම් හා ක්‍රියාවලීන්ට ආරක්ෂාව පිළිබඳ තර්ජනවලට මුහුණ දුන් හා දිගටම මුහුණ දෙමින් සිටින තනි ගෘහ මූලික කුටුම්බ හා ස්ත්‍රීන් විසින් මුහුණ දෙනු ලබන ප්‍රශ්න ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාව සංවේදී ඉදිරි දර්ශනයන් ඇතුළත් කිරීම සහතික කිරීම ය.

ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කිරීම හා වෙනසක් පිළිබඳ ආශාව පෙන්නුම් කිරීමේ සාක්ෂියකි. **මාධ්‍යයෙහි** වාර්තා කරන ලද උතුරේ පුද්ගලයෙකුගේ උද්ධෘතයක් වන “අපි අපේ ගෞරවය ආපසු ලබා ගැනීමට ඡන්දය දුනිමු” යි යන්න ප්‍රශ්නයේ හදවතටම ගමන් කරයි. පසුගිය වසර කිහිපය තුළ කෙරුණ සංවර්ධනය, නාගරීකරණය හා අලංකරණය සඳහා වූ මුලපිරුම් ජනතාව ඔවුන්ගේම නිවාසවලින් ඉවත් කිරීම හෝ ඔවුන්ගේම ඉඩම්වලට ආපසු පැමිණීම වැළැක්වීම ඇතුළු ජනතා අයිතීන්ගේ සමගාමී උල්ලංඝනයන්ට හිලව් කළ හැකි නොවේ. රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමට ජනතාවගේ අයිතීන්ට හා ගරුත්වයට ගරු කිරීම පරම වැදගත්කමක් ගනී. වත්මන් ආණ්ඩුව දින 100 සැලස්ම හා දිගුකාලීන වැඩසටහන් පෙරට ගෙන යන විට දී මෙම මූලික කරුණු සැලකිල්ලට ගත යුතු ය. අයෙකුට රාජපක්ෂ ආණ්ඩුවේ මානව හිමිකම් හා ප්‍රතිසන්ධාන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහාවූ හඳුනාගත් ක්‍රියා ලක්ෂ්‍යයන්, ක්‍රියාකාරකයන් හා කාල රාමු ඒවා අඩංගු ජාතික මානව හිමිකම් ක්‍රියා සැලැස්ම හා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම සඳහා වූ ජාතික ක්‍රියා සැලැස්ම යන දෙකම තුළ කියවිය හැකි ය. මෙසේ තිබියදීත් ප්‍රගතිය හා බලපෑම සම්බන්ධයෙන් බොහෝ ප්‍රශ්න ශේෂව පවතී. එවැනි මුලපිරීම් කඩදාසි මත හොඳ වන අතර ජනතාව වෙත ඇති කරනු ලබන්නේ සුළු බලපෑමකි. ඉදිරියට ගමන් කිරීමේ දී නව ආණ්ඩුව අයිතීන් ආරක්ෂා කිරීම, සත්‍යය, යුක්තිය, වගවීම හා ප්‍රතිසන්ධානය සම්බන්ධ එහි ආස්ථානයන් එහි ආස්ථානයන් ප්‍රකාශයට පත් කළ යුතු ය. දින 100 සැලස්ම අධි අපේක්ෂා සහගත හා ප්‍රතිසංස්කරණය සඳහාවන ක්ෂේත්‍ර හඳුනා ගන්නේ වුව ද එහි නැතිවී ඇති කොටසක් වන්නේ සත්‍යය හා යුක්තිය යි. හිංසනය නැවත ඇතිවීම වැළැක්වීමට හා සමාජය තුළ ඇතිවී තිබෙන තුවාල හා බෙදීම් සුවපත් කිරීමේ මුලපිරුම් හා ක්‍රියාවලීන් හඳුන්වා දීමට ආණ්ඩුව අතීතය විභාග කිරීම, පිළිග ැනීම හා අවබෝධකර ගැනීම කාලෝචිත වේ. මේ සම්බන්ධයෙන් ගත් කල දිගු කාලීන හා තිරසර ප්‍රතිසන්ධානයේ ඉලක්කය ඇතිව සත්‍යයට හා යුක්තියට ආමන්ත්‍රණය කිරීමේ මිනුම් දඬු හා කාල රාමු සමගින් මාර්ග සිතියමක් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. ක්‍රියාවලිය සියලු අදාළ පංගු පාර්ශ්ව සම්බන්ධකර ගන්නා අතරම අන්තර්ග්‍රාහී හා පාරදෘශ්‍ය විය යුතු ය. එසේම වැදගත් දෙය වන්නේ මුලපිරුම් හා ක්‍රියාවලීන්ට ආරක්ෂාව පිළිබඳ තර්ජනවලට මුහුණ දුන් හා දිගටම මුහුණ දෙමින් සිටින තනි ගෘහ මූලික කුටුම්බ හා ස්ත්‍රීන් විසින් මුහුණ දෙනු ලබන ප්‍රශ්න ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාව සංවේදී ඉදිරි දර්ශනයන් ඇතුළත් කිරීම සහතික කිරීම ය.

**මාර්ග සිතියමක් හා ඉදිරි පියවර**

ආණ්ඩුවේ ආස්ථාන හා ප්‍රමුඛතා පැහැදිලිව ප්‍රකාශ කිරීමට හැකිවීම වැදගත් ය. මාර්ග සිතියමක් මගින් මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයිය යුතු අතරම අතීතය පිළිගැනීමේ විශාල කැමත්තක් පිළිබඳව හා ජනතාවගේ දුක්ගැනවිලිවලට ආමන්ත්‍රණය කිරීමට හැකිවන විශ්වසනීය දේශීය ක්‍රියාවලීන් සහතික කරන්නාවූ ආණ්ඩුවක් පිළිබඳව මහජනතාව තුළ විශ්වාසයක් ගොඩ නැගීම ද කළ යුතු ය. ආරම්භයේ දී සත්‍යය, යුක්තිය, වගවීම හා ප්‍රතිසන්ධානය සම්බන්ධ ආස්ථානයන් පිළිබඳව යළි රාමුගත කිරීමක් හා යළි සිතීමක් තිබිය යුතු ය. අතීත උල්ලංඝනයන් සම්බන්ධ වගවීම ඉල්ලා බරපතල මානව හිමිකම් උල්ලංඝන හා ආක්‍රමණය සම්බන්ධයෙන් යම් අයෙකු අරහයා වන සම්පූර්ණ ප්‍රතික්ෂේප කිරීම වෙනස් විය යුතු ය. දැනටමත් ආණ්ඩුව මේ ප්‍රතිපත්තියෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් කරනු ලබන



www.theguardian.com

**අතීත උල්ලංඝනයන් සම්බන්ධ වගවීම ඉල්ලා බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් හා ආක්‍රමණය සම්බන්ධයෙන් යම් අයෙකු අරභයා වන සම්පූර්ණ ප්‍රතික්ෂේප කිරීම වෙනස් විය යුතු ය.**

ගිනිගත් දේශයක සිට

විමර්ශන ඇතුළුව යුක්තිය හා වගවීමට සම්බන්ධ ක්‍රියාකාරකයින් සමග කටයුතු කිරීමේ කැමැත්තක් දක්වා තිබෙන ප්‍රතිපත්තියකට මාරුවීමක් කර තිබේ. මෙය පිළිගත හැකි නමුත් සැලකිය යුතු වෙනස්කම් ප්‍රකාරව තව බොහෝ දේ අවශ්‍ය ය. මේ සම්බන්ධයෙන් මාර්ග සිතියමක් උපකාරී විය හැකි ය. දණ්ඩන මුක්තියට එරෙහිව සටන්වදින ජොයින්/ඔරෙට්ලිචර් (Joinet/ Oretlicher) මූලධර්ම හා ඒවා පෙරට ගෙනයන කුළුණු හතර මේ සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් වේ: ඒවා නම් සත්‍යය දැන ගැනීමට ඇති අයිතිය, යුක්තියට ඇති අයිතිය, වන්දි ලැබීමේ අයිතිය හා නිර් පුනරාගමන වගකීම් සහතිකය ය. පහතින් සාකච්ඡා කරනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර හතර නිරවශේෂ නොවන නමුත් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ වැදගත් ක්ෂේත්‍ර මතුකර දක්වන අතර වැඩිමනත් මුලපිරුම් සඳහා වේදිකාව සකසයි.

## සත්‍යය පැවසීමේ වැදගත්කම

ගැටුමෙන් පීඩාවට පත් බොහෝ ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් සත්‍යය සෙවීම දිගටම නිරතව සිටියේ වුව ද වත්මන් ක්‍රියාවලීන් ඊට පිළිතුරු සැපයීමෙහිලා අසාර්ථක වී තිබේ. මෙම ක්ෂේත්‍රය වහාම ප්‍රතිසංස්කරණ අවශ්‍ය කරන ක්ෂේත්‍රයකි. නව ආණ්ඩුව ප්‍රතිසංස්කරණවලට අනාගත විමර්ශන කොමිෂන් සභා ස්වාධීනව වැඩ කරන්නේ ද හා ඒවායේ සොයා ගැනීම් ප්‍රසිද්ධියට පත් කරන්නේ ද නැද් ද යන්න පිරික්සා බැලීමට විමර්ශන කොමිෂන් සභා පනත විමර්ශනය කළ යුතු ය. එසේම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ප්‍රකාරව ඔවුන් කාර්ය සාධනීය ආරක්ෂණ යාන්ත්‍රණයක් සපයන වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂණ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව නැවත සාකච්ඡාවට ගත යුතු ය.

එසේම ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය සත්‍ය කොමිසමක ක්‍රියා මාර්ගයට අනුව යම් කිසිවක් වැනි අලුත් ආයතන ඇතුළුව සත්‍යයට හා යුක්තියට ආමන්ත්‍රණය කිරීමේ නව මාතයන් (modalities) විභාග කළ යුතු ය. වින්දිතයින්ට, දිවි ගලවාගත්තවුන්ට හා පීඩාවට පත් ප්‍රජාවන්ට ඇසීමට අවකාශයක් සලස්වනු ලබන හෙයින් හා අතීතයේ සිදු වූයේ කුමක් ද යන්න පිළිබඳව ප්‍රසිද්ධ පිළිගැනීමක් කෙරෙන හෙයින් සත්‍යය පැවසීමේ ක්‍රියාවලීන් වැදගත් වේ. එසේම සත්‍ය කොමිෂන් සභාවලට මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ නිර් පුනරාගමන සහතිකවීම් හා සියලුම පුරවැසියන්ගේ අයිතිවාසිකම්වලට ගරුකිරීමේ සහතිකවීම් හඳුන්වාදීම ඇතුළත් කරන වන්දි ගෙවීම්, නඩු විභාග හා රාජ්‍ය ප්‍රතිසංස්කරණ මුලපිරුම් සඳහාවන ඊළඟ පියවරයන් නිර්දේශ කිරීමට ද පුළුවන.

කලින් සත්‍යය පැවසීම සඳහා වන විය හැකි ක්‍රියාවලියක් සම්බන්ධයෙන් දකුණු අප්‍රිකානු පන්නයේ සත්‍යය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (SATRC) සාකච්ඡාවට ඉදිරිපත් වී තිබිණ. දකුණු අප්‍රිකානු සත්‍යය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම මනාව ප්‍රකට එකක් වුව ද ශ්‍රී ලංකාව සඳහා යෝග්‍ය ක්‍රියාවලියක් සැකසීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන් ආජන්ටිනාවේ, චිලියේ හා සියෙරා ලියොන්හි එවැනි ඒවා ඇතුළු අනෙකුත් මුලපිරුම් ද ඉතා මෑතක දී සිය විමර්ශන අවසන් කරන ලද බ්‍රසීල ජාතික සත්‍ය කොමිසම ද සැලකිල්ලට ගත යුතු ය. පුද්ගලයින් අතුරුදහන් වීම පිළිබඳ ආජන්ටිනියානු ජාතික කොමිෂන් සභාව (CONADEP) 'නුන්කා මාස්' ('Nunca Mas'- යළි කිසිදාක එපා) නමින් වූ සවිස්තර වාර්තාවක් සපයා ඇති අතර එවකට පැවැති ආජන්ටිනියානු ආණ්ඩුව මිලිටරි ජුන්ටාවට සලසා තිබූ ක්ෂමාවන් ඉවත් කර වරදකරුවන්ට දඬුවම් දීමට මග පෑදූ




www.global.britannica.com

**දකුණු අප්‍රිකානු සත්‍යය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම මනාව ප්‍රකට එකක් වුව ද ශ්‍රී ලංකාව සඳහා යෝග්‍ය ක්‍රියාවලියක් සැකසීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන් ආජන්ටිනාවේ, චිලියේ හා සියෙරා ලියොන්හි එවැනි ඒවා ඇතුළු අනෙකුත් මුලපිරුම් ද ඉතා මෑතක දී සිය විමර්ශන අවසන් කරන ලද බ්‍රසීල ජාතික සත්‍ය කොමිසම ද සැලකිල්ලට ගත යුතුය.**

සත්‍ය සෙවීමේ කොමිෂන් සභා

දේශීය නඩු විභාග පැවැත්වීමට මුල පිරී ය. එසේම බ්‍රසීලියානු කොමිසම ද පොදු ක්ෂමාවන් පිළිබඳ කාරණය මතු කරන අතර බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධ වරදකරුවන් අධිකරණය හමුවට ගෙන ඒමට ඒවා ඉවත් කළ යුතු යයි නිර්දේශ කරයි. ශ්‍රී ලංකාව සඳහා හොඳම කුමක් ද යන්න වශයෙන් එක සූත්‍රයක් නොමැත. ආණ්ඩුව විවිධ මතයන් විභාග කළ යුතු අතර ශ්‍රී ලාංකික සන්දර්භයට වඩාත්ම සුදුසු මුලපිරුමක් සැලසුම් කළ යුතු ය. මෙයට ස්වාධීනත්වය, අපක්ෂපාතීභාවය, පාරදෘශ්‍යභාවය හා වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන මිනුම් දඬු ඇතුළත් කළ යුතු ය.

සත්‍යය පැවසීමේ ක්‍රියාවලීන් සඳහා සඳහා වන මානයන් සාකච්ඡා කරන අය අතීත කොමිෂන් සභාවල වාර්තා පරීක්ෂාකර බැලිය යුතු අතර කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන වශයෙන් ක්‍රියා ලක්ෂ්‍යයන් හඳුනාගත යුතු ය. බොහෝ වාර්තා පොදු විෂය පථය තුළ දක්නට නොමැති වුව ද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම වැනි ලබා ගත හැකි ස්වල්පය කාර්ය සාධනීය ක්‍රියා ලක්ෂ්‍යයන් සපයන අතර ප්‍රතිසංස්කරණ සම්බන්ධ සංවාදවල දී ප්‍රයෝජනවත් මාර්ගෝපදේශ ලෙස යොදාගත හැකි ය. එසේම අතීත විමර්ශන කොමිෂන් සභා වාර්තා ප්‍රසිද්ධියට පත් කිරීම ද වැදගත් ය.

### දණ්ඩන මුක්ති සංස්කෘතිය නිමා කිරීමේ පියවර

ප්‍රතිසංස්කරණය සත්‍ය සොයා ගැනීමට පමණක් සීමා නොවිය යුතුවා පමණක් නොව යුක්තියට හා වගවීමට ද ආමන්ත්‍රණය කළ යුතු වේ. බරපතල මානව හිමිකම් උල්ලංඝනයන්ට සම්බන්ධ වරදකරුවන්ට අධි චෝදනා ඉදිරිපත් කිරීමේ හා දඬුවම් පැමිණවීමේ මන්දගාමී ප්‍රගතිය සැලකිල්ලට ගත් කල ප්‍රතිසංස්කරණ ඉතා වැදගත් වේ. අතීත උල්ලංඝන පිළිබඳ නඩු වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවට ඇති ධාරිතාව ප්‍රශ්නකාරී ය. විශේෂිත නඩු විභාග කිරීමට සිය කටයුතු ක්‍රියාත්මක කිරීමේ නිශ්චිත කාල සීමා සහිත විශේෂ කාර්යාංශයක් ස්ථාපනය කිරීම මෙම බරෙන් නිදහස් වීමට බෙහෙවින් උපකාරී වනු ඇත. එවැනි කාර්යාංශයකට බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධ සිද්ධි විමර්ශනය කිරීමට, අධි චෝදනා ඉදිරිපත් කිරීමට හා නීතිමය පියවර ගැනීමට වරයක් තිබිය යුතු ය. බරපතල මානව හිමිකම් උල්ලංඝන විමර්ශනය කිරීමේ විශේෂ කාර්යාලයක් පිහිටුවීමේ දී හා නඩු විභාග ආරම්භ කිරීමේ දී වගවීමට ආමන්ත්‍රණය කිරීම ප්‍රමුඛතාවක් වන බවට පණිවිඩයක් යැවීමට ද පුළුවන. එසේ වුව ද මෙය කාර්ය මණ්ඩල හා සම්පත් මත රැඳෙන්නා වූ යාන්ත්‍රණයකි. මීට අමතරව නීති කෘත්‍යයන් රික්තකයක් තුළ සිදු නොවනු ඇති බව පැහැදිලි ය. ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ උත්සාහයන් ස්වාධීන අධිකරණයක් සඳහා අවකාශ සැලසීමේ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයක් තුළට ඇතුළත් කිරීම ද එසේම විනිසුරුවන්ගේ හා අධිකරණ කාර්ය මණ්ඩලවල ධාරිතාව ගොඩ නැගීමට තාක්ෂණික සහය ලබා දීම ද කළ යුතු ය.

එසේම රජය අවශ්‍ය පියවර ගැනීමට අසමත්ව තිබෙන තත්ත්වයන්හි දී ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධව නඩු ආරම්භකර පවත්වාගෙන යාමේ පුරවැසියෙකුගේ හැකියාව ශක්තිමත් කළ යුතු ය. වර්තමානයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය සලසනු ලැබ ඇති මූලික අයිතිවාසිකම් පිළිබඳ උල්ලංඝනයක් හෝ ආසන්නතම කඩ කිරීමක් සිදුවන විටක ශ්‍රේෂ්ඨාධිකරණයෙහි පෙත්සමක් ගොනු කිරීම සඳහා අවකාශ සලසා තිබේ. ව්‍යවස්ථා සම්පාදකයින් ඔවුන්ගේ

www.supremecourt.lk



**විශේෂිත නඩු විභාග කිරීමට සිය කටයුතු ක්‍රියාත්මක කිරීමේ නිශ්චිත කාල සීමා සහිත විශේෂ කාර්යාංශයක් ස්ථාපනය කිරීම මෙම බරෙන් නිදහස් වීමට බෙහෙවින් උපකාරී වනු ඇත. එවැනි කාර්යාංශයකට බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධ සිද්ධි විමර්ශනය කිරීමට, අධි චෝදනා ඉදිරිපත් කිරීමට හා නීතිමය පියවර ගැනීමට වරයක් තිබිය යුතු ය.**




පුරවැසියන්ට යුක්තිය සඳහා වඩා හොඳ ප්‍රවේශයක් ලබා දෙන ක්‍රියාවලීන් පිළිබඳ ආදර්ශ සොයා ගැනීමට අනෙකුත් රටවල එවන් ක්‍රියාවලීන් විමසා බැලිය යුතු ය. නිදසුන් ලෙස ආජන්ටිනාවේ තනිකරම රාජ්‍යයේ යාන්ත්‍රණය මත රැඳී සිටීමෙන් තොරව බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධ වැරදිකරුවන් පෞද්ගලිකව නඩු පැවරීමෙන් යුක්තිය හමුවට ගෙන ආ හැකි ය. අවශ්‍ය පියවර ගැනීම සඳහා වන පුරවැසියෙකුගේ හැකියාව ආජන්ටිනාවේ වඩා වැඩි වගවීමකට හා දණ්ඩන මුක්ති සංස්කෘතියට ආමන්ත්‍රණය කිරීමට දායකත්වය ලබා දී තිබේ. වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීමට අසමත්ව තිබෙන වත්මන් සංයුතිය සැලකිල්ලට ගැනීමේ දී ආණ්ඩුව එවැනි ක්‍රියාවලියක් සලකා බැලිය යුතු ය. කෙසේ වුව ද මෙය සත්‍ය විකල්පයක් බවට පත් කළ හැකි වනුයේ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයක් හා නිසි තාක්ෂණික සහායකින් පමණකි.

දණ්ඩන මුක්තිය අවසන් කිරීමට ආණ්ඩුව බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් වන ක්ෂමාවන් පිළිබඳව ද ආස්ථානයක් ගැනීම වැදගත් ය. විශේෂිත තත්ත්වයන් සපුරන ලද විට දී දකුණු අප්‍රිකානු සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම ක්ෂමාවන් ප්‍රදානය කළේ වුව ද අනෙකුත් සන්දර්භයන් තුළ-ආජන්ටිනාවේ, චිලියේ හා උරුගුවේ හි මෑත භාවිතයන් යුද අපරාධ, මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ හා මහා ජන සංහාර පිළිබඳ බරපතල උල්ලංඝන හමුවේ ක්ෂමා නීති උඩු යටිකුරු කර තිබෙන බව දක්නට තිබේ. බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධ වරදකරුවන්ට ඔවුන්ගේ නිලය හා තරාතිරම නොතකා ඔවුන් යුක්තිය හමුවට ගෙන යන බවට පැහැදිලි පණිවිඩයක් යැවිය යුතු ය. හිංසනය නැවත ඇතිවීම වැළැක්වීම දණ්ඩන මුක්ති සංස්කෘතිය අවසාන කිරීම සමග සමීපව සම්බන්ධ වී පවතී. මේ සම්බන්ධයෙන් ගත් කල ආයතනික හා ව්‍යුහමය ප්‍රතිසංස්කරණයන්ට අධිකරණය හා ආරක්ෂක අංශය ද උල්ලංඝනයන්හි දී අපසහායක වූ වැළැක්වීමේ ආයතන ද ඇතුළත් කළ යුතු ය. අවසාන වශයෙන් රජය හා සිවිල් සමාජය යන දෙකම අතීතය පිළිබඳව දැනුවත් භාවය නගාලීමේ දී පහසුකරණය සැලසිය හැකි ලිපි ලේඛන හා අනෙකුත් සම්පත් ක්‍රමානුකූලව ලේඛනාගාරගත කිරීමක නිරත විය යුතු අතර ඔවුන් ද අතීතය ස්මරණය කිරීමට හා අයිතිවාසිකම් උල්ලංඝන නැවත ඇති වීම වැළැක්වීමට උත්සාහ දැරිය යුතු හෙයින් අනාගත පරම්පරා සඳහා තොරතුරු මෙවලමක් විය යුතු ය.

**අනුස්මරණීකරණය**

අනුස්මරණයන්ට අතීතය අනුස්මරණය කිරීමේ දී හා පිළිගැනීමේ දී මෙන්ම වින්දිතයින්ට, දිවි ගලවා ගත්තවුන්ට හා විපතට පත් ප්‍රජාවන්ට මළවුන් වෙනුවෙන් ශෝක වීම සඳහා අවකාශයක් සැපයීමේ දී වැදගත් කොටසක් රඟ පෑ හැකි ය. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සන්දර්භය සමයෙහි ස්මාරක ගොඩ නැගීමට පහසුකම් සැලසුවේ එක ආඛ්‍යානයකට, එනම් ජයෝන්මාදවාදී ජයග්‍රාහකයාට පමණක් වන අතර වින්දිතයින්ගේ හා දිවි ගලවා ගත්තවුන්ගේ බහුවිධ ආඛ්‍යාන සඳහා ඊට අවකාශයක් නොලැබිණ. ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ජනතාවට ඔවුන්ගේ දුක් ගැනවිලි පිළිබිඹු කරන විවිධ තලයන්හි දී අනුස්මරණය කිරීම් සඳහා අවකාශ සලසනු ලැබීම අත්‍යවශ්‍ය ය. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව අදාළ පංගු පාර්ශ්වකරුවන් සමග, සම්බන්ධ දිවි ගලවා ගත්තවුන්, පවුල්, පීඩාවටපත් ප්‍රජාවන්, සිවිල් සමාජය, කලාකරුවන් හා බුද්ධිමතුන් සමග අනුස්මරණ අවකාශ නිර්මාණය කිරීමේ දී, හඳුනා ගැනීමේ දී පවත්වාගෙන යාමේ දී සලකා බැලිය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම පිණිස මුලපිරීම වැදගත් ය.

www.onlanka.com




**වන්දි ලබා දීම ප්‍රතිසන්ධානය සඳහාවන වැදගත් කොටසක් මෙන්ම පුද්ගලයාගේ අයිතීන් පිළිගැනීමක් හා ආරක්ෂා කිරීමක් ද වේ. රජය අතීත අපයෝජනය සම්බන්ධයෙන් ප්‍රතිකර්ම සැලසීම කළ යුතුව තිබේ.**

එල්.එල්.ආර්.සී. වාර්තාව

හිංසන ක්‍රියාවලට මුහුණ දුන් අනෙකුත් රටවල රජය, පෞද්ගලික ආයතන හා මහජනතාව විසින් අනුස්මරණය සඳහා අවකාශ සලසනු ලැබ තිබේ. මෙහිලා එක් සූත්‍රයක් නොමැත්තේ වුව ද එය සියල්ල ඇතුළත් කර ගන්නා ක්‍රියාවලියක් වීම අවශ්‍ය ය. දකුණු අප්‍රිකාවේ පැරණි කොටුව බන්ධනාගාර පරිශ්‍රයෙහි පිහිටා තිබූ ව්‍යවස්ථා අධිකරණය දැන් අතීත සිද්ධීන් දැක බලා ගැනීමේ අනුස්මරණ ස්ථානයක් බවට පරිවර්තනය කර ඇත. ආජන්ටිනාවෙහි කලින් නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථානයක් ලෙස යොදා ගෙන තිබූ ESMA නමින් හැඳින්වුන නාවික සුළු නිළධාරීන්ගේ යාන්ත්‍රික ශිල්ප පාසල දැන් රාජ්‍ය අනුග්‍රහයෙන් යුත් ලේඛනාගාර මධ්‍යස්ථානයක් සහිත අනුස්මරණ ස්ථානයකි. එසේම හැරොල්ඩො කොන්ටි සංස්කෘතික කේන්ද්‍රය නම් කරන ලද්දේ මිලිටරි ජුන්ටාව විසින් මාධ්‍යවේදියෙකු පැහැර ගෙන ගොස් මරා දමනු ලැබූ පසුව ය. ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සැලකිල්ලට ගන්නවුන් පෘථිවි ගෝලය මුළුල්ලේ මෙම සහ අනෙකුත් නිදර්ශන දෙස බැලිය යුතු ය.

නව ආණ්ඩුව එසේම මිය ගියවුන් වෙනුවෙන් ශෝකවීමට ද අවකාශ සැලසිය යුතු ය. පසුගිය අවුරුදුවල යුද්ධයේ අවසාන අදියරෙහි සිදුවූ මරණ වෙනුවෙන් ශෝක වීමට උත්සාහ කළවුන් මර්දනය කෙරිණ. මෙම මර්දනයන් ආගමික උත්සව නතර කර දැමූ අතර ප්‍රජා රැස්වීම් කඩාකප්පල් කර දැමී ය. එවැනි අත්තනෝමතික සීමා කිරීම් වහාම නවතා දැමිය යුතු අතර ආණ්ඩුව ප්‍රජාවන්ට ගෞරවයෙන් යුතුව ඔවුන්ගේ මිය ගියවුන් වෙනුවෙන් ශෝක වීමට අවකාශයන් නිර්මාණය කිරීම හා සහාය සැපයීම කළ යුතු ය.

**වන්දි ගෙවීම්**

වන්දි ලබා දීම ප්‍රතිසන්ධානය සඳහාවන වැදගත් කොටසක් මෙන්ම පුද්ගලයාගේ අයිතීන් පිළිගැනීමක් හා ආරක්ෂා කිරීමක් ද වේ. රජය අතීත අපයෝජනය සම්බන්ධයෙන් ප්‍රතිකර්ම සැලසීම කළ යුතුව තිබේ. මෙයට වන්දි ගෙවීම, පුනරුත්ථාපනය හා ප්‍රතිෂ්ඨාපනය ඇතුළත් කළ හැකි ය. වන්දි ලබා දීම මුදල් හා මුදල් නොවන යන දෙයාකාරයෙන්ම විය හැකි ය. නිදසුන් ලෙස ඉඩම් හා දේපොළ අහිමිවීම/හානි සඳහා ආරම්භක පියවර ජනයාට ඔවුන්ගේ ඉඩම්වලට ආපසු පැමිණීමට සැලැස්වීම හා හානි සඳහා ඔවුන්ට වන්දි ගෙවීම විය හැකි ය. අධිකාරීන්ට ස්වාධීන විමර්ශන කිරීමෙන් පසු අතුරුදහන් වූ පුද්ගලයින් සඳහා මරණ සහතික නිකුත් කිරීමේ පියවර ගන්නට පුළුවන. ආණ්ඩුව ඉඩම්වල පදිංචිය, දේපළ හානි, ජීවිකාවෘත්ති, අතුරුදහන් වීම් හා රඳවා තබා ගැනීම් පිළිබඳව විභාග කිරීමට නිලධාරීන් පත් කළ යුතු ය. ඉඩම්වල පදිංචිය සම්බන්ධයෙන් ගත් කල ඉඩම් අමාත්‍යාංශය හා ආරක්ෂක අමාත්‍යාංශය අප්‍රමාදව හමුදාව හා අනෙකුත් රාජ්‍ය ආයතන විසින් අත්පත් කරගෙන තිබෙන ඉඩම්වල ප්‍රමාණය තක්සේරු කළ යුතු අතර ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ආපසු ලබා දිය යුතු ය. පොදු කටයුතු සඳහා අවශ්‍ය වන ඉඩම් අත්පත් කර ගත යුත්තේ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි සලසා ඇති නීතිමය විධිවිධාන ප්‍රකාරව ය.

ඉහතින් එන්නේ ශ්‍රී ලංකාවෙහි ප්‍රතිසංස්කරණ සඳහාවන විවාදයන්හි සත්‍යය හා යුක්තිය ප්‍රමුඛතාවට ගැනීම ආරම්භ කිරීම සඳහා වන අදහස් සමහරකි. ඉදිරි සති කිහිපය හා මාස කිහිපය තුළ කෙරෙන වැඩ ජනාධිපති සිරිසේනගේ හා ඔහුගේ ආණ්ඩුවේ උරුමය නිර්වචනය කරනවා ඇත. එහෙයින් ආණ්ඩුව ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ගේ යුක්ති යුක්ත දුක්ගැනවිලිවලට ආමන්ත්‍රණය කිරීමට හා නිශ්ශබ්දතාවය අවසන් කර දැමීමට සැලකිල්ල දැක්වීම හා පියවර ගැනීම අති මූලික වේ. ●

http://groundviews.org වෙබ් අඩවියේ අනුග්‍රහයෙනි.



මහාචාර්ය
**ජයන්ත සෙනෙවිරත්න**




උතුරේ මහ ඇමති විග්නේශ්වර්න් සහ හිටපු ආණ්ඩුකාර චන්ද්‍රසිරි මහත්වරු

# මිලිටරි හස්තයෙන් යහපාලනයේ සිහිලැල්ලට

මෙ වර ජනාධිපතිවරණයේදී රාජපක්ෂ පවුල් රෙජීමය පලවා හැරීමට අප ලද අවස්ථාව 1988 දී චිලියේ මිලිටරි ආඥාදායක ජෙනරාල් ඔගස්ටෝ පිනෝෂේ (Augusto Pinochet) බලයෙන් පහකිරීම සඳහා එරට ජනතාව ලද මහඟු අවස්ථාව මෙන් විය. 1973 දී පිනෝෂේ බලයට පැමිණියේ 1970 දී ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් මැතිවරණයකින් බලයට පත් මාක්ස්වාදී නායක සැල්වදෝර් ඇලන්ඩේ (Salvador Allende) ගේ රජය හමුදා කුමන්ත්‍රණයකින් පෙරළා දැමීමෙනි. එම කුමන්ත්‍රණයේදී ඇලන්ඩේ ඇතුළු නායකයන් කීපදෙනෙක්ම ඝාතනයට ලක්වූහ. අනතුරුව වසර 15ක් තිස්සේ ඉතාමත් කෲර හමුදා පාලනයක් ගෙනගිය පිනෝෂේ විසින් සිය දේශපාලන විරුද්ධවාදීන් 3000කට වැඩි පිරිසක් ඝාතනය කරනු ලැබ තවත් 3000 කට වැඩි පිරිසක් අතුරුදහන් කරනු ලැබීය. එසේම 50,000 කට අධික පිරිසක් හමුදාමය වධ හිංසනවලට ගොදුරුවූහ. ඇතැමුන් එහිදී සදාකාලික අංගවිකලත්වයට පත්ව ඇතැයි

www.testinggossip2.blogspot.com



රතුපස්වල ප්‍රහාරය

**ඇතැමුන් එහිදී සදාකාලික අංගවිකලත්වයට පත්ව ඇතැයි ද වාර්තාවේ. මෙසේ හමුදා හිංසකත්වයට සහ ඝාතනයට ගොදුරු වූයේ විපක්ෂ දේශපාලන ක්‍රියාධරයන් පමණක් නොව කලාකරුවන්, බුද්ධිමතුන්, පූජකවරුන්, පැවිදි සොයුරියන් සහ වෘත්තීය සමිති නායකයන් ඇතුළු විශාල පිරිසකි.**

ද වාර්තාවේ. මෙසේ හමුදා හිංසකත්වයට සහ ඝාතනයට ගොදුරු වූයේ විපක්ෂ දේශපාලන ක්‍රියාධරයන් පමණක් නොව කලාකරුවන්, බුද්ධිමතුන්, පූජකවරුන්, පැවිදි සොයුරියන් සහ වෘත්තීය සමිති නායකයන් ඇතුළු විශාල පිරිසකි.

කෙසේ නමුත් වසර 15 ක හමුදා පාලනයකින් අනතුරුව හෙතෙම ජනමතය උරගා බලන්නට කල්පනා කළේය. රාජ්‍යයට එරෙහිව සිටි සතුරු බලවේග (ඔහු කල්පනා කළ ආකාරයට මාක්ස්වාදීන්) විනාශකර දැමීමත් සහ නිදහස් වෙළඳ පොළ ආර්ථිකයත් නිසා ජනතා ප්‍රසාදයක් ඔහුට ඇතැයි හෙතෙම සිතීය. ඒ නිසා ම තවත් වසර අටක පාලන කාලයක් ලබාගැනීම සඳහා ජනමතවිචාරණයකට යාමට පිනෝෂේ සැලසුම් කළේය. ඒ ජනමතවිචාරණය මගින් පිනෝෂේට තවත් වාරයක් දෙනවාද නැද්ද යන ප්‍රශ්නය හෙතෙම ජනතාව ඉදිරියේ තැබීය. ඔව් (Yes) හෝ නැත (No) යන දෙකින් එකකට ජනතාවට ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව ඒ අනුව ලැබුණි. තවත් සාධාරණ පාලකයකු බව ඇඟවීම සඳහා නැත (No) ව්‍යාපාරය ගෙනයන උදවිය සඳහාත් ටෙලිවිෂනයේ විනාඩි 15 ක කාලයක් දිනපතා රාත්‍රීකාලයේ ලබාදීමටත් හෙතෙම එකඟවුණි.

විපක්ෂ කණ්ඩායම් ප්‍රයෝජනයට ගත්තේ මේ මොහොතය. මෙතෙක් රහසිගතව ක්‍රියාකරමින් සිටි දේශපාලන ක්‍රියාකාරීන්, කලාකරුවන්, පැවිද්දන්, වෘත්තීය සමිති නායකයින්, බුද්ධිමතුන් සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය කණ්ඩායම් යුහුසුළුව මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත්හ. ඔවුහු සියලු දෙනා එක අරමුණකට ඒකරාශීවූහ. එනම් පිනෝෂේ පරාජය කිරීම සඳහාය. ලැබුණු විනාඩි 15 ක රූපවාහිනී කාලය තුළ ඔවුහු ඉතා ආකර්ශනීය එසේම බලවත් දැන්වීම් මාලාවක් "No Campaign" (ව්‍යාපාරය) පණගැන්වීම සඳහා නිර්මාණය කළහ. මේ දැන්වීම් ව්‍යාපාරයේ අධ්‍යක්ෂවරයා වූයේ එකල චිලියේ ප්‍රකට දැන්වීම් නිර්මාණ ශිල්පියකු වූ ඉයුජිනෝ ගාර්ෂියා (Engenio Garcia) ය. No (නැත) නැතිනම් "එපා" යන්න නිශේධනාත්මක ස්වරූපයක් ගත් වචනයක් වූ නමුදු එය සාධනාත්මක ලෙස සමාජගතකරන්නට හෙතෙම සමත්විය. 'චිලියට සතුට පැමිණෙනවා ' (Chelie, joy is coming) යන පාඨය ඔහු සමාජගත කළේ පිනෝෂේට තවත් වාරයක් නොදිය යුතුය යන්න මිනිසුන්ගේ හදවත් තුළ කාවැද්දීම තුළිනි. රූපවාහිනියේ පමණක් නොව මගතොට හැමතැනම ද "No" යන්න මිනිසුන්ගේ ඇස ගැටෙන්නට සැලැස්වීය. රාත්‍රී 27 ක් මුළුල්ලේ සෑම විනාඩි 15 ක් 'No ව්‍යාපාරයේ ' අපූරු දැන්වීම් පෙළක් රූපවාහිනියේ ඇස දැවටීමට ඔවුහු සමත්වූහ. ජන මනස (psyche) කොතෙක් සකස් කළා ද කිවහොත් ජනමතවිචාරණ දිනයේ ඡන්ද පොළට ගිය ඡන්දදායකයින් තම ඡන්ද පත්‍රිකාව තුළ දුටුවේ No යන්න පමණි. අවසානයේ පිනෝෂේ පරාජයට පත්විය. ඒත් සමග එතෙක් පැවැති හමුදා ආඥාදායකත්වය ද අහෝසිකර දැමීමට එරට ජනතාවට හැකිවිය.

මීට සමාන ක්‍රියාවලියක් අපගේ පසුගිය ජනාධිපතිවරණයේදී ද දක්නට ලැබුණි. රාජපක්ෂට 'තෙවරක් එපා' යන්න ප්‍රවර්ධන මාතෘකාව බවට පත්ව තිබුණි. රාජපක්ෂ රෙජීමයේ කෘෘර හස්තයට හසුවූවන් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය අපේක්ෂාකළ සියලු දෙනාම පක්ෂ, පාට භේද සියල්ල අමතකකොට රාජපක්ෂ පරාජය කිරීම සඳහා පෙරමුණකට ආහ. විකල්ප කලාකරුවන්, කලාකාරියන් මෙන්ම පුරවැසි බලය පෙරටුකොටගත් බුද්ධිමය සභාවද, සිංහල, දෙමළ,

www.shewsonline.net



# මේ සියල්ල මෙසේ සැකසෙද්දී රාජ්‍යය මුහුණදුන් ප්‍රධාන ප්‍රශ්නය ද අප අබිමුඛව පවතී. එනම් ජාතික ප්‍රශ්නයයි.

ඉන්දු ලංකා ගිවිසුම ජේ.ආර්. - රජීව්

මුස්ලිම්, දේශපාලන පක්ෂද, බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි බහුතර ආගමික ප්‍රජාවද රාජපක්ෂ රෙජීමයට තිත තැබීමේ කර්තව්‍යයට ඒකරාශීවූයේ කවුරුත් බලාපොරොත්තු නොවූ මොහොතකවීම විශේෂත්වයකි. චිලියේ පිනෝෂේ මෙන්ම මහින්ද රාජපක්ෂ ද බලාපොරොත්තු වූයේ බලාපොරොත්තු නොවූ මොහොතක ජනමතය උරගා බලන්නටය. පිනෝෂේ චිලියේ විපක්ෂය අක්‍රීයකොට තැබූවා සේ මහින්දද මෙහි විපක්ෂය කෑලි කෑලි වලට කඩා දමා තිබුණි. කිසියම් හෝ අවාසනාවකට මහින්දට තවත් වාරයක් ලැබුණේ වී නම් ලංකාවේ ද පිනෝෂේ කෙනෙකු බිහිවීමට ඉඩතිබුණි. රාජපක්ෂ උද්දාමයෙන් සිටියේ ඔහු දිනන බවට අන්ධ ප්‍රත්‍යක්ෂයක් තිබූ බැවිණි. ඔහුගේ සමීපතමයින් ඔහුව කිසියම් මනෝ භ්‍රාන්තියකට හසුකොට තිබුණි. ඔහු දිනන බවට රාජකීය දෛවඥයා විසින් සපථ කරනු ලැබ තිබුණි. රැස්වීම්වලදී මහා ජනකායක් හෙතෙම දිටීය. ඒ ජනකාය බලහත්කාරයෙන් හෝ වෙනත් තාන්න මාන්න මත දුර ඈත පළාත්වලින් ගෙන්වූ අය බව හෙතෙම නොදිටීය. හෙතෙම නාර්සිසිස්ට් (Narcissist) මානසික අක්‍රමිකතාවයෙන් පෙළුණේය. රාජ්‍ය ජනමාධ්‍ය තුළත් ඔහු දුටුවේ ඔහුම පමණි. තමන්ගේ බලය ඒ තුළින් ඔහු දිටීය. ඔහු තමාටම පෙම්කළේය. පිනෝෂේ වටා එදා සිටි හමුදා නායකයින්ද ඔහුව රැවටූයේ එසේමය. හෙතෙම විපක්ෂය සැහැල්ලුවට ගත්තේය. නමුදු ඒ ජනමත විචාරණයේදී පිනෝෂේට ප්‍රතිවාදියෙක් නොවීය. නමුත් මහින්දට සිටි ප්‍රතිවාදියා ඔහුට කිසිසේත් සමාන කළ නොහැක්කෙකු ලෙසට ඔහුම කියවාගෙන තිබුණි. ඔහුගේ ප්‍රතිවාදියා රාජ්‍ය මාධ්‍යය හරහා සමච්චලයට ලක්වූවකු විය. රාජ්‍ය නායකයා පිළිබඳ වැඩවසම්වාදී කියවීම තුළ මහින්ද රජකු කර තිබුණි. රජකු සතු උස, මහත, රැවුල, ඊනියා ගාම්භීර බව, කටහඬ ආදී මෙකී නොකී හැම දේම ඔහු සතු බව කියවුණි. මේ සියලු කියවීම් හරහා ඔහු තම ප්‍රතිවාදියා දුටුවේ නෝංජල් කෙනෙකු හැටියටය. තම සගයින් විසින් තමන්ව අන්දවනු ලැබ ඇති අන්දම ඔහුට මෙනෙහි වන්නට ඇත්තේ පරාජයෙන් අනතුරුව විය හැකිය. නාර්සිසිස්ට් අක්‍රමිකතාවට අමතරව හෙතෙම තවත් තෙවැදෑරුම් ව්‍යාධියකින් පෙළුණු බව පෙනීයයි. එනම් මෝහය, මායාව සහ භ්‍රාන්තියයි. මෝහය නම් වැරදි විශ්වාසයන්ගෙන් මුළාවට පත්වීමය. මායාව නම් පවතින ඇත්ත දේ විකෘතිව පෙනීමයි. භ්‍රාන්තිය වනාහී නැතිදේත් මැවී පෙනීමය. බලය පිළිබඳ අධිතක්සේරුවේ අවසාන ප්‍රකාශනය මේ තෙවැදෑරුම් අක්‍රමිකතාවයට ගොදුරුවීම විනා අන් දෙයක් නොවේ. ලෝකයේ අනෙක් ආඥාදායකයන්ද මේ සකල මානසික ව්‍යාධීන්වලට උරුමකම් කියූ බව සත්‍යයකි.

කෙසේ නමුදු සියලු සංසිද්ධි හරහා දැන් රාජපක්ෂ රෙජීමය අවසන් වී තිබේ. දැන් අපට අලුත් ජනාධිපතිවරයෙකු මෙන්ම අලුත් ආණ්ඩුවක්ද ලැබී තිබේ. මේ අලුත් තත්වය බොහෝ දෙනෙකුට කියවාගත නොහැකි තත්වයකි. ජනාධිපති සාමාන්‍ය මනුෂ්‍යයෙකි. තමන් රජකු නොවන වග ඔහුම පවසන්නේය. අතිගරු, ශ්‍රීමත්, උතුමාණනි යන යෙදුම් ඔහු අපේක්ෂා නොකරයි. අගමැතිවරයා ටයි කෝට් අඳින්නේය. පසුගිය කාලය පුරාවට රාජ්‍යයට ඇන්දවූ ජාතිකවාදී ඇඳුම අගමැතිවරයා නොඇඳින්නේය. ආණ්ඩුවේ සුසංයෝගය ඇදහිය නොහැකි තරම්ය. සියලු ජාතිකවාදී බලවේගවල එකමුතුවක් එහි දක්නට ලැබේ. මේ අලුත් තත්වය තේරුම්ගැනීම සඳහා අපගේ සිතිවිලි රටාවල ද පිම්මක් පැනීම සිදුකළ යුතුය. එනම් සුසමාදර්ශ වෙනසකි. එක පථයකට හුරුවූ චින්තන ක්‍රමය විපර්යාසයකට භාජනය කිරීම ඉන් අදහස් කෙරේ. එය නිකම්ම සිදුවන්නක්

www.asianews.it



**විදෙස් තානාපති සේවය හමුදා ලොක්කන්ගේ ක්ෂෙමභූමි බවට පත්ව තිබුණි, වාර්ගික සහ ආගමික සංහිඳියාව පිළිබඳව සිවිල් සමාජය ගෙනගිය වැඩසටහන් හමුදා බුද්ධි අංශවල විමර්ශණයට ලක්විය. සිවිල් සමාජය, රාජපක්ෂ රෙජීමය පිළිකෙව් කළ වූවක් විය.**

සිවිල් සමාජ ක්‍රියාකාරිකයෝ

නොවේ. විපර්යාසකාරකයන්ගේ හැසිරීම තේරුම්ගැනීම තුළින් ම සිදුවිය යුත්තකි. එය සමාජ විපරිවර්තනයකි. මේ බලවේග සියල්ලන් එසේ මුළු ගැනුණේ පොදු අරමුණකටය. එනම්, රාජ්‍යයට යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදී ඇඳුම ඇන්දවීම පමණක් නොව සියලු ජාතීන් රාජ්‍යයට සමෝධානය කරගැනීම උදෙසාය. නීතියේ ආධිපත්‍යය රාජ්‍යයට සවිබලග උන්වීම සඳහාය. දඬුවම් විනිර්මුක්තිය නොව වැරදිකරුවන් අධිකරණය වෙත පැමිණවීම සඳහාය. මේ සියල්ල මෙසේ සැකසෙද්දී රාජ්‍යය මුහුණදුන් ප්‍රධාන ප්‍රශ්නය ද අප අබිමුබව පවතී. එනම් ජාතික ප්‍රශ්නයයි. එම ප්‍රශ්නය විසඳාලීම මේ මොහොතේ සිට ආරම්භ කෙරෙන ප්‍රායෝගික වැඩ පිළිවෙලක් හරහා කළහැකි වෙතැයි අපි විශ්වාස කරමු. ඒ විසඳුම් ක්‍රියාවලියකට අවශ්‍යකරන පසුබිම මේ අවස්ථාව වනවිට භූමිය තුළ සකස්වෙමින් පවතී. එය ඉතාම සාධනීය තත්වයක් බව අමුතුවෙන් කිවයුතු නැත.


රාජපක්ෂ රෙජීමය පැවැති සමයේ රාජ්‍යයේ සෑම අස්සක් මුල්ලක් නෑරම බූවල්ලෙකු මෙන් මිලිටරි හස්තයට හසුකර තිබුණි. දේශපාලන, සමාජීය, ආර්ථික මානසික සහ සංස්කෘතික යන සියලු ක්ෂෙත්‍ර කෙරෙහි හමුදා බලපෑමක් තිබුණි. උතුරේ සිවිල් ජනජීවිතය ඇණහිට තිබූ තත්වයක් පැවැතුණි. දකුණේ මිලිටරිකරණය ජන අරගල මැඩපැවැත්වීමට පමණක් නොව ජන විඥානය සකස්කිරීම සඳහා ද යොදාගෙන තිබුණි. ‘දැයට කිරුළ’ එවැන්නකි. විදුහල්පතිවරුන්ට, වරියන්ට හමුදා තනතුරු නාම ප්‍රදානය තවත් නාඩගමක් විය. විශ්වවිද්‍යාල සිසු ප්‍රජාවගේ නායකත්ව පුහුණුව නම්වූ වැඩසටහන පාලකයන්ගේ මිලිටරි මනෝභාවය සරසවි තුළට කාන්දු කිරීමට ගත් අසාර්ථක සහ විකට ප්‍රයත්නයක් විය. විදෙස් තානාපති සේවය හමුදා ලොක්කන්ගේ ක්ෂෙමභූමි බවට පත්ව තිබුණි, වාර්ගික සහ ආගමික සංහිඳියාව පිළිබඳව සිවිල් සමාජය ගෙනගිය වැඩසටහන් හමුදා බුද්ධි අංශවල විමර්ශණයට ලක්විය. සිවිල් සමාජය, රාජපක්ෂ රෙජීමය පිළිකෙව් කළ වූවක් විය.

ඒවා අන්තවාදී බලසේනාවල ප්‍රහාරවලටද ලක්විය. ඇතිකළ යුතු සංහිඳියාව බියෙන් සැකෙන් කළයුත්තක් වන්නේ නම් සමාජය තුළ තිබෙන අසහනය එයින්ම පැහැදිළි වන්නේය. මේ වන විට අවි ආයුධ රහසිගත ලෙස සඟවා තිබූ තැන් ක්‍රමයෙන් හෙළිවෙමින් පවතී. ඒ කුමන අරමුණක් උදෙසා සිදුකළ එකක්ද යන්න තවමත් හරිහැටි හෙළි නොවූ රහසක්ව පවතින්නේය. මැතිවරණය පැවැති දා අලුයම් කාලයේ මිලිටරි කුමන්ත්‍රණයක් සම්බන්ධයෙන්වූ අස්වාභාවික හමුවක් පිළිබඳව ද හෙළිදරව් කිරීමක් සිදුවන්නේය. මේ සියලු දේ සම්බන්ධයෙන් ගත් කල අලුත් ආණ්ඩුවට තවමත් අනතුරුදායක තත්වයක් පවතින බව අමුතුවෙන් කිව යුතු නොවේ. මේ අනතුරුදායක බව දැනට සැඟව පැවතියත් එය එළිමහනට පැමිණෙන්නේ ජාතික ප්‍රශ්නයට විසඳුම් ඉදිරිපත් කරන මොහොතේ සිට වියහැකිය. ඒ නිසා මේ මොහොත සියලු දෙනාම අවදියෙන් සිටිය යුතු කාලපරිච්ඡේදයක් වනවාට සැක නැත. ආණ්ඩු බලය ලැබීමෙන් ලබන තෘප්තිය පමණක් නොව එය නිවැරදි දිශානතිය කරා හැරවීමද අප සතු කාර්යයක් විය යුත්තේය. එසේම ජන සවිඥානිකත්වය හැම විටම අවදිකොට තැබිය යුතු වන්නේය. එය කළ හැක්කේ ලාභ අපේක්ෂාවෙන් තොරව රාජපක්ෂ රෙජීමය නෙරපා දැමීම උදෙසා කැපවීමෙන් කටයුතු කළ උදවියට විනා අලුත් ආණ්ඩුව පත්වීමෙන් පසු නායකයින්ට ප්‍රශස්ති ලියන මුග්ධ බුද්ධිමතුන්ට නොවේ. ●



www.seithy.com

අගමැති රනිල් වික්‍රමසිංහ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන හා හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග



මහාචාර්ය
**සුමනසිරි ලියනගේ**

# ප්‍රභූ ප්‍රජාතන්ත්‍රවාදය සහ නිර්ප්‍රභූ ප්‍රජාතන්ත්‍රවාදය

ප්‍රජාපතිවරණයත් සමඟ සහ එයින් පසුව කිසියම් ප්‍රමාණයකට ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය මිනිසුන් ප්‍රයෝජනයට ගන්නා බව අපට පෙනේ. විශේෂයෙන් ම ඡන්දයෙන් පසු එය මතුවන ආකාරය හරි විදිය නොවෙන්නට පුළුවන. නමුත් හොරකමට සහ මිනීමැරීමට එරෙහි උද්ඝෝෂණවලින් අපිට එය පැහැදිලිව දක්නට ලැබේ.

ඊ ළඟට ප්‍රශ්නය තිබෙන්නේ දේශපාලන තලයේ ය. සැම කෙනෙක්ම දැන් මෛත්‍රීපාල සිරිසේන වටා සහ දින සියයේ වැඩ පිළිවෙල වටා ගොනුවෙමින් සිටිති. නමුත් එය යටිතලයේ පවතින්නේ වෙනස් ආකාරයකට ය. යටිතලයේ ඡන්ද සමයේ දී මතුකළ ප්‍රශ්න මාලාවක් තිබේ. එය යම් ප්‍රමාණයකට ජනතා විමුක්ති පෙරමුණ, සෝභිත හාමුදුරුවන් හා වෙනත් එවැනි අයගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වේ.

www.lawandsocietytrust.blogspot.com



**දින 100 වැඩ සටහනේ එක් වැදගත් කමක් වන්නේ දින නියම කොට යම් දේවල් යෝජනාකර තිබීම ය. මෙයින් එකක්, එනම් පළමුවෙනි කරුණ තමයි රාජ්‍යය ප්‍රතිසංස්කරණය කරන්නේ කෙසේ ද යන ප්‍රශ්න ය.**

අගමැති රනිල් දිවුරුම් දීම

එවිට අපට තල දෙකක ක්‍රියාකාරිත්වයක් දක්නට පුළුවන. උඩු තලයේ එනම් පාර්ලිමේන්තු තලයේ එකඟත්වයකුත්, අනික් තලයේ විශේෂයෙන් විරෝධවාදී අදහස් මතුවන බවක් පෙනෙන්නට තිබේ.

දින 100 වැඩ සටහනේ එක් වැදගත් කමක් වන්නේ දින නියම කොට යම් දේවල් යෝජනාකර තිබීම ය. මෙයින් එකක්, එනම් පළමුවෙනි කරුණ තමයි රාජ්‍යය ප්‍රතිසංස්කරණය කරන්නේ කෙසේ ද යන ප්‍රශ්නය මගේ කල්පනාවේ හැටියට එතන දී ව්‍යවස්ථාව වෙනස් කිරීම මගහැරිය නොහැක. මූලික වශයෙන් 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනයෙන් පෙර තිබුණු තත්ත්වයට, එනම් ස්වාධීන කොමිෂන් සභා සහ එයට අමතරව ජනාධිපතිගේ සමහර බලතල අඩු කිරීම යන කරුණු දෙක මෙයට අයත් ය. විශේෂයෙන් ම මැතිවරණ ක්‍රමය වෙනස් කරන පාටක් පෙනෙන්නේ නැත. ඒ අනුව ව්‍යවස්ථා සංශෝධනයක් ඇතිවීම සහ විශේෂයෙන්ම රාජ්‍ය සේවා කොමිසම, පොලිස් කොමිසම යනාදිය විසින් මහජනයා සෑහීමකට පත් කෙරේ යැයි කිවහැක.

### ඌන පූරණයක්

මෙතන දී තිබෙන තව ප්‍රශ්නයක් වන්නේ, මේ ස්වාධීන කොමිෂන් සභා කියන අදහස ය. මෙ වැනි කොමිෂන් සභා 1972ට පෙර සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ද තිබුණි. ඒ අවස්ථාවේ ස්වාධීන කොමිෂන් සභා කියන ඒවායින් ප්‍රකාශිතව පැවති ප්‍රශ්නයක් වූයේ නිලධාරී බලය ගැන ය. එක් අතකින් පොලීසිය හා අනික් අතින් රාජ්‍ය සේවයේ ඉහළ නිලධරයේ බලය ලෙස එය හැඳින්වීමට පුළුවන. මූලික වශයෙන් කොමිෂන් සභා තුළින් වූ පාලනය පුළුල් ජන කොටස් වලට එතරම් සහනයක් වූයේ නැත. ඒවායේ නිලබලය නිසා තමයි ලංකා සමසමාජ පක්ෂය වැනි පක්ෂ මුල්කාලයේ සිට උද්ඝෝෂණය කළේ. මේ නිලධාරී බලය, එනම් කච්චේරි ක්‍රමය නිසා අර නිලධාරින්ගෙන් ජනයාට සිදු වූ හිරිහැරවලින් එම ජනයා නිදහස් කරගත යුතුය යන අදහස මේ තුළ තිබුණි. ඒ නිසා ස්වාධීන කොමිෂන් සභා පත්කිරීමේ යෝජනාව අර ජන තෙරපීම් හසුකරගන්නේ කෙසේද යන කාරණය වැදගත් ය. මක්නිසා ද යත් අප දන්නා තරමට මේ නිලධාරී බලයට විරුද්ධ වූ ජනතාවට පසුගිය වසර ගණනාව තුළ දේශපාලනඥයින්ගේ බලපෑමට නතුවීමට සිදුවිය. මේ නිසා නව කොමිෂන් සභා තුළ මහජන නියෝජනයක් ඇති කරන්නේ කෙසේ ද යන්න නැවත සළකා බැලිය යුතු ය. මක් නිසාද යත් පැරණි කොමිෂන් සභාවල එක් පැත්තක දුර්වල කමක් තිබුණා මෙන්ම යෝජිත කොමිෂන් සභාවල තවත් පැත්තක දුර්වලකමක් තිබේ.

මෙයින් බොහෝ විට හිරිහැරයට ලක්වන්නේ මහජනතාව ය. උදාහරණයක් ලෙස දේශපාලකයන් ගේ හිතවතුන් අත්අඩංගුවට ගතහොත් ඔවුන් නිදහස් කරගන්නා අතර විරුද්ධවාදීන් අත් අඩංගුවට ගැනීම බහුලව සිදුවිය. රාජ්‍ය සේවය තුළ ද මේ අසාධාරණයම සිදුවේ. එවිට ප්‍රශ්නය වන්නේ මේ දෙකම නැතිකරන පොලිස් කොමිසමක් සහ රාජ්‍ය කොමිසමක් පත්කරන්නේ කෙසේ ද යන්න ය. එම කොමිෂන් සභාවලට ජන සහභාගිත්වය සහ වෘත්තිය සමිති සහභාගිත්වය ඇතුළු කරගන්නේ කෙසේ ද යන්න සොයා බැලීම ඉතාම වැදගත් ය. මා හිතන්නේ මූලික වශයෙන් ව්‍යවස්ථා සංශෝධන කථිකාවට එය ඇතුළත් කළ යුතු ය.

### මූලික ප්‍රශ්නයක්

ව්‍යවස්ථා සංශෝධනය තුළ ආමන්ත්‍රණය කිරීමට යෝජනාකර නැති නමුත් ආමන්ත්‍රණය කළ යුතු වැදගත් ප්‍රශ්නයක් අපට දැනටමත් පෙනෙන්නට තිබේ. විශේෂයෙන් මැතිවරණ ව්‍යාපාරයේ දී දෙමළ ජනතාව ගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් ප්‍රකාශ කිරීම නිසා, මතු වූ මගහැරිය නොහැකි ප්‍රශ්නයක් වන ජාතික ප්‍රශ්නය අද මතු කළ යුතු ප්‍රශ්නයක් බවට පැමිණ ඇත. ඒ නිසා තමයි රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළේ ඒකීය රාමුව ඇතුළත මේ ප්‍රශ්නය ආමන්ත්‍රණය සඳහා යම් සංශෝධනයක් කිරීමට ආණ්ඩුව බලාපොරොත්තු වන බව. එමෙන් ම උතුර මිලිටරි හරණයට අනිවාර්යෙන් ම හසුකරවාය යන අදහස විදේශ ඇමතිවරයා ඉන්දියාවේ නරේන්ද්‍ර මෝදි හමු වූ අවස්ථාවේ ප්‍රකාශකර තිබේ.

photo by Lahiru (CPA)



**එම කොමිෂන් සභාවලට ජන සහභාගිත්වය සහ වෘත්තිය සමිති සහභාගිත්වය ඇතුළු කරගන්නේ කෙසේ ද යන්න සොයා බැලීම ඉතාම වැදගත් ය. මා හිතන්නේ මූලික වශයෙන් ව්‍යවස්ථා සංශෝධන කථිකාවට එය ඇතුළත් කළ යුතු ය.**

විද්වත් කථිකා

දැනට ආණ්ඩුකාරයා ඉවත්කර නව ආණ්ඩුකාරයෙක් පත්කිරීම යන සීමිත තීන්දුවක් ගෙන තිබේ. එවිට මේ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාදාමය තුළ එවැනි කරුණු ඇතුළත් කරගන්නේ කෙසේ ද යන්න සළකා බැලිය යුතු ය. දින 100 ඇතුළත විශාල ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් කිරීම අපහසු විය හැක. එය යෝජනා වී ද නැත. නමුත් මේ දින 100 වැඩ සටහන අප ඡන්ද ප්‍රතිඵලවල ආවර්ජනයකින් නැවත වෙනස් කළ යුතුය. මක්නිසා ද යත්, ඡන්ද ප්‍රතිඵලයෙන් පෙනෙන්නේ සැබෑ මහජන උවමනාවන් ය. ඒ ආශ්‍රයෙන් දින 100 ප්‍රතිසංස්කරණ කළයුතු වේ. එසේ කිරීමේ දී අනිවාර්යයෙන් ම ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් කිසියම් වූ විසඳුමක් වෙනුවෙන් වැඩ පිළිවෙළක් අවශ්‍යව තිබේ. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් නොමැතිව ඒකීය වචනය ඉවත් කිරීම මේ අවස්ථාවේ කරගත නොහැකි වියහැක. එසේ වූවත් කුමන ප්‍රතිසංස්කරණ කෙසේ කරන්නේ ද යන්න ප්‍රශ්නයකි. එම රාමුව ඇතුළත පිහිටමින් දෙවන මන්ත්‍රණ සභාවක් පිළිබඳ අදහස ගෙනෙන්නට හැකි යැයි මට සිතේ. විශේෂයෙන් ම ජී. ජී. පොන්නම්බලම් ගේ පනහට පනහ මූලධර්මය මත දෙවන මන්ත්‍රණ සභාවක් ගොඩනැගීමට පුළුවන. ඒ මගින් ඒකීය ක්‍රමය තුළ භෞමික නොවන බලහවුල්කාරිත්වයක් ඇති කළ හැක. හැබැයි මෙහි නියෝජනය කෙසේ සිදුවන්නේ ද යන්න ඉතාම බරපතල සාකච්ඡාවකින් කළ යුතු දෙයක්. මෙම කරුණු ව්‍යවස්ථා සංශෝධනවලට ඇතුළත් කළයුතු වේ. රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීකරණයට ලක්කරන්නේ කෙසේ ද යන කාරණයේ දී මෙය මූලික ප්‍රශ්නයකි.

**යහපාලනය**

ඊ ළඟ කරුණ තමයි යහපාලනය පිළිබඳ ප්‍රශ්නය. මා හිතන්නේ මැතිවරණ ක්‍රියාදාමය තුළ වඩාත් ම ආකර්ෂණීය වූ යෝජනාව වූයේ මේ ආශ්‍රිත කරුණු ය. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයට වඩා ඇත්තට ම පුළුල් ජනකොටස් මහින්ද රාජපක්ෂට විරුද්ධව මෛත්‍රීපාල සිරිසේනට දකුණේ ඡන්දය දුන්නේ මූලික වශයෙන් මේ දූෂණ පිළිබඳ ප්‍රශ්ණයට ය. ඇස්පනා පිට සිදුවූ දූෂණ තත්වයක් ඇතුළේ මේ මැතිවරණය පැවැත් වූ බව කවුරුත් දන්නා කාරණයකි. ඇත්තටම ප්‍රජාතන්ත්‍රවාදය මූලික ප්‍රශ්නය වූයේ උතුරුකරයේ සහ කිසියම් ප්‍රමාණයකට නැගෙනහිර මෙන්ම යම් ප්‍රමාණයකට සුළු ජනකොටස් ජීවත්වන පළාත්වල ය. යහපාලනය පිළිබඳ ප්‍රශ්නය වැදගත් නමුත් මෙය ආමන්ත්‍රණය කෙරෙන්නේ ඇල්මැරුණු ස්වරූපයකිනි. විශේෂයෙන් ආණ්ඩුවේ ප්‍රධාන කොටස් මේ සම්බන්ධව ඉවත් වෙමින් සිටින බවක් පෙනේ. ඒ නිසා දැන් අවශ්‍ය වෙන්නේ එක්කෝ පවත්නා යන්ත්‍රණයන් ශක්තිමත් කිරීම, නැත්නම් මේ ප්‍රශ්නය ක්‍රමවත් ලෙස ආමන්ත්‍රණය කළ හැකි ආකාරයට අලුත් යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම ය.

**පංති ප්‍රශ්නය**

තුන්වෙනි වැදගත් ප්‍රශ්නය වන්නේ ආර්ථිකය වේ. තුන්වෙනි ව යන්නෙන් අදහස් කරන්නේ උක්ත ප්‍රශ්නවලට වඩා වැදගත් කමෙන් අඩු බවක් නොවේ. ආර්ථික ප්‍රශ්නය ආණ්ඩුවේ වැඩපිළිවෙල තුළ තිබෙන දුර්වලම කොටස හැටියට දක්නට පුළුවන. දින 100 වැඩ සටහනේ යෝජනා කරන ප්‍රධාන, විශේෂයෙන් ම ඛනිජ තෙල් සහ විදුලිය ඇතුළු ව අත්‍යවශ්‍ය භාණ්ඩ 10ක බදු අඩු කිරීම ගතහැක. මේ අඩු කිරීමත් සමඟ නිශ්චිත වූ ආදායම් යෝජනා ඉදිරිපත් නොකළොත් අනිවාර්යයෙන් ම අයවැය ලේඛනයේ හිඟය ජාතික ආදායමෙන් සියයට දෙකකින් පමණවත් වැඩිවීමට ඉඩ තිබේ. එනම් අද තිබෙන සියයට 5 ක 6 ක ප්‍රමාණය 8ක් පමණ දක්වා ඉහළ යන්නට ඉඩ ඇත. ඉතින් එසේ වුවහොත් ඊ ළඟට බරපතල ප්‍රශ්නයක් මතුවේ. විශේෂයෙන් උද්ධමනය පිළිබඳ ප්‍රශ්නය ගත හැක. මේ හිඟය පියවා ගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය, එනම් ණය ගන්නේ ද එහෙම නැත්නම් වෙනත් ආකාරයක් තිබෙනවා ද යන ප්‍රශ්නය මතුවේ.

ඊ ළඟට පොලී අනුපාතය ඉහළ යෑමේ ප්‍රශ්නය හා විනිමය අනුපාතිකය පහත වැටීමේ ප්‍රශ්නය ද තිබේ. මේ ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීමට නම් මා හිතන්නේ ආණ්ඩුවට ඉතාම ශක්තිමත් ආකාරයට අයවැයේ ආදායම් පැත්ත ගැන



//www.gettyimages.com

**ආර්ථික ප්‍රශ්නය ආණ්ඩුවේ වැඩපිළිවෙල තුළ තිබෙන දුර්වලම කොටස හැටියට දක්නට පුළුවන. දින 100 වැඩ සටහනේ යෝජනා කරන ප්‍රධාන, විශේෂයෙන් ම ඛනිජ තෙල් සහ විදුලිය ඇතුළු ව අත්‍යවශ්‍ය භාණ්ඩ 10ක බදු අඩු කිරීම ගතහැක.**

අතුරු අය-වැය යෝජනා මුදල් ඇමති රවි කරුණානායක මහතා ඉදිරිපත් කරමින්

සැළකිලිමත් වන්නට සිදුවේ. මේ ප්‍රශ්නයට ආණ්ඩුව ඉදිරිපත් කළ යෝජනා අතර තිබෙන්නේ එකම එක යෝජනාවකි. ඒ තමයි දූෂණ සහ නාස්තිය වැළැක්වීම කියන යෝජනාව. එය හොඳ යෝජනාවක් වන අතර ම දූෂණය හා නාස්තිය වැළැක්වීමේ ප්‍රතිඵල එක්වරක් පමණක් ලැබෙන ප්‍රතිඵලයකි. ඒවා දිගින් දිගට ම ලැබෙන ප්‍රතිඵල නොවේ. දූෂණ සහ නාස්තිය වැළැක් වූ සැනින් එහි ප්‍රතිඵලය ලැබිය හැකි නමුත් ඊට පසුව එය ලැබෙන්නේ නැත. දූෂණ හා නාස්තිය නැති කිරීමෙන් එතරම් විශාල ප්‍රමාණයක් පියවාගත නොහැකි බව ද අමතර කරුණකි. සහනයන් දීර්ඝ වශයෙන් දීමට නම් ආදායම් ප්‍රතිපත්තියේ කුමන වෙනසක් කරනවා ද යන්න ආණ්ඩුව යෝජනා කළ යුතුය. එතන දී ඉතාම වැදගත් ප්‍රශ්නය තමයි බදු ප්‍රතිපත්තිය වෙනස් කිරීම. ලංකාවේ බදු ප්‍රතිපත්තිය, මූලික වශයෙන් වක්‍ර බදුවලට වැඩි බරක් තැබීම ප්‍රකට කරුණකි. ප්‍රධාන භාණ්ඩවල මිල අඩු කළ විට අනිවාර්යයෙන් ම වක්‍ර බදු ආදායම අඩුවේ. ඒ නිසා එයට සරිලන පරිදි ආදායම් බදු වැඩි කළ යුතුය. විශේෂයෙන් ම ඉහළ ආදායම් ලබන අයගේ ආදායම් බදු වැඩිකළ යුතු ය. අනුක්‍රමික බදු ක්‍රමය හඳුන්වා දීමක් ද අත්‍යවශ්‍ය වේ. මෙය පංති ප්‍රශ්නය සමඟ බැඳී පවතී.

**ප්‍රභූ දේශපාලනය**

දින 100 වැඩ සටහන සහ ඒ හා බැඳී ඇති උද්ඝෝෂණ තුළ දක්නට ලැබෙන්නේ සාධාරණය ඉටු කිරීම පිළිබඳ අදහස ය. මූලික වශයෙන් මතු වී තිබෙන්නේ ප්‍රභූ සාධාරණය සම්බන්ධ ප්‍රශ්නයකි. ප්‍රසිද්ධියක් උසුලන දන්නා කියන අයවළුන් නිසා එහි ස්වාභාවික ගතියක් තිබේ. ක්ෂණිකව මතු වූ සාධාරණය පිළිබඳ ප්‍රශ්නය තමයි නැතිව ගිය සරත් ෆොන්සේකා ගේ සිවිල් අයිතීන් ලබාදීමේ ප්‍රශ්නය. ශිරාණි බණ්ඩාරනායක ගේ නීතිඥයින්ගෙන් මතුවෙන ප්‍රශ්නය ද එවැන්නකි. තුන් වෙනුව ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ සොයා බැලීම ය. මේ සියල්ල ම ප්‍රජාතන්ත්‍රවාදය සමඟ සම්බන්ධ ප්‍රශ්න බවට සැකයක් නැත. ඒ ඒ තනතුරුවලට මොවුන් සුදුසු ද යන්න තවත් ප්‍රශ්නයක් වන නමුත් එය වෙනම ප්‍රශ්නයකි. උදාහරණ හැටියට ගතහොත් ශිරාණි බණ්ඩාරනායක තමයි 18 වෙනි ආණ්ඩුක්‍රම සංශෝධනයට නීතිමය පාර කැපුවේ. නමුත් මෙහි මූලික ගැටළුව තමයි පසුගිය කාලය තුළ අප දන්නා, අසාධාරණයට ලක්වුණු නිර්ප්‍රභූන් ගණනාවක් සිටීම. උදාහරණයක් ලෙස සමහර ශිෂ්‍යයින් මරා දමන ලදි. දෙමළ සටන ඇතුළත නමුත් යුද්ධය තුළ නොවන ක්‍රියාකාරීන් අතුරුදන්කර තිබේ. තවම දෙමළ සහ වෙනත් සිරකරුවන් චෝදනා නැතිව අවුරුදු 10 -15 සිරගතකරගෙන සිටී.

ඊ ළඟට ප්‍රජාතන්ත්‍රවාදයට දැවැන්ත පහරක් වන ත්‍රස්තවාදී මර්දන පනත තව දුරටත් පවතී. මේ දින 100 ඇතුළත ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් ඉටුකරන්නට නම් පසුගිය ආණ්ඩුවේ මර්දනීය ක්‍රියාමාර්ගයන් හේතු කොටගෙන පහර වැදුණු නිර්ප්‍රභූ කොටස්වලට සාධාරණයක් ඉටුකිරීම පිළිබඳ ප්‍රශ්නයත් ඉතාම පැහැදිළි ලෙස ඉදිරියට ගැනීම අවශ්‍ය වේ. ඒ අත්අඩංගුවට ගත් අයට මොකද වුණේ ? අත්අඩංගුවට ගත් අය තව දුරටත් අත්අඩංගුවේ සිටිනවා ද ? මරා දමලා ද ? නිදහස් කරනවා ද? සිරගෙවල්වල මරා දැමූ අය ඇයි මරා දැම්මේ ? කවුද ඒවා පසුපස සිටියේ යන ප්‍රශ්නත් බරපතල ලෙස ගතයුතුව තිබේ.

එක් අයෙක් පැවසූ ලෙසට ලෝකය බැංකුවක් නම් මේ වේලාවට ආණ්ඩු මැදිහත් වී ලෝකය බේරා ගනී. විශේෂයෙන් ම මේ පරිසරය වැනි ප්‍රශ්නය ගැන එවැනි කථාවක් ඇත. අපේ රටේ දූෂණ විරෝධී යහපාලනය කියන ප්‍රශ්නය ඉතා හොඳ ප්‍රශ්නයකි. නමුත් මතුවන ප්‍රශ්නයක් තමයි අපි ජීවිතවලට වඩා තරමක් දේපොළවලට ඇල්මක් දක්වීම. වෙනත් ආකාරයකට කියන්නේ නම් දේපොල මංකොල්ලකෑම ගතයුතු වැදගත් ප්‍රශ්නයක් වන නමුත් ජීවිත කොල්ලකෑම පිළිබඳ ප්‍රශ්නයක් පසුගිය කාලය පුරාම තිබේ. දැන් ඒ ප්‍රශ්න වැඩිදුර කවුරුවත් මතු කරන්නේ නැත. ඒ ප්‍රශ්න මතු කරන්නේත් ප්‍රභූන්ට වන අසාධාරණයට සම්බන්ධ කිරීමෙන් පමණ ය.

ඒ නිසා ඉතා පැහැදිළි ලෙස දින 100 තුළ, අර ප්‍රජාතන්ත්‍රවාදයට අනුව සංශෝධනයන් ක්‍රියාත්මක කරන්නේ නම් . ජනවාර්ගික ප්‍රශ්නය සමඟ චෝදනා නැතිව සිටින සිරකරුවන් නිදහස් කිරීම,

www.twitter.com



ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඉදිරියේ දිවුරුම් දෙන නව අගවිනිසුරු ශ්‍රී පවන් මහතා

**දින 100 වැඩ සටහන සහ ඒ හා බැඳී ඇති උද්ඝෝෂණ තුළ දක්නට ලැබෙන්නේ සාධාරණය ඉටු කිරීම පිළිබඳ අදහස ය. මූලික වශයෙන් මතු වී තිබෙන්නේ ප්‍රභූ සාධාරණය සම්බන්ධ ප්‍රශ්නයකි.**

මෙන්ම විවිධාකාරයෙන් අතුරුදහන් වුවන්ට කුමක් ද වුයේ යන ප්‍රශ්නය යන කරුණුත් මෙයට ඇතුළත් වියයුතු ය. මා හිතන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පුළුල් වූ අවකාශය තාවකාලික එකක් නොවී දීර්ඝ කාලීන එකක් බවට පත්කිරීමට පියවර ගතයුතු ය.

අප දන්නා තරමින් හැමදාම අලුතෙන් ආණ්ඩුවක් බලයට පත්වූ වහාම කිසියම් වූ සහනයක් නැත්නම් විරාමයක් ඇති වේ. ඒ විරාම කාලය තමයි අප මේ ගත කරන්නේ. විරාම කාලය දික් වෙන්නට නොහැකි බවක් මින් ඇඟවෙන්නේ නැත.

### නව ලිබරල්වාදය හා ප්‍රජාතන්ත්‍රවාදය

විරාම කාලය දික්වෙන්නේ ද යන්න තීරණය වන්නේ ආර්ථිකය සම්බන්ධයෙන් නවලිබරල්වාදී ප්‍රතිපත්තියෙන් මේ ආණ්ඩුව කැඩී යන්නට සූදානම් ද යන කරුණ මත ය. එමෙන් ම ප්‍රජාතන්ත්‍රවාදයේ, විශේෂයෙන් ම නිර්ප්‍රභූ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ ප්‍රශ්නය මතු කරන්නේ ද යන ප්‍රශ්නය වැදගත් එකකි. නිර්ප්‍රභූ කොටස් මත පටවා ඇති බදුබර ප්‍රභූ ජනකොටස් වෙතට මාරුකරන්නට මේ ආණ්ඩුව සූදානම් ද යන මූලික ප්‍රශ්නය මෙතන දී මතුවේ. මෙය ආදායම විෂයෙහි බරපතල ප්‍රශ්නයකි.


මේ ආණ්ඩුව මූලික වශයෙනුත්, විශේෂයෙන් ම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට ධනේශ්වර බලපෑම තිබිය හැකි බැවිනුත්, මෙය තර්කානුකූල ය. විශේෂයෙන් අගමැතිතුමා ක්‍රමසම්පාදන අමාත්‍යංශය තමා යටතේ තබා ගැනීමත්, හර්ෂ ද සිල්වා එහි උප ඇමති ලෙස පත්කිරීමෙනුත්, මහාචාර්ය කේ. ලියනගේ ලේකම් හැටියට පත්කිරීමෙනුත්, අපිට පැහැදිලිව මේ බව පෙනේ. චරිත රත්වත්ත වැනි ලේකම්වරු පත්කිරීමෙනුත් ඒ බලපෑම තහවුරු වේ. ඒ අනුව නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියක් තමයි මේ ආණ්ඩුව අනුගමනය කිරීමට ඉඩ තිබෙන්නේ.

ඔය කියන සහන එවැනි ප්‍රතිපත්තියක් යටතේ දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කළහැකි යැයි මා සිතන්නේ නැත. සහන නොදන බව එයින් අදහස් නොකරන නමුත් ඒ දෙන සහන දීර්ඝ කාලීනව පවත්වා ගත නොහැකි බවයි මා පවසන්නේ. විශේෂයෙන් ම ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වෙනසක් වුවහොත් එය පවත්වා ගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය බරපතල ලෙස මතුවේ. නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය දිගින් දිගටම ගෙන යන විට මතුවන ප්‍රශ්නය තමයි නැවත වතාවක් පසුගිය ආණ්ඩුවට එරෙහිව වගේ ම මහජන විරෝධතා මතුවීම.

එවිට ඇත්තටම ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නය නැවත සම්බන්ධ වන්නේ මෙතන දී ය. කිසියම් රටක ප්‍රජාතන්ත්‍රවාදය හැකිලීම, මර්දනය කිරීම, මූලික වශයෙන් රඳාපවතින්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට මහජනයා කොතෙක් ප්‍රතික්‍රියා දක්වනවා ද කියන ප්‍රශ්නය මත ය. උදාහරණයක් ලෙසට රොෂේන් චානකලා නිදහස් වෙළෙඳ කලාපයේ විරෝධය ඇති නො කරන්නට ඔහු මිය යන්නේ නැත. රතු පස්වල ජනයා විරෝධය නො පාන්නට රතු පස්වල තිදෙනෙක් මැරෙන්නේ නැත. ශිෂ්‍යයින් විරෝධය පළ නො කරන්නට ශිෂ්‍යයින් අත්අඩංගුවට ගැනීම්, ශිෂ්‍යයින් මරා දැමීම් සිදුවෙන්නේ නැත. එවිට ප්‍රජාන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයේ මුරගල හුදෙක් ආණ්ඩුවේ ස්වාභාවික යමක් නොව ආර්ථික ප්‍රතිපත්තිය, සමාජ ප්‍රතිපත්තිය, ජනවාර්ගික ප්‍රතිපත්තියට ඇතිවන විරෝධයන්ට ආණ්ඩුව කෙසේ මුහුණ දෙන්නේ ද යන ප්‍රශ්නය සමග බැඳී පවතී. ආර්ථික තලයේ මේ ප්‍රතිසංස්කරණ ඵලදායි ලෙස නො කෙරුණොත්, දැවැන්ත විරෝධයන් මතුවේ, විශේෂයෙන් ම මෛත්‍රීපාල සිරිසේනගේ ප්‍රතිපත්ති මාලාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන යෝජනාව තීරණාත්මක ය. රාජ්‍ය විශ්ව විද්‍යාල ඇතුළතත් මුදල් අය කිරීමට නැවත වරක් තදබල ලෙස යෝජනා කිරීම ශිෂ්‍ය විරෝධයන්ට මග පෙනවන්නකි. ඒ ශිෂ්‍ය විරෝධයන්ට ආණ්ඩුව ආමන්ත්‍රණය කරන්නේ කොයි ආකාරයට ද? ඊ ළඟට පුද්ගලික විශ්වවිද්‍යාල පිළිබඳ ප්‍රශ්නයේ දී කොහොම ද ආණ්ඩුව කටයුතු කරන්නේ? සෞඛ්‍ය සේවයේ තිබෙන පුද්ගලීකරණය පිළිබඳ ප්‍රශ්නය ආණ්ඩුව ආමන්ත්‍රණය කරන්නේ කොයි ආකාරයට ද? විශේෂයෙන් මේ ප්‍රතිපත්තිය නව ලිබරල්වාදයට තදබල ලෙස ගැටගැසෙන හෙයින්, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නය නැවත අලුත් ආකාරයකට පැන නැගීමට ඇති ඉඩකඩ බැහැර කළ නොහැක. ●




**2015-01-30 දින විද්වත් වෘත්තිකයන්ගේ සංගම් ශාලාවේ හි දී පැවැති ස්වාධීන කොමිෂන් සභා වඩාත් ශක්තිමත් කිරීම පිළිබඳ මහජන සංවාදයේ දී සාකච්ඡා වූ අදහස්**



# මැතිවරණ කොමිසම ශක්තිමත් කිරීම

**- නීතිඥ එල්මෝ පෙරේරා**

2001 දී සම්මත කළ 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් අපේක්ෂා කළ ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම 18 වැනි සංශෝධනයෙන් අහෝසි විය.

17 වැනි සංශෝධනය අනුව මැතිවරණ කොමිසම පත් කළ යුත්තේ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ අනුව ජනාධිපති විසිනි. එහි කාල සීමාව අවුරුදු 5කි. මැතිවරණ කොමසාරිස් පත්කරන්නේ එම කොමිසමෙනි. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා පොලීසිය මෙහෙයවීමේ බලය එයට ඇත. කොමිසමෙහි සාමාජික සංඛ්‍යාව 5කි. මම ද කලක් එහි සාමාජිකයෙකු හැටියට කටයුතු කළෙමි.

එහෙත් කොමිසමෙහි සභාපති ධුරය සඳහා එක්සත් ජාතික පාක්ෂිකයෙකු පත්කර ඇතැයි ජනාධිපති චන්ද්‍රිකා මැතිනිය චෝදනා කළා ය. මෙසේ විවිධ හේතු මත මැතිවරණ කොමිසම පුළුල් බලතල සහිත කොමිසමක් බවට පත් වූයේ නැත.

අරලියගහ මන්දිරය යනු රාජ්‍ය දේපළකි. එහි ආරක්ෂාව සඳහා යැයි කියමින් පොලිස් නිලධාරීන් 1000ක් සේවයෙහි යෙදවීම නීතියට එකඟද? එහෙත් එසමයෙහි සිටි මැතිවරණ කොමසාරිස්වරයාගේ තිබූ බියසුළු බව නිසා නීතිය ක්‍රියාත්මක වූයේ නැත.

කොමිෂන් සභා බලාත්මක කිරීම සඳහා 19 වැනි ව්‍යවස්ථාව ගෙන ඒමේ සූදානමක් මේ වන විට ඇත.

කොමිසමෙහි සාමාජිකයන් 9 දෙනෙකු සිටිය යුතු බව මම යෝජනා කරමි. එහෙත් සාමාජිකයන් පත් කිරීම ඒකපාර්ශ්වීය වූ විට එහි ස්වාධීනත්වය පිළිබඳ ගැටලු ඇති වේ. පත් කරන ලද පුද්ගලයන් පක්ෂග්‍රාහී වීමේ අගතිය වළක්වා ගත යුතු ය. දේශපාලන පක්ෂවලින් නියෝජිතයන් පත් කිරීමේ දී මේ ගැටලුව ඇති වේ.

විවිධ ක්ෂේත්‍රවල කටයුතු කරන අපක්ෂපාතී ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහයෝගය මේ සඳහා ලබාගත යුතු ය.

කොමිසම විධායකයේ රබර් මුද්‍රාව බවට පත්වීම වළක්වා ගැනීම අවශ්‍ය වේ. ●



photo by Lahiru (CPA)



# මානව හිමිකම් කොමිසම සවිබල ගැන්වීම

- නීතිඥ එස්.ජී. පුංචිහේවා

මානව හිමිකම් කොමිසන් සභාව වසර ගණනක් තිස්සේ ක්‍රියාත්මක වෙයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් ව ඇති මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ඕනෑ ම පුරවැසියකුහට මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීමේ හැකියාව පවතී. එහෙත් එහි ක්‍රියාකාරිත්වය අනුව පෙනී යනුයේ එයින් පුරවැසියාට යුක්තිය ඉෂ්ට කර ගැනීම දුෂ්කර කටයුත්තක් ව ඇති බව ය.

තම අයිතිවාසිකම් කඩවීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කිරීමේ හැකියාව පුරවැසියාට නොමැත්තේ එය වියදම් අධික කටයුත්තක් වන නිසා ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි මැදිහත්වීමෙන් පසුගිය අවදියෙහි පැමිණිලි තුන්සිය ගණනක් අප ඉදිරිපත් කර ඇතත් ඒවායින් විභාගයට ගෙන ඇත්තේ කිහිපයක් පමණකි. පසුගිය දිනවල මානව හිමිකම් කොමිසමට පැමිණිලි විශාල වශයෙන් ඉදිරිපත්ව ඇතත් ඒවා විභාග කිරීමේ ක්‍රියාදාමය කෙබඳු ද යන්න පැහැදිලි නැත. වරක් මානව හිමිකම් කොමිසම සඳහා කාර්ය සාධන අංශයක් ඇති කර එම අංශයට මනා පුහුණුවක් ද ලබා දී තිබුණි.

එහෙත් එම පුහුණුව ලැබූ උදවිය අද කොහේ සිටිනවා දැයි අප කවුරුත් දන්නේ නැත. මෙසේ විවිධ හේතු මත පැමිණිලි ගොඩ ගැහෙමින් පවතී.

මානව හිමිකම් කොමිසමෙහි කාර්ය මණ්ඩලය හා එහි වගකීම් ඉටු කිරීමේ ස්වභාවය අනුව පැහැදිලි වනුයේ එහි ඉක්මන් වෙනසක් අවශ්‍ය වී ඇති බව ය.

රතුපස්වල, මීගමුව, හලාවත ජන උද්ඝෝෂණවල දී සිදු වූ මිනිස් ඝාතන සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම ප්‍රමාණවත් පරිදි මැදිහත් වීමක් සිදු කර නොමැත.

අපේ රටේ පුරවැසියන් සහ ආයතන ව්‍යුහයන් කාලයක් තිස්සේ හුරුපුරුදු වී ඇති ආකාරය මෙයින් ද පෙනේ.

ඉකුත් ජනාධිපතිවරණ සමයෙහි මැතිවරණ කොමසාරිස්වරයා සහ මැතිවරණ දෙපාර්තමේන්තුව තමන්ට හිමි බලතල අනුව කටයුතු කිරීමට දැරූ උත්සාහය මෙහි දී සසඳා බැලීම උචිත ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16, 17, 18 වගන්ති අනුව කොමසාරිස්වරයාට ලැබී ඇති බලතල අනුව ඔහු කටයුතු කර ඇති ආකාරය මෙහි දී කැපී පෙනේ. මැතිවරණ කොමිසමක් නොතිබුණත් ව්‍යවස්ථාවෙන් පවරා ඇති බලතල අනුව කටයුතු කළ හොත් පුරවැසියන්ගේ අයිතිවාසිකම් තහවුරු වන ආකාරය එයින් පැහැදිලි වෙයි.

ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට පෙර හමුදා බලය යොදවා ප්‍රතිඵල විකෘති කිරීමේ උත්සාහය පරාජය වූයේ මැතිවරණ කොමසාරිස්වරයා තමාට තිබෙන බලතල අනුව පොලිස්පති ඇතුළු වගකිව යුතු පාර්ශ්වවලට ලබාදුන් උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක වීම හේතුවෙනි. මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව විශේෂයෙන් මැතිවරණය පැවැත්වෙන දිනයෙහි සිට ප්‍රතිඵල නිකුත් කරන අවස්ථාව වනතෙක් කොමසාර්ස්වරයාට ලැබෙන නීතිමය බලතල අනුව පෙනෙන්නේ ඔහු අභිබවා යා හැකි බලයක් වෙනත් අයකුට නොමැති බව ය. මෙවර සිදුවූයේ එම බලය මනාව හඳුනාගනිමින් පාවිච්චි කිරීම ය.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමෙහි කාර්යභාරය මේ සමග සැසඳිය හැකියි. තමන් වෙත ලැබෙන පැමිණිලි විභාග කර අදාළ පුද්ගලයන්ට හා ආයතනවල නිර්දේශ ඉදිරිපත් කිරීමේ හැකියාව කොමිසමට ඇතත් ඒවා ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පියවර ගැනීමේ බලයක් නැත. එය දත් ගලවන ලද කොමිසමකි. ●



– photo by Lahiru (CPA)



# සංවරණ හා තුලන මූලධර්ම මත පිහිටීම

- ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

ජනාධිපතිවරණය පැවති කාලයේ මැතිවරණ කොමසාරිස්වරයා නිදහස් හා සාධාරණ ඡන්දයක් පැවැත්වීම සඳහා තම බලය නිසියාකාරයෙන් පාවිච්චි කිරීමට දරන උත්සාහය කැපී පෙනුණි. මැතිවරණ ප්‍රතිඵල නිකුත් කිරීම අත්හිටුවා කුමන්ත්‍රණකාරී ලෙස බලය ලබා ගැනීමේ උත්සාහය ද පරාජයට පත්විය. මෙහි දී මැතිවරණ කොමසාරිස්වරයා තමාට පැවරී ඇති බලය පාවිච්චි කිරීම හේතුවෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් විය.

මෙහි දී වැදගත් වන්නේ තිබෙන නීතිය හරිහැටි ක්‍රියාත්මක වන්නේද නැතිද යන්න ය. මැතිවරණ දෙපාර්තමේන්තුව ආයතනයක් හැටියට නීතිමය වශයෙන් ලැබී ඇති බලතල අනුව කටයුතු කර ඇති බව පැහැදිලි ය. කොමිෂන් සභා ස්ථාපිත කිරීම සහ නව නීති සම්පාදනයේ දී වැදගත් වන්නේ ඒ ස්ථාවර ව ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යෑම ය.

උදාහරණයක් හැටියට ගත් විට සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය ගත හැකි ය. ඒවායෙහි සීමාකම් පිළිබඳ සාකච්ඡා වෙමින් පවතී.

අල්ලස් හා දූෂණ කොමිසමෙහි පැමිණිලි විභාග කිරීම අඩාල වීමට බලපා ඇත්තේ නිලධාරී හා සම්පත් හිඟය බවට මැසිවිලි නැගෙමින් පවතී.

වත්මන් රජය දින 100 වැඩසටහන යටතේත් ඉන් ඉදිරියටත් යහපාලනයට අදාළ පියවර ගනු ඇතැයි අප විශ්වාස කිරීමෙන් පමණක් අරමුණු ඉටුකරගත නොහැක. ඒ සඳහා ජනතා අවශ්‍යතාවක් තිබිය යුතු ය. 17 වැනි සංශෝධනය යටතේ, සිදු වූ වෙනස්කම් කෙටි කාලයකට සීමා වීම කෙරෙහි විධායකයේ අත පෙවීම මෙන් ම ඒ පිළිබඳ මහජන අවශ්‍යතාවක් නොවීම බලපෑ බව අපට පෙනේ.

යහපාලනය සඳහා ක්‍රියාත්මක විය යුතු දේවල් ක්‍රිකට් තරගයක දී මෙන් පන්දුවෙන් පන්දුවට හා පහරෙන් පහරට ක්‍රියාත්මක කළ නොහැක. සංවරණ හා තුලන මූලධර්මය අනුව සැලසුම් කිරීමේ අවශ්‍යතාව මෙහි දී මතු වේ.

කොමිෂන් සභා ක්‍රියාත්මක විය යුත්තේ රජයේ අවශ්‍යතාවක් හැටියට නොව මහජන අවශ්‍යතාවක් හැටියට ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා ගෙනෙන සංශෝධන පරස්පර විරෝධී නොවන බවට වගබලා ගැනීම ද අවශ්‍ය වේ. විශේෂයෙන් ම ජාතික ප්‍රශ්නය විසඳීමේ දී මෙය වැදගත් වේ. 17 වැනි සංශෝධණය හා 13 සංශෝධනය අතර ගැටුමක් නිර්මාණය විය හැකි යැයි මතයක් තිබූ බව මෙහි දී සිහිපත් කළ මනා ය.

දින 100 වැඩ පිළිවෙළ තුළ ඇතුළත් වන දේවල් ක්‍රියාත්මක කිරීමේ දී මෙසේ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තිබෙන තත්ත්වයන් ද සැලකිල්ලට ගනිමින් කටයුතු කළ යුතු වේ. ●



– photo by Lahiru (CPA)



# තොරතුරු දැනගැනීමේ අයිතිය

**රාවය කර්තෘ නීතිඥ කේ. ඩබ්ලිව්. ජනරංජන**

ජනවාරි 9 දා මේ රටේ පුරවැසියන්හට දැනී ගියේ තමන් මරණ බයෙන් නිදහස් වූ බව ය. එයින් පසු ඇති වූයේ නිදහස් යුගයක් බව අපට දැනේ. එහෙත් එම නිදහස අප පවත්වාගෙන යා යුතු ය. දින 100 වැඩසටහන තුළ පොරොන්දු වී ඇති පරිදි එම නිදහස සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගත යුතු ය.

ජනවාරි 8 දා තෙක් පැවතුණේ පුරවැසි බලය යටපත් කරගත් ආණ්ඩුව කේන්ද්‍ර කරගත් බලයකි. එහෙත් ජනවාරි 9 දා වන විට එය එක්තරා ආකාරයකින් පුරවැසි බලය ජයග්‍රහණය කිරීමේ අවස්ථාවක් බවට පත්විය. මෙයින් තාවකාලිකව අපට හිමි වූ නිදහස දිගටම පවත්වාගෙන යෑම අපගේ වගකීම විය යුතු ය.

එහි දී මාධ්‍යවේදීන් මෙන් ම සිවිල් පුරවැසියන් විසින් ද දිනාගත යුතු අයිතිවාසිකමක් වන්නේ තොරතුරු දැනගැනීමේ අයිතියයි.

ඒ පිළිබඳ පණත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දින 100 වැඩ සටහනට ඇතුළත් ය. තොරතුරු දැනගැනීමේ අයිතිය මාධ්‍යවේදීන්ට සීමා වූවක් ය යන විශ්වාසය මුලින්ම දුරුකර ගත යුතු ය.

දින 100 වැඩ පිළිවෙළට අනුව පෙබ. 21 දින තොරතුරු දැනගැනීමේ අයිතිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එහෙත් මේ පණත් කෙටුම්පතෙහි අන්තර්ගතය කෙසේ වනු ඇතිදැයි හරිහැටි පැහැදිලි නැත. එය මහජන සංවාදයට ලක්වීමක් ද නොමැත. තොරතුරු දැනගැනීම පුරවැසියාගේ අයිතියකි. එය මාධ්‍යවේදීන්ට සීමා වූවක් නොවේ. එය සීමිත අර්ථ දැක්වීමකි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පණත් කෙටුම්පත සම්පාදනය කිරීම සඳහා 15 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන බව කී ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා, එයට මාගේ නියෝජනය ද අවශ්‍ය බව මීට සති කිහිපයකට පෙර ප්‍රකාශ කළේ ය. එහෙත් එවැනි කමිටුවක් පත් කළ බව දැනගන්නට නොමැත.

තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් පුරවැසි හඬක් ගොඩනැගීම සඳහා අප පසුගිය අවධියෙහි දායක වූයේ තනතුරු අපේක්ෂාවෙන් නොවේ. හීතියේ පාලනය පරදවා නීතියේ පාලනයක්, යහපාලනයක් ගොඩනැගීමේ අරමුණෙනි. තොරතුරු දැනගැනීමේ අයිතිය එහි පදනම වෙයි. පුරවැසියාට තොරතුරු වසන් කිරීම දූෂණයට, වංචාවට මග පෑදීමකි.

පෙබ. 20 දා ඉදිරිපත් කිරීමට පණත් කෙටුම්පත සම්බන්ධයෙන් අපට ගැටලු කිහිපයක් ඇත.

- මෙය තනි පුද්ගලයකු විසින් අලුතින් සකස් කරන ලද එකක්ද?
- මීට පෙර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, පුවත් පත් ආයතනය හා කර්තෘ සංසදය විසින් සකස් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කෙටුම්පත් මෙහි දී සැලකිල්ලට ගෙන තිබේද?
- මෙය මහජන සංවාදයට ඉදිරිපත් නොකරන්නේ ඇයි?

පුරවැසියෙකු කිසියම් රාජ්‍ය ආයතනයකින් තොරතුරු ඉල්ලා සිටීමේ දී තොරතුරු ලබාදීමේ සීමාව පිළිබඳ ගැටලු පවතී. ජාතික ආරක්ෂාවට තර්ජනයක් කෙරෙන තොරතුරු යනුවෙන් දැනට ම සීමාවක් පණවාගෙන ඇති බව දින 100 වැඩ පිළිවෙළ

– photo by Lahiru (CPA)





අනුව ද පෙනේ. 'ජාතික ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාවය' වගන්තියට මුවා වී ඇතැම් තොරතුරු වසන් කිරීමේ හැකියාවක් නොතිබේද යන ප්‍රශ්නය පුරවැසියාගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් විය හැකි ය.

මේ අනුව ඇතිවන ගැටලු

1. තොරතුරු ලබාගැනීමේ සීමාව
2. තොරතුරු ලබා ගන්නා යාන්ත්‍රණය

   රජයේ ආයතනවල මේ සඳහා අයෙකු පත් කරන්නේද? ඒ සඳහා අවශ්‍ය සම්පත් හා පහසුකම් ලබා දෙන්නේද?

3. තොරතුරු ලබාගැනීමේ අධ්‍යාපන හා සංස්කෘතික පසුබිම සැලකිල්ලට ගෙන තිබේද?

තොරතුරු ලබාගැනීම පිළිබඳ අවබෝධ කර ගැනීමේ සංස්කෘතියක් ලංකාවේ තවමත් නිර්මාණය වී නොමැත. එය නිර්මාණය කිරීම යුගයේ අවශ්‍යතාවකි. ඉන්දියාවේ නම් එය බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක වෙයි. එනම් පහළ සිට ඉහළට ක්‍රියාත්මක වෙයි. ලංකාවේ එය ක්‍රියාත්මක වන්නේ ඉහළ සිට පහළට ය. ●

# ජාතික පොලිස් කොමිසමේ කාර්ය භාරය

- නීතිඥ චන්ද්‍රපාල කුමාරගේ

පොලිස් කොමිසම සමාජ අවශ්‍යතාවකි. එයින් ස්වාධීන පොලිස් සේවයකට අවශ්‍ය මඟ සැකසිය යුතු ය. එහෙත් එහි සාමාජිකයන් ලෙස ඒ.එස්.පී. ලා පත්කළ යුතු නැත.

1972 පටන් රාජ්‍ය සේවය දේශපාලනීකරණයට ලක්වීම ආරම්භ විය. අසාධාරණයට ලක් වූ පොලිස් නිලධාරීන් විශාල පිරිසකගේ ගැටළු නිරාකරණය කිරීමට අපට සිදු විය.

17 ව්‍යවස්ථාවේ 155 1 අ යටතේ පොලිසියේ කාර්යය, විනය හා උසස්වීම් පටිපාටිය දක්වා ඇත. මේ බලය පොලිස් කොමිසම සතු ය. පොලිස්පති ක්‍රියාත්මක වන්නේ කොමිසමෙන් පිටස්තර ව ය. විනය කටයුතුවල දී මහජනයා සම්බන්ධ වෙයි.

එහෙත් පොලිස් කොමිසමෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දී ගැටලුකාරී තත්ත්වයන් මතු වෙයි. පොලිස් කොමිසමෙහි නිර්දේශ නොසලකා හැර විධායක ජනාධිපතිට වුවමනා විදියට පොලිස් නිලධාරීන් මාරු කිරීම හා උසස්වීම් ලබාදීම නරක ආදර්ශයකි.

පොලිස් කොමිසම සඳහා පත්කළ යුත්තේ ද රාජ්‍ය සේවයේ මනා අත්දැකීම් ඇති පුද්ගලයන් මිස පූජකවරුන් නොවේ. ජනාධිපති නීතිඥ රංජිත් අබේසූරිය මහතා පොලිස් කොමිසමෙහි සේවය කරද්දී විවිධ අභියෝගවලට මුහුණ දුන්නේ ය. එහෙත් කොමිසමෙහි සේවය කරන්නා පූර්ණකාලීනයකු විය යුතු ය. නො එසේ නම් ඔහුට එම රාජකාරිය හරිහැටි ඉටු කළ නොහැකි වේ. පොලිස් කොමිසම ඇතුළු කොමිසන් සභා බලගැන්වීම සඳහා උචිත පාර්ලිමේන්තු කමිටුවක් පත්කළ යුතු ය.

එහි සම්බන්ධය ඔරුව පසුපස යන කොල්ලෑව මෙන් විය යුතු ය. ඒ දෙක වෙන ම ගමන් කිරීමෙන් පලක් නොවේ. 18 වැනි සංශෝධනයේ දී එම කරුණු සැලකිල්ලට ගත යුතු ය. ●



– photo by Lahiru (CPA)



# ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

- වෛද්‍ය රාජා විජේතුංග

මහාචාර්ය සේනක බිබිලේගේ ශිෂ්‍යයෙකු වූ මා හට ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම විෂය කරගත් කතිකාවතට දායක වන්නට ලැබීම දෛවෝපගත සිදුවීමකි. දශක හතරක් ඉක්මවා ඇදී ගිය ප්‍රශ්නයක් නිමා කිරීමේ උත්සාහයක අපි යෙදී සිටිමු. ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම දින 100 වැඩසටහනට ද ඇතුළත් ය. 2012 පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පණතට සිදුවූයේ කුමක්ද යන්න මෑත අවධියෙහි දී මහජන සංවාදයට ලක් විය.

ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම මහින්ද චින්තනයට ද ඇතුළත්ව තිබිණ. එහෙත් අවශ්‍ය පියවර ගැනීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවන ලද ඖෂධ පනතට සිදුවූයේ කුමක්ද? මෙය ක්‍රියාත්මකවීම වැළැක්වීම සඳහා අදිසි හස්තයක් ක්‍රියාත්මකවූ බව පැහැදිලි ය.

මහාචාර්ය සේනක බිබිලේගේ පුරෝගාමීත්වයෙන් ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවීමෙන් පසුව දේශීය වශයෙන් ඖෂධ වර්ග 700ක් නිෂ්පාදනය කෙරිණ. සංඛ්‍යාත්මක වශයෙන් පහළ බැස ඇතත් දැනට ද එම සංස්ථාවෙන් ඖෂධ වර්ග නිෂ්පාදනය කෙරේ. එහෙත් නිදහස් ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන රටක නිදහස් ඖෂධ වෙළඳාම දේශීය ඖෂධ ප්‍රතිපත්තියට අභියෝගයකි. එය පාලනය කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය විය යුතු ය.

ඖෂධවල නියම නම වෙනුවට වෙළඳ නාම කිහිපයකින් වෙළෙඳ පොළට නිකුත්වීම මිල ගණන්වල විෂමතා සහ බොහෝ වෛද්‍යවරුන්ට සමාගම්වලින් ලැබෙන වාසි අනුව එම සමාගම්වල ඖෂධ නිෂ්පාදන රෝගීන්ට නිර්දේශ කිරීම බරපතල ගැටලුවකි.

රු. 2 සිට රු. 100 දක්වා පරාසයක එක ම ඖෂධයක් විවිධ වෙළෙඳ නම්වලින් වෙළෙඳ පොළට නිකුත්වීම රෝගියාට සිදුවන අසාධාරණයකි. ඒ නිසා එම නිෂ්පාදනවලට සීමාවක් (Needs Closed) පැනවිය යුතු ය. ඖෂධ වෙළෙඳ පොළෙහි ඇති ඖෂධ WHO ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කර තිබේ දැයි පරීක්ෂාවට ලක්විය යුතු ය. දරාගත නොහැකි මිලකට ඖෂධ අලෙවි කිරීම සීමා කිරීමේ හැකියාව එවිට ඇතිවේ. ඖෂධවල ප්‍රමිතිය පිළිබඳ රෝගියාට විශ්වාසයක් ඇති වේ.

ඖෂධ පිළිබඳ ප්‍රචාරණය කිරීමේ දී WHO සංවිධානයෙහි ආචාරධර්ම අනුගමනය කරන්නේද යන්න පරීක්ෂාවට ලක් කිරීමේ ක්‍රමවේදයක් තිබිය යුතු ය.

එමෙන් ම දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය දිරිගැන්වීමේ සංස්කෘතියක් ඇති කළ යුතු ය.

වෛද්‍ය ගුරුකුල ගණනාවක් පැවතීම ද මේ ප්‍රශ්නයෙහි තවත් පැත්තකි. රෝගීන්ට ඖෂධ නියම කෙරෙන්නේ ඒ ඒ ගුරුකුලයේ ස්වභාවය අනුව ය.

ජාතික ඖෂධ වෛද්‍ය උපකරණ හා සුවඳ විලවුන් පණත් කෙටුම්පත හැටියට ඉදිරිපත් කෙරෙන ඖෂධ පණත් කෙටුම්පතෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් දැනට ගැටලුකාරී තත්ත්වයක් උද්ගත ව තිබේ. ඊට හේතුව ඒ සම්බන්ධයෙන් පාර්ශ්ව දෙකක් අතර කඹ ඇදීමක් පැවතීම ය. ඖෂධ සමාගම්වල වාසියට අනුව කටයුතු කරන බලවේග එයින් ජයගතහොත් සම්මත වන පණතෙන් මහජනයාට සැබෑ සේවයක් වීම සැක සහිත ය. ●




අගමැතිතුමා ඇතුළු වර්තමාන කැබිනට් මණ්ඩලයෙන් කොටසක්

**ලයනල් ගුරුගේ**

# යහපාලනය ඇති කළ හැක්කේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමෙනි

රට තුළ යහපාලනයක් ඇති කිරීම මේ අවධියෙහි තිබෙන ප්‍රධානම කතිකාවත වී ඇති බව පෙනේ. යහපාලනය වෙනම ප්‍රපංචයක් නොවේ. එය තව බොහෝ කරුණු සමඟ සම්බන්ධ වේ. එයින් අපගේ අවධානයට ලක්වන ප්‍රධානතම කරුණු වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයයි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු නොකර යහපාලනයක් ඇති කිරීම සිහිනයක් පමණි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ දී පළමුවෙන් සැලකිල්ලට ගත යුතු වන්නේ රට වැසියා ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන හා එය තම ජීවන පිළිවෙතට අන්තර්ග්‍රහණය කර ගැනීමයි.

www.archive.maginternational.org



**පුරවැසියන්ගේ දායකත්වයෙන් පිහිටුවාගෙන ඇති විවිධ සමිතිවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සැලකිය යුතු මට්ටමේ දියුණුවක් අත්පත් කරගෙන සිටී. ගමේ මරණාධාර සමිතිය මේ සඳහා දැක්විය හැකි නිවැරදිම නිදර්ශනයකි.**

පුරවැසි කතිකාව

**පුරවැසි සමාජයන්හි අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය**

අනෙක් වැදගත් කරුණ වන්නේ පුරවැසියාගේ එම ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත සංවිධානගත ව්‍යුහයක් තුළ පොදු පිළිවෙතක් බවට පත් කිරීමයි. මෙය අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම ලෙස හැඳින්වීම සුදුසුය. මෙකී අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පුරවැසියන් හැටියට මෙන්ම සංවිධාන ව්‍යුහයක් හැටියට ද මනාව අභ්‍යාස කිරීමේ නිදර්ශන ඕනෑ තරම් පෙන්වාදිය හැකිය.

පුරවැසියන්ගේ දායකත්වයෙන් පිහිටුවාගෙන ඇති විවිධ සමිතිවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සැලකිය යුතු මට්ටමේ දියුණුවක් අත්පත් කරගෙන සිටී. ගමේ මරණාධාර සමිතිය මේ සඳහා දැක්විය හැකි නිවැරදිම නිදර්ශනයකි.

මරණාධාර සමිතියෙහි ව්‍යවස්ථාවක් ඇත. සාමාජික මුදල, අරමුදලින් මරණකරු සඳහා ලබා දෙන ආධාරයෙහි ප්‍රමාණය, වාර්ෂික අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම, සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, සාමාජිකත්වය අහෝසි කිරීම යනාදිය විනිවිදභාවයකින් යුතුව සිදු කෙරේ. එම පටිපාටියෙන් බැහැරව ක්‍රියාකරන නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීමට හා අවශ්‍ය නම් තනතුරු හා සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට ද පියවර ගැනේ.

මෙහිදී අපගේ අවධානයට ලක්වන්නේ සමිතියෙහි අරමුදල ලැබීම් හා ගෙවීම් පිළිබඳ සාමාජිකයන්ට දැනුවත්වීමේ අවස්ථාව ලැබීම ය.

ගම් සංවිධානයක් විසින් අවුරුදු උත්සවයක් පවත්වනු ලැබීමේ දී එහි අයවැය ලේඛනයක් මහජනයාට ප්‍රදර්ශනය වන්නට තැබීමෙන් පැහැදිලි වන්නේ විනිවිදභාවයකින් කටයුතු කිරීම සඳහා ඇති කරගෙන නිරන්තර සමාජ සම්මුතීන්හි බලගතුකම මිස අන් කුමක් ද ?

පාසල් ක්‍රීඩා සමිතිය හා සාහිත්‍ය සංගමය යනාදී සමිතිවලින් දරුවන්ට ලැබෙන අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අභ්‍යාසය ඔවුන් වැඩිහිටියන් වූ පසුව එය ජීවන පිළිවෙතක් බවට පත් කර ගැනීමේ අවස්ථාව ලැබෙයි.

කිසියම් සමිතියකින් දූෂණ චෝදනා ලැබූ සාමාජිකත්වයෙන් නෙරපා හැරිය විට "ඕකා හොරා කාපු එකා" යනාදී වශයෙන් ගම් සමාජය තුළ පරිභවයට ලක්වී හා විවිධ සමාජ තහංචිවලට ලක්වීම නිසා අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කිරීමේ සමාජ අවකාශය පුළුල් වේ.

ශ්‍රී ලාංකීය ගැමි සමාජයෙහි පවුල නමැති ඒකකය තුළ ද අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ හුරුවක් පාරම්පරික වශයෙන් ලැබී ඇත. පවුලක ගෘහමූලිකයාට ලැබෙන ආදායම සහ වියදම පිළිබඳ පවුලේ සාමාජිකයන් හට අවබෝධයක් ඇත. සැමියාට ලැබෙන මාසික ආදයම බිරිය නොදන්නා කුටුම්භයක යහපැවැත්ම (යහපාලනය) අර්බුදයට ලක්වේ. මේ නිසා පවුල තුළ ස්වභාවයෙන්ම අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අභ්‍යාසය සිදුවේ.

**ලංකාවේ දේශපාලන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය**

කරුණු මෙසේ වුවද ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් ඇතැයි පිළිගැනීමට තරම් සාක්ෂි එම පක්ෂ විසින් සමාජයට ඉතුරුකර දී නොමැත. දක්ෂිණාංශික යැයි සලකන පක්ෂවලට මෙන්ම වාමාංශික පක්ෂවලට ද මේ යථාර්ථය පොදු ය.

/www.ft.lk



**සාමාජික මුදලේ සිට පක්ෂයට ලැබෙන සියලු මුදල් පිළිබඳ විස්තරය පක්ෂ සාමාජිකයන් වෙත දැනුවත් කළ යුතුයි. එහෙත් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ මේ සදාචාරාත්මක අයිතිය කොතෙක් ගරු කරනවාද යන්න විමසා බැලීම ඉතාම වැදගත් ය.**

වෙනසකින් පසු අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පක්ෂ අතර ඇති වේද.....

රටක ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම තහවුරු කිරීම සඳහා දායකවීම දේශපාලන පක්ෂයක මූලික වගකීමයි. දේශපාලන පක්ෂයක් යනු ක්‍රියාකාරී සිවිල් පුරවැසියන්ගේ එකමුතුවකි.

යම් රටක ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ වගකීම ඉටු කළ හැකි වන්නේ දේශපාලන පක්ෂ තුළ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළ විට පමණි. කකුළුවා ඇදේට ගමන් කරමින් සෙස්සන්ට කෙළින් යන්නට උපදෙස් දීමේ නිරර්ථක බව පිළිබඳ ජනවේදයෙහි සඳහන් වේ. එහෙත් අප රටේ සියලුම දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කෙතරම් ජප කළත් එම පක්ෂවල අභ්‍යන්තර ප්‍රජතන්ත්‍රවාදයක් දක්නට නොවීම සහ ඒ පිළිබඳ කතිකාවතක් ගොඩ නැගීමෙන් බැහැර වීමට ප්‍රවේශම් සහගත වීම අපට නිරීක්ෂණය කළ හැකිය.

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ පිළිබඳ මහජනයා තුළ විස්මිත හැඟීම් ඇතිවන සමයක් වන්නේ විවිධ මැතිවරණ පැවැත්වෙන කාල පරිච්ඡේදයයි. එහිදී වියදම් කරන මුදල් සම්භාරය දකින විට ඒවා කොහෙන් පහළ වුණාද යන විමතිය ඇතිවීම ස්වාභාවිකය. මැතිවරණයක දී අත දිගහැර වියදම් කිරීම සඳහා පක්ෂයේ නායකයා හෝ නායිකාව විසින් සංවිධායකවරයාට විශාල වශයෙන් මුදල් ලබාදීම සිරිතකි. දේශපාලන පක්ෂයන්හි අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම උදෙසා ගත යුතු ක්‍රියාමාර්ගයන් බොහෝ ය. ඒ අතර දේශපාලන පක්ෂවල වගකීම් කීපයකි.

**1. තම දේශපාලන පක්ෂයේ සාමාජිකයන් නිරන්තරයෙන් දැනුවත් කිරීම**

පක්ෂයේ ඉහළ සිට පහළටත් පහළ සිට ඉහළටත් විවෘත සංවාදයන් පැවැත්විය යුතු ය. පක්ෂය ගනු ලබන තීන්දු තීරණ පිළිබඳව සාමාජිකත්වය නිරන්තරයෙන් ම දැනුවත් කළ යුතුයි. ඔවුන්ගේ මත විමසුම කළ යුතුයි.

**2. පක්ෂයේ අරමුදල් පිළිබඳ විනිවිදභාවයකින් කටයුතු කිරීම**

සාමාජික මුදලේ සිට පක්ෂයට ලැබෙන සියලු මුදල් පිළිබඳ විස්තරය පක්ෂ සාමාජිකයන් වෙත දැනුවත් කළ යුතුයි. එහෙත් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ මේ සදාචාරාත්මක අයිතිය කොතෙක් ගරු කරනවාද යන්න විමසා බැලීම ඉතාම වැදගත් ය.

මෙසේ ලබා දෙන මුදල් ප්‍රමාණය හා ඒවා වියදම් කෙරෙන ආකාරය පිළිබඳ එම පක්ෂවල සාමාජිකයෝ කිසිවක් නොදනිති. ඒවා "දේව රහස්" බවට පත්වේ. එහෙත් ඒ පිළිබඳ දැනුවත්වීම පක්ෂ සාමාජිකයාගේ අයිතියකි. එම අයිතිය පිළිබඳ පක්ෂ සාමාජිකයන් දැනුවත් කිරීම කළ යුත්තේ ද දේශපාලන පක්ෂ විසිනි.

දේශපාලන පක්ෂවලට දේශීය හා විදේශීය වශයෙන් මූල්‍යාධාර ලැබෙයි. ඒවා විවිධ අවස්ථාවල වියදම් කරනු ද පෙනෙයි. එහෙත් මේ පිළිබඳ වාර්ෂික අයවැය ලේඛනයක් හෝ විගණන වාර්තාවක් ඉදිරිපත් නොකෙරේ. ඒ නිසා පක්ෂ සාමාජිකයෝ මේ අරමුදල් පිළිබඳ කිසිවක් නොදනිති.

**3. දේශපාලන ආර්ථික සංස්කෘතික ගැටළු ඒවා විසඳීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පක්ෂ සාමාජිකයන් අතර නිරන්තර කතිකාවක් ගොඩනැගි යුතු ය.**

රාජ්‍ය අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම, විවිධ ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීම, පාර්ලිමේන්තුව තුළට විවිධ අණ පනත් ගෙනඒම, මෙවැනි කාරණාවලදී පක්ෂ සාමාජිකයන්ට අවශ්‍ය දැනුම කඩිනමින් සැපයිය යුතුය. රට තුළ පවත්නා විවිධ දේශපාලන සාධකයන් පක්ෂයේ ඉහළ ස්ථරයේ සාකච්ඡාවන් පහළ මට්ටම දක්වා ගෙන ආ යුතුය. පක්ෂ සාමාජිකයන්ගේ අදහස් සහ ඔවුන්ගේ ආකල්පයන් ඉහළ මට්ටම වෙත ගෙන යා යුතුය.

www.demotix.com



නාමයෝජනා මණ්ඩලය වෙත හම්බන්තොට දිස්ත්‍රික් අපේක්ෂකත්වය ඉල්ලා පැමිණි නාමල් රාජපක්ෂ මහතා බර්ටි ප්‍රේමලාල් සහ සී. බී. රත්නායක මහත්වරුන් සමග

**සැබෑවටම නම් පළාත් පාලන ආයතන සඳහාත්, පළාත් සභා සඳහාත් පාර්ලිමේන්තුවටත් ආසන සංවිධායකන් තෝරා ගැනීම සිදුවිය යුත්තේ පක්ෂ සාමාජිකයන්ගේ බහුතර කැමැත්තෙනි. එහෙත් අද සිදුවන්නේ ඊට පිටස්තර දෙයකි.**

**4. පක්ෂ සාමාජිකයන්ගේ ශක්‍යතා හා නායකත්ව ලක්ෂණ හඳුනා ගනිමින් ඒවා වර්ධනය කිරීම හා අනුබල දීම**

පක්ෂ ගොඩනැගෙන්නේ විවිධ ශක්‍යතා ඇති පුද්ගලයන්ගෙනි. විවිධ නායකත්ව පුහුණු සහ වගකීම් පැවරීම තුළින් නායකත්වයන් හඳුනා ගැනීම දේශපාලන පක්ෂවල තිබිය යුතු ගුණාංගයකි. එවැනි නායකත්වයන් ඔසවා තැබීම වෙනුවෙන් දේශපාලන පක්ෂ වෙත සවිමත් යාන්ත්‍රණයක් තිබිය යුතුය.

**5. පක්ෂ සාමාජිකයන්ගේ සක්‍රීය දායකත්වය ලබාගැනීම**

සෑම දේශපාලන පක්ෂයකම මධ්‍යම කාරක සභාව, විධායක සභාව, නායකත්ව මණ්ඩලය, කෘත්‍යාධිකාරී මණ්ඩලය, උත්තරීතර මණ්ඩලය යනාදී ප්‍රමුඛ මට්ටමේ දේශපාලන පක්ෂවල කණ්ඩායම් සිටිති. මොවුන් ගන්නා තීන්දුවලට පක්ෂ සාමාජිකයන්ට සිදු වී තිබෙන්නේ හිස නමා අනුමත කිරීම පමණකි. ඇතැම් විට ඒ කිසිවක් පිළිබඳ ඔවුන් නොදනිති. මෙය ප්‍රජාතන්ත්‍රවාදයට මුළුමණින්ම පටහැනි ක්‍රියාවලියකි.

උදාහරණයකට පළාත් පාලන ආයතනයට හෝ පළාත් සභාවලට හෝ පාර්ලිමේන්තුවට නියෝජනය සඳහා තරග වදින අපේක්ෂකයන් තෝරාගැනීම සිදුවන්නේ අප ඉහතින් කී අන්දමේ සීමිත කණ්ඩායමක් හෝ පක්ෂ නායකත්වය විසිනි.

සැබෑවටම නම් පළාත් පාලන ආයතන සඳහාත්, පළාත් සභා සඳහාත් පාර්ලිමේන්තුවටත් ආසන සංවිධායකන් තෝරා ගැනීම සිදුවිය යුත්තේ පක්ෂ සාමාජිකයන්ගේ බහුතර කැමැත්තෙනි. එහෙත් අද සිදුවන්නේ ඊට පිටස්තර දෙයකි. පක්ෂ නායකත්වය තෝරා ගැනීමේදී ද පක්ෂයේ මහා සම්මේලනය යොදා ගන්නා බව පෙනුණත් සාමාජික බහුතරයේ කැමැත්ත එයින් නියෝජනය වේද යන්න සැක සහිතය.

නියමිත කාලයට පක්ෂ සම්මේලනය කැඳවිය යුතුය. ආසන සංවිධායකවරුන් පත්කිරීම දිස්ත්‍රික් සම්මේලනයේ දී පක්ෂ සාමාජිකයන් විසින් සිදු කළ යුතුය. පක්ෂ නායකත්වය තීන්දු කළ යුත්තේ පක්ෂ සාමාජිකයන්ගේ ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්තෙන් පමණි.

**6. පක්ෂය ආණ්ඩු බලය ලබාගන්නා විටත් පක්ෂය තුළින් රට තුළ පුද්ගලයන්ට සමාන හා සාධාරණ අවස්ථා ලබාදීම**

විනිවිද භාවයකින් යුතුව ආණ්ඩු බලය ලැබීමේදීත් අන් අවස්ථාවන්හි දී සමාජ සාධාරණත්වය පදනම් කරගනිමින් පක්ෂ සාමාජිකයන්ට නිසි අවස්ථාවන් හි නිවැරදි තීන්දු ගැනීම හා ඔවුන්ගේ සහාය රටේ සංවර්ධනයට භාවිතා කිරීම ද පක්ෂ විසින් කළ යුතුයි.

පවත්නා මැතිවරණ ක්‍රමය හා රටේ දේශපාලන සංස්කෘතියෙහි ස්වභාවය අනුව සමාජ බලය හා මුදල් බලය අසීමිත වශයෙන් හිමි අපේක්ෂකයෝ වැඩි ඡන්දයෙන් ඉදිරියට එති. එම බලය අවම වශයෙන් ඇති අපේක්ෂකයා දේශපාලනය සඳහා කෙතරම් සුදුසුකම් සපුරා ඇතත් ඔහුට හෝ ඇයට බහුතර ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීම අසීරු වෙයි. මෙයද ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරකි. මේ හේතුව නිසා කළු සල්ලිකාරයන්ට හා නොයෙකුත් දූෂණවලට සම්බන්ධ වූවන්ට මහජන නියෝජිතයන් හැටියට බෞතීස්ම ලැබීමේ අවස්ථාව හිමි වේ. යහපාලනය හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ සැබෑ වුවමනාව ඇති සමාජ සංවේදී ක්‍රියාකාරිකයන් හට මහජන නියෝජිතයන් ලෙස පත්වීමේ අවස්ථාව අහිමි වේ. විශේෂයෙන්ම බුද්ධිමතුන් සුළුතරයක් සහ විවිධ විෂමතාවන්ගෙන් මුදල් උපයා ගන්නා කණ්ඩායමක් සහිත ව්‍යවස්ථාදායකයක ක්‍රියාකාරීත්වය ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය අනතුරට හෙළීමේ මර්මස්ථානය බවට පත්වෙයි.




**ලංකාවේ දේශපාලනඥයන්ට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය තම ජීවන දර්ශනය තුළ අන්තර්ගත වී නැත. මන්ද ඔහු හෝ ඇය තම නියෝජනය ලබාගෙන ඇත්තේ පක්ෂයේ ඉහළ නායකත්වය මගිනි. එවිට පක්ෂ සාමාජිකයන්ගේ සහාය ඔවුන්ට අවශ්‍ය වන්නේ ඡන්දයක් දිනීමට පමණි. මේ සංස්කෘතිය ප්‍රජාතන්තවාදය පිළිබඳ සංකල්පයට පටහැනි ය.**

### ස්වාධීන මැතිරවණ කොමිෂන් සභාව සතු බලතල පුළුල් විය යුතුයි

ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමේ දී මෙම කරුණු පිළිබඳව ද අවධානය යොමු කිරීම අතිශයින් වැදගත් වේ. මැතිවරණයක දී ඒ ඒ අපේක්ෂකයන්ට මුදල් වියදම් කිරීමේ සීමාවක් පැනවිය යුතුය. එමෙන්ම දේශපාලන පක්ෂ වල අරමුදල් පවත්වාගෙන යෑමේ විනිවිද භාවයක් තිබීම පිළිබඳව වගවීමේ නියාමනයක් මැතිවරණ කොමිෂන් සභාවකින් අපේක්ෂා කළ යුතුය.

පළාත් පාලන මැතිවරණයක දීත්, පළාත් සභා මැතිවරණයක දීත්, පාර්ලිමේන්තු මැතිවරණයක දීත්, එක් අපේක්ෂකයකුට වියදම් කළ හැකි උපරිම මුදල පිළිබඳ මැතිවරණ කොමිසම විසින් නියාමනයක් කළ යුතුයි.

පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළහැකි මගක් වන්නේ මැතිවරණ කොමිසම බලගැන්වීම ඔස්සේ දේශපාලන පක්ෂවල ප්‍රජාතන්ත්‍ර විරෝධී කටයුතු පාලනය කිරීමේ හැකියාව එයට ලබා දීමෙනි.

හුදෙක් මැතිරවණ කොමිෂන් සභාව ස්ථාපිත කිරීම පමණකින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වන්නේ නැත. එබැවින් දේශපාලන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සිදුවෙන්නේ දැයි නියාමනයක් කිරීමට මැතිවරණ කොමිසමට යාන්ත්‍රණයක් තිබිය යුතුයි. එය නීතියෙන් බලගැන්විය යුතුයි.

පක්ෂ ව්‍යවස්ථාව නොසලකා කටයුතු කරන දේශපාලන පක්ෂවලට මෙරට වැසියාගේ අවශ්‍යතා තේරුම් ගත හැකි වේද ? මෙය අශෝභන තත්ත්වයකි. දියුණු රටවල දේශපාලන පක්ෂ ක්‍රියාත්මක වන්නේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමිනි. 1980 වසරේ ඉන්දියාවේ කොංග්‍රස් පක්ෂයේ සිටි ජ්‍යෙෂ්ඨතම සහ බහුජන කැමැත්ත දිසා සිටි නායිකාව වූයේ ඉන්දිරා ගාන්ධිය. ඇගේ නම පක්ෂ නායකත්වයට යෝජනා වෙද්දී වෙනත් නම් තිබේදැයි මුලසුන සභාවෙන් විමසා සිටියේ ය. එහෙත් වෙනත් නම් යෝජනා වූයේ නැත. වරක් ඔස්ට්‍රේලියාවේ අගමැති බලයේ සිටියදීම ඔහු පක්ෂයෙන් ඉවත් කිරීමට ඔහු අයත් දේශපාලන පක්ෂය කටයුතු කළේය. බලයේ සිටින දේශපාලන පක්ෂය විරුද්ධ මත දරන දේශපාලන පක්ෂ දුර්වල කිරීම සඳහා යටිකූට්ටු වැඩ කිරීම නොදියුණු දේශපාලන ලක්ෂණයකි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් බා ගැනීම සඳහා මුදල් හෝ වෙනත් වරදාන ලබා දීමද හීතියට පත් කිරීම ද නොදියුණු ලක්ෂණයකි. ප්‍රජාතන්ත්‍ර විරෝධී පුරුද්දකි.

අප රටේ දේශපාලන සංස්කෘතියෙහි අටුවම් බැස තිබෙන මෙවැනි අංග මුළුමණින්ම ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට ලක් කරයි.

ලංකාවේ දේශපාලනඥයන්ට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය තම ජීවන දර්ශනය තුළ අන්තර්ගත වී නැත. මන්ද ඔහු හෝ ඇය තම නියෝජනය ලබාගෙන ඇත්තේ පක්ෂයේ ඉහළ නායකත්වය මගිනි. එවිට පක්ෂ සාමාජිකයන්ගේ සහාය ඔවුන්ට අවශ්‍ය වන්නේ ඡන්දයක් දිනීමට පමණි. මේ සංස්කෘතිය ප්‍රජාතන්තවාදය පිළිබඳ සංකල්පයට පටහැනි ය.

ආණ්ඩු වෙනසකින් පසුව නව දේශපාලන සංස්කෘතියක මුල් බීජ වපුරමින් සිටින මෙසමයෙහි යහපාලනයෙහි පදනම හැටියට පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ කතිකාවතක් ගොඩ නගමු. ●





ආචාර්ය
**නිර්මාල් රංජිත් දේවසිරි**

ජවිපෙ සමරු රැස්වීමක්

# පාලක ප්‍රභූන්ට මගහැරිය නොහැකි ප්‍රතිසංස්කරණ කිහිපයක්

දේශපාලනයේ දි මිනිසුන් ගේ ආචාරධාර්මික හැසිරීම අමතර සාධකයක් විය හැකි නමුත් ඒවා මත විශ්වාසය තබා කටයුතු කිරීම යථාර්ථවාදී නොවේ. ඇත්ත වශයෙන්ම පවතින දේශපාලනයේ ද (Actually-Existing Politics) මිනිසුන් පොදු යහපතට අනුකූල යැයි සැලකෙන යම් යම් දේ කරන්නේ, බොහෝ විට, හොඳ නරක පිළිබඳ, එසේත් නැතිනම් සාදාචාරවාදී, මිණුම් දඬු මත පිහිටා නොව නොකර බැරි තත්ත්වයක් ඇති වන්නේ නම් පමණි. උදාහරණයක් ලෙස මෛත්‍රීපාල සිරිසේන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නේ හෝ සංශෝධනය කරන්නේ නම් එය එසේ කිරීම තේරුම් ගත යුත්තේ ඔහු හොඳ මිනිසෙක් නිසා එසේ කරන්නේද යන දෘෂ්ටි කෝණයෙන් නොවේ. අප ඒ දෙස බැලිය යුත්තේ පවතින තත්ත්වයන් යටතේ ඔහුට එසේ කිරීමට බල කෙරෙන්නේ මන් ද යන කාරණය ආශ්‍රයෙනි.



**1994 දී ඉදිරිපත් කළ කම්කරු ප්‍රඥප්තිය මේ වෙනස තේරුම් ගැනීමට හොඳ උදාහරණයකි. එම ප්‍රඥාප්තිය නීතියක් බවට පත්කර ගැනීමට නොහැකි විය.**

කම්කරුවන් සැමදා සටනේ....

1994 දී ඉදිරිපත් කළ කම්කරු ප්‍රඥප්තිය මේ වෙනස තේරුම් ගැනීමට හොඳ උදාහරණයකි. එම ප්‍රඥාප්තිය නීතියක් බවට පත්කර ගැනීමට නොහැකි විය. කම්කරු ප්‍රඥප්තිය නීතියක් බවට පත් කළේ නම් ආණ්ඩුවට සමාජයේ හොඳ නම දිනාගන්නට ද හැකි වන්නට තිබුණි. නමුත් ආණ්ඩුවට සහයෝගය දැක් වූ හාම්පුතුන්ගේ සම්මේලනය වැනි සංගත ප්‍රභූහු එයට විරුද්ධ වූහ. ආණ්ඩු රඳා පවතින්නේ ඒ අයගේ (ද) සහයෝගය මත ය. ඒ සහයෝගය අහිමි වුවහොත් ආණ්ඩුවට පැවතීමට නොහැක. එහෙයින් මහජන අපේක්ෂාවට පිටු පෑමට ආණ්ඩුවට සිදු වේ. මහජනය මතය යන්න ආණ්ඩුවක පැවැත්මේ එක් සාධකයක් පමණක් වන අතර ඕනෑම ආණ්ඩුවකට බලපෑම් කරන විවිධ පිරිස් සිටිති. ව්‍යාපාරික පංතිය වැනි විවිධ අභිලාෂ කණ්ඩායම් ද මේ අතර සිටී.

**බලතුලනය සහ ප්‍රතිසංස්කරණ**

කෙසේ නමුත් මා කල්පනා කරන ආකාරයට මේ අවස්ථාවේදී ජනාධිපතිවරයාගේ බලතල අඩුකිරීමට බලකෙරී තිබේ. පොරොන්දු වූ ආකාරයට ම එය සිදු නොවුවත් පෙනෙන විදිහට සංශෝධනය වූ පසු ඇතිවන්නේ මේ පැවති ජනාධිපති ධුරයම යැයි කිව නොහැක. මේ වෙනස් කිරීම මේ නිශ්චිත මෙහොතේ දී සිදුකිරීමට බල කෙරී ඇත්තේ මේ මොහොතේ පවතින දේශපාලන බලතුලනයේ ඇතැම් පාර්ශ්වවල බලපෑම නිසා ය.

මේ මෙහොතේ දේශපාලන බලතුලනය මූලික වශයෙන් ප්‍රභූ දේශපාලනයේ ක්‍රීඩකයින් සිවු දෙනෙකුගේ ක්‍රියාකාරකම් හා අභිලාෂ මත රඳාපවතී. එනම් චන්ද්‍රිකා, මෛත්‍රීපාල, රනිල් සහ චම්පික ලෙස එම ක්‍රීඩකයින් නම් කළ හැක. පාලක සන්ධානය පවතින්නේ මේ හතර දෙනාගේ ක්‍රියාකාරකම් හා අභිලාෂයන්හි සමතුලනය මත ය. ජනවාරි 9 වෙනි දිනට කලින් පැවති ආණ්ඩුව තුළ පැවැතියේ ඒක කේන්ද්‍රීය බල සැකැස්මකි. එනම් රාජපක්ෂලා ප්‍රමුඛව ගොඩනැගුණු සන්ධානයකි. නමුත් මෛත්‍රීපාල සිරිසේනගේ ජයග්‍රහණයත් සමග තත්වය වෙනස් විය. කිසියම් ආකාරයකට මේ සන්ධානය නොයෙක් අංගයන්ගෙන් වෙනස් වන අතරම සමාන මට්ටමකින් පවතින බල කේන්ද්‍ර සතරක් තිබේ. මේ සිව් දෙනා අතර සමතුලිතතාව කිසියම් හෙයකින් බිඳවැටුණොත් මේ පාලක සන්ධානය බිඳ වැටීමට පුළුවන.

මෙහි දී විශේෂයෙන් රනිල් වික්‍රමසිංහට ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කිරීම අනිවාර්ය යෙන් ඔහුගේ පැවැත්ම සඳහා ම අවශ්‍ය වන්නකි. අනික් අයට එම බලතල අඩු කිරීම එතරම්ම අවශ්‍ය වන්නේ නැත. දේශපාලන උපක්‍රමික පැත්තෙන් ගත් කල චන්ද්‍රිකාට සහ මෛත්‍රීපාලට එය අඩු කිරීම අවශ්‍යතාවක් තිබිය නොහැක. දීර්ඝ කාලීන වශයෙන් ගත් කල මේ රටේ රාජ්‍ය නායකයා වීමට අපේක්ෂා කරන චම්පිකට ද එය ඉවත් නොකිරීම ප්‍රශ්නයක් නොවේ. තමන්ට බලය ලැබුණු පසු මේ ක්‍රමය තබාගැනීමට කැමති වුවත් මේ මොහොතේ පවතින බලතුලනය තුළ රනිල්ගේ අපේක්ෂාව වන්නේ අග්‍රාමාත්‍ය තනතුරේ රැඳී සිටීම සහ එය ශක්තිමත් කිරීමය.

අග්‍රාමාත්‍ය තනතුරේ දිගටම රැඳී සිටීමට නම් ජනාධිපති තනතුරේ බලය අඩු විය යුතු ය. ඒ නිසා එය නොකර මගහැර සිටීමට නොහැක. එහෙයින් මා කල්පනාකරන ආකාරයට විධායක ජනාධිපති ක්‍රමය ඉවත් කිරීම වැළැක්විය නොහැක. මේ සඳහා පවතින පරිබාහිර සාධක ද නිශේධනාත්මක නැත. අවශ්‍ය කරන ජනමතය තිබෙන අතරම පාර්ලිමේන්තුව පවා එයට විරුද්ධ වේ යැයි සිතිය නොහැක. ඒ බැවින් පැවති ජනාධිපති ක්‍රමය ඉවත් කිරීම එතරම් කරදර විය යුතු දෙයක් ලෙස මා සළකන්නේ නැත.

www.tamildiplomat.com



**මේ මෙහොතේ දේශපාලන බලතුලනය මූලික වශයෙන් ප්‍රභූ දේශපාලනයේ ක්‍රීඩකයින් සිවු දෙනෙකුගේ ක්‍රියාකාරකම් හා අභිලාෂ මත රඳාපවතී. එනම් චන්ද්‍රිකා, මෛත්‍රීපාල, රනිල් සහ චම්පික ලෙස එම ක්‍රීඩකයින් නම් කළ හැක.**

යහපාලනයේ ක්‍රීඩකයෝ.....

කොමිෂන් සභා පිළිබඳව ද එතරම් ප්‍රශ්නයක් වේ යැයි සිතීමට සාධක නැත. දැනට තිබෙන ආකාරයට යහපාලනය වැනි දේ පොදු ජනයාට මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට ද අවශ්‍යව ඇත. ඒ අයටත් ව්‍යාපාර කිරීමේ දී අධික කොමිස් ගෙවීමට පමණක් නොව තම ව්‍යාපාර පවත්වාගෙන යන විට දේශපාලනඥයින්ගේ බලපෑම්වලට මුහුණ දීමට සිදුවේ. යහපාලනය යන සටන් පාඨයට වැඩියෙන්ම ඉල්ලුමක් තිබුණේ ඒ අයගෙනි. ඡන්ද දීමේ රටාව අනුවත් එය පැහැදිළි ය. ඒ නිසා කොමිෂන් සභා ඇති කිරීම ද ප්‍රශ්නයක් නොවේ.

**මැතිවරණ ක්‍රමය**

නමුත් යෝජිත මැතිවරණ ක්‍රමයේ සංශෝධනය පහසු එකක් නොවන බව පෙනේ. පවත්නා තරගකාරී දේශපාලනය තුළ සමානුපාතික මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම පහසු යැයි කිව නොහැක. ජනතා විමුක්ති පෙරමුණ වැනි දේශපාලන පක්ෂ ද එවැන්නකට කැමති වන්නේ නැත. මෙය වඩාත් සංකීර්ණ ප්‍රශ්නයකි. සමානුපාතික නියෝජන ක්‍රමය තුළ වැඩියෙන් විරෝධය ඇත්තේ මනාප ක්‍රමයට වුවත් මේ ක්‍රමය මනාප ක්‍රමය නැතිව තබාගැනීම අසීරුය. සමානුපාතික ක්‍රමය හඳුන්වා දෙන විට මනාප ක්‍රමය තිබුණේ නැත. සමානුපාතික ක්‍රමය තබාගෙන මනාප ක්‍රමය අහෝසි කිරීමට මා ද එකඟ ය. එසේ වුව ද සමානුපාතික ක්‍රමය මනාප ක්‍රමය නොමැතිව එය ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු ගණනාවක් මතු වේ. මනාප ක්‍රමය රහිත සමානුපාතික නියෝජන ක්‍රමයක් තිබෙන විට අපේක්ෂක ලැයිස්තුව සැකසෙන්නේ අකාරාදිය පිළිවෙලට නොව පක්ෂ ලේකම්වරයා ඇතුළු පක්ෂ නායකත්වයේ කැමැත්තට අනුව ය. ලැයිස්තුවේ සිටින සියලුම අපේක්ෂකයින් තේරීපත් නොවන හෙයින් ලැයිස්තුවේ පහළින් සිටින අයට මැතිවරණ ව්‍යාපාරයේ නියැලෙන්නට පුද්ගලික උනන්දුවක් ඇති නොවේ. එපමණක් නොව ආයාසයකින් තොරව පත්වන බව දන්නා බැවින් ලැයිස්තුවේ ඉහළින් සිටින අය ද මැතිවරණ ව්‍යාපාරයේ නියැලීමට උනන්දුවක් නොදැක්වීමට ඉඩ තිබේ.

වර්තමානයේ ප්‍රධාන පක්ෂවලට අදාළව ගත් කල පක්ෂ මැතිවරණ ව්‍යාපාරය කියා දෙයක් නැත. එය තිබෙන්නේ තනි තනි අපේක්ෂකයින්ගේ පුද්ගලික මැතිවරණ ව්‍යාපාර ලෙසට ය. මේ නිසාම තමන් ජයගැනීමේ අරමුණ ඇතිව මැතිවරණ ව්‍යාපාරය පුද්ගලයින් දියත් කරන විට පක්ෂයට ප්‍රථමයෙන් ඡන්දය දිය යුතු හෙයින් අනිවාර්යයෙන් පක්ෂයත් දිනවීමට ක්‍රියා කෙරේ. එය නැතිවුවහොත් මැතිවරණ ව්‍යාපාරය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇතිවේ.

යෝජනාකර ඇති මිශ්‍ර ක්‍රමය වුවත් ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂයකට ඉතාමත් අවාසි සහගත ය. දැනට තිබෙන ආකාරයට ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂයකට සැළකිය යුතු නියෝජනයක් ලැබෙන්නේ සමානුපාතික ක්‍රමය නිසා ය. ජනතා විමුක්ති පෙරමුණට බොහෝ විට ආසනයක් ලැබෙන්නේ අර සාමාන්‍ය ජනවහරේ ඇති "කොටේ" යන කොටසෙනි. නමුත් මිශ්‍ර ක්‍රමය තුළ ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂයකට ඒ අය ලබන ඡන්ද ප්‍රමාණයට සමානුපාතික නියෝජනයක් නොලැබෙන්නට ඉඩ තිබේ.

දැන් පවතින සමානුපාතික ක්‍රමයේ ආරම්භයේදී සළුවීම සඳහා 12% ක් ගතයුතුව තිබුණි. එය අඩු කරගනු ලැබුයේ අෂ්රොෆ් ප්‍රේමදාස සමග ඇතිකරගත් එකඟතාවක ප්‍රතිඵලයක් වශයෙනි. සාමාන්‍යයෙන් ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂයකට 12% ක් ගැනීම පහසු නැත. මේ නිසා ක්‍රියාත්මක වශයෙන් ගත් කල සමානුපාතික ක්‍රමයේ මූලික අරමුණ ඉවත් වී ප්‍රධාන පක්ෂ දෙකට වඩාත් වාසි තත්වයක් ඇතිවීමට තිබෙන ඉඩකඩ ඉහළය.

www.dailynews.lk



**අග්‍රාමාත්‍ය තනතුරේ දිගටම රැඳී සිටීමට නම් ජනාධිපති තනතුරේ බලය අඩු විය යුතු ය. ඒ නිසා එය නොකර මගහැර සිටීමට නොහැක.**

ඉදිරිය කුමක් වේද?

මෙයින් වාසියක් ලැබෙන්නේ නම් එය අත්කර ගන්නේ දෙමළ ජාතික සංධානය වැනි ප්‍රදේශ කේන්ද්‍රීය පක්ෂ ය.

මෙහිදී ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන සාධකයක් ලෙස සැලකිය යුත්තේ මන්ද යන්න යමෙකු ප්‍රශ්න කළ හැක. මගේ මතයට අනුව නම් ජනතා විමුක්ති පෙරමුණ මේ මොහොතේ සැළකිල්ලට ගතයුතු ප්‍රධාන සාධකයකි. මේ අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණට පාර්ලිමේන්තුවේ සැලකිය යුතු නියෝජනයක් නොලැබෙන තත්වයන් ඇතිවීම අතිශයින් නිෂේධාත්මක තත්ත්වයකි. වර්තමානය තුළ යහපාලන දෘෂ්ටිවාදය ඉතාමත්ම ශක්තිමත්ව නියෝජනය කරන්නේ ජනතා විමුක්ති පෙරමුණය. එම පක්ෂය මා දකින්නේ සමාජවාදි පක්ෂයක් ලෙස නොව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් ලෙසටය. මේ මොහොතේ ලංකාවේ මහජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂය නියෝජනය වන්නේ එම පක්ෂය තුළිනි. එය අතීතයේ දී සමසමාජ පක්ෂය විසින් ඉෂ්ට කරනු ලැබුවා වූ වැනි කාර්යයකි.

**නියෝජන ක්‍රමයේ උභතෝකෝටිකය**

වර්තමාන කතිකාව තුළ ජනාධිපති ක්‍රමයට සාපේක්ෂව මැතිවරණ ක්‍රමය ගැන ගැඹුරු සාකච්ඡාවක් දක්නට නැත. අප දන්නා ආකාරයට ඉන්දියාව, එංගලන්තය වැනි කේවල ඡන්දදායක කොට්ඨාස ක්‍රමය තිබෙන රටවල සාමාන්‍යයෙන් කුමන අවස්ථාවක වුවත් ජය ලබන පක්ෂය ආසන සියල්ලම අත්පත් කරගන්නේ නැත. මෙවර ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂයට විශාල ජයග්‍රහණයක් ලැබුණේ වී නමුත් කොන්ග්‍රස් පක්ෂයට ද ආසන එකසිය ගණනක පමණ ප්‍රමාණයක් ලැබී තිබේ. ලංකාවේ එසේ වන්නේ නැත. ඊට හේතුව පක්ෂ කෙරෙහි ඡන්ද දායක ආකර්ශනය එකිනෙක පක්ෂ කෙරේ යොමුවන ආකාරයේ ඇති ව්‍යුහාත්මක අසමානතාවන්ය. ඉන්දියාව, එංගලන්තය වැනි රටවලට සාපේක්ෂව ලංකාවේ ප්‍රධාන පක්ෂ දෙකට ඇති ඡන්ද දායක ආකර්ශනය යම් යම් ව්‍යතිරේක තත්වයන්ට යටත්ව පක්ෂ දෙකේ ක්‍රියාකාරිත්වය පවත්නා සමස්ත ප්‍රදේශය පුරාම විහිදී ඇත. මේ නිසා එක් පක්ෂකට වාසි සහගත ලෙස ඇති වන ඡන්ද දායක පක්ෂපාතිත්වයේ වෙනස් වීමක්, නැතහොත් සාමාන්‍ය ව්‍යවහාරයේ ප්‍රකාශ කරන ආකාරයට 'රැල්ලක්' නිසා එක් පක්ෂයක පාර්ලිමේන්තු නියෝජනයේ ප්‍රමාණය සහ එහි සමස්ත ඡන්දදායක ආකර්ශනයේ ප්‍රමාණය අතර අසමමිතිකතාවයක් ඇතිවීමට ඇති ඉඩ විශාලවේ.

ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ කේවල ක්‍රමය තුළ විරුද්ධ පක්ෂයට ඉතා සුළු ආසන සංඛ්‍යාවක් ලැබුණු අවස්ථා සුලභ ය. 77දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලැබුණේ ආසන අට කි. කේවල ක්‍රමයට පැවැත්වූයේ නම් පසුගිය කාලයේ තිබූ මැතිවරණවල දී එජාපයට පාර්ලිමේන්තු ආසන විශාල සංඛ්‍යාවක් අහිමිවන තත්ත්වයක් තිබුණි. ඉන්දියාවේ සහ එංගලන්තයේ ඒ ඒ ප්‍රදේශවල එක් එක් පක්ෂවලට ඡන්දය දෙන පිරිසක් වෙන් වෙන්ව සිටී. ලංකාවේ තිබෙන්නේ එසේ නොව සෑම ගමක ම පවා ඡන්ද බෙදී තිබේ. එබැවින් එක් පැත්තකට බලය යනවිට අනික් පක්ෂය සේදී යයි.

සිය ප්‍රායෝගික ජීවිතයේ පුද්ගලික අවශ්‍යතා ඉටුකර ගැනීමට ඡන්දය දෙන අතරම පොදු යහපත පිළිබඳව සලකා බැලීමේ නැඹුරුවක්ද මිනිසුන් තුළ පවතී. 2004 මැතිවරණයේ දී සන්ධානගත වී ඡන්දය ඉල්ලූ ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකයින්ට සෑම තැනකදීම වැඩිම මනාප ගැනීමට හැකිවූයේ එහෙයිනි. දෛනික ජීවිතයේ ප්‍රායෝගික අවශ්‍යතා සඳහා එක් දේශපාලනඥයෙකුට මනාපය දෙන අතරේම පොදු යහපත වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණට ද මනාපයක්

www.anfrel.org



රාජගිරිය - මැතිවරණ මහලේකම් කාර්යාලය

**නමුත් යෝජිත මැතිවරණ ක්‍රමයේ සංශෝධනය පහසු එකක් නොවන බව පෙනේ. පවත්නා තරගකාරී දේශපාලනය තුළ සමානුපාතික මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම පහසු යැයි කිව නොහැක.**

ලබාදුන්හ. නමුත් ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජනතා සන්ධානයෙන් ඉවත් වූ පසුව මෙම හැකියාව අහිමි වේ.

අතීතයේදී සමසමාජ නායකයින් සම්බන්ධයෙන්ද ඡන්දදායකයා තුළ මීට සමාන ප්‍රවේශයක් දක්නට ලැබුණි. දෛනික ජීවිතයේ ප්‍රායෝගික අවශ්‍යතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැනි පක්ෂවලට ඡන්දය දෙන අතරම වාමාංශික නායකයින් සම්බන්ධව සාධනීය ආලක්පයක්ද ජනයා තුළ විය. නමුත් ඡන්දය දීමට අවශ්‍ය විය. ජනතා විමුක්ති පෙරමුණ ඉදිරියේ දී සහාග දේශපාලනයට නොයන බවට තීරණයක් ගෙන ඇත. එවිට ඒ අය තරග කරන්නේ තනිවම ය. එසේ තනිවම තරඟ කරන විට ජනතා විමුක්ති පෙරමුණට ඡන්දයක් දෙන්නේ කෙසේද යනුවෙන් ඡන්ද දායකයාට ප්‍රශ්නයක් මතුවේ. මෙහිදී ජනතාවගේ ඡන්දය දීමේ තීරණය ගැනෙන්නේ ජනතා විමුක්ති පෙරමුණට අවාසිදායක ආකාරයට වීමට වැඩි ඉඩක් තිබේ.

අනුර කුමාර දිසානායක ජනප්‍රිය දේශපාලනඥයෙකු බවට අද මතයක් තිබේ. හේ සැබෑ විපක්ෂ නායකයා බව ඇතැමෙක් කියති. නමුත් ඡන්දදායක ආකර්ශනය තුළ ඒ ජනප්‍රියකම ඒ ආකාරයටම නියෝජනය නොවනු ඇත. ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දෙන්නේ සිය දෛනික ජීවිතයේ ප්‍රායෝගික අවශ්‍යතා කැප කිරීමට හිත හදා ගන්නා අය පමණි. යෝජිත මිශ්‍ර ක්‍රමය නිසා ජවිපෙට ලැබෙන ආසන ප්‍රමාණය තවත් අඩුවීමට ඉඩ තිබේ. ඒ අඩුවීම නිසා එම පක්ෂය බොහෝ දුරට මැතිවරණ දේශපාලනයෙන් විතැන්වීමට ඇති ඉඩකඩ වැඩි වේ. එය එතරම් යහපත් දෙයක් නොවේ. මෙය ජනතා විමුක්ති පෙරමුණ ගැන සිතීමක් පමණක්ම නොවේ. එය ලංකාවේ දේශපාලනයේ දී සැළකිල්ලට ගතයුතු කරුණකි. විශේෂයෙන්ම අප ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ගැන සිතන්නේ නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂයෙන් පොදු මහජන අභිලාෂයන් නියෝජනය වීමක් සිදු නොවේ. ජනතා විමුක්ති පෙරමුණ ද ප්‍රභූ මට්ටමට ළඟාවී ඇතත් අර පක්ෂ දෙකට වඩා තවමත් කිසියම් දුරස්ථ භාවයක් ඇත. මේ නිසා ජවිපෙ පාර්ලිමේන්තුවෙන් විතැන්වුව හොත් බොහෝ දුරට දූෂිත විභවයන් සහිත ප්‍රධාන පක්ෂ දෙකේ පිරිස් පමණක් පාර්ලිමෙන්තුට පැමිණේ. මෙය යහපත් තත්ත්වයක් නොවේ.

**ප්‍රභූ සහ නිර්ප්‍රභූ දේශපාලනය**

මේ ආණ්ඩුව යටතේ පවා බැරෑරුම් ආර්ථික ප්‍රතිසංස්කරණ වීමට ඇති හැකියාව අඩුය. මෙහි දී බදු ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය උදාහරණයක් ලෙස සලකා බැලිය හැක. ලංකාවේ බදු ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම බරපතල ප්‍රශ්නයකි. වක්‍ර බදු වෙනුවට සෘජු බදු අනුපාතය වැඩි කිරීම සඳහා වූ අවශ්‍යතාව මෙහි දී කේන්ද්‍රීය වේ. කෙසේ වෙතත් එවැනි රැඩිකල් බදු ප්‍රතිසංස්කරණයක් වෙත යොමුවීමට මේ ආණ්ඩුවට හැකියැයි මම නොසිතමි. ඒවා මේ ආණ්ඩුවේ බල තුලනය බිඳ දමන ආකාරයේ පියවර වීමට ඉඩ තිබේ.

මෙහිදී ලංකාවේ දේශපාලන තීරණ ගැනීමේ දී ප්‍රභූ පැලැන්තිය සතු ශක්තිය ඉතාම වැදගත් ය. 'මහජන අභිලාෂ' යන සාධකය වැදගත් වුවත් තීරණ ගැනීමේ දී මහජන අභිලාෂයන්ට වඩා දේශපාලන ප්‍රභූ තන්ත්‍රයේ අභිලාෂ තීරණාත්මක වේ. මේ මොහොතේ ඒ පරස්පරය ඉතාමත් ප්‍රබලව දැකගත හැක.

ලංකාවේ දේශපාලන ප්‍රභූ තන්ත්‍රය, මේ මොහොතේ ක්‍රියාත්මක වන ආකාරය අනුව, තුන් වර්ගයකට බෙදිය හැක. පළමුවෙනි වර්ගය වන්නේ කාලයක් තිස්සේ බලය අහිමි ව විරුද්ධ පක්ෂයේ සිටි ප්‍රභූ පිරිස යි. ඒ අය සිය අවස්ථාව දැන් අත්පත්කර ගනිමින් සිටී. 1977 ට පෙර තට්ටුමාරු ක්‍රමය ලෙස හැඳින්වූයේ මේ ආකාරයට වසර පහෙන් පහට එකිනෙක

www.newsfirst.lk



**දැන් පවතින සමානුපාතික ක්‍රමයේ ආරම්භයේදී සළුවීම සඳහා 12% ක් ගතයුතුව තිබුණි. එය අඩු කරගනු ලැබුයේ අෂ්රොෆ් ප්‍රේමදාස සමග ඇතිකරගත් එකඟතාවයක ප්‍රතිඵලයක් වශයෙනි.**

ආර්. ප්‍රේමදාස සහ අෂ්රොෆ්

ප්‍රභූ කණ්ඩායමට අවස්ථාව ලැබීමයි. 77 න් පසු ඒ අවස්ථාව ලැබුණේ දිගු කාලවලට පසුවයි.

දෙවැනි වර්ගය වන්නේ ආණ්ඩු වෙනස කිට්ටු වන විට කලින් ම එය අවබෝධ කොටගෙන වෙනසින් පසු පාලන තන්ත්‍රයේ ඉහළ තැන් අල්ලා ගැනීම අපේක්ෂා කරමින් දේශපාලන පක්ෂපාතිත්වය මාරුකරන අයයි. ඒ අයට ගිය වාරයේ මෙන්ම මේ වාරයේ ද ඇමතිකම් මෙන්ම වෙනත් නිලතනතුරු හිමි වී තිබේ. තුන් වැනි වර්ගය වෙනස සිදුවූවාට වූවාට පසු නොයෙක් සබඳතා මත තමන්ගේ පක්ෂපාතිත්වය මාරුකර නව පාලන තන්ත්‍රයට පක්ෂපාතීත්වය දක්වන් පිරිස්ය. මේ පිරිස් තුනටම පොදු ජන අභිලාෂයන්ට වෙනස්ව තමන්ටම අනන්‍ය වූ වෙනම අභිලාෂ තිබේ. මහජන අභිලාෂ සහ මේ පිරිසේ අභිලාෂ අතර පරස්පරයක් තිබේ. මේ පරස්පරය තුළ දැනට අර ප්‍රභූ තන්ත්‍රය බලවත් ය. තීරණ ගැනීමේ ක්‍රියාවලිය මෙහෙයවීමේ හැකියාව වැඩි වශයෙන් මේ අය සතුය. මෙය සැලකිල්ලට ගතයුතු කාරණයකි. මක් නිසා ද යත් මේ තීරණ ගැනෙන්නේ ඒ අයට අවශ්‍ය ආකාරයට ය.

ජනවාරි 8 වනදා සිදුවීම අඩු තීව්‍රතාවක් සහිත විප්ලවයක් ලෙසට (Low-Intensity Revolution) හැඳින්වීමට මම කැමත්තෙමි. ප්‍රංශ විප්ලවය, රුසියානු විප්ලවය වැනි දේ ඉහළ තීව්‍රතාවයෙන් යුතු විප්ලව (High-Intensity Revolution) ලෙස හඳුන්වන්නට පුළුවන. සාමාන්‍යයෙන් ඕනෑම විප්ලවයකින් පසුව එම විප්ලවය පසුපස ඇති ජනතා අපේක්ෂා සහ පශ්චාත් විප්ලවීය පර්යාය අතර පරස්පරතාවක් ඇතිවිය හැක. ජනවාරි 8 වෙනිදා ශ්‍රී ලංකාවේ ඇති වූවා වැනි පහළ තීව්‍රතාවකින් යුතු විප්ලවයකදී මෙවැනි පරස්පරතා වැඩිවීමට ඇති හැකියාව වැඩි ය. සාමාන්‍යයෙන් ඉහළ තීව්‍රතාවකින් යුතු විප්ලවවලදී පරාජය කරනු ලැබූ බලවේග මත දැවැන්ත ප්‍රචණ්ඩත්වයක් මුදා හැරේ. තිව්‍රතාව අඩු විප්ලවවලදී එසේ වන්නේ නැත. එහිදී පරාජය කළ බලවේග නැවතත් ඉදිරියට පැමිණේ. දැන් සිදුවෙමින් තිබෙන්නේ ඒ හා සමාන දෙයකි. ඒ සමග ම අර මහජන බලාපොරොත්තු සහ අලුතින් ඇතිවන නව පාලන තන්ත්‍රය අතර පරස්පරයක් නිර්මාණය වේ. මේ තත්වය අද ක්ෂණිකවම සිදුවී තිබේ. උත්ප්‍රාසජනක දෙයක් වන්නේ රාජපක්ෂලා බලයේ එල්ලී සිටීමට කුමන්ත්‍රණයක් කර ප්‍රචණ්ඩ ජන අරගලක් අවුළුවාලුයේ නම් තත්ත්වය මෙයට වඩා යහපත් වීමට ඉඩ තිබීමයි. එසේ වූවා නම් පරාජිත බලවේග තව දුරටත් දුර්වල වන අතර ඔවුනට ආපසු පැමිණීමට ඇති හැකියාව අඩුවේ.

කෙසේ නමුත් ජනයාගේ හඬ අඛණ්ඩව ක්‍රියාත්මක වීමක් ද දැකිය හැක. ඔවුන් තුළ ඉහළ දේශපාලන උනන්දුවක් ඇති වී තිබේ. එක් පැත්තකින් ප්‍රභූ පංතියේ තහවුරු වීමක් තිබෙනවා මෙන් ම අනෙක් අතින් මහජනයා අතරද ක්‍රියාත්මක භාවයක් පවතී. එම ක්‍රියාත්මක භාවය පවතින තාක් අපට බලාපොරොත්තු තබාගත හැක. හැකි තරම් මහජනයා සංවිධානය කළ යුතුවන අතරම ඔවුන්ගේ අභිලාෂ ප්‍රකාශයට පත් කළ යුතුය. දේශපාලනය ගැන බැරෑරුම්ව හිතන අය මේ ක්‍රියාකාරිත්වය නිවැරදි දැක්මක් තුළට ගොනු කරගත යුතු ය. ප්‍රභූන් සිය කේවල් කිරීමේ ශක්තිය විදහා දක්වන විට ඊට ප්‍රතිවිරුද්ධව මහජන ශක්තිය බලමුළුගැන්වීම අවශ්‍ය වේ.

ඉදිරි මහ මැතිවරණය ලංකා දේශපාලනයේ නව අත්දැකීමක් විය හැක. මේ මහා මැතිවරණයට පෙර මහජනයාගේ විරුද්ධ පක්ෂයක් (People's Opposition) ගොඩනගා ගැනීම වැදගත් වේ. ප්‍රභූ අභිලාෂ සහ මහජන අභිලාෂ අතර ඒ මගින් පැහැදිලි බෙදාවෙන් කිරීමක් ඇති කළ හැකි ය. එවැන්නක් ජනහිතකාමී දේශපාලන අනාගතයක් පැත්තෙන් ගත් කල අත්‍යාවශ්‍ය වේ. ●




අල්ලස් කොමිසම වෙත ජවිපෙ සාමාජික පිරිසක් පැමිණිලි ඉදිරිපත් කරමින්....



නීතිඥ
**ඩී. එම්. දිසානායක**

# යහපාලනය සහ ස්වාධීන කොමිෂන් සභා

රාජ්‍ය යාන්ත්‍රණය දේශපාලනීකරණය වීම වැලැක්වීම සඳහා මෙන්ම සියලු දෙනාටම නීතිය ඉදිරියේ දී සහ නීතිය ක්‍රියාත්මක වීමේදී සමාන ඉඩ ප්‍රස්ථාවන් ලැබෙන යහපාලනයක් ස්ථාපිත කිරීමේ අරමුණින් නොයෙක් වර විවිධ කොමිෂන් සභා පිහිටුවීම මෑත කාලීන ලංකා දේශපාලනය තුළ සිදු වී ඇත. 1946 පිහිටුවා තිබූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව 1972 දි අවලංගු කෙරුණු අතර 1978 ව්‍යවස්ථාව මගින් නැවත පිහිටුවනු ලැබීය. රජයේ නිළධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුවීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලතල ක්‍රියාත්මක කිරීමට ආරම්භයේදී මෙය පිහිටවනු ලැබීය. 1994 දී බලයට පැමිණි ආණ්ඩුව විසින් රාජ්‍ය



www.thesundayleader.lk

චෝදනාවට ලක් වූ ශිරාණි

**1994 දී ස්ථාපිත කළ අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමට ද අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟාවීමට හෝ රාජ්‍ය අංශයේ අල්ලස හා දූෂණය අවම කිරීමට ප්‍රමාණවත් බලයක් නොලැබුණි. එමෙන්ම යහපාලනය ස්ථාපනය කිරීම සඳහා ස්වාධීන පාලන මණ්ඩලවලින් පාලනය විය යුතු තවත් අංශ ගණනාවක් ඇති බව හඳුනාගැනීමක්ද මේ අතර සිදු වී තිබුණි.**

දේහය පුරා පැතිරී තිබූ අල්ලස හා දූෂණය අවම කිරීමේ අරමුණින් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසම පිහිටුවනු ලැබීය. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1996 දී මානව හිමිකම් කොමිසම ස්ථාපනය කෙරිණි. නමුත් මෙම කොමිෂන් සභා ආරම්භ කර කෙටි කලකින්ම ආරම්භක අරමුණු වලින් බැහැරවීම හෝ නැවත දේශපාලනයේ බලයට යටත් වීම පොදු ලක්ෂණය විය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුව තිබූ රජයේ නිළධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුවීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලතල ඇමතිවරුන්ගේ බලයට යටත් කිරීම සහ එහි තීරණ වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට බලය අමාත්‍ය මණ්ඩලය වෙත තබා ගැනීම ඊට එක් උදාහරණයකි. 1994 දී ස්ථාපිත කළ අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමට ද අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟාවීමට හෝ රාජ්‍ය අංශයේ අල්ලස හා දූෂණය අවම කිරීමට ප්‍රමාණවත් බලයක් නොලැබුණි. එමෙන්ම යහපාලනය ස්ථාපනය කිරීම සඳහා ස්වාධීන පාලන මණ්ඩලවලින් පාලනය විය යුතු තවත් අංශ ගණනාවක් ඇති බව හඳුනාගැනීමක්ද මේ අතර සිදු වී තිබුණි.

මෙම තත්ත්වයන් සලකා බලමින් වඩාත් පුළුල් මට්ටමක ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීමක් හා එතෙක් පැවති කොමිෂන් සභාවල පත්කිරීම් දේශපාලන පක්ෂග්‍රාහිත්වයෙන් ඈත්කර විධිමත් කිරීමක් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුවිය. එවකට පැවති ජනතා විමුක්ති පෙරමුණෙහි සහයෝගය ලැබූ එක්සත් ජනතා නිදහස් සන්ධානය ප්‍රමුඛ සභාග ආණ්ඩුව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආ අතර පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ වල සහාය එයට හිමිවීම මෙරට දේශපාලනයේ සුවිශේෂී සිදුවීමක් විය. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එතෙක් පැවති කොමිෂන් සභාද ඇතුළුව කොමිෂන් සභා 7ක් පත්කිරීම සඳහා ප්‍රතිපාදන සපයන ලදී.

1. මැතිවරණ කොමිසම
2. රාජ්‍ය සේවා කොමිසම
3. ජාතික පොලිස් කොමිසම
4. මානව හිමිකම් කොමිසම
5. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම
6. මූල්‍ය කොමිසම
7. සීමා නිර්ණය කොමිසම යන ආයතන

**සාධනීය වෙනසක්**

එකී කොමිෂන් සභා වන අතර මෙම සිය කොමිෂන් සභා පත් කිරීමෙහි ලා පොදු ක්‍රම වේදයක් හඳුන්වා දීම මෙහි සුවිශේෂිත්වය විය. එතෙක් පැවති ක්‍රමවේදය වන ජනාධිපතිවරයා විසින් රජයේ ඉහළ තනතුරුවලට පුද්ගයන් පත්කිරීම වෙනුවට ඉහත කොමිෂන් සභාවලට පුද්ගලයින් පත්කිරීම සඳහා ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව හඳුන්වා දිම ද 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුවිය. රාජ්‍ය සේවා කොමිසම, මානව හිමිකම් කොමිසම සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම ඒ වන විටත් වෙනත් නීති මගින් ස්ථාපනය කර තිබූ අතර එකී කොමිෂන් සභා පත් කිරීම් හුදෙක් විධායකයේ අභිමතය මත සිදු වී තිබුණි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයින් සහ සභාපතිවරයා පත්කිරීම ජනාධිපතිවරයා විසින් සිදුකරනු ලබයි. මානව හිමිකම් කොමිසමෙහි සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමෙහි සාමාජිකයන් පත්කිරීම

www.freedomoutpost.com




**යහපාලනය ස්ථාපනය කිරීම සඳහා මෙන්ම අනිසි දේශපාලන බලපෑම් කිරීම්වලින් තොරව රාජ්‍ය පාලනය ශක්තිමත්ව ස්ථාපනය කිරීම සඳහා දායක වන හඳුනාගත් කොමිෂන් සභා 7 රටේ මූලික නීතිය වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින්ම පිළිගෙන එහි කොටසක් බවට පත්කිරීම 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් වඩාත් සාධනීය වෙනසක් විය.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ උපදෙස් මත ජනාධිපතිවරයා සිදුකරන බව අදාල නීතීන්හි සඳහන් වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් නොමැති පසුබිම තුළ ජනාධිපතිවරයා විසින් සිදුකර තිබුණි. යහපාලනය ස්ථාපනය කිරීම සඳහා මෙන්ම අනිසි දේශපාලන බලපෑම් කිරීම්වලින් තොරව රාජ්‍ය පාලනය ශක්තිමත්ව ස්ථාපනය කිරීම සඳහා දායක වන හඳුනාගත් කොමිෂන් සභා 7 රටේ මූලික නීතිය වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින්ම පිළිගෙන එහි කොටසක් බවට පත්කිරීම 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් වඩාත් සාධනීය වෙනසක් විය.

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කිරීමෙන් පසු ඉහත සඳහන් කළ කොමිෂන් සභා පත්කිරීම සිදුවිය. ඒ අනුව 2001 වර්ෂයේදී රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති ප්‍රතිපාදන සංශෝධනය කර නව ප්‍රතිපාදන ගෙන එන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා සාමාජිකයන් 9 දෙනෙකුගෙන් යුත් රාජ්‍ය සේවා කොමිසම පත්කළ අතර එක් සාමාජිකයකු සභාපතිවරයා ලෙස පත් කරන ලදී. මෙම සංශෝධනය මගින් එතෙක් පැවති රාජ්‍ය සේවා කොමිසම විශාල වෙනසකට ලක් කළ අතර රජ්‍ය සේවයේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුවීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් පිළිබඳ පූර්ණ බලතල කොමිසම වෙත පැවරිණි. එතෙක් දේශපාලනයේ දැඩි බලපෑමට ලක්වී තිබූ රාජ්‍ය සේවයට ස්වාධීනව වැඩ කිරීමේ ඉඩ කඩ විවරවූ අතර එහි වගකීම දරණ කොමිසම පාර්ලිමේන්තුවට වගකියන ආයතනයක් බවට විය.

**දුබලතා**

2002 වර්ෂයේදී සාමාජිකයින් 9 දෙනෙකුගෙන් යුත් ජාතික පොලිස් කොමිසම ස්ථාපනය කළ අතර ජනාධිපති නීතිඥ රංජිත් අබේසූරිය මහතා එහි සභාපතිවරයා ලෙස පත් කෙරිණි. පොලිස් සේවයේ පත්කිරීම්, උසස්වීම්, මාරුකිරීම් සහ විනය සම්බන්ධ බලතල පොලිස් කොමිසම සතු වූ අතර වඩාත් ඵලදායී පොලිස් සේවාවක් පවත්වාගෙන යාම සඳහා එය පිටුවහලක් විය. 2004 පාර්ලිමේන්තු මැතිවරණයේදී වඩාත් අපක්ෂපාතී පොලිස් සේවාවක් දැක ගැනීමට හැකිවීමත්, ප්‍රචණ්ඩත්වය අවම මැතිවරණයක් බවට එය පත්කර ගැනීමටත් හැකියාව ජාතික පොලිස් කොමිසම හේතුවෙන් ලැබුණි. කෙසේ වුවද, කොමිසම වැඩි අවධානයක් පොලිස් නිළධාරීන්ගේ විනය සම්බන්ධව අවධානය යොමුකළ බවද, පොලිස් නිළධාරීන්ගේ උසස්වීම් ලබා දීම අනවශ්‍ය පරිදි ප්‍රමාද වූ බවටද චෝදනා එල්ල විය. කොමිසමට පත් වූ සභාපතිවරුන් පූර්ණ කාලීන නිළ දරන්නන් නොවීම සහ පොලිස්පති වරයාගෙන් ප්‍රමාණවත් සහායක් පරිපාලන හා පිරිස් කළමනාකරණ පිළිබඳ තීරණ ගැනීමේදී නොලැබීමත් මත යම් ගැටලුකාරී තත්ත්වයන් උද්ගත වූ බවට නිරීක්ෂණය වී ඇත. අවස්ථා කීපයකදී කොමිසමේ තීරණ මගින් අගතියට පත් පොලිස් නිළධාරීන් මානව හිමිකම් නඩු පැවරීමට යොමුවීම දක්නට ලැබුණි.

මානව හිමිකම් කොමිසම හඳුන්වා දීම 1996 වර්ෂයේ ගෙන එනු ලබන අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් සිදුකරන අතර එයට සාමාජිකයන් පත්කිරීම 2003 වර්ෂය තෙක් ජනාධිපති විසින්ද 2003 පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින්ද සිදුකරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට හැකියාවක් නොමැති පිරිස්වලට ඒ සඳහා ඉඩ කඩ විවර කරමින් නීතිය ඉදිරියේ සමානාත්මතාව තහවුරු කිරීම මෙන්ම මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය

www.therepublicsquare.com



**අල්ලසට හා දූෂණයට එරෙහිව ක්‍රියාකිරීම 1994 බලයට පත් වු ආණ්ඩුවේ ප්‍රධාන සටන් පාඨයක් වු අතර නව ආණ්ඩුව බලයට පත් වූ වහාම ඒ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන ස්ථිර කොමිෂන් සභා පනත ගෙන ඒම සිදුකරන ලදී.**

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය

පටිපාටි සකස් කිරීමෙහි ලා උපදෙස් දීම සහ මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය ලබාදීම කොමිසමේ මුඛ්‍ය පරමාර්ථ වේ. එහි ලා කොමිසමට පැමිණිල්ලක් නොමැතිව වුවද මානව හිමිකම් ආරක්ෂාකිරීමට ඉදිරිපත් වීමේ බලය කොමිසම සතුය. එක් එක් රටවල මානව හිමිකම් තත්ත්වයන් පිළිබඳව සමාලෝචනය කරනු ලබන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ සමාලෝචන රැස්වීම්වලදී මෙරට මානව හිමිකම්වල තත්ත්වය පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රබල වගකීමක් කොමිසමට ඇත.

අල්ලසට හා දූෂණයට එරෙහිව ක්‍රියාකිරීම 1994 බලයට පත් වු ආණ්ඩුවේ ප්‍රධාන සටන් පාඨයක් වු අතර නව ආණ්ඩුව බලයට පත් වූ වහාම ඒ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන ස්ථිර කොමිෂන් සභා පනත ගෙන ඒම සිදුකරන ලදී. ඒ වන විටත් අල්ලස් සම්බන්ධ නීතිය මෙරට නිතී පද්ධතියට 1954 අල්ලස් පනත සහ ජාතික රාජය සභාවේ 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත මගින් ඇතුළත් කර තිබුණද එය ක්‍රියාත්මක කිරීමට විධිමත් ආයතන පද්ධතියක් නොමැතිවීම මහත් අඩුවක්ව පැවතුණි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන ස්ථිර කොමිෂන් සභා පනත මගින් විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකු සහ අපරාධ විමර්ශනයට සහ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාලව පළපුරුද්ද ඇති පුද්ගලයකු ද ඇතුළත් සාමාජිකයින් 3න් යුත් කොමිසමක් වසර 5 ක කාලයකට හඳුන්වාදීම සිදුවිය. අල්ලස් චෝදනා විමර්ශනයට හා වැරදිකරුවන් අත් අඩංගුවට ගැනීමට විශේෂ පුහුණුව ලත් පොලිස් නිළධාරීන් කණ්ඩායමක් අනුයුක්ත කරනු ලැබීය. කොමිසමට පත්කිරීමේ පළමු සහ දෙවන අවස්ථාවන් දෙකම 17 වන සංශෝධනයට පෙර සිදු වූ බැවින් එවකට සිටි ජනාධිපතිවරිය විසින් සිදුකරන ලදී. තෙවන කොමිසම පත්කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත සිදුවිය. කෙසේ වුවද කොමිසම ආරම්භ කිරීමේදී බලාපොරොත්තු වූ මට්ටමේ මැදිහත් වීමක් දූෂණ වැලැක්වීම සහ වැරදි කරුවන් නීතියේ ග්‍රහණයට ගැනීම සඳහා සිදු නොවීම කොමිසමට එල්ලවන බරපතලම චෝදනාව වේ. අල්ලස් හෝ දූෂණ යන පුළුල් විෂය පථය පනත මගින් කොමිසමට ලබා දී තිබුණද එය අල්ලස්වලට පමණක් සීමා කරගැනීමත් සහ ලිඛිත පැමිණිල්ලක් නොමැතිව විමර්ශන කටයුතු වලට යොමු නොවීමත් මත පසුගිය කාලය පුරා තම ක්ෂේත්‍රය පටුකර ගැනීමක් සිදුකර ගෙන තිබුණි.

### විධායකය යටතට

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් පත් කිරීමට යෝජනා වුවද, මේ දක්වා එය පත්කිරීම සිදු වී නොමැත. එක් පුද්ගලයකු විසින් සමස්ත මැතිවරණ ක්‍රියාවලියම මෙහෙයවීමේ අවදානම නොයෙක් වර සාකච්ඡා වී ඇතත් ස්වාධීන මැතිවරණ කොමිසම පත්කිරීමේ කැමැත්ත පැවති විධායකයන් වෙතින් නොලැබීම කණගාටු දායක තත්ත්වයක් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මැතිවරණ කොමිසම පත්කිරීම සඳහා සිය නිර්දේශ ලබාදුන්නද, එවකට බලයේ සිටි ජනාධිපතිවරිය ඊට ඒ යෝජනා ප්‍රතික්ෂේප කිරීම නිසා කොමිසම පත් නොවුණි. ඒ හෙයින්ම ඒ වන විට ධුරයේ සිටි මැතිවරණ කොමසාරිස්වරයාට තම විශ්‍රාම වයස් සීමාවද පසු වී වසර කීපයක් සේවයේ යෙදී සිටිමට සිදුවිය.

ඊහත කොමිෂන් සභාවලට අමතරව හයපාලනය තහවුරු කිරීමෙහි ලා දායක වන තවත් කොමිෂන් සභා ගණනාවක් ඇති අතර 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු එම කොමිෂන් සභාවලටද සාමාජිකයින් පත්කිරීම ආණ්ඩුක්‍රම

www.theguardian.com



**කොමිෂන් සභා සතු බලය අඩු කිරීමට වඩා කොමිෂන් සභාවලට සිදුකරන පත්කිරීම් දැඩි දේශපාලන පක්ෂග්‍රාහීත්වයකින් සිදුකිරීමට ජනාධිපතිවරයාට ඉඩ විවර කරගැනීමෙන් ඒවායෙහි ස්වාධීනත්වය සම්පූර්ණයෙන් අහෝසි වූ අතර හුදෙක් විධායකයේ සිත් සතුටු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන පද්ධතියක් බවට පත් විය.**

ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත සිදුවන බවට නීති සංශෝධනය විය. මහ බැංකුවේ මූල්‍ය කොමිසමත්, මැතිවරණ පැවැත්වීමට අදාල සීමා නිර්ණය කොමිසමත් සහ ස්වාධීන අධිකරණ සේවා කොමිසමත් ඒ අතර වැදගත් ය. අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා නිළ බලයෙන්ම අගවිනිසුරු බවට පත්වන අතර සාමාජිකයින් පත්කිරීම ජනාධිපති විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත සිදුකෙරිණි. පසුගිය කාලය තුළ දැඩි ලෙස දේශපාලනීරණයට ලක් වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වැනි ආයතනද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සුපරීක්ෂණයට ලක්විය යුතුව තිබූ බවට අදහස් ඉදිරිපත් වී ඇත.

කෙසේ වුවද, යහපාලනය ස්ථාපිත කිරීමත්, අනිසි දේශපාලන බලපෑම්වලින් තොර රාජ්‍ය සේවය, යුක්තිය පසිඳලීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම උදෙසාත් ස්ථාපිත ස්වාධීන කොමිෂන් සභාවන්ගේ මූලික අපේක්ෂාවම බිඳ වැටීම 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග සිදුවිය. එතෙක් පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත්කිරීමේ දී ඇතිව තිබූ ගැටුම්කාරී තත්ත්වයන් ආයුධයක් බවට පත්කර ගනිමින්, ඉඳුරාම දේශපාලනයට ගැති වූ හා විධායක ජනාධිපතිවරයාගේ බලයට යටත් වූ පාර්ලිමේන්තු සභාවක් ස්ථාපනය කළ අතර ජනාධිපතිවරයා ඉදිරිපත් කරන නම් වලට අදහස් පලකිරීමේ අයිතිය පමණක් ලබාදෙන ලදි. එසේ හෙයින් කොමිෂන් සභා වෙත ජනාධිපතිවරයාට හිතවාදී පක්ෂග්‍රාහී පුද්ගලයින් පත්කර ගැනීම සිදු වූ අතර සියලු කොමිෂන් සභා ඒවා පිහිට වූ මූලික අරමුණු වලින් සම්පූර්ණයෙන්ම බැහැරවීම සිදුවිය. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන අවස්ථාව වන විටත් විධායකය විසින් වරින් වර ස්වාධීන කොමිෂන් සභාවලට බලපෑම් එල්ලකරමින් තිබුණි. 2006 අප්‍රේල් මාසයේදී ජනාධිපතිවරයා ව්‍යවස්ථා විරෝධී ලෙස පොලිස් කොමිසම පත්කරන ලද අතර ඔහු විසින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මතය නොවිමසා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් දෙදෙනකු පත්කිරීමද සිදුකරන ලදී. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් කොමිසම සතු පත්කිරීම්, මාරුකිරීම් හා උස්වීම් සම්බන්ධ බලතල නැවත රාජ්‍ය සේවා කොමිසමට ලබා දී විනය සම්බන්ධ බලය පමණක් පොලිස් කොමිසමට ඉතිරිකරන ලදී. එමෙන්ම මැතිවරණ කොමිසමට මැතිවරණයන්හි ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ලබා දී තිබූ සුවිශේෂී බල තල ගණනාවක් ඉවත් කිරීමද 18 වන සංශෝධනය මගින් සිදු විය.

කොමිෂන් සභා සතු බලය අඩු කිරීමට වඩා කොමිෂන් සභාවලට සිදුකරන පත්කිරීම් දැඩි දේශපාලන පක්ෂග්‍රාහීත්වයකින් සිදුකිරීමට ජනාධිපතිවරයාට ඉඩ විවර කරගැනීමෙන් ඒවායෙහි ස්වාධීනත්වය සම්පූර්ණයෙන් අහෝසි වූ අතර හුදෙක් විධායකයේ සිත් සතුටු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන පද්ධතියක් බවට පත් විය. කුමන හෝ කොමිසමක විමර්ශනය වන කාරණයක් ජනාධිපතිවරයාගේ හෝ ඔහු වටා සිටි පුද්ගලයින්ගේ එක් දුරකථන ඇමතුමකින් නැවැත්විය හැකි මට්ටමට කොමිසම් වල ගරුත්වය පිරිහීමට ලක්විය.

යහපාලනය ස්ථාපිත කිරීමේ අරමුණකට සමස්ත සමාජයම ඒකරාශී වී සිටින මේ මොහොතේ, යහපාලනය උඩු යටිකුරු කළ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීමට කටයුතු කරන අතරෙහි 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබූ දුර්වලතා ද උගත් පාඩමක් ලෙස සැලකිල්ලට ගත යුතුව ඇත. යහපාලනය ඇති කිරීමෙහි ලා ගෙන එන 19 වන සංශෝධනය අනාගතයේ බිහිවන තවත් අත්තනෝමතික රාජ්‍ය පාලකයකුට තම හිතු මතයට වෙනස්කළ හැක්කක් නොවිය යුතුය.

www.gallery.gossipelankanews.org



කලාකරුවන් පිරිසක් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හමුවී.....



ප්‍රවීන සිනමාවේදී, ආචාර්ය
**ධර්මසේන පතිරාජ**

# ආණ්ඩුව කුමක් වුවත් කලාකරුවන් වන්දිභට්ටයන් කරගැනීම වරදක්

සමාජය සහ එහි සාමාජිකයෙකු වන මිනිසා ආධ්‍යාත්මිකව ඉහළට ඔසවා තබන කලාවක් බිහිවන්නට යහපත් සමාජයක් තිබිය යුතු බවට මතයක් තිබේ. නමුත් කලාව ආරම්භයේ සිට වර්තමානය දක්වා නිරීක්ෂණය කරන විට යහපත් කලාව බිහිවෙන්නේ සාමකාමී සමාජවල පමණක් ම නොවේ. මේ අතර කලාවේ විවිධ ප්‍රවනතා ද සාමකාමී නොවන සමාජවල ඇති වූ බව දක්නට තිබේ. උදාහරණයකට ගතහොත් වර්තමාන කලාව සහ සාහිත්‍ය පිළිබඳ අපේ තිබෙන නැඹුරුව මූලික වශයෙන් දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු බිහි වූ කලාවත් සමඟ සම්බන්ධ ය. අපේ  කලාව පිළිබඳ සම්බන්ධතා ගොඩනැගෙන්නේ  දෙවන ලෝක යුද්ධයෙන් පසු සමාජයේ නොයෙක් සංසිද්ධීන් සහ පොදුවේ ඒ සමාජ යථාර්තය සමඟ ය. සමාජයේ ඇති වූ විවිධ වර්ධනයන් තුළ විශේෂයෙන් ම යථාර්තවාදි සංකල්පය, ඊටපසු අධියථාර්තවාදය පසුව පශ්චාත් නූතනවාදය යනාදී වශයෙන් විශාල වර්ධනයක් එම විකාශනය තුළ අත්කරගත් බව පෙනේ.

www.archives.dailynews.lk



**පවතින දේශපාලනයෙන්, සංස්කෘතියෙන්, සමකාලීන සමාජ විද්‍යාවෙන්, දර්ශනවාදයෙන් සහ ආගම තුළින් එකී මතවාද හදාගන්නට පුළුවන. නමුත් කලාව යනු විශේෂයෙන් ම එබඳු මතවාද මත පැටලී ඒ මතවාද නිර්මාණය කිරීමේ කාර්යයක් ද යන කාරණය සලකා බැලිය යුතු ය .**

කලා නිර්මාණ යනු එක පුද්ගලයෙකුගේ මනසේ හුදෙකලාව බිහිවෙනවා ද කියන කාරණය පිළිබඳ අපට සැළකිලිමත් වීමට සිදුවේ. තනි පුද්ගලයෙකු හැටියට කලාකරුවෙකු තමන්ගේ සමාජයත් සමග ගනුදෙනු කරන්නේ කොහොමද ? කලාව යනු සමාජය ම මුල්කරගෙන සමාජ අත්දැකීම්, එහෙම නැත්නම් සමාජයේ අධ්‍යාත්මය පසුබිම් කරගෙන නිර්මාණය වෙන එකක් නම් එය ඔහු සමීකරණය කරගන්නේ  කෙළෙස ද? තමන්ගේ කලා නිර්මාණවලට විෂය වන්නේ මොනවා ද? තේමා වන්නේ මොනවා ද? යන්න එයට හේතුව ය.

එතන දී  විශේෂයෙන්ම කලාකරුවෙකු ලෙස හඳුනාගන්නේ කිසියම් ආකාරයක මතවාදයක් තමන් තුළ පෝෂණය කරගෙන ඒ පෝෂණය කරන මතවාදය කලාව තුළින් නිර්මාණය කරන්නා ද යන ගැටළුව පැමිණේ. එවිට කලාව හා මතවාදය අතර තිබෙන සම්බන්ධය කුමක් ද යන්න අපට බොහෝ විට සිතන්නට සිදු වේ.  පවතින දේශපාලනයෙන්, සංස්කෘතියෙන්, සමකාලීන සමාජ විද්‍යාවෙන්, දර්ශනවාදයෙන් සහ ආගම තුළින් එකී මතවාද හදාග න්නට පුළුවන. නමුත් කලාව යනු විශේෂයෙන් ම එබඳු මතවාද මත පැටලී ඒ මතවාද නිර්මාණය කිරීමේ කාර්යයක් ද යන කාරණය සලකා බැලිය යුතු ය .

1917 විප්ලවයෙන් පසු රුසියාවේ බිහිවුණු කලාව මෙයට හොඳම උදාහරණයකි. සමාජ සත්තා යථාර්තවාදය යනුවෙන් එම කලාව හැඳින් වේ. එයින් අදහස් වූයේ කලාවේ අරමුණ විය යුත්තේ තිබුණා වූ සමාජය ප්‍රතිසංවිධානය කිරීම ය. එසේ නැත්නම් සමාජය යනුවෙන් අදහස් කළේ පංති සමාජය වේ. විශේෂයෙන් ම නිර්ධන පංතියේ එහෙම නැත්නම් වැඩකරන පංතියේ අරමුණු ජයග්‍රහණය කරන්නට  කලාව නිර්මාණ කළ යුතුය යන අදහසයි ඒ සමාජවාදය තුළ පිළිගැනුණේ. එහිදී දී පවතින අධිපති බලයේ මතවාදය කලාවේ මතවාදය බවට පත්වන බව පෙනේ. එහිදී  රාජ්‍ය බලය හා කලාව එක මතවාදයක් හැටියට මතු වේ. නමුත් එහි අස්ථිරත්වය සහ කලාව එය නොවන බව හඳුනා ගන්නට එපමණ කලක් යන්නේ නැත. සෝවියට් රාජ්‍යයේ පරිහානියට ප්‍රථමයෙන් ම එය හඳුනා ගැනේ. සොල්සිනිට්සින් වැනි යම් යම් ප්‍රවනතා මෙන්ම යම් යම් රචකයන් බිහිවෙන්නේ ඒවා තුළින්ම ය.

සෝවියට් විප්ලවයට නායකත්වය දුන් නායකයින් අතරේ පවා අරමුණු අතරේ වෙනස්කම් තිබේ. ලෙනින්, ට්‍රොට්ස්කි මෙන්ම එංගල්ස් ද  කලාවේ අරමුණ කුමක් ද යන්න හා කලාව මේ ආකාරයට පවත්වාගත යුතු බවට කිසියම් ආකාරයක පැහැදිළි මොඩලයක් සකස් කළේ හෝ ඉදිරිපත් කළේ නැත.  ගතික ව තේරුම්ගත යුතු දෙයක් ලෙසටයි ඔවුන් කලාව සැළකුවේ. මේ නිසා කුමන ආකාරයට කලාව හඳුන්වන්නේ ද යන ගැටලුවට කලාකාරයෝ මුහුණ දෙති.

### අපේ කලාව

අපේ කලාවේ ඉතිහාසය ගත් කල එහි වර්ධනය ඉතා මන්දගාමී ය.  මාගේ දැනීමේ හැටියට වඩාත් ම විශිෂ්ට විදියට ඒ කාරණය හඳුනා ගත් එකම විචාරකයා සහ දාර්ශනිකයා තමයි මහාචාර්ය ගම්ලත්. එතුමා තමයි මේ කාරණා ටික ඉස්මතු කරලා ගන්නේ, විශේෂයෙන්ම ට්‍රොට්ස්කිවාදි ආස්ථානයේ සිට ඔහු කලාව විනිශ්චය කළේ ය. ට්‍රෙට්ස්කිවාදි කලා විචාරය අන්ධානුකරණයෙන් පිටපත් කිරීමක් නොවෙයි ඔහු කළේ.

ගම්ලත් අභියෝග කළේ පේරාදෙණිය සාහිත්‍යට ය. එය කලාවේ තිබෙන විශුද්ධඥාණවාදයට එරෙහි අරගලය කි.  කිසියම් ආකාරයකට සමාජයෙන් වෙන් වී සිට තමන්ගේ ඒ මනෝ ලෝකයේ ඇතිවන යම් යම් සංවේදනා, සංකල්ප ප්‍රතිනිර්මාණය කරන්නා කලාකරුවා ලෙසයි පේරාදෙණිය සාහිත්‍යයෙන් කියැවුණේ. ඒ අනුව කලාව යනු කලාකරුවාගේ මනෝ ලෝකයේ ප්‍රතිනිර්මාණයක් විය.



www.chineseposters.net

**සෝවියට් විප්ලවයට නායකත්වය දුන් නායකයින් අතරේ පවා අරමුණු අතරේ වෙනස්කම් තිබේ. ලෙනින්, ට්‍රොට්ස්කි මෙන්ම එංගල්ස් ද කලාවේ අරමුණ කුමක් ද යන්න හා කලාව මේ ආකාරයට පවත්වාගත යුතු බවට කිසියම් ආකාරයක පැහැදිලි මොඩලයක් සකස් කළේ හෝ ඉදිරිපත් කළේ නැත.**

එයින් ඔබ්බට ගිය ගම්ලත් කලාව යනු පවතින සමාජයේ තිබෙන පරස්පරයන් ආශ්‍රයෙන් ඉස්මතුවන දේවල් ඉතාමත් ගැඹුරින් ගෙන කලාවේ න්‍යාය ආශ්‍රයෙන් කරන නිර්මානයන් බව පෙන්වා දුන්නේ ය. ආස්වාදනයක් පිණිස නිර්මාණය කරන මෙම කලාව තමන් ජීවත්වන යුගයත්, තමා අයත් පරම්පරාවත්, එමෙන්ම තමා ඉන්නා මහපොළොවත් විෂය කරගත් එකක් විය යුතුය. එක්තරා ආකාරයකට මෙවන් විචාරවාදයක් ගොඩනැගූ මහාචාර්ය ගම්ලත් පසු කාලීනව වර්ධනය වූ විචාර සංකල්ප කෙරෙහි එපමණ අවධානයක් යොමු කළේ නැත. ජාත්‍යන්තරව ගොඩනැගෙන ප්‍රවනතාවත් එකතුකරගෙන වර්තමාන යුගයේ සැබෑ කලාව කුමක් ද යන්න මත නිර්මාණ කටයුතු කිරීමේ දී විශාල අභියෝග යකට වත්මන් කලාකරුවෝ මුහුණ දී සිටිති.. කෙසේ නමුත් නොයෙකුත් කලා විචාරයන්ගේ අදහස් ගෙන ඒවා එකට එකතු කර සංවර්ධනය කර ඇති හෙයින් විචාරයේ දී අපට දැන් බොහෝ අමුද්‍රව්‍ය තිබේ. ඒ අනුව ඒවායින් පැන නගින සැබෑ කලාව කුමක් ද යන වැටහීම ලබාගන්නට පුළුවන. එහෙත් නිර්මාණාත්මක කෘතීන් තුළ ආස්වාදනය පිණිස නිර්මාණය කරන්නේ කොහොම ද කියන ගැටලුව අභියෝගය ලෙස වර්තමානයේ අපේ රටේ පවතී.

**යුද්ධය හා කලාව**

පසුගිය වසර 30 -40 තුළ සිදු වූ සමාජමය වෙනස්කම් නිවැරදිව ග්‍රහණය කරගත් කෘතියක් දෙකක් තිබෙන්නට පුළුවන. නමුත් මෙරට පැවති යුද්ධය නවකථාවකින්, කවියකින්, කෙටි කථාවකින් එසේත් නැත්නම් චිත්‍රපටියකින් හෝ නිවැරදිව ග්‍රහණය කරගත්තා යැයි කිව නොහැක.

අපේ බොහෝ ලේඛකයන් සිටින්නේ වී නමුත් යුද්ධය ගැන ලියැවී තිබෙන දේ ගත් විට ඒවා අර විඥ්ඥාණවාදී ආකාරයට, නැත්තම් තමන්ගේ කාල්පනික දේවල් හැටියටයි නිර්මාණය වී තිබෙන්නේ. එසේ නැතිව යුද්ධය තුළට ප්‍රවේශ වී සමීකරණය කිරීමක් ඒවායෙහි නැත. මේ තුළ එයට හේතු වූ මතවාදී කාරණා කිහිපයක් තිබේ. වෙනත් ආකාරයකට පවසන්නේ නම් මෙයට ප්‍රවිශ්ට වෙන්නට තරම් ස්වාධීනත්වයක් ඔවුන්ට නැත. මේ නිර්මාණයන්ගෙන් ප්‍රකාශ වී තිබෙන්නේ සිංහල සිවිල් ජනයා කරදරයට පත් වූ බව ය. බෝම්බ ගැසූ විට පාරේ ගමන් කළ නොහැක, බියක් සැකයක් තිබේ, ළමයින් පාසැල් යවාගැනීමට නොහැකිය යන දේවල් ය. සංසිද්ධීන් ඒ ආකාරයට අව ප්‍රමාණය කර තිබේ.

කලා කෘතියක් නිර්මාණය කරන්නට ඒ අත්දැකීම ප්‍රමාණවත් නොවේ. ඒ අත්දැකීම මීට වඩා ගැඹුරින් ග්‍රහණය කර නොගන්නේ නම් නිර්මාණයක් කෙරෙන්නේ නැත. උසස්ම ගනයේ කියන්නට නොහැකි නමුත් සමහර විට විටින් විට ලියැවුණු අවධානය යොමුකළ යුතු කලා කෘති තිබේ. එසේ තිබුණත් මා මුලින් කියූ ආකාරයට සමස්ත සමාජයේ යුද්ධය පිළිබඳ නිර්මාණයක් වූයේ නැත. යුද්ධය කොහොමද සමාජයේ පහළට කාන්දු වෙලා එන්නේ ? යුද්ධය ඇයි පහළට නියමාකාරයට කන්දු නොවන්නේ? යන කාරණා පිළිබඳ විමසිය යුතු ය. මට පෙනෙන්නේ අන්තගාමිත්වයෙන් තොරව යුද්ධයේ අත්දැකීම ලබාගන්නට ලංකාවේ කලාකරුවන්ට නොහැකි වූ බව ය.

දකුණට යුද්ධයක් නොතිබී ම එයට හේතුව දැයි මට සැක සිතේ. විශේෂයෙන්ම දකුණේ සිංහලෙන් ලියන නවකථාකරුවන්ට, කෙටිකථා කරුවන්ට හා වෙනත් කලා නිර්මාණ කරුවන්ට එය ග්‍රහණය කරගන්නට නොහැකි වූයේ ඒ නිසා විය හැක. යුද්ධයේ අත්දැකීම අපට දුන්නේ හුදෙක් මාධ්‍යවලින් සහ රාජ්‍ය මතවාදයෙනි. විශේෂයෙන්ම සිංහල බෞද්ධ මතවාදය තුළිනුයි අපිට එය සංවේදී වුයේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස එය දකුණට දැනුණේ පිටස්තර දෙයක් ලෙසට ය, එම නිසා යුද්ධය හටගත් යථාර්තය සියුම් සංඥ්ඥාණයෙන් හඳුනාගත හැකි ලෙස ග්‍රහණය කරගන්න පුළුවන් කම ලැබුණේ නැත. වර්තමානයේ තිබෙන්නේත් එයම ය.

www.peaceinsrilanka.lk



**අපේ බොහෝ ලේඛකයන් සිටින්නේ වී නමුත් යුද්ධය ගැන ලියැවී තිබෙන දේ ගත් විට ඒවා අර විඥප්ඥාණවාදී ආකාරයට, නැත්තම් තමන්ගේ කාල්පනික දේවල් හැටියටයි නිර්මාණය වී තිබෙන්නේ. එසේ නැතිව යුද්ධය තුළට ප්‍රවේශ වී සමීකරණය කිරීමක් ඒවායෙහි නැත.**

යුද්ධයේ සමීකරණය....

කවියන් හැටියට කෘති සම්භාරයක් කළ අය නොවන නමුත් උතුරේත්, නැගෙනහිරත්, තරුණ දෙමළ කවියන් අතින් ඉඳහිට යුද්ධයේ ඇති සැබෑව නිරූපනය වූ බව පරිවර්තන මාර්ගයෙන් මා දැක තිබේ. "ට්‍රේටර්" නමින් ඉංග්‍රිසියට පරිවර්තනය කර තිබෙන කෘතිය උදාහරණයකට ගතහැක. මා දන්නා තරමින් එය ප්‍රංශයේ පළ වී ප්‍රංශ භාෂාවෙන් ඉංග්‍රිසියට පරිවර්තනය කර තිබේ.

යුද්ධය යනු කෙබන්දක් ද? යුද්ධයක් ඇතිවුණේ කොහොම ද? යුද්ධයෙන් කොතරම් ආකාරයක විශාල සමාජ විනාශයක්, භිෂණයක් ඇති කළේ ද? යන්න මෙයින් නිරාවරණය කර ඇත. එ පමණක් ද නොව සංස්කෘතික, සාමාජිය සහ ආර්ථික වශයෙන් කොතෙක් දුරට ඔවුන් පීඩාවට පත්කළා ද යන්න එයින් දැකගත හැක. යුද්ධයේ තිබෙන බිහිසුණු බව කැටිකරගෙන ඒ තුළින් යුද්ධයේ යථාර්තය ග්‍රහණය කරගත් කෘතියක් ලෙස ඒ පොත මට හැඳින්වීමට පුළුවන.

මාගේ In Search of a Road නම් වූ වාර්තාමය චිත්‍රපටිය කරන විට ඕමන්තෙන් එහා තිබුණේ එල්. ටී. ටී. ඊ. රාජ්‍යයකි. එහි දී මට ඒ අයගේ කලාකරුවන්, චිත්‍රපටිකරුවන් බොහෝ දෙනෙකු හමුවීමේ අවස්ථාව සැලසුණි. ඔවුන් තුළ සංවේදී කලාකරුවෝ ද හිටිය හ. අනික එල්. ටී. ටී. ඊ. ය මගේ නිර්මාණය කරන්නට ද උදව් කළේ ය. නැත්නම් දකුණෙන් ගොස් මෙවැනි සිනමා නිර්මාණයක් කරන්නට ඉඩ ලැබෙන්නේ නැත. මෙයින් මා පෙන්වාදීමට මහන්සි ගන්නේ දරුණුම සහ කෲර, එල්. ටී. ටී. ඊ රාජ්‍ය යැයි හැඳින් වූ ඒ ප්‍රදේශය තුළ ද නිදහසක් තිබුණු බව ය. මට අවශ්‍ය දේ බලපෑමක් නොමැතිව කළා පමණක් නොව එහි කොපියක් ද දයා මාස්ටර්ට යැවූ නමුත් මට කිසි දෙයක් දැන්වූයේ ද නැති බව ද සඳහන් කළ යුතු ය.

**රාජ්‍ය මතවාදය හා කලාව**

රාජ්‍යය යනු කලාකරුවන් සහ කලා නිර්මාණ තුළට පුදුමාකාර විදියට ඇතුළු වී තිබේ. මෙහි දී මා කථා කරන්නේ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයෙන් කරන වාරණය පිළිබඳව නොව රාජ්‍ය බලය උත්කර්ෂයට නංවන කලා කෘතිවලට ලැබුණු අනුග්‍රහය සම්බන්ධයෙනි. එය තුන් පැත්තකින් සිදුවේ. තම දේශපාලනය සඳහා බොහෝ කලාකරුවන් ප්‍රමාණයක් තමන්ගේ අන්තේවාසිකයින් නැත්නම් වන්දිභට්ටයින් කරගෙන තමන්ගේ වටේ තබාගැනීම ඉන් පළමු වැන්න ය. කුමන ආණ්ඩුව බලයේ හිටියත්, එය ඉතා භයානක දෙයකි. එයින් සිදුවන්නේ රාජ්‍ය අනුග්‍රහය ලබන කලාකරුවන් රාජ්‍ය බලය විසින් මෙහෙයවෙන රාජ්‍ය මතවාදය ඉදිරියට ගෙනයෑම ය. එවිට යම්යම් හැකියාවන් තිබෙන, නිර්මාණ කුසලතා ඇති අය ඒ ආකාරයට කුලියට ගත් පසු රාජ්‍යයේ අධිපති මතවාදය සඳහා යි ඒ අය සේවය කරන්නේ. ඔවුන් නළුවන් ලේඛකයින් විය හැකිය. සංගිතඥයින් විය හැකිය. කලා ක්ෂේත්‍රයේ කිනම් හෝ විෂයකට අයත් විය හැකිය.

මහින්ද රාජපක්ෂගේ රෙජීමය තුළ මෙය දිගටම සිදු විය. ඒ අය මාධ්‍ය අරක්ගෙන තිබුණි. ජැක්සන් ඇතන්තනී, සෝමරත්න දිසානායක, රෝහණ වීරසිංහ, රවින්ද්‍ර රන්දෙනිය, මාලිනී පොන්සේකා යන රොත්තම උදාහරණයට ගතහැක. මේ අය එතනින් එහාට ගියේ නැත. මහාවංශය වැනි ඉතා ශ්‍රේෂ්ඨ කෘතියක් ගෙන , ඒ දෙස විවේචනාත්මකව නොබලා එය රාජ්‍ය බලය සඳහා පාවිච්චි කළ හ. සිංහල බෞද්ධ මතවාදය රැල්ලක් ලෙස ඉදිරියට පැමිණියේ ය. "අබා" සිට "සිරිසඟබෝ" හරහා "මහ රජ ගැමුණු" දක්වා එය පැමිණ තිබේ. දුටු ගැමුණු චරිතය "මහරජ ගැමුණු" තුළින් අති උත්කර්ශයෙන් වර්ණා කෙරේ. ජාත්‍යොන්මාදය නිසාය. මිනිසුන් මේවා නැරඹුවේ සහ නරඹින්නේ. මේ කෘති නරඹින්නේ කලා කෘති නරඹන ආකාරයට නොව ධාතු බලන ආකාරයෙනි.

මෙතරම් සුලභව නැතත් මෙය අලුත් දෙයක් නොවන බව ද කිව යුතු ය. අප අතීතකාලයේ දී "අජාසත්ත" චිත්‍රපටිය නරඹා තිබේ. "හතර මහා නිධානය" නමින් එල්. එම්. පෙරේරා චිත්‍රපටියක්

www.nytimes.com



**ජාතික උන්මාදය ඔලුවට දැමීමේ ප්‍රධාන හේතුවක් විය. මෙම යුද්ධය අප තේරුම් ගත්තේ අපේ රටේ ඇතිවුණු කැරැල්ලක් ලෙස නොව විදේශයක් ජය ගත් විලසිනි.**

යුධ ජයග්‍රහණයෙන් පසු

කළේ ය. ඒ කාලේ උපාසක අම්මලා සිනමා ශාලාවලට ගියේ මල්වට්ටි අරගෙන ය. එවැනි මානසික තත්ත්වයක් මේ රටේ තිබේ. රාජ්‍ය විසින් මිනිස්සුන්ගේ ඔලුවවලට දැමූ බෞද්ධ උන්මාදයක් තමයි එහි තිබෙන්නේ. ජාතික උන්මාදය එන්නෙත් රාජ්‍ය තුළිනි. යුද්ධය ජයගැනීම, ජාතික උන්මාදය ඔලුවට දැමීමේ ප්‍රධාන හේතුවක් විය. මෙම යුද්ධය අප තේරුම් ගත්තේ අපේ රටේ ඇතිවුණු කැරැල්ලක් ලෙස නොව විදේශයක් ජය ගත් විලසිනි.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ පාලකයා රජෙකු ලෙස රූපාන්තරණය කෙරෙන තුන්වන මහින්ද කරළියට කැඳවා ගත්තේ සුනිල් ආරියරත්න ය. දුටු ගැමුණු කළ යුද්ධය තුළින් දෙමළ ජනතාවට එරෙහි සටනකින් ලත් ජයක් ලෙස උතුරේ යුද්ධය අර්ථ දැක්විණි. එය මේ අය සම්බන්ධ කරන්නට යන්නේ අශෝක අධිරාජ්‍යාගේ ජයග්‍රහණයට ය. යුද්ධයෙන් කළකිරුණු ධර්මාශෝකට මෙන් මහින්ද රාජපක්ෂට ධර්ම රාජ්‍යයක් ගොඩනග න්නට හැකිවූයේ නැත. නමුත් සියුම් ව බලන විට ඒ මතවාදය ගම් නියම්ගම් පුරා ඉතා ශීඝ්‍රයෙන් පැතිරී ගියේ ය. රාජපක්ෂගේ ඡන්ද පදනම මේ තුළින් ශක්තිමත් කෙරිණ. එ පමණක් නොව මනාප ක්‍රමය විසින් එබඳු අපේක්ෂකයින් ඉහළට ඔසවා තැබේ. ආහාර, ගමන් ගාස්තු වැනි දේට වඩා මනාප ගන්නට බුද්ධාගම සිංහල ජාතිය අවශ්‍ය ය.

මේ කාරණා හේතුකොටගෙන එක්තරා ආකාරයකට කලාව සීග්‍රයෙන් පරිහානියට පත්විය. චිත්‍රපටි පමණක් නොව රජ්ජුරුවන් ගැන කවි හා සිංදු කීයක් ශ්‍රවණය වන්නේ ද? වේරලියද්දගේ මුවින් රජාණෝ යනුවෙන් ගැයෙන අතර රජෙකු පහළ වූ බව කියවෙන ගීයක් ගැහැණු ළමයෙකු විසින් ගැයිණ. ඊ ළඟට උතුරු දෙසින් එන්න, දකුණු දෙසින් එන්න කියන ගීතයක් ද ඇසේ.

මෙහිදී රාජ්‍ය මාධ්‍ය පමණක් නොව අනික් මාධ්‍යයත්, විශේෂයෙන් ම ස්වර්ණවාහිනී වැනි ආයතනත් අමු ජාතිවාදී ආස්ථානයක් ගෙන තම වැඩසටහන් කළේ ය. රූපවාහිනී නාලිකා, රේඩියෝ නාලිකා ආශ්‍රයෙන් මේ ආකාරයට මහා ජනමතයක් ගොඩනැගුවේ ය. එවිට කලාකරුවන් රොත්ත පිටින් සේවය කර තිබෙන්නේ ඒ රාජ්‍ය මතවාදයට ය. ඒ කලාව රාජ්‍යයේ අධිපතිවාදය විසින් ඉදිරිපත් කෙරෙන මතවාදයෙන් පෝෂණය ලබන්නකි. එය සිදුවන්නේ වන්නේ වාරණය තුළින් නොවේ. රාජ්‍ය බලය නිර්මාණවලට කාන්දුවන ආකාරය එයින් මොනවට පැහැදිළි වේ.

**කලා වාරණය**

අනික් එක තමයි කලා නිර්මාන වාරණය. ඒක විශේෂයෙන්ම පෙනෙන්නේ දෘශ්‍ය කලාවන්හි ය. අශෝක හඳගමගේ අක්ෂරය චිත්‍රපටය උදාහරණයට ගතහැක. එය තහනම් කරන්නේ විනිශ්චය කරුවන්ගේ ප්‍රතිරූපය විනාශවන බව කියමිනි. ප්‍රසන්න වීතානගේ නිර්මාණය කළ පුරහඳ කළුවර ද තහනම් කෙරිණ. පසුව නඩු කියා තහනම ඉවත්කර ගත හැකි විය. පුරහඳ කළුවර තහනම් කරන්නට හේතු වුයේ වෙන යමක් නොව එ මගින් යුධ හටයන්ගේ ධෛර්ය විනාශ කෙරෙන බව කියමිනි. මේ සියල්ල කළ රාජපක්ෂ පාලනය, ප්‍රතිරූපය කොලසාගත් පුද්ගලයෙකු අග විනිසුරු ලෙස පත්කළේ ය.

මේ අතර යුද්ධය පිළිබඳ චිත්‍රපටි පිටපත් බලන්නට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට භාරකෙරිණ. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වන අජිත් රෝහණ ද පිටපත් බලන්නට පැමිණියේ ය. මේවා නිසා රූප ගත කරමින් සිටි චිත්‍රපටි පවා නවත්වන්නට සිදු වී තිබේ.

ආගමට කිසියම් ප්‍රශ්නයක් මතුවන්නේ ද බලන්නට ආගමික නායකයින් සහ රාජ්‍ය සම්බන්ධයෙන් මතුවන දෙයක් තිබේ දැයි බලන්නට පිරිසක් වාරණ මණ්ඩලයක සිටිති. දැන්, දැන් පොලිස් කාරයෝ සහ හමුදාකාරයෝ ද පැමිණෙති. මේ වාරණ කරන්නේ මේ

www.utsandiego.com



**පසු ගිය වසර 10 තුළ තමන් සිදු කළ සංවර්ධනය තුළින් උතුරේ බොහෝ ප්‍රශ්න විසඳුණු බව ඇතැම් පාලකයෝ කියති. නමුත් 30 අවුරුදු යුද්ධයේ පීඩාවෙන් පසු ඇයි මේ මිනිස්සු ඡන්දය දුන්නේ කියන එක විමසිය යුතු ය.**

උතුරේ ජනයා තම ඡන්දය භාවිතා කරමින්....

අංශවල අතිශය දූෂිතයින් සිටින රටක ය. මේ මගින් සමාජය දෙස කලාකරුවෙකුට ස්වාධීනව බලන්ට අයිතියක් නැති කර තිබේ. ඒ ආකාරයට ප්‍රධාන ප්‍රවනතා තුනකින් කලාව වාරණයට ලක් ව ඇත.

### කලාව හා ප්‍රජාතන්ත්‍රවාදය

තුන් පැත්තකින් වන මේ වාරණය ප්‍රජාතන්ත්‍රවාදය සමඟ එකට බැඳී ඇත. එහෙයින් බොහෝ විට තමන්ගේ කලාව අත්හැර ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමේ අරගලයට පිවිසෙන්නට කලාකරුවන්ට සිදුවේ. මේ වතාවේ පුරවැසි බලයේ කලාකරුවන් ලෙස අපට එළියට බසින්නට සිදුවුයේ මේ ආකාරයට ය. අනෙක් අතට මෙය නොකර නව පරපුරේ කියන ඒ තරුණ කලාකරුවන්ට කලාව කරන්නට නොහැකි බව හැඟුණ නිසයි ඔවුන් පැමිණියේ.

මේ අත්දැකීමට අනුව අප මේ ආණ්ඩුවට කියන්නේ අර තහංචි අයින් කර දමන ලෙස ය. ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිෂ්ඨාපනය කිරීම කලාකරුවන් ස්වාධීන කිරීමේ ව්‍යාපෘතියේ කොටසකි. සමහර විට ඒ තුළ තිස් අවුරුදු යුද්ධය නිවැරදි ලෙස දකින්නට හැකි කලාකරුවන් බිහිවෙන්ට පුළුවන. පසුගිය කාලයේ අපට දකින්නට හැකි වුයේ රාජ්‍ය මර්දනය, අතුරුදන්වීම්, ඝාතන, ස්ත්‍රී දූෂණ සහ අවතැන්වීම් වැනි දේ ය. වසර 30ක් තුළ ආවරණය වී තිබූ බොහෝ දේ තහංචි ඉවත් කිරීමෙන් නිරාවරණය වෙන්නට පුළුවන.

පසු ගිය වසර 10 තුළ තමන් සිදු කළ සංවර්ධනය තුළින් උතුරේ බොහෝ ප්‍රශ්න විසඳුණු බව ඇතැම් පාලකයෝ කියති. නමුත් 30 අවුරුදු යුද්ධයේ පීඩාවෙන් පසු ඇයි මේ මිනිස්සු ඡන්දය දුන්නේ කියන එක විමසිය යුතු ය. මගේ කල්පනාවේ හැටියට හොඳ කලා නිර්මාණයකට ද ඒය තේමාවකි. යුද්ධ කාලයේ යාපනයේ විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකු මුහුණ දුන් සිද්ධියක් මට අසන්නට ලැබුණි. මගේ දෙමළ චිත්‍රපටියේ තාත්තාගේ චරිතය නිරූපණය කළේ ද ඔහු ය.

කුලියට ගත් පරණ නිවසක ජීවත්වන ඔහුගේ නිවහනට මා ගිය විට කාමරයක සිටින තම අම්මා මට පෙන්වී ය. ඒ අම්මා සැම විටම පිස්සියක් මෙන් ගෙදර තිබුණු උඩ තට්ටුව හා කොරිඩෝව ගැන අසන හෙයින් ඇයගේ සැනසීම සඳහා ඊට තරමක් සමාන එම ගෙය ඔහු කුලියට ගෙන තිබේ. ඔහු පවසන ආකාරයට තම මෑණියන් ඒ අයහපත් මානසික මට්ටමෙන් දැන් මිදෙමින් සිටින්නී ය.

### කලාවේ ස්වාධීනත්වය

සිනමාව පැත්තෙන් ගත් කල විශල පසුබැසීම් පසුගිය කාලයේ තිබුණි. සිනමාව අනික් කලාවට වඩා වේගයෙන් වර්ධනය වන කලාවකි. එම කලාව අනිකුත් සියලු කලාවන් උරාගනී. උදාහරණයක් ලෙස කවි, නවකථා සහ කෙටිකථා චිත්‍රපටියට නැගෙන්නට පුළුවන. දැනුම කියන එක නිකම්ම එන්නේ නැති හෙයින් ඒවාට ආයතන තිබිය යුතුය. පසුගිය කාලයේ ඒවා කිසි දෙයක් තිබුණේ නැත. පසුගිය පාලන කාලයේ දී රන්මිණිතැන්න නමින් හම්බන්තොට ටෙලි ගම්මානයක් බිහි විය. හොලිවුඩ් සහ බොලිවුඩ් අතර එය ජ්ලයිවුඩ් ලෙස හාස්‍යයට ලක් විය. ඉන්දියාවේ නළුවෝ මෙහෙ පැමිණ රෑ ගතකළා යැයි කීමෙන්වත්, එම උපකරණ මෙහෙ තබාගිය බව පැවසීමෙන්වත් එය සාර්ථක වන්නේ නැත. කිසිදු දැක්මක් නැති එවැනි මහා ප්‍රදර්ශනාත්මක වැඩ තුළින් කලාවක් සංවර්ධනය කළ නොහැක.

අනික් අතට තාක්ෂණය සම්පූර්ණයෙන්ම උඩුයටිකුරු වී තිබේ. සිනමාව සම්පූර්ණයෙන් ඩිජිටල් කරණයට ලක්ව ඇත. සිනමාවේ තිබුණ මූලික යාන්ත්‍රණය හා තාක්ෂණය සම්පූර්ණයෙන් වෙනස් වී තිබේ. දැන් දළ සේයාපට යනුවෙන් දෙයක් නැත. ඒ නිසා ප්‍රක්ෂේපණය පවා වෙනස් ය. ඩිජිටල් සිනමා ප්‍රොජෙක්ටර් සඳහා සිනමා ශාලා සූදානම් විය යුතු අතරම ඩිජිටල් තාක්ෂණයට අනුව චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සිදුවී ඇත. ලෝකයේ සිදුවී තිබෙන මෙම වෙනස, අඩු ගණනේ එහෙම දෙයක් සිදුවූ බවට ප්‍රතිපත්තියක්




**සමහර වේලාවන් හි 7.30න් පසු ඉතාම බාල ටෙලි නාට්‍ය හැම නාලිකාවක මෙන්ම ප්‍රචාරණය වේ. ඇත්තට ම මිනිසුන් ඒවා බලන්නේ නැති බව ඒ නාලිකාවලින් ම තේරුම් ගතහැක. සමහර නාලිකාවල වැඩ සටහන් තිබෙන්නේ බැලුවොත් මුදල් ලැබෙන අයුරිනි.**

ලෙසවත් පිළිගත යුතු ය. පසුගිය කාලයේ සිනමාව කලාවක් හැටියට පමණක් නොව තාක්ෂණය අතින් පවා ඉදිරියට යෑමට තිබූ ගමන සම්පූර්ණයෙන් අඩාළ විය.

අප ඉගෙන ගන්න කාලයේ ස්වාධීනව කලා නිර්මාණවල යෙදෙන්නට හැකි පරිසරයක් විශ්වවිද්‍යාලවල තිබුණි. උදේ 9.00ට පටන්ගෙන සවස 4.00 වන විට කන්තෝරු මෙන් එකල විශ්වවිද්‍යාල වැසුණේ නැත. ඒ කාලයේ විශේෂයෙන්ම විශ්ව විද්‍යාල පැය 24ක් විවෘත වී තිබුණි. අද කිසිම ආකාරයකින් ශිෂ්‍යයන්ට අධ්‍යාපනයෙන් එහාට වෙන ජීවිතයක් නැත. මේ වන විට දේශපාලනීකරණය වී ඇති විශ්ව විද්‍යාල පරිහානියට පත් වී තිබේ.

අප සිටින කාලයේ කලාව අප අතින් පෝෂණය වූයේ එම අතිරේක කාලය අධ්‍යාපනය ලබන කාලයට බාධාවක් නොවෙන ආකාරයට යොදාගෙන ය. එහෙම කාලයක් ඒ කාලයේ නාගරික ආයතනවල ද තිබුණි. 4.30ට වැඩ අවසන් වූ ලිපිකරුවෝ ගෙවල් වලට ඒ මොහොතේම නොගිය හ. ඔවුන් නාට්‍ය පුහුණු කළා මෙන්ම සංගීත කටයුතුවල ද යෙදුණි. පේරාදෙණිය ගතහොත්, මනමේ සහ සිංහබාහු සරච්චන්ද්‍ර මුල් කරගෙන කිසියම් ප්‍රබෝධයක් වූවා නම් එයත් සමඟ ම මතු වූ අපේ කට්ටිය වැනි නාට්‍ය කණ්ඩායම් වලින් පැමිණ මෙම කටයුතුවල යෙදෙන්නට අතිරේක කාලයක් ඒ අයට තිබුණි. සුගතපාල සිල්වා, ටෝනි රණසිංහ, සිරිල් බී පෙරේරා වැනි විචාරකයෝ එ අලුත් දැනුම අත්පත් කර ගත්හ. මේකට අර මුලින් කී ප්‍රජාතන්ත්‍රවාදය ද හේතු විය.

එමෙන්ම බාහිරව පැවති නිදහස තුළ අවශේෂ නාට්‍ය ද බිහිවිය. කලා මණ්ඩලය නව නිර්මාණවලට ශක්තියක් විය. එහි ව්‍යවස්ථාව ගත්තොත් එය ඉතා ප්‍රජාතන්ත්‍රවාදී ය. එකල සංස්කෘතික දෙපාර්තමේන්තුවක් නොතිබුණි. සංස්කෘතික දෙපාර්තමේන්තුවක් ආවාට පසු කලා මණ්ඩලය සම්පූර්ණයෙන්ම සංස්කෘතික දෙපාර්තමේන්තුව යටතට ගැනිණ. එතැනින් පසු සංස්කෘතික දෙපාර්තමේන්තුවට කිරීමට දෙයක් නැති හෙයින් කලා මණ්ඩලයෙන් කළ දේ ඔවුන් අතට පත්විය. රාජ්‍ය සාහිත්‍ය උළෙල යනාදිය මෙයට උදාහරණ ය. කලා මණ්ඩලයට වැඩ කිරීමට පරිසරයක් සකස් නොකර සංස්කෘතික දෙපාර්තමේන්තුවේ යැපීම සඳහා සොච්චමක් දී අකර්මන්‍ය තැනක් බවට කලා මණ්ඩල පත් කෙරිණ. කලා භවන හැදුවේ නෙළුම් පොකුණ හදන්නට පෙර ය. තමන්ගේ සලකුණ තැබූ නිර්මාණකරුවන් සැළකිය යුතු ප්‍රමාණයක් රජයේ ලලිත කලායතනයෙන් බිහි වුණි. එමෙන්ම උඩරට හා පහත රට නැටුම් ඒ තුළ පෝෂණය විය. මේ සියල්ල පැමිණියේ අර ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තුළය. ඒවා සියල්ල ස්වාධීනව පවතින්නට නොදී රාජ්‍ය බලයට කේන්ද්‍රගත කෙරිණි.

රජය කළ යුත්තේ මුලින් තිබුණු ආකාරයට ඒවාට ස්වාධීනත්වය දීම ය. ජනමාධ්‍යට වී තිබෙන්නේ ද මේ නස්පැත්තියම ය. විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය අංශය යනු ඉතාමත් පිරිහුණු අංශයකි. මහාචාර්යකම් ලබාගත් ඇතැම් අනාචාර්යවරු නිබන්ධ ලෙස ලියා තිබෙන්නේ වල්බූත ය. මේ ආකාරයට අධ්‍යාපනයේ ඉහළ තැනම පිරිහී තිබේ. මෙසේ ඉහළ තැන පිරිහුණු පසු එය ළමුන්ට ඉතාමත්ම නිශේධනාත්මකව කාන්දු වේ.

### නව ලිබරල්වාදය හා කලාව

මෙයට අමතරව 77න් පසු නව ලිබරල් ප්‍රතිසංස්කරණවලින් විනෝදාස්වාදය වෙනුවෙන් කළ ඒවා ද ලාභ ලබන භාණ්ඩ බවට පත් වී ඇත. පරිභෝජන සමාජය යනු උන්මත්තක භාවයකි. වෙළෙඳ ප්‍රචාරණය නැතිව අද ජනමාධ්‍යට පවතින්ට නොහැක. සති අන්තයේ පෙන්වන වැඩසටහන් කොයි රටේ ද යන්න සිතා ගන්නට ද නොහැක. මෙයින් කියන්නේ විදේශ රටවල පෙන්වන ඒවා නරකය යන්න නොවේ. තෝරාගෙන තිබෙන්නේ හොඳ ඒවා නොවන

88 වැනි පිටුවට



තිඹිරියාගම බණ්ඩාර
thimbiri@gmail.com




ඝාතනය කරනු ලැබූ භාරත ලක්ෂ්මන් මහතාට හිටපු ජනාධිපති අවසන් ගෞරව දක්වමින්

# නව දේශපාලන සංස්කෘතියක් ගොඩ නැගීමේ අභියෝගය

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ අපූර්වතම අත්දැකීමක් බවට පත් වූ සර්ව පාක්ෂික ආණ්ඩුව තම බිළිඳු වියෙන් ළමා වියට පිවිසෙමින් සිටී. එය යොවුන් වියට එළැඹීමට නියමිත ව ඇත්තේ අප්‍රියෙල් මස 23 දා යින් පසුව පැවැත්වෙන මහ මැතිවරණයේ දී ය. ළමා වියේ දී අකල් මරණයකට ගොදුරු නොවී යොවුන් වියට එළඹෙන්නටත් කෙමෙන් තුරුණු විය හා මැදි විය ඉක්මවා සැඳෑ සමයට එළඹෙන්නටත් ඊට හැකියාව ලැබේවා යි පතමි.

දූෂණයෙන් තොර යහපාලනයක් ගොඩ නැඟීම, බලයට පත්වූ පක්ෂ හා සංවිධාන එක්ව මැතිවරණ ව්‍යාපාරයේ දී ඉදිරිපත් කළ ප්‍රධාන තේමාවයි. මෙය ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතියෙහි කඩයිමක් විය හැකි අවස්ථාවකි. එය එසේ වනුයේ නව ආණ්ඩුවෙහි ගමන් මග කුමන දිසාවකට සේන්දු වේදැයි යන කරුණ මත ය.



**යහපාලනය සඳහා වත්මන් ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙල කිච කරන ප්‍රකාශ නිකුත් කරමින් සිටින සන්ධානයේ හවුල්කාර වමේ පක්ෂවලට තවමත් එජාපය පෙනෙනුයේ බටහිර ගැති කොම්ප්‍රදෝරු ධනපති පන්තියේ පක්ෂයක් හැටියට ය.**

ඩඩලි, රනිල්, ජේ.ආර්.

යහපාලනයක් ගොඩනැගීමේ ඓතිහාසික ක්‍රියාදාමයේ නියමුවන් වී සිටිනුයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් වරයා සහ එක්සත් ජාතික පක්ෂයේ නායකයා ය. ඍජු ව හා වක්‍ර ව මීට සහයෝගය දෙන දේශපාලන පක්ෂ හා සිවිල් සංවිධාන සංඛ්‍යාව විශාල ය. ජනාධිපතිවරණයෙන් පසු ව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා ජනාධිපති හැටියට ද එජාප නායකයා අගමැති හැටියට ද සෙසු බොහෝ පක්ෂවල නියමුවෝ ඇමතිවරු හැටියට ද පත් වූහ.

ශ්‍රීලනිපය හා එජාපය මේ රටේ දේශපාලන ඉතිහාසයෙහි හැසිරී ඇත්තේ සතුරු බලවේග දෙකක් හැටියට ය. පැරණි මාක්ස්වාදීන් එජාපය හැඳින්වූයේ කොම්ප්‍රදෝරු (බටහිර ගැති) ධනපති පන්තියේ පක්ෂය ලෙස ය. ශ්‍රීලනිපය හැඳින්වූයේ දේශීය ධනපති පන්තියේ පක්ෂය හැටියට ය.

වමේ ව්‍යාපාරය කිසිම දාක එජාපය හා සන්ධානගත නොවූ නමුත් ශ්‍රීලනිපය සමඟ සන්ධානගත වී එජාපය පරදවා කිහිප විටක් ම ආණ්ඩු බලය හිමිකර ගත්තේ ය.

යහපාලනය සඳහා වත්මන් ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙල කිච කරන ප්‍රකාශ නිකුත් කරමින් සිටින සන්ධානයේ හවුල්කාර වමේ පක්ෂවලට තවමත් එජාපය පෙනෙනුයේ බටහිර ගැති කොම්ප්‍රදෝරු ධනපති පන්තියේ පක්ෂයක් හැටියට ය. එමෙන් ම බටහිර අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාකම් අනුව කටයුතු කරන පක්ෂයක් ලෙසට ය.

තිස්ස විතාරණ හිටපු ඇමතිවරයාට අනුව ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා බටහිර වුවමනාකම් අනුව කටයුතු කරන ඉත්තෙක් විය. කරුණු මෙසේ තිබිය දී යහපාලන අපේක්ෂා වෙනුවෙන් නායකත්වය ගෙන කටයුතු කළ පාර්ශ්ව විධායක බලය හා ආණ්ඩු බලය හිමිකරගත් හ.

දින 100 වැඩ සටහනෙන් පසු ව ඔවුන්ගේ අපේක්ෂාව මහමැතිවරණයක් පවත්වා සියලු පක්ෂ නියෝජනය වන ජාතික ආණ්ඩුවක් තැනීම ය.

මේ අරමුණ සඳහා වැඩ පිළිවෙළක් දියත් ව පවතින අතර ශ්‍රීලනිපයේ එක් පාර්ශ්වයක් මෙයට පක්ෂව කටයුතු කරමින් සිටී. තවත් පාර්ශ්වයක් මේ වැඩ පිළිවෙළට මාරාන්තික වාග් ප්‍රහාර එල්ල කරමින් සිටී. දැඩි මහින්දවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ විමල් වීරවංශ ප්‍රමුඛ සුළුතර කණ්ඩායමක් මෙහි එක් පාර්ශ්වයකි. අනෙක් පාර්ශ්වය නියෝජනය කරන්නේ විවිධ දූෂණ හා අපරාධ චෝදනාවලට ලක් වී සිටින පුද්ගලයන් ය.

බිළිඳු අවධිය පසුකරමින් සිටින ආණ්ඩුව කුජීත කර දමා පැරණි ආණ්ඩුව යළි ගොඩ ගැනීම ඔවුන්ගේ අරමුණයි. ඇමති ධුර අහිමි වූ වමේ පාර්ශ්වය මෙයින් අපේක්ෂා කරනුයේ ඇමැතිධුර හා වරප්‍රසාද නැවත ලබා ගැනීම ය. දැඩි මහින්ද හිතවාදී විමල් වීරවිංශ වැනි කණ්ඩායම් ප්‍රධාන පක්ෂ දෙක ම ගණන් නොගන්නා තත්ත්වයක් තුළ තමන්ට පිළිගැනීමක් ඇති ආණ්ඩුවක් දිනා ගැනීමට යත්න දරනු ඇත. ඇද වැටී සිටින මහින්ද රාජපක්ෂට සළු පිළි අන්දවා මහමැතිවරණ කරළියට ගෙන ඒම ඔවුන්ගේ අභිලාෂය වී ඇත්තේ එම නිසා ය.

මේ සියලු ගැටලු සමනය කරගෙන මහ මැතිවරණයක් කරා යන ගමනේ දී නව ආණ්ඩුව සහ ජනාධිපතිවරයාට පිටු නොපා සිටිය හැකි ඊට වඩා බරපතළ අභියෝගයක් තිබේ. එනම් නව දේශපාලන සංස්කෘතියක් මහජනතාවට පුරුදු පුහුණු කිරීමේ අභියෝගය යි.

www.dailynews.lk



**"මේ ආණ්ඩුව හදන්න වමේ අයත් හවුල් වුණා. අන්තිමේට ලුම්පන් බලවේග ජයගෙන ආණ්ඩුවේ ප්‍රගතිශීලී කොටස් දුර්වල උනා."**

ඩියු, වාසු, තිස්ස

ගහ මරා ගන්නා දේශපාලනය ඉබේ ඇති වූවක් නොවේ. ඩලස් අලහප්පෙරුම හිටපු ඇමතිවරයා සිතන පරිදි මනාප ක්‍රමය නිසා ඇති වූවක් ද නොවේ. එය මේ රටේ පන්ති පදනම වෙනස්වීම හා සංකීර්ණ වීම පිළිබඳ ප්‍රශ්නයකි.

දැනට පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයන් අතර සිටින කළු සල්ලි කාරයන් කොතෙක් දැයි දන්නෝ දනිති. චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනිය ලෙස පත්වීමෙන් වසර කිහිපයකට පසුව වාම චින්තකයකු වූ තිස්ස අබේසේකර පුවත්පත් සාකච්ඡාවක දී මෙසේ ප්‍රකාශ කර තිබුණි.

''මේ ආණ්ඩුව හදන්න වමේ අයත් හවුල් වුණා. අන්තිමේට ලුම්පන් බලවේග ජයගෙන ආණ්ඩුවේ ප්‍රගතිශීලී කොටස් දුර්වල උනා.''

ඔහුගේ මේ නිර්වචනය හරියට හරි ය. වත්මන් මහජන නියෝජිතයන්ගේ පන්ති පදනම අතීතයෙහි මෙන් ම කොම්ප්‍රදෝරු හෝ දේශීය ධනපති යනාදී වශයෙන් සරල බෙදීමකට ලක් කළ නොහැක. එය ඊට වඩා සංකීර්ණ ය.

බ්‍රිතාන්‍ය යටත්විජිත සමයෙහි වතු වැවිලි කර්මාන්තය, කෝපි වගාව, මිනිරන් කර්මාන්තය, අරක්කු සහ රා රේන්දය, ඉදිකිරීම් කර්මාන්තය යනාදී ක්ෂෙත්‍ර ඔස්සේ නිර්මාණය වුණු නව ධනපති පන්තියේ නියෝජිතයෝ ද කාරක සභා ආණ්ඩු නියෝජනය කළ හ. එය ඉංග්‍රීසි උගත් පන්තියකි.

1948 නිදහසෙන් පසුව නිදහස් අධ්‍යාපනයේ අනුහසින් උගත් මධ්‍යම පන්තියෙහි නියෝජිතයන් හට ද ව්‍යවස්ථාදායකයේ දොරගුළු විවර විය.

1980 දශකයෙන් මෙ පිට අවධිය බලන විට නීති විරෝධී ජාවාරම්වලට සම්බන්ධ වූවන් හට ද ව්‍යවස්ථාදායකයට පිවිසීමේ අවස්ථාව උදා වූයේ බලයට එන දේශපාලන පක්ෂයට අත දිග හැර වියදම් කිරීම ඔස්සේ තම ජාවාරම්වලට සුජාත භාවයක් ලබාගැනීම අනුව ය.

මත් කුඩු ජාවාරමට චෝදනා ලැබ සිටින එක් මන්ත්‍රීවරයෙකු සන්ධාන ආණ්ඩුවට එක් වූයේ විපක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුව සිටියදී ඔහුට එල්ල වූ අපරාධ චෝදනා හේතුවෙනි. එතනෝල් ජාවාරමට චෝදනා ලැබ සිටින මන්ත්‍රීවරයෙකු විපක්ෂයේ සිට සන්ධානයට එක් වූයේ ඔහුට විරුද්ධ ව ඇති චෝදනා එළියට එන්නට වූ මොහොතක ය.

මේ අනුව කළු සල්ලිකාර පන්තියක් ආණ්ඩු බලය හැසිරවීමේ හයිය ද අතට ගෙන සිටී.

මෙය කොම්ප්‍රදෝරු ධනපති පන්තිය හා දේශීය ධනපති පන්තියට වඩා වෙනස් ලුම්පනයකි. මෙම ලුම්පන් පන්තිය රාජ්‍ය පාලනයේ මර්මස්ථානවල පැතිරී සිටින්නේ පිළිකාවක් පරිද්දෙනි.

කොළඹ මත් කුඩු ව්‍යාපාරය මර්දනය කිරීමේ යෙදී සිටි පොලිස් පරීක්ෂක ඩග්ලස් පීරිස් ඝාතනය, දක්ෂ අවංක රේගු නිළධාරියෙකු වූ සුජිත් ප්‍රසන්න පෙරේරා ඝාතනය සහ භාරත ලක්ෂමන් ප්‍රේමචන්ද්‍ර ඝාතනය යනාදී ඝාතන රැසක් පිටුපස සිටින බලවේගය වන්නේ ලුම්පන් පන්තියයි. ව්‍යවස්ථාදායකයෙහි ද පිළිකාවක් ව තිබෙන මෙම ලුම්පන් බලවේග පරාජය කිරීම මාරාන්තික ක්‍රියාවකි. පසු ගිය ආණ්ඩු පාලන අවධියෙහි විශේෂත්වය වන්නේ මෙකී ලුම්පන් බලවේගවලට රාජ්‍යාරක්ෂාව ද ලැබීම ය.

1950, 60, 70 දශකවල මෙරට අනුහස් පැතිර වූ පරිපාලන නිළධාරීන්, ගුරුවරුන්, ලිපිකරුවන් ඇතුළත් වූ මධ්‍යම පන්තිය කිසියම් ශාස්ත්‍රීය ශික්ෂණයක් සහිත විචාරවත් පන්තියක් විය.

www.facebook.com



**මත් කුඩු ජාවාරමට චෝදනා ලැබ සිටින එක් මන්ත්‍රීවරයෙකු සන්ධාන ආණ්ඩුවට එක් වූයේ විපක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුව සිටියදී ඔහුට එල්ල වූ අපරාධ චෝදනා හේතුවෙනි.**

එවක රටෙහි දේශපාලන චින්තනය සකස්වීම කෙරෙහි බලගතු බලපෑමක් කිරීමේ හැකියාව මොවුන් සතු විය. එහෙත් නූතනයෙහි එම පන්තිය අභිබවා නැඟ එන පන්ති මට්ටම් කිහිපයක් නිර්මාණය වී තිබේ. විවිධ ව්‍යාපාර, නීතිවිරෝධී ක්‍රියා, කොමිස් යනාදී මාර්ග ඔස්සේ කෙටි කාලයකින් සමෘද්ධිමත් භාවයට පැමිණි මෙම නව ධනපති පන්තියේ අනුහස නූතන දේශපාලනයේ දිශානතිය තීන්දු කරන තීරණාත්මක බලවේගයකි.

උගතුන්ගෙන් සැදුම් ලත් පැරණි මැද පන්තියෙහි කොඳු බිඳ දමා තිබේ. එම පන්තිය ද නූතනයෙහි අවිචාරවත් සමාජ තීරුවකි. කෙටි මාර්ගවලින් ධනපතියන් බවට පත් වූ පන්ති ගණනාවක් තිබෙන අතර ඔවුන් ද අවිචාරවත් සමාජ තීරුවකි.

එහෙත්, ඔවුන්ට ඇත්තේ විශාල සමාජ බලයකි. දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ සිට ව්‍යවස්ථාදායකයට තම නියෝජිතයන් තල්ලු කිරීම දක්වා වූ සමාජ දේශපාලන බලයක් ඔවුන්ට හිමි ය.

මොවුන්ගේ සටන් පාඨය වී ඇත්තේ ද තම අශිෂ්ට බව වසා ගැනීමේ සළුපිළි බවට පත්ව ඇත්තේ ද මෙම දේශප්‍රේමයයි. හිටපු ජනපති මහින්ද රාජපක්ෂ සහ ඔහු ළඟින් ම සිටි කණ්ඩායමෙන් දෘශ්‍යමාන වූයේ මෙම දේශප්‍රේමී සමාජ තීරුවයි. දේශපාලන බලය මොහොතකට අහිමි වූ බව පෙනුණ ද මෙම දේශප්‍රේමී බලවේග තවමත් සමාජයේ හොල්මන් කරමින් සිටී.

මෛත්‍රී පාලනයේ වැදගත් ලක්ෂණයක් බවට බැලූ බැල්මට පෙනෙනුයේ ව්‍යාජ දේශප්‍රේමයේ ධජය අතහැරීම ය. කොහොමටත් රනිල් වික්‍රමසිංහගෙන් නියෝජනය වන පරිණත දේශපාලන සංස්කෘතිය තුළ ව්‍යාජ දේශප්‍රේමයට ඉඩක් නැත. නූතනයේ එම දේශප්‍රේමී ධජය යට ඇති පාදඩ දේශපාලනය පිළිබඳ රනිල් හොඳින් දනී.

ශ්‍රීලනිපයේ මහ ලේකම්කම, රටේ ජනාධිපති කමට අමතර ව මෛත්‍රීපාල සිරිසේන මහතාට ලැබී තිබේ. පොදුවේ සන්ධානයේ සංයුතිය ගත් විට ඔවුන් තවමත් ව්‍යාජ දේශප්‍රේමයේ ධජය අඩකුඹු කරගෙන සිටිනු විනා එය අතහැර නැත. මීළඟ මහ මැතිවරණයේ දී ඔවුන් කුමක් කරනු ඇති ද?

සත්‍ය වශයෙන් ම යහපාලනය සහ නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීමේ දී අමාරු ම අභ්‍යාසය කරන්නට වී ඇත්තේ ශ්‍රීලනිපය ප්‍රමුඛ කරගත් සන්ධානයට ය. ශ්‍රී ලංකා දේශපාලනයේ වැඩවසම් නෂ්ඨාවශේෂ රැසක් තවමත් නඩත්තු කරමින් සිටිනුයේ ද එම පක්ෂය විසිනි. රනිල්ගේ පරිණත නායකත්වයෙන් යුතු එජාපයේ දේශපාලන බල රටාව ඉදිරියේ ශ්‍රීලනිපයේ වැඩවසම් නෂ්ඨාවශේෂ කෙළින් කිරීමට නොහැකි වේ නම් එය අප රටේ දේශපාලන සංස්කෘතිය පරිණත භාවයට පත් වීමේ ඓතිහාසික අවස්ථාවක් වනු නිසැක ය. ●




# සර්වපාක්ෂික ආණ්ඩුවක් අවශ්‍ය වන්නේ ඇයි ?

ජනාධිපති **මෛත්‍රීපාල සිරිසේන**

> “ අප සර්ව පාක්ෂික ආණ්ඩුවක් හැදුවේ දින 100 වැඩ සටහන ක්‍රියාත්මක කර ඉන් පසු මහ මැතිවරණයක් පැවැත්වීම සඳහායි. එම මැතිවරණයෙන් පසුව නිර්මාණය කරන ජාතික ආණ්ඩුව තුළ අවම වශයෙන් අවුරුදු දෙකක්වත් අප එක් වී රට ගොඩ නැගිය යුතුය

අප නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන්නේ සර්ව පාක්ෂික ආණ්ඩුවක් හෙවත් ජාතික ආණ්ඩුවක් බව මැතිවරණ ව්‍යාපාරයේ මුල පටන් ම ප්‍රකාශ කළා. එබඳු ආණ්ඩුවක රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක නියෝජනය විය යුතුයි. මේ පණිවුඩය ජනතාව අතරට ගෙනයෑමේ දී එජාප, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු පක්ෂ ගණනාවක් පුළුල් සහයෝගයක් ලබා දුන්නා. එසේ බලය ලබා දුන්නේ දින 100 වැඩ සටහන සහ මැතිවරණ ප්‍රකාශයේ ඇතුළත් පොරොන්දු ඉටු කිරීමටයි. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් නැතිව තිබෙන ව්‍යවස්ථාව වෙනස් කළ නොහැකියි. වත්මන් පාර්ලිමේන්තුවේ වැඩි බලය තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 න් 127ක් ම ශ්‍රී.ල.නි. පාක්ෂිකයින්. ඔවුන්ගේ සහය නොමැතිව දින 100 වැඩ සටහන ක්‍රියාත්මක කළ නොහැක් යි. මැතිවරණයක් පැවැත්වීමෙන් පසු ව්‍යවස්ථාදායකයේ කුමන ව්‍යුහයක් ඇතිවේ දැයි කිව නොහැකි යි. එය සිදු වන්නේ ජනතාවගේ තීන්දුව මතයි. දින 100 වැඩසටහන සහ මතිවරණ

“ හොරු තවම අත්අඩංගුවට ගත්තේ නැත යනුවෙන් චෝදනාවක් එල්ල වී තිබෙනවා. එහෙත් පිළිගත් නීතියට අනුව මිස කැලෑ නීතියට අනුව කටයුතු කරන්න බැහැ.

ප්‍රකාශනය වතුරේ යවා දේශපාලන අර්බුදයක් නිර්මාණය වීම වළක්වා ගත යුතුයි.

පක්ෂයේ සභාපති තනතුර මට ලබා දීම සඳහා පක්ෂ සාමාජිකයන් මහින්ද රාජපක්ෂ මහතාගේ කැමැත්ත ලබා ගත්තා. මැතිවරණය අවසානයේ ඔවුන් විවිධ මත දැරුවත් විධායක ජනාධිපති ධුරයට ඔවුන්ගේත් කැමැත්තක් නැහැ. දුන් පොරොන්දු ඉටු කිරීම සඳහා තමන් සහය දෙන බව ඔවුන් මට ප්‍රකාශ කළා.

අප සර්ව පාක්ෂික ආණ්ඩුවක් හැදුවේ දින 100 වැඩ සටහන ක්‍රියාත්මක කර ඉන් පසු මහ මැතිවරණයක් පැවැත්වීම සඳහායි. එම මැතිවරණයෙන් පසුව නිර්මාණය කරන ජාතික ආණ්ඩුව තුළ අවම වශයෙන් අවුරුදු දෙකක්වත් අප එක් වී රට ගොඩ නැගිය යුතුයි. එහි ප්‍රතිඵලය නව දේශපාලන සංස්කෘතියක් බිහිවීමයි. එය එක දවසකින් ක්‍රියාත්මක කළ හැක්කක් නොවේ. එම දේශපාලන සංස්කෘතිය තුළ ප්‍රචණ්ඩත්වය පැවතීමේ ඉඩක් නැහැ. ප්‍රචණ්ඩත්වය සහ හිංසාව අතහැර සහෝදරත්වයෙන් ඉදිරියට යා යුතුයි. අවිහිංසාවාදය නීතිගත විය යුතුය යනුවෙන් මා අදහස් කරන්නේ එයයි. ශ්‍රීලනිප යට තැනක් නොදී මෙය කළ නොහැකියි. ඒ අනුව මම ඉදිරි මැතිවරණයේ දී එජාප ය පහත් කර ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරයට බාධා වන අයුරින් කටයුතු කරනවා නම් එය වැරදියි. එය මිනිසත්කමට කරන නිගරුවක්. එහෙත් මම ශ්‍රීලනිප ය පාවා දෙන්නේත් නැහැ.

එංගලන්තය, ඇමරිකාව හා ඕස්ට්‍රේලියාව වැනි දියුණු රටවලත් මැතිවරණ තිබෙනවා. හැබැයි අපේ රටේ වගේ ප්‍රචණ්ඩත්වයක් නැහැ. ආණ්ඩුව හා විපක්ෂය යන දෙකම තම රට වෙනුවෙන් පෙනී සිටිනවා. එම නිසා මාස තුනේ වැඩපිළිවෙල අප ඉතාමත් අවබෝධයෙන් ක්‍රියාත්මක කළ යුතු යි.


මෙය බොහෝ අයට නුහුරු අත්දැකීමක් . දෙපැත්තට ඇද කඩා දමන්නයි උත්සාහ කරන්නේ. මෙය කැඩුවොත් අප පරාදයි. එනම් රට ම පරාදයි. එනිසා පක්ෂවල න්‍යාය පත්‍රවලට වඩා ජනතාවගේ න්‍යාය පත්‍රය වැදගත්.

හොරු තවම අත්අඩංගුවට ගත්තේ නැත යනුවෙන් චෝදනාවක් එල්ල වී තිබෙනවා. එහෙත් පිළිගත් නීතියට අනුව මිස කැලෑ නීතියට අනුව කටයුතු කරන්න බැහැ.

අප කටයුතු කරන්නේ චෝදනාවලට ලක් වූ අය සමඟ නොව අනෙක් සියලු දෙනා සමඟයි. රටේ ජනතාව යහපාලනය ගැන විශ්වාසයට තබා සිටින හෙයින් අප ඒ අනුව වැඩ කරනවා.

ජාතික ආණ්ඩුවකින් අප අපේක්ෂා කරන්නේ ජාතීන්, ආගම් හා දේශපාලන පක්ෂ අතර සංහිඳියාවයි. අප රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අභියෝගයක් තියෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයි. ●

ජනවාරි 31 රාත්‍රී රූපවාහිනිය ඔස්සේ විකාශය වූ
''මෛත්‍රී පිළිසඳර'' සම්මුඛ සාකච්ඡාව ඇසුරිනි.




# පක්ෂ විපක්ෂ කවුරුත් නව දේශපාලන සංස්කෘතියට කැමතියි.

අගමැති **රනිල් වික්‍රමසිංහ**

> “ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම, නීති විරෝධී ජාවාරම් නතර කිරීම, ආගමික සහජීවනය ඇති කිරීම, රට නවීකරණය කරමින් ජනතාවගේ ආදායම් තත්වය ඉහළ නැංවීම සහ රැකියා සුලබ කිරීම අපගේ අරමුණු අතර ප්‍රධාන වෙනවා.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙහි සභාපති වීම නිසා ජනාධිපතිවරයා සහ ආණ්ඩුව එම පක්ෂයට අයිති වේ යැයි පවසන අය නියෝජනය කරන්නේ නව දේශපාලන සංස්කෘතිය නොව මහින්ද රාජපක්ෂගේ පැරණි දේශපාලන සංස්කෘතියයි.

එම පත්වීම කිසි සේත්ම එක්සත් ජාතික පක්ෂයට හා එහි පාක්ෂිකයන්ට අහිතකර ලෙස බලපාන්නේ නැහැ.

මැතිවරණ ව්‍යාපාරයේ මුල පටන්ම මා කියා සිටියේ එංගලන්තය, ජපානය සහ ඉන්දියාව යනාදී රටවල මෙන් ශීලාචාර දේශපාලනයක් අපට අවශ්‍ය බවයි. දේශපාලන පක්ෂ ගහ මරා ගනිමින් රාජ්‍ය දේපළ අල්ලා ගැනීමේ දේශපාලනය අප අනුමත කරන්නේ නැත. දින 100 වැඩ සටහන ක්‍රියාත්මක කරන්නේ එම දේශපාලන සංස්කෘතිය ඇති කිරීම සඳහාය. එයින් පසු පැවැත්වෙන මහ මැතිවරණයෙන් පිහිටුවනු ලබන ජාතික ආණ්ඩුව වසර දෙකක් සඳහා බල පවතින්නකි. එය තවදුරටත්

තිබිය යුතු යැයි ජනතාව ඉල්ලා සිටියහොත් මහජනයාගේ කැමැත්ත අපට ඉෂ්ඨ කළ හැකියි.

මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජයග්‍රහණයෙන් පසුව ශ්‍රීලනිප මන්ත්‍රීවරුන් පිරිසක් නව වැඩපිළිවෙලට සහය පළ කිරීමට කැමැත්ත පළ කර ඇතත්, තවත් පිරිසකගේ මතය වී ඇත්තේ එජාපය සමඟ මුහුණට මුහුණ සටන් කළ යුතු බවයි. මේ කණ්ඩායම් දෙකෙහි දිශානතිය පිළිබඳ පූර්ව නිගමනවලට ඒම අපහසුයි.

මීළඟ මැතිවරණය සඳහා සෑම පක්ෂයක්ම තනි තනිව තරග කරනවා. නමුත් එහිදී කිසිවෙකු ගහ මරා ගැනීමට අවශ්‍ය නැහැ.

නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම, නීති විරෝධී ජාවාරම් නතර කිරීම, ආගමික සහජීවනය ඇති කිරීම, රට නවීකරණය කරමින් ජනතාවගේ ආදායම් තත්වය ඉහළ නැංවීම සහ රැකියා සුලබ කිරීම අපගේ අරමුණු අතර ප්‍රධාන වෙනවා.

සමෘද්ධි නිළධාරීන් දේශපාලන වැඩවලට යෙදවීමක් මේ රජය යටතේ සිදුවන්නේ නැහැ.

මෙය ඉතා වැදගත් ක්‍රමයක් බව ශ්‍රීලනිප මන්ත්‍රීවරුන්ද මා සමඟ පවසනවා. ඊට එරෙහි වන්නේ දූෂිතයන් පමණයි. මෙය නිවැරදිව ක්‍රියාත්මක වුවහොත් රටත් ජනතාවත් මුහුණ දී තිබෙන ගැටලු වසර 5 ක දී විසඳිය හැකියි. ●

(දෙසුමක් ඇසුරිනි)

## 80 පිටුවෙන්

සහ පරිභෝජනවාදයට මිනිස්සු තල්ලුකර දමන ඉතාම බාල නිර්මාණ බව ය. එමෙන්ම අප රටේ නිෂ්පාදනය වන ඒවා ඔවුන් අලෙවි කරන්නට බලන්නේ ද ඒ ආකාරයට ය. ජනමාධ්‍ය නියාමනය කිරීමට රජයකට හැකි විය යුතුයි.මේවා නියාමනය කිරීම ලෝකයේ සෑම රටකම කෙරෙන එකකි. නාලිකා තිබුණ පලියට තමන්ට ඕනෑ දේවල් ප්‍රචාරය කළ නොහැක. සමහර වේලාවන් හි 7.30න් පසු ඉතාම බාල ටෙලි නාට්‍ය හැම නාලිකාවක මෙන්ම ප්‍රචාරණය වේ. ඇත්තට ම මිනිසුන් ඒවා බලන්නේ නැති බව ඒ නාලිකාවලින් ම තේරුම් ගතහැක. සමහර නාලිකාවල වැඩ සටහන් තිබෙන්නේ බැලුවොත් මුදල් ලැබෙන අයුරිනි.

අනික් පැත්තෙන් පරිභෝජනය යන්න වෙනස් වී ඇත. එය සිදුවී තිබෙන්නේ භාණ්ඩ හඳුනා ගැනීම සහ භාණ්ඩ අතර අනවශ්‍ය තරගකාරිත්වයක් ඇති කිරීමෙනි. මෙම තරගකාරිත්වය මිනිසුන් අතරින් ආකර්ෂණයක් ඇති කිරීමට හේතු වේ. ආනයන අපනයනය යන්න පවා නිදහස් කිරීමෙන් ලැබුණු ප්‍රයෝජනය කුමක් ද යන්න සොයා බැලිය යුතු ය. අනිත් අතින් මහජනතාවට මේවා ගැන දැනුවත් කරණ ආකාරයේ ව්‍යාපෘති නැත. ආර්ථිකය විවෘත කිරීම නිසා සංස්කෘතික විනාශයක් සිද්ධවී ඇත. වාරණයක් නොකර රජය මේවා නියාමනය කළ යුතු ය.

මීට අමතරව අලුතින් පොහොසතුන් පිරිසක් බිහිවී ඇත. ඒ අය පොහොසතුන් වී තිබෙන්නේ ඉතා සුලභ දේවලින් ය. විශේෂයෙන් මත්ද්‍රව්‍ය වෙළඳාම වැනි ජාවාරම් මගින් නිදාශීලි ජනතාවක් බිහිකර තිබේ. ඒ මිනිසුන් තමන්ගේ සිහින ලෝක හදාගෙන ජීවත්වන අතර බහුතරයක් ආදායමක් නැතිව මහා බලාපොරොත්තු කන්දරාවක් දරාගෙන සිටිති. මේ පරිභෝජනවාදි මානසිකත්වයට මුළු රටේම මිනිස්සු ගොදුරු වී සිටිති. එයින් මිනිසුන් මුදවා ගැනීමට ජනමාධ්‍ය සහ සිනමාව මෙහෙයවිය යුතු අතරම සිවිල් සමාජ ව්‍යාපාර ආරම්භ කළ යුතුය. විශේෂයෙන්ම අධ්‍යාපනයේ තරගකාරී විභාග ක්‍රමය නැවැත්විය යුතුය. එවිට දෙමාපියන්ට මෙතරම් දුක් විඳින්නට සිදුවන්නේ නැත. ආණ්ඩුවක් මාරු කිරීමෙන් පසු කලාව වෙනුවෙන් මූලික වශයෙන් කළ යුතු දේවල් මේවා ය. පසුගිය කාලයේ පවුලක් විසින් සම්පූර්ණයෙන් රාජ්‍ය බලය සියලු ම දේට පාවිච්චි කළා මිස මේ ගැන අවධානය යොමු කළේ නැත. රට නිකම් තිබුණු අතර පවුලේ අය සහ ඔවුන්ගේ ගැත්තනට විනෝදයක් තිබුණි. ●



businesstoday.lk

# මොකද්ද ඔය ස්වාධීනත්වය ?

විපක්ෂ නායක **නිමල් සිරිපාල ද සිල්වා**

> " මේ සකස් කරලා තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන තුළින් රටේ ඒකීය භාවය රැකගෙන බෙදුම්වාදය පරාජය කරන්න පුළුවන් ද කියලා අපි බලන්න ඕනේ.

**විපක්ෂය හැටියට දින 100 වැඩ සටහනට සහාය දෙන්න තීරණය කළේ ඇයි ?**

දින 100 වැඩසටහන තුළ සාධනීය ලක්ෂණ රාශියක් තියෙනවා. ජේන හැටියට ඒක කොටස් දෙකකින් යුත්තයි. එකක් තමයි ජනතාවට සැළසෙන සහන. සමෘද්ධි සහනාධාරය වැඩි කිරීම. විශ්‍රාමිකයින් ගේ මුදල් වැඩි කිරීම, ඊ ළඟට රජයේ සේවකයින් ගේ පඩිනඩි වැඩි කිරීම. ජනතාවට ප්‍රතිලාභ ලැබෙන කාරණා රාශියක් තියෙනවා. ඉතින් එවැනි අවස්ථාවක දී අපි මේකට විරුද්ධවෙලා පරාජය කළොත් එහෙම, ජනතාව අපිට තමයි ඒ පිළිබඳව දෝෂාරෝපණය කරන්නේ, මේ අපිට ලැබෙන්නට තිබුණු ප්‍රතිලාභ අපිට ලබාගන්න දුන්නේ නැහැ කියලා. ඒකයි සහාය දෙනන තීරණය කළ පළවෙනි කාරණා ය.

දෙවෙනි කාරණාය, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයක් අත්‍යවශ්‍යයි. ඒක අපි පිළිගන්නවා, මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ඕනේ, විධායක ජනාධිපති ධුරයේ බලතල වෙනස් කරන්න ඕනේ කියන ස්ථාවරයේ තමයි අපි ඉන්නේ. නමුත් ඒක කරන ක්‍රමවේදය, කොතෙක් දුරට බලතල අඩු කරනවා ද කියන එක, මේ

සකස් කරලා තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන තුළින් රටේ ඒකීය භාවය රැකගෙන බෙදුම්වාදය පරාජය කරන්න පුළුවන් ද කියලා අපි බලන්න ඕනේ.

ඊ ළඟට ඖෂධ පනත. ඖෂධ පනතට අපි පක්ෂයි. මේක රටට අවශ්‍ය පනතක්. අනික් එක මේක දවස් සියයක වැඩ පිළිවෙලක් පමණයි. ඉන් පස්සෙ මහ මැතිවරණයකට යන්න තීරණය කර තිබෙනවා. ඉතිං ඒ නිසා මේ කෙටි කාලසීමාව තුළ රටට වැඩදායිවෙන යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙනවා නම් ඇයි අපි ඒකට බාධා කරන්නේ ? විපක්ෂයක් කියලා කියන්නේ හැම වෙලාවෙ ම විරුද්ධවෙන එක නොවෙයි නේ. හැබැයි මේවාට අපි සහයෝගය දෙන්නේ විවේචනාත්මකව. දැන් අපි අයවැය ලේඛනයේ තියෙන අඩුපාඩුකම් ගැන පෙන්නලා දුන්නා. උදාහරණයක් වශයෙන් අයවැය ලේඛනයේ කිව්වා ගැබිණි මව්වරුන්ට එක්කෙනෙකු වෙනුවෙන් රුපියල් 20,000 ගණනේ දෙනව කියලා දරු ප්‍රසූතියක දී. දැන් ලංකාවේ තිබෙන දත්ත අනුව 3,60,000ත් 4,00000ක් අතර දරුවන් අවුරුද්දකට බිහිවෙනවා. එතකොට මේ ප්‍රතිලාභය දෙන්නට බිලියන අටක මුදල් ප්‍රමාණයක් අවශ්‍යයි. නමුත් අයවැය ලේඛනයේ පෙන්නලා තිබුණේ බිලියන එකක් පමණයි. ඉතින් අපි ඒ වගේ අඩුපාඩුකම් පෙන්නා දුන්නා.

> **පොලීසිය බලාගෙන ඉන්නවා. ඉතින් අපේ ආණ්ඩුවට චෝදනා කරනවා යහපාලනය තිබුණේ නැහැ කියලා. ඉතින් දැන් යහපාලනය තියෙනවා ද?**

ඊ ළඟට අපි පෙන්නා දුන්නා කැසිනෝ පිළිබඳව. දන්නවනේ, කිව්වේ සම්පූර්ණයෙන් ම ඉවත් කරනවා කියලා. අපේ භික්ෂූන් වහන්සේලා, එතකොට විවිධ ව්‍යාපාරවල අය කිව්වේ මේ කැසිනෝ සම්පූර්ණයෙන් ම ලංකාවෙන් අතුගා දානවා කියල නේ. නමුත් මේ කැසිනෝ ව්‍යාපාරය වෙනුවෙන් බිලියන පහක බද්දක් ගහලා තියෙනවා. ඒකෙන් අදහස් කරන්නේ මොකද්ද? අදහස් කරන්නේ කැසිනෝ ව්‍යාපාරය පවත්වාගෙන යෑම නතර කරන්නේ නෑ කියන එකයි. මේ විදියට බද්දක් ගහලා ඒක පවත්වාගෙන යනවා. ඉතිං එතන ප්‍රතිපත්තිමය වශයෙන් යම් ගැටුමක් අපිට පෙනෙනවා. ඒ කියන්නේ කියපු ප්‍රතිපත්තියත්, දැන් රවි කරුණානායක මුදල් ඇමතිතුමා කරගෙන යන වැඩපිළිවෙලත් අතර පරස්පර විරෝධිතාවක් තියෙනවා. ඒක අපිම ජනතාවට පෙන්නුම් කරලා දුන්නා. ජනතාව බලාපොරොත්තු වුණේ මේක ද? ඒ කියන්නේ බදු ගෙවලා කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යෑමට ද ජනතාව ඡන්දය දුන්නේ ? නැත්නම් කැසිනෝ ව්‍යාපාරය සම්පූර්ණයෙන් වහලා දාන එකට ද?

ඒ නිසා ප්‍රායෝගිකව මේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී රජය විශාල උනන්දුවක් ගන්නට ඕනේ විශාල අධීක්ෂණයක් කරන්නට. මේ කියන දේවල් පල්ලෙහාට ගලා යනවාද කියන කාරණය පිළිබඳව. ඉතිං විපක්ෂයක් වශයෙන් අපි කරන්නේ ඒ අඩුපාඩුකම් පෙන්වා දීම, ඒ වගේම විශේෂයෙන්ම ඒ විවේචනාත්මක සහයෝගය ලබාදෙනවා. ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳව යෝජනා කෙටුම්පතක් අපිට ලබා දී තිබෙනවා. ඒක මං විපක්ෂයේ පක්ෂ නායකයින්ට බෙදලා දිලා තියෙනවා. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දී තියෙනවා. මේ පිළිබඳව අපිත් වෙනම ම අධ්‍යනයක් කරලා ඒකට අවශ්‍ය සංශෝධන ගෙනල්ලා, අපේ අදහස් එකතු කරනව. වඩා හොඳ මැතිවරණ ක්‍රමයක් ඒ වගේම විධායක ජනාධිපති ධූරයේ බලතල අඩු කිරීම පිළිබඳ කාර්යට අපි සහයෝගය දෙනවා.

**ඔබ වඩාත්ම විස්තර කරන්නේ දින 100 තුළ ජනතාවට ලැබෙන ආර්ථික සහන පිළිබඳ කරුණු වලට. නමුත් මේ මැතිවරණයේ දී වඩාත්ම අවධාරණය වූයේ මූලික වශයෙන් රාජ්‍ය ප්‍රජාතන්ත්‍රිකරණය පිළිබඳව සහ දෙවනුව යහපාලනය පිළිබඳ ප්‍රශ්නයට නේ ද?**

යහපාලනය කියන එක නීතියෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මං විශ්වාස කරන්නේ නැහැ නීතිරීති පැනවීමෙන් පමණක් යහපාලනයක් ඇතිකරන්නට පුළුවන් කියලා. දැන් බලන්න යහපාලනය පිළිබඳව පොරොන්දු දීලා බලයට පත්වෙලා, යහපාලනය භාරව ආපු ඇමතිතුමා තමයි ජෝන් අමරතුංග ඇමතිතුමා. රටේ නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා. එතුමා යටතේ තමයි පොලීසිය සහ ඒ හා සම්බන්ධ ආයතන තියෙන්නේ. ඉතින් එතුමාගේ මැතිවරණ කොට්ඨාසයේ වත්තල ප්‍රාදේශය සභාවේ ප්‍රාදේශය සභා රැස්වීම පවත්වද්දි මැරවරයින් ඇවිල්ලා ප්‍රාදේශිය සභාවේ සභාපති ඇතුළු මන්ත්‍රිවරුන්ට ගහලා අඩන්තේට්ටම් කරලා ඒ ගොල්ලන් ඉස්පිරිතාලෙට ගෙනියනවා. ඉතින් මොකද්ද එතන තියෙන යහපාලනය. පොලීසිය බලාගෙන ඉන්නවා. ඉතින් අපේ ආණ්ඩුවට චෝදනා කරනවා යහපාලනය තිබුණේ නැහැ කියලා. ඉතින් දැන් යහපාලනය තියෙනවා ද? ඒ නිසාම යහපාලනය පිළිබඳ සංකල්පයේ ම නීති රීති, රෙගුලාසි වගේ ඒවා ක්‍රියාත්මක කිරීමට බලය තිබෙන පුද්ගලයෝ ඒවා අපක්ෂපාතීව ක්‍රියාත්මක කිරීම වැදගත් ඒ නිසා තමයි රජයට කරුණු අපි පෙන්නලා දෙන්නේ.

අපේ සමහර තැන්වල විශාල පිරිස් මාරු කර යවා තිබෙනවා. ඉතිං මාරුකරනවා නම් රජයේ මාරු කිරීමේ ප්‍රතිපත්තියක් තියෙන්නට ඕනේ. ඒ මාරු කිරීමේ ප්‍රතිපත්තිය අනුව අයදුම්පත් කැඳවන්න ඕනේ. ඒ නිසා යහපාලනය කියන ඒ සංකල්පය ක්‍රියාත්මක වෙන බවක් අපිට පෙනෙන්නේ නෑ. මීට අමතර ව පශ්චාත් මැතිවරණ ප්‍රචන්ඩ ක්‍රියා සෑහෙන සංඛ්‍යවක් තියෙනවා. ඒවාට කෝ ඔය යහපාලනය.

> "යහපාලනය කියන ඒ සංකල්පය ක්‍රියාත්මක වෙන බවක් අපිට පෙනෙන්නේ නෑ. මීට අමතර ව පශ්චාත් මැතිවරණ ප්‍රචන්ඩ ක්‍රියා සෑහෙන සංඛ්‍යවක් තියෙනවා. ඒවාට කෝ ඔය යහපාලනය.

**ඔබතුමා කියන ආකාරයට බඳවා ගැනීම්, මාරු කිරීම්, උසස් කිරීම් සඳහා සෝල්බෙරි ව්‍යවස්ථාව යටතේ නම් තිබුණා ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක්. නමුත් ක්‍රමානුකූලව එවැනි ආයතන අහෝසිකර දැමීමේ ප්‍රතිඵලයක් නේද මේක?**

දැනුත් කොමිෂන් තියෙනවානේ. අල්ලස් කොමිසම් වගේ ඒවා දැනුත් තියෙනවා නේ.

**ඒ තිබෙන කොමිෂන් සභා අහෝසි කිරීම සහ නාමිකව තිබෙන ඒවායේ ස්වාධීනත්වය පිළිබඳ ගැටළුව නේ ද පැන නැඟුණේ?**

මොකද් ද ඔය ස්වාධීන කියලා කියන්නේ?

එක් පුද්ගලයෙකුගේ නැත්නම් ජනාධිපතිගේ ඕනෑ එපාකම්වලට අනුව පත්කරන සහ ඔහුට අවශ්‍ය විටෙක ඉවත් කිරීමට නොහැකි, පාර්ලිමේන්තුවට පමණක් වගකියන කොමිෂන් සභා ගැන මම කථා කරන්නේ. වෙනත් ආකාරයට කියන්නේ නම් 18වෙනි සංශෝධනයෙන් අහෝසි කිරීමට පෙර 17 වෙනි සංශෝධනයෙන් ස්ථාපිත කළ කොමිෂන් සභා.

හොඳයි පත්කරලා බලමුකෝ. කොමිෂන් ස්වාධින වෙයි ද කියලා. මම නම් විශ්වාස කරන්නේ නෑ ඕක. ස්වාධීනත්වය රඳාපවතින්නේ පත්කරන එක්කෙනා මොනවාගේ වෙයි ද කියන එක උඩ.

**ඉතින් ඔබතුමා දැන් සහයෝගය දෙනවා කිව්වේ ඒ සංශෝධනවලට නේ ?**

පත්කරන පුද්ගලයින් ස්වාධීන වෙන්න ඕනේ. හොඳයි ඔය කියන විදියට පත්වුවත්, ඒ

අය ස්වාධීන වෙයි කියලා කියන්න තියෙන සහතිකය කුමක් ද? අපි බලමුකෝ ඒක. ඒක අපි ඉදිරියට තියමුකෝ.

**ඔබතුමා ඇතුළු විපක්ෂය සහයෝගය දෙනවා කියන්නේ මේ සංශෝධනවලට නේ?**

අනිවාර්යයෙන්ම.

**එතකොට ඔබතුමන්ලා පිළිගන්නවා ජනාධිපතිගේ බලතල අඩුකර, මේ වාගේ ආයතන පද්ධතියක් ස්ථාපිත කිරීම අවශ්‍යයි කියලා ?**

ඔව්

**දින 100න් අනතුරුව එළඹෙන මැතිවරණයේ දී ඔබතුමන්ලා තරඟ කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට ද සන්ධානය හැටියට ද?**

අපි සියලුම එක්සත් ජාතික පක්ෂ විරෝධී බලවේගය ඒක රාශිකරගෙන තරඟ කරන්නේ. අපිට අතීත අත්දැකම් තියෙනවා. බෙදුණොත් ජයග්‍රහණය කරන්න අමාරුයි. ඒ නිසා එකට ශක්තිමත්ව මුහුණ දෙනවා.

සන්ධානයේ සිටින ඇතැම් පිරිස් මේ සංශෝධන පිළිබඳ උපහාසයෙන් බලන බවක් පේනවා. ඉදිරි මැතිවරණයෙන් ඔබ ජයග්‍රහණය කළොත් මේ ප්‍රතිසංස්කරණ වඩාත් ශක්තිමත් කරන්නේ ද?

තව මොකද්ද ශක්තිමත් කරන්නට තියෙන්නේ? ශක්තිමත් කිරීමක් අවශ්‍ය නෑ. මේ ප්‍රතිසංස්කරණ කළාම අවශ්‍ය ශක්තිමත් කිරීම සිදුවෙන්නට ඕනේ.

ජේ. ආර්. ගේ 78 ව්‍යවස්ථාවට කෙරෙන සංශෝධනයක් පමණයි නේ මෙයින් කෙරෙන්නේ. විශේෂයෙන්ම සුළු ජාතීන්ගේ ගැටලුව ද විසඳා ගැනීම සඳහා නව ව්‍යවස්ථාවක් සම්පාදනය කළ යුතු බව ඔබ විපක්ෂ නායක ලෙස ඔබ පිළිගන්නවා ද?

> “ ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් වෙනම කල්පනා කරන්න වෙනවා. ඒක ඒ අවස්ථාව එනකොට බලමු. ඒ පිළිබඳ දැන් ම පේන කියන්න බැහැ නේ.

ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් වෙනම කල්පනා කරන්න වෙනවා. ඒක ඒ අවස්ථාව එනකොට බලමු. ඒ පිළිබඳ දැන් ම පේන කියන්න බැහැ නේ. නමුත් අඩුගානේ මේ පුළුවන් ටික කරමුකෝ. මෙතෙක් කාලයක් මේ ජනාධිපති බලතල ඉවත්කර ගැනීමට කිසිම රජයකට පුළුවන් කමක් උනේ නෑ. දැන් අවස්ථාව ලැබිලා තියෙනවා. ඒක අපි කරගමු. ඒක නිසා අපිට මේ හැම දේම ඉතා ඉක්මනින් කරගන්න බැරි උනාට යම් ප්‍රමාණයක වැඩ ටිකක් මේ දින 100 ඇතුළත කරගෙන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් කරගන්නට පුළුවන් නම් ඒක සාධනීය ලක්ෂණයක් .

**ඉදිරි මැතිවරණයේ දී විපක්ෂ සන්ධානයේ තේමාව කුමක් ද?**

ඒකට තව කල් තිබෙනවා. ඒ අවස්ථාවේ ඇතිවන දේශපාලන පෙළ ගැස්ම අනුව තීරණය කරන්න පුළුවන්.

**දින් 100 කියන්නේ ඉතා කෙටි කාලයක් නේ. මේ වන විට ඒ පිළිබඳ දළ අදහසක්වත් විපක්ෂයට නැද්ද?**

දැනට නෑ. අපි බලමු රජයේ ගමන් මග, වැඩ පිළිවෙල, යහපාලනය කොතෙක් දුරට ප්‍රදර්ශනය වෙනවා ද කියන එක. එතකොට ජීවන වියදම් ප්‍රශ්නය කොතෙක් දුරට විසඳිලා තියෙනවා ද කියන එක, ඒ අනුව අපි වැඩ පිළිවෙලක් සකස් කරගන්නවා. ●



tamildiplomat.com

# අපගේ අරමුණ නිෂ්පාදන ආර්ථිකයක්

ජවිපෙ නායක **අනුර කුමාර දිසානායක**

ජන වරමක් මැනිය යුත්තේ ලැබුණු ඡන්ද ප්‍රමාණයෙන් නොව ජනතා අභිලාෂයන්ගෙනුයි. ඒ නිසා ජනතා අභිලාෂයන් ඉටු කිරීමේ විශාල වගකීමක් නව ජනාධිපතිවරයාට තිබෙනවා.

දින 100 පිළිබඳව එතරම් හීන තබා ගත යුතු නැති වුණත් මෙයින් සම්මත කළ හැකි පණත් කීපයක් තිබෙනවා. ඒවා සම්මත කරගත් විට ස්ථාවර ආණ්ඩුවක් නිර්මාණය කරගත හැකියි.

ජනතා විමුක්ති පෙරමුණ මේ වැඩ පිළිවෙළට විවේචනාත්මක සහයෝගයක් ලබා දෙනවා. ඒ අනුව තොරතුරු දැන ගැනීමේ පණත හා ඖෂධ පණත ක්‍රියාත්මක කළ යුතුයි. දූෂණ වංචා විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පූර්ව විගණනයක් කළ හැකි නව නීති සම්පාදනය කිරීම අවශ්‍යයි. පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන් සඳහා අචාර ධර්ම පද්ධතියක් අවශ්‍යයි. එම වගකීම ජනතා විමුක්ති පෙරමුණට පැවරී තිබෙනවා. එය සම්මත කරගැනීම අසීරු වුවත් අප කෙසේ හෝ කරනවා.

දූෂණ වංචා පිළිබඳ පසුගිය අවධියෙහි කෙතරම් කතා කළත් ඒ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී බව නිසා ඇතැම් හොරුන්ට පැන යෑමේ අවස්ථාව ලැබුණා. අල්ලස් හා දූෂණ කොමිසමට මේ වන විට පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබී තිබෙනවා.

ජනතාවගේ වුවමනාකම් ඉටු කිරීමේ වගකීම සඳහා විපක්ෂයේ සිටිමින් කටයුතු කිරීම ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂාවයි.

පාර්ලිමේන්තුව තුළ අපගේ පක්ෂය කුඩා කණ්ඩායමක් වුණත් දූෂණ වංචාවලට එරෙහිව ලොකු ම හඬ නැගුවේ අපයි. ශිරාණි බණ්ඩාරනායකට එරෙහි ව පත් කළ තේරීම් කාරක සභාවෙන් නැගිට විත් විරෝධය දැක් වූ එකම පක්ෂය අපයි.

මේ නිසා මීළඟ මහ මැතිවරණයේ දී ආණ්ඩුවෙන් ජනතාවට උපරිම සහන ලබාදීම සඳහා මහජන නියෝජිතයන් පත් කර යැවීමේ දී උගත් බුද්ධිමත් අය පිළිබඳ සැලකිලිමත් විය යුතුයි.

පාර්ලිමේන්තුව පත් කිරීමෙන් පමණක් සියල්ල අවසන් නොවේ. මෙය අසීරු කටයුත්තක්. ආර්ථික ප්‍රතිලාභ ජනතාව අතර බෙදී යන නිෂ්පාදන ආර්ථිකයක් ඇති කළ යුතුයි. එය දිගුකාලීන වැඩ පිළිවෙළක්. ඒ සඳහා ජනතාව පෙළ ගැස්වීම අපගේ අරමුණයි. ●

(බල පෙරළිය හා ජනතා අභියෝගය මැයෙන් පැවති රැළියක දී කළ දෙසුමක් ඇසුරිනි.)



**නීතිඥ**
**වාසුදේව නානායක්කාර**

## ජනතාව තම අභිලාෂයන්ට අනුව ඡන්දය දුන්නා

# මෙය ප්‍රජාතන්ත්‍රවාදයේ ජීවමාන ප්‍රතිඵලයක්

**ජනපතිවරණයේ ප්‍රතිඵල නිකුත්වීමෙන් අනතුරුව පෙර මෙන් නොව ජනතාව තම ක්‍රියාකාරිත්වය නවත්වා නැත. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිසංස්කරණ ඉටුකරවා ගැනීම සඳහා ඔවුන් තුළ ඇති මේ උනන්දුව ඔබ දකින්නේ කෙසේ ද ?**

මෙය ජීවමාන ප්‍රජාත්‍රන්ත්‍රවාදයේ ප්‍රතිඵලයක්. ප්‍රජාතන්ත්‍රවාදය ජීවමානයි. එය තමයි මේ රටේ විශාල ම සතුට. මිනිසුන් ඒකරාශී වී තමන්ගේ අභිලාසයන් අනුව ඡන්දය දුන්නා, ඒ වගේම මිනිසුන් තමන්ගේ දේශපාලන මතිමතාන්තරවලට අනුව ඡන්දය දුන්නා. මේ අනුව ඡන්දයේ අඩු වැඩි ප්‍රතිඵලයෙන් මෛත්‍රීපාල

www.ft.lk



## මේ රටේ තිබූ ප්‍රජාතන්ත්‍රවාදී පාරිශුද්ධ භාවය නැති කිරීමට කිසියම් කුමන්ත්‍රණයක් කිරීමේ යම් උත්සාහයක් තිබුණා නම් එය පරීක්ෂණයට ලක්කර නිර්දය ලෙස ක්‍රියා කළ යුතුයි.

මොහාන් පීරිස් මහතා සහ උදය ගම්මන්පිල මහතා

සිරිසේන මැතිතුමා පත්වුණා. ඒ පත්වීම ම ප්‍රජාතන්ත්‍රවාදය ජීවමාන බවට හොඳම සාක්ෂියක්. තව ද අවම ප්‍රචණ්ඩත්වයකින් පැවති මැතිවරණයක් ලෙස ද මෙය හැඳින්වීමට පුළුවන්. මේ මැතිවරණය ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රකාශනයක්.

මැතිවරණයේ දී උතුරේ මිලිටරි මැදිහත්වීමක් ඇතිවේ යැයි යම් බියක් තිබුණත් එවැනි කිසිවක් සිදුවූයේ නැහැ. ඡන්ද වැළැක්වීමට උත්සාහ දැරුවේ ද්‍රවිඩ සංවිධානයේම යම් පිරිසක්. නමුත් එම පෙරමුණේ අනික් කණ්ඩායම ඡන්දය දැමීමට ජනතාව උනන්දු කළා. ඒ නිසා මේ මැතිවරණයේ දී ඉහළම ඡන්ද ප්‍රමාණයක් භාවිතා වුණා. හිටපු ජනාධිපති තුමාටත් උතුරෙන් ගියවරට වඩා ඡන්ද 70,000ක් පමණ ලැබී තියෙනවා. සියලු ජන කොටස් එකතුවුණ අවස්ථාවක් හැටියට මේ මැතිවරණය හැඳින්වීමට පුළුවන්. එය ද ප්‍රජාතන්ත්‍රවාදය විකසිතවීමේ ජීවමාන ලක්ෂණයක්. මහින්ද රාජපක්ෂගේ පරාජයට සහ මෛත්‍රීපාල සිරිසේනගේ ජයග්‍රහණයට උතුරේ දෙමළ ජනයාගේ සහ නැගෙනහිර මුස්ලිම් ජනයාගේ ඡන්දය හේතු වූ බවට කෙරෙන ප්‍රලාපය මං පිළිගන්නේ නෑ. ඒ විතරක් නොවෙයි එවැනි ජාතිභේදවාදි අරමුණෙන් කරන ප්‍රකාශ අපි හෙළා දකිනවා. අනික් අතට ඔබ සඳහන් කළ ආකාරයට ජනතාව තමන්ගේ බලාපොරොත්තු ඉටුකර ගැනීම සඳහා ආණ්ඩුවත් සමඟ ගනුදෙනු කරමින් සිටිනවා. මෙය ඉතා යහපත් තත්ත්වයක්. මේ තත්ත්වය දිගටම පවතින්නේ නම් කොපමණ යහපත් ද ?

එහෙත් අපගේ න්‍යායික වැටහීම හා පෙර දැක්මට අනුව මේ තත්ත්වය ආරම්භක අවස්ථාවක් පමණයි. එයින් පසුව එළඹෙන්නේ තර්මිඩෝරියානු★ කාලයක්. මේ වචනයට ගැලපෙන සිංහල වචනයක් හොයා ගන්න. එම අවස්ථාව උදාවෙන විට එයට මුහුණ දීමට ජනතාව සූදානම් කර පෙළගැස්විය යුතුයි.

**මැතිවරණ ප්‍රතිඵල නිකුත්වන අතරතුර ප්‍රජාතන්ත්‍රවාදය අත්හිටුවීම සඳහා හිටපු ජනාධිපති ඇතුළ පිරිස කරන ලද කුමන්ත්‍රණය සාර්ථක වූයේ මේ ප්‍රජාතන්ත්‍රවාදි අවකාශය නිර්මාණය වන්නේ නැහැ නේ ද?**

මේ රටේ තිබූ ප්‍රජාතන්ත්‍රවාදී පාරිශුද්ධ භාවය නැති කිරීමට කිසියම් කුමන්ත්‍රණයක් කිරීමේ යම් උත්සාහයක් තිබුණා නම් එය පරීක්ෂණයට ලක්කර නිර්දය ලෙස ක්‍රියා කළ යුතුයි. නමුත් එවැනි දෙයක් ඇති වුණා යන්න පිළිගන්නට, මට මේ වනතුරු සාක්ෂියක් ලැබී නෑ. නමුත් එවැනි දෙයක් ඇතිවූවා නම් මා පාර්ලිමේන්තුවේ දී සඳහන් කළ ආකාරයට ඉතාමත් කඩිනම් ලෙස පරීක්ෂණ පවත්වා ඒ පිළිබඳව ගතයුතු ක්‍රියා මාර්ග ගතයුතුයි. ඒවැනි සාක්කියක් මා ඉදිරියේ නොමැති බැවින් මට එවැනි ප්‍රයත්නයක් දැරුණු බව මට පිළිගන්නට පුළුවන් කමික් නැ. නමුත් එසේ වූවා නම් නිර්දය ලෙස ඒ ගැන ක්‍රියා කළ යුතුයි.

**මහා පරිමාණ අල්ලස් ගැනීම් සහ දූෂණ පිළිබඳව රාජපක්ෂ පාලනයට බරපතල චෝදනා එල්ල වුණා. ඒවාට එරෙහිව පැවති පාලනය කිසිදු පියවරක් නොගත් බවට ද චෝදනා තිබෙනවා. මෛත්‍රී පාලනය යටතේ දූෂණ හා වංචා පිළිබඳව විමර්ශනයක් ආරම්භ කර තිබෙන නමුත් එහි ඇල්මැරුණු ස්වභාවය පිළිබඳව ද ජනතාවට ඇත්තේ කළකිරීමක්. මේ චෝදනා පිළිබඳ ඔබගේ අදහස කුමක් ද?**

දූෂණ වංචා, අයථා දේපල පරිහරණය, පුද්ගලයන්ගේ දේපල පැහැර ගැනීම, රජයේ දේපල වංචාකර ලබාගැනීම ආදී වූ බොහෝ චෝදන තියෙනවා..ඒවා හුදෙක් ම දේපල හුවමාරුවක්

www.srilankaguardian.org



**නමුත් මට තිබෙන සැකය තමයි මේවා සොයන්නට යාන්ත්‍රණයක් නෑ. මේවා සොයා බැලීමට දැවැන්ත යාන්ත්‍රණයක් අවශ්‍යයි. පොලීසියේ වංචා විමර්ශන අංශයටයි, අල්ලස් හා දූෂණ කොමිසමටයි, පුළුල් යාන්ත්‍රණයක් අවශ්‍යයි.**

හෝ මුදල් හුවමාරුවක් වශයෙන් පමණක් නොව සමහර විට අඩු වටිනාකම් ඇති දේවලට වැඩි වටිනාකමක් නියම කර විකිණීම සම්බන්ධ චෝදනා ද මෙයට ඇතුළත්. මෙය බරපතල චෝදනාවක්. ඒ මගින් ඒවාට සංතෝසම් දීමනා ලැබුණු බවට ඇති චෝදනා ද සොයාබැලිය යුතුයි. මා කැබිනට් මණ්ඩලයේ සිටින විට යම් යම් දේපල පිළිබඳව නිරීක්ෂණ ලබා දී තිබෙනවා. රජයේ දේපල බදු දීමට කටයුතු කරන විට රජයේ තක්සේරුකරුගේ තක්සේරුවේ මිලට කියලා තීන්දු කළාම රජයේ තක්සේරුකරුගේ මිල වෙළඳපොළේ මිල අනුව ඔහු තීන්දු කළේ ද, කැබිනට් අනු මණ්ඩලය නිසි වටිනාකම ඒවාට ලබා දුන්නේ ද, ඒවායින් අයකරන බදු රාජ්‍යයේ යහපතට නිසි මට්ටමින් ලැබුණේ ද යන මේවා ගැන සොයා බැලිය යුතුයි.

නමුත් මට තිබෙන සැකය තමයි මේවා සොයන්නට යාන්ත්‍රණයක් නෑ. මේවා සොයා බැලීමට දැවැන්ත යාන්ත්‍රණයක් අවශ්‍යයි. පොලීසියේ වංචා විමර්ශන අංශයටයි, අල්ලස් හා දූෂණ කොමිසමටයි, පුළුල් යාන්ත්‍රණයක් අවශ්‍යයි. මේ ගැන තිබෙන පැමිණිලි හා චෝදනා සියල්ල සොයා බැලීමට අවශ්‍ය නම් මේ යාන්ත්‍රණය මීට වඩා පළල් කළ යුතුයි. එකක් අල්ලස් හා දූෂණ යාන්ත්‍රණය, අනික් පැත්තෙන් පොලීසියේ ඒ සඳහා වෙනම කාර්යාංශයක් ඇති කළ යුතු බව මා සිතනවා.

පොලීසියේ වංචා විමර්ශන අංශය වඩාත් පෞද්ගලික වංචා ගැන සෙවීමේ අංශයයි. රාජ්‍ය දේපලක් අවභරණය කිරීම, රාජ්‍ය දේපල අනර්ථයකට ලක්කිරීම, ඒවා දණ්ඩ නීති සංග්‍රහයේ අපරාධ ගනයට සැළකෙනවා. එහෙයින් පොලීසියට ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පුළුවන්. අනික් අතට අල්ලස් හා දූෂණ කමිටුව. මේ දෙක පුළුල් කළ යුතුයි. මේ තිබෙන පැමිණිලි විභාග කිරීමට තරාතිරම නොබලා කටයුතු කරන්න ඕනේ. එහෙත් කවුරුවත් ගැන නිකම් බොරුවට පත්තරවල නම් දැමීම නම් නැවැත්විය යුතුයි. සත්‍ය තොරතුරු නැතිව එක් එක් දෙයට සම්බන්ධ බවට ප්‍රකාශ නිකුත් කිරීම නැවැත්විය යුතුයි. නවත්වා තොරතුරු සොයා ගෙන පරීක්ෂා කර ඒ පරීක්ෂණවල ප්‍රතිඵල අනුව පෙනීයන්නේ නම් ඒ අය වරදක් කර ඇති බවට, යම් අධිකරණයකට හෝ කොමිසමකට වහාම ඒ අය ඉදිරිපත් කළ යුතු අතර එයින් පසුව ඔහුට නිදහසට කරුණු කීමට අවස්ථාවක් ලබාදිය යුතුයි. ඒ අයිතියට යටත්ව එවැනි ගොනු කරගත් තොරතුරු අනුව පැමිණිලි චෝදනා ඉදිරිපත් කරන තුරු පුද්ගලයින්ගේ නම් භාවිතා කරමින් අවලාද නැගීම නවත්වන එක හොඳයි.

**රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම සඳහා ප්‍රතිසංස්කරණ ගණනාවක් හඳුන්වාදීමට වත්මන් පාලනය සූදානමින් සිටිනවා. විශේෂයෙන්ම ජනාධිපතිගේ බලතල අඩු කිරීම, ස්වාධීන කොමිෂන් සභා ගණනාවක් පිහිටුවීම සහ මැතිවරණ ක්‍රමය මෙයට අයත්. මේ ප්‍රතිසංස්කරණ ගැන ඔබගේ අදහස කුමක් ද?**

එයට සම්පූර්ණ සහයෝගය දෙන්න මා සූදානම්. සහයෝගය කීවොත් එය වැරදියි. මේවා මගේ ඉල්ලීම්. මේවා දිනා ගැනීමට හැකිවීම පිළිබඳ උත්සවාකාරයෙන් ම එකග වෙනවා.

**මේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ඔබ යම් අඩුපාඩුවක් දකින්නේ ද?**

මේවා පිළිබඳ හොඳින් සොයාබලා යෝජනා ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. දැනට මට කියන්නට තිබෙන්නේ මේ ප්‍රතිසංස්කරණ වලින් කිසිදෙයක් අත්හැරිය යුතු නෑ. මැතිවරණ ක්‍රමය වෙනස්

www.srilankaguardian.org




**නැවත සීමා නිර්ණයක් අවශ්‍ය නෑ. දැනට පවතින මැතිවරණ කොට්ඨාස ක්‍රමය අනුව එය ක්‍රියාත්මක කරන්න පුළුවන්. දැනට තිබෙන ආසන ගණන එසේම ගෙන ඒ ආසන ඡන්ද කොට්ඨාස හැටියට පිළිගෙන මන්ත්‍රීවරු පත් කළ හැකියි.**

කිරීමත් මේ දින 100 තුළ කරන්න. මෙය කළ හැකියි. ඒවා මගහැරීමට නොයෙකුත් බලපෑම් එමින් තිබෙන බව පේනවා. එම බලපෑම් වලට අසු නොවිය යුතුයි. මැතිවරණ කොට්ඨාසවලින් දිනන්න බැරි මන්ත්‍රීවරුයි මේ බලපෑම් වැඩියෙන්ම ගෙන එන්නේ. දිස්ත්‍රික්කය පුරාම තමන් වෙනුවෙන් මැතිවරණ ව්‍යාපාරයක් දියත් කළ හැකි වන්නේ විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළ හැකි අයට පමණයි. එවිට සැබෑ ජනතා නියෝජිතයන් හැලී වත්පොහොසත්කම් ඇති පිරිසකට පමණක් පාර්ලිමේන්තුවේ නියෝජනයක් ලබා ගත හැකි වෙනවා. දූෂණ වංචා ඇතිවීමට ද ඒ ක්‍රමය ඉවහල් වන බව කවුරුත් දන්නවා. ඡන්ද කොට්ඨාසවල ඡන්දයක් නැති අය තමයි මේ සමානුපාතික ක්‍රමය ඉවත් කිරීමට එරෙහිව බලපෑම රැගෙන එන්නේ. එහෙයින් කවදාවත් මේකට යට විය යුතු නෑ.

**මැතිවරණ සීමා නිර්ණයකින් තොරව මෙය කළ නොහැකි බවට මතයක් තියෙනවා නේද?**

නැවත සීමා නිර්ණයක් අවශ්‍ය නෑ. දැනට පවතින මැතිවරණ කොට්ඨාස ක්‍රමය අනුව එය ක්‍රියාත්මක කරන්න පුළුවන්. දැනට තිබෙන ආසන ගණන එසේම ගෙන ඒ ආසන ඡන්ද කොට්ඨාස හැටියට පිළිගෙන මන්ත්‍රීවරු පත් කළ හැකියි.

**වමේ පක්ෂයක් ලෙස ඉදිරියේ දී කුමන ක්‍රියා මාර්ගයක් ද ගැනීමට අදහස් කරන්නේ ?**

තවම ඒ ගැන කියන්නට අපහසුයි. අද අපට කිරීමට තිබෙන්නේ මහින්ද රාජපක්ෂට ඡන්දය දුන් බලවේගය එකට තබා ගැනීම. ඔවුන්ගේ අරමුණු ජාතික නිදහස, ජනතාවාදී ආර්ථික ප්‍රතිපත්තියක්, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ, ජාතික එක්සත්කම, දේශයේ එක්සත්කම, මේවා එකට තබාගෙන ක්‍රියාත්මක වීමට තමයි අප අදහස් කරන්නේ

බොහෝ කල් ප්‍රාර්ථනා කළා මේ දේවල් ඉටුකර ගන්නට. බොහෝ වේලාවට අපේක්ෂා භංගත්වයට ද පත් වුණා. නමුත් ඒ බලවේග විසිරී ගියේ නැහැ. ඒ බලවේග තමන්ගේ නෝක්කඩුවක් තබාගෙන නමුත් එකට හිටියා. එකට හිටියේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂයට විරුද්ධව. ඒ අය ඒ විදියටම තවම ඉන්නවා. ඒ අය සමග කතා කරමින් අපි බලන්න ඕන ඉදිරි පෙළ ගැස්ම කෙසේ වෙයි ද කියලා. නමුත් අපි ඉතාමත්ම සාධනීය මැදිහත්මක් කළ යුතුයි. ඒ කියන්නේ මේ රටේ ඇතිවන යහපත් පරිවර්තනයට අප සම්පූර්ණයෙන් ඇතුළත් විය යුතුයි.

**විපක්ෂයේ ඔබ කියන ලෙසට එක්සත් කමකට වඩා ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් බරපතල බෙදීමක් තිබෙනවා නේ ද?**

මේ බෙදීම පසුගිය පාර්ලිමේන්තු වාරයේ දී මතුවුණා. විශේෂයෙන්ම විමල් වීරවංශ හා මා අතර. උදාහරණයක් ලෙස විමල් වීරවංශ කියන්නේ උතුරේ ආණ්ඩුකාරයා හමුදාකාරයෙක් වියයුතු බවයි. මා එයට විරුද්ධයි. හොඳ සිවිල් නිළධාරියෙකු වන පලිහක්කාර මහතා පත්කිරීම හොඳ තේරීමක්.

**මේ රටේ කේන්ද්‍රීය ප්‍රශ්නයක් ලෙසයි ජාතික ප්‍රශ්ණය තිබෙන්නේ. ඡන්දය දී තිබෙන රටාව අනුව ද මෙය පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ආණ්ඩුව යම් සාධනීය පියවරක් තබන්නේ නම් විපක්ෂයේ තිබෙන ඔය බෙදීම තීව්‍ර විය හැකියි නේද?**

මෙහිදී වීරවංශ මහතා කිසියම් බලය බෙදීමකට විරුද්ධයි. එය අලුත් දෙයක් නොවේ. උතුරේ පළාත් සභා ඡන්දය පවත්වනවාට

www.colombogazette.com



## මෙහිදී වීරවංශ මහතා කිසියම් බලය බෙදීමකට විරුද්ධයි. එය අලුත් දෙයක් නොවේ. උතුරේ පළාත් සභා ඡන්දය පවත්වනවාට ද ඔහු විරුද්ධ වුණා.

ද ඔහු විරුද්ධ වුණා. හිටපු ජනාධිපතිතුමා එය නොතකා පළාත් සභා හා පළාත් පාලන මැතිවරණ පවත්වා ඔවුන්ගේ නියෝජිතයින් පත්කර ගැනීමට අවස්ථාව දුන්නා. ඒවාට ද මේ කට්ටිය විරුද්ධ වුණා. මේ උදවිය කියන්නේ උතුරු පළාත් සභාවට මීට වඩා බලයක් දෙන්න එපා කියලා. අප ඉන්නේ උතුරේ හා නැගෙනහිර ඉන්න දෙමළ ජනතාවගේ අපේක්ෂා හැකි තරම් දුරට ඉටු කරමින්, මේ රටේ සිංහල බහුතර ජනතාවගේ පිළිගැනීමට ලක්වෙන එකතු කිරීමක් හරහා මේ ප්‍රශ්නය විසඳා ගතයුතුයි කියන ස්ථාවරයේ. ඒකට විරුද්ධ වන කට්ටිය මම හිතන්නේ තනිවේවි. මොකද මේ පළල්ම ජනතාවට යුද්ධයේ පින්තූර පෙන්නුවාට, යුද්ධය ජය ගැනීමේ චිත්‍රපටි පෙන්වූවාට මිනිසස්සු ඡන්දය මහින්දට දුන්නේ යුද්ධය ජය ගැනීම පමණක් නිසා නොවෙයි. යුද්ධය ජය ගැනීමත් එකක්.

ඒ මිනිසුන්ට පාරම්පරිකවම මුඛ පරම්පරාවෙන් උරුම වෙච්ච දේශපාලනයක් තිබෙනවා. ඒක එන්නේ 56 ඉඳලා. ඊටත් පෙර සිට. ඒ උරුමයේ අද ගමන්කරුවන් හැටියට තමයි ඒ අය වැළඳගෙන සිටියේ මහින්දව. පොහොර සහනාධාරය දීම, සහතික මිල ක්‍රමයක් තිබීම. ස.තො.ස වැනි රාජ්‍ය බෙදාහැරීමේ අංශ විවෘත කර අඩු මිලට ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට ක්‍රියා කිරීම. මේවා තමයි රාජ්‍යයේ මැදිහත්වීම් අවශ්‍ය තැන්. ආර්ථිකය රාජ්‍ය මැදිහත් වීමෙන් ගොඩනැගීම. ඒ ක්‍රියාදාමය මහින්ද යටතේ සිදුවීම මහජනයාට යම් අස්වැසිල්ලක් වුණා. ඒ අස්වැසීමට අමතර ව ගම් දනව් සිසාරා මාර්ග පද්ධතිය හැදිලා තිබෙනවා. ගම්වල මාර්ග දියුණුව, ගම් සම්බන්ධ කර පාලම් සෑදීම තුළින් විශාල පරිවර්තනයක් මිනිසුන්ගේ ජීවිතයට දැනුණා. 57 ලක්ෂයක් පමණ මහින්දට ලැබුණේ ඒ නිසයි. ඒ බලවේගය එකතු කරගැනීමයි අපි කරන්නේ.

**ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ආණ්ඩුවට විරුද්ධව ජාතිවාදී ව්‍යාපාර මතුවෙනවා නම් ඔබ කුමන මැදිහත්මක් ද කරන්න බලාපොරොත්තු වෙන්නේ?**

අපගේ ප්‍රතිපත්තිය ජාතිවාදයෙන් තොරයි. ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ඕනේ. සමගිය හදාගන්න අවශ්‍යයි. දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට දෙන විසඳුමකට යම් අයෙක් විරුද්ධ වන්නේ නම් 88, 89 දී වගේ එම විසඳුම ආරක්ෂා කිරීමට මා පසුබට වෙන්නේ නෑ ●

සංවාද සටහන
**මහින්ද රත්නායක**

★ ලැබූ ජයග්‍රහණය ඉදිරියට ගෙන යනවා වෙනුවට එම ජනතා අභිලාෂයන් මත ම පදනම් ව ජනතාවගේ අභිලාෂයන් ඉදිරියට ගෙනයෑමට සූදානම් පිරිස් ඉවත්කර දේශපාලන බලය තම අතට ගෙන පවත්වාගෙන යන ප්‍රතිගාමී පාලනය තර්මිඩෝරය යනුවෙන් හැඳින්වේ.



# උතුරු නැගෙනහිර ජනතාවට සිවිල් අයිතීන් ලබාදිය යුතුයි

දෙමළ සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී
**නීතිඥ එම්. ඒ. සුමන්දිරන්**

**දින 100 වැඩ සටහන යටතේ උතුරු හා නැගෙනහිර පළාත් සඳහා නව සැළසුමක් තිබෙනවා ද?**

දැනට එවැන්නක් නැහැ. නමුත් හමුදාව ආක්‍රමණය කළ ඉඩම් ජනතාවට ලබාදීම සහ දැනට අත්අඩංගුවේ සිටින දේශපාලන සිරකරුවන් නිදහස් කර ගැනීම සඳහා රජය සමග සාකච්ඡා කළා. ජනාධිපතිතුමා එයට එකඟ වුණා.

**අත්අඩංගුවේ පසුවන දෙමළ තරුණයන් සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක් ද?**

අත්අඩංගුවේ පසුවන්නන් වර්ග තුනකට අයත් වෙනවා.

1. පරීක්ෂණ අවසන්ව ඇති නමුත් නිදහස් ජීවිතයකට උරුම කම් නැති අය. මේ අයට ජනාධිපතිගේ පොදු සමාව අවශ්‍යයි.
2. දැනට පරීක්ෂණ කෙරෙමින් සිටින අය. ඒ සඳහා නීතිපතිගේ මැදිහත්වීම අවශ්‍යයි.
3. කිසිම පරීක්ෂණයකින් තොරව රඳවා සටින අය.

මෙසේ අත්අඩංගුවේ සිටින විශාල පිරිසක් පිළිබඳව සාධාරණය ඉෂ්ට කිරීම නව රජයේ වගකීමක්.

**නැවත පදිංචිකිරීම්වල ප්‍රගතිය කුමක් ද?**

යාපනයේ ඉඩම් අක්කර 6500 ක් හමුදාව යටතේ පැවතුණා. මේවා ක්‍රමයෙන් නිදහස් කරගනිමින් පවුල් 23000 ක් පදිංචි කිරීමේ කාර්යය කඩිනම් වූයේ නැහැ. 2012 දී වාවෙයි සේනාධිරාජා විසින් පවරා ඇති නඩුව අනුව නැවත පදිංචි කිරීම ප්‍රමාද වුණා. නමුත් රාජයෙන් අප බලාපොරොත්තු වන්නේ මේ ජනතාවට ඉක්මනින් සහන සැලසීමයි.

උතුරු නැගෙනහිර ජීවත් වන සියලු ජනයාට දකුණේ ජනයා මෙන් හමුදා පාලනයකින් තොරව නිදහසේ කටයුතු කිරීමට අවශ්‍යයි. උතුරු නැගෙනහිර යුද්ධය අවසන් වුවත් එහි ජීවත්වන සිවිල් වැසියන් තවමත් ජීවත් වන්නේ අර්ධ මිලිටරි රාජ්‍යයකයි. සියලු ජාතීන්ට නිදහසේ ජීවත් වන රටක් නිර්මාණය කිරීම ජාතික දෙමළ සන්ධානයේ පූර්ණ සහාය ලබා දෙනවා. ●

(2015.02.01 වීරකේසරී පුවත්පතේ පළ වූ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි)



# ජාතික ආණ්ඩුවේ සිහිනය දිනා ගන්නවා

මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ නියෝජ්‍ය මහ ලේකම්
මාධ්‍ය ප්‍රකාශක, **නීතිඥ නිසාම් කාරියප්පර්**

**ප්‍රසුගිය ජනාධිපතිවරණය ආසන්න වන තෙක් ම සන්ධාන ආණ්ඩුව සමඟ කටයුතු කළ ඔබේ පක්ෂය අවසාන මොහොතේ දින සියයේ වැඩ පිළිවෙළට එකඟ වෙමින් පොදු අපේක්ෂකයාට සහාය දුන්නේ ඇයි ?**

අප මේ සංවාදය පටන් ගත්තේ වසර දෙකකට පමණ පෙර සිටයි. මුල් කාලයේ අපගේ මතය වුණේ ජනාධිපති අපේක්ෂකයෙකු හැටියට තෙවන වර තරඟ කිරීමේ වරදක් නැති බවයි. මහජන කැමැත්ත තිබේ නම් නැවත පත්වීමේ පත් වීමේ වරදක් නැතැයි අප සිතුවා. එහෙත් 18 වැනි ව්‍යවස්ථාව අනුව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා, ක්‍රමයෙන් සියලු බලතල තමන්ගේ අතට ගන්නා විට මෙහි බියකරුකම අපට වැටහෙන්න පටන් ගත්තා. ඒ අතරතුර මුස්ලිම් කොංග්‍රසය ඇතුළු විවිධ පක්ෂවල අභ්‍යන්තර ගැටුම් වර්ධනය කරන ආකාරයත් අපට පෙනුණා. අප විටින් විට හිටපු ජනාධිපතිවරයාට මේ පිළිබඳ පෙන්වා දුන්නා. නමුත් ඔහු හැම විටම ''මගේ බලතල'' නැමැති මන්ත්‍රය ජප කරමින් ප්‍රජාතන්ත්‍රවාදයට සතුරු පිළිවෙතක් අනුගමනය කළා. අලුත්ගම ප්‍රහාරය වැනි සිදුවීම් ඔස්සේ මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රහාර නිසා මුස්ලිම් ජනතාව විශාල කලකිරීමක හිටියේ. මේ තත්ත්වය මත පක්ෂයක් හැටියට පොදු අපේක්ෂකයාට සහාය දීමේ තීන්දුව ගැනීමට අපට සිදු වුණා.

**ශ්‍රී ලංකාවට ගැලපේ යැයි ඔබ සිතන්නේ පැරණි වෙස්ට්මිනිස්ටර් ක්‍රමය ද? නො එසේ නම් විධායක ජනාධිපති ක්‍රමය ද?**

මේ දෙකම හරි යන්නේ නැහැ. පැරණි ක්‍රමය යටතේ සුළු ජාතික නියෝජනය නොසලකා හැරුණා. 51% ක නියෝජනය වැදගත් වෙද්දී 49% ක් ප්‍රතික්ෂේප උනා.

1978 දී ජේ.ආර්. ජයවර්ධන විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වාදීමෙන් පසු සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ සුළු ජාතික නියෝජනයට අවස්ථාවක් ලැබුණා. නමුත් එහිද තවත් අන්තයක් තිබුණා. දුෂ්ටත්වය හා අරාජික පාලනයකට වඩා අවශ්‍ය වන්නේ සුළු ජාතීන් යැයි සම්මත ජන කොටස්වල ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමයි. මේ නිසා මිශ්‍ර ක්‍රමයකට යෑම වඩාත් සුදුසුයි.

**දින 100 න් එහාට ඔබේ පක්ෂයේ අපේක්ෂා මොනවා ද?**

අපේ ඉලක්කය ජාතික ආණ්ඩුවක්. මෙය අපේ පැරණි ඉල්ලීමක්. අපේ හිටපු නායක අෂ්රෆ් මහතා චන්ද්‍රිකා මැතිනියත් රනිල් වික්‍රමසිංහ මහතාත් සමඟ අතීතයේ දී මේ පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙනවා. එය අපගේ සිහිනයක්. ඒ සිහිනය සැබෑ වන දිනය අප උදා කර ගන්නවා. ●

CPA

Centre for Policy Alternatives

# 2015 ජනාධිපතිවරණය පිළිබඳ ප්‍රකාශය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2015 ජනවාරි 14 දින නිකුත් කරන ලදි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) 2015 ජනවාරි 08 දින පැවති ජනාධිපතිවරණයේ දී පොදු විපක්ෂයේ අපේක්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මහතා ලද ජයග්‍රහණය ඉමහත් සතුටින් පිළිගනියි. ජනාධිපති සිරිසේන මහතාගේ තනතුරේ වැඩ කටයුතු ද විශේෂයෙන් ම ඔහුගේ දින 100 ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ ද පූර්ණ ලෙස සාර්ථක වේවා යි අපි ප්‍රාර්ථනා කරමු.

මැතිවරණය හේතු ගණනාවක් නිසා වැදගත් විය. එය බලයේ සිටි ජනාධිපතිවරයකු තුන් වන වරටත් එම තනතුරට පත් වීමට උත්සාහ කළා වූ ද එක් අන්තයක ජාතික හෙළ උරුමයත් අනෙක් අන්තයේ දෙමළ ජාතික සන්ධානයත් සිටිමින් ඔහුට එරෙහිව අපගේ ඉතිහාසය තුළ දේශපාලන බලවේගවල පුළුල් ම සන්ධානයක් ගොඩ නැගුණු පළමු වතාව ද විය. එමෙන් ම එය අපගේ විධායක ජනාධිපති ඉතිහාසය තුළ රට පුරා ඡන්ද දායකයන් පෙර නොවූ විරූ පරිමාණයෙන් සිය ඡන්දය ප්‍රකාශ කිරීමට පැමිණි මැතිවරණයක දී විධායක ජනාධිපතිවරයකු පරාජයට පත් වූ පළමු වතාව ද විය. මෙම ඓතිහාසික ජයග්‍රහණය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට හෝ යටත් පිරිසෙයින් ඊට නිසි බලතල සැලකිය යුතු ලෙස අඩු කිරීමට තුඩු දෙතියි අපි බලාපොරොත්තු වෙමු.

මැතිවරණයෙන් ප්‍රජාතන්ත්‍රවාදය ලද විජයග්‍රහණය මැතිවරණ දිනයේ දී පවා රාජ්‍ය සම්පත් අශික්ෂිත ආකාරයෙන් අයථා ලෙස යොදා ගැනීම, මැතිවරණ ව්‍යාපාරය පුරා කෙරුණු බියගැන්වීම් හා ප්‍රචාරක කටයුතු කෙරෙහි ප්‍රතිවිරෝධය පාමින් ශ්‍රී ලංකාවේ සියලු ජනතාවන් ලද විජයග්‍රහණයක් බැවින් මැතිවරණය විශේෂයෙන් වැදගත් විය. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය කෙරෙහි පවත්නා වූ විශ්වාසය යළි තහවුරු කිරීම ද අපගේ ආයතනික ශක්තිය හා විශ්වාසය යළි සවිමත් කිරීම ද වෙනුවෙන් අපි අපගේ පුරවැසි සගයන්ට ආචාර කරමු. මැතිවරණයේ තීරණාත්මක මොහොතවල දී මැතිවරණ කොමසාරිස්වරයා මැතිවරණ ක්‍රියාවලියේ අවංක භාවය දැඩි ලෙස ආරක්ෂා කරමින් කටයුතු කළ ආකාරය පිළිබඳව ද එමෙන් ම ප්‍රජාතන්ත්‍රවාදය පෙරළා දැමීම සඳහා ප්‍රයත්නයන් දැරෙන බව වාර්තා වූ තත්ත්වය තුළ සන්නද්ධ හමුදා ආඥාපතිවරුන්, පොලිස්පතිවරයා හා ඔහුගේ නිලධාරීන් සහ නීතිපතිවරයා ඉටු කළ කාර්යභාරය පිළිබඳව ද අපි අපගේ විශේෂ කෘතඥතාව හා ප්‍රශංසාව පළ කරමු. මේ වනාහි පෞද්ගලික ධෛර්ය හා අවංකභාවය පළ කරන නමුත් අපගේ ප්‍රජාතන්ත්‍රවාදයේ ආයතනික හා ක්‍රියා පටිපාටිමය පදනම් තවත් ශක්තිමත් කිරීම කොතරම් තීරණාත්මක අවශ්‍යතාවක් දැයි අපට සිහිපත් කරවන ක්‍රියාවන් ය.

මැතිවරණය පැවතියේ රික්තයක් තුළ නොවන බව CPA සඳහන් කර සිටී. බියගැන්වීම් සිදු වෙමින් පැවතියා වූත් පෙර පැවති පාලන තන්ත්‍රයේ ඒකාධිපතිවාදයට එරෙහිව නැගී සිටීම කාලෝචිත නොවන්නේ ය යනුවෙන් පවා විස්තර කෙරුණා වූත් කාලයක ඊට එරෙහිව පුද්ගලයෝ ද ආයතන ද නැගී සිටියහ. ඒ අතරින් සමහරු තම ප්‍රජාතන්ත්‍රවාදී විශ්වාසයන් උදෙසා සිය ජීවිතවලින් හා ජීවනෝපායන්ගෙන් වන්දි ගෙවූහ. අපි ඔවුන්ගේ පුරවැසි සගයන් ඔවුන් නිදොස් කරන මේ මොහොතේ ඔවුන්ට අපගේ ආචාරය පුද කරමු. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට එරෙහිව හා ඒවා සම්බන්ධයෙන් වගවීම ඉල්ලා සිටිමින් නැගී සිටි අතර, අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයට සහ හලාවත දී නිදහස් වෙළඳ කලාපයේ දී හා රතුපස්වල දී සිය මූලික, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පාවිච්චි කරද්දී තම ජීවිත පූජා කළ අයට ද ලසන්ත වික්‍රමතුංග හා ප්‍රගීත් එක්නැලිගොඩට ද නිමල රූබන්ට ද ගිණිය නොහැකි තරම් තවත් අය සමග තවමත් රැඳවුම් කඳවුරක කල්ගෙවන ජෙයකුමාරිට ද අනර්ථකාරී දහඅට වන ව්‍යවස්ථා සංශෝධනයට සහ අගවිනිසුරුවරිය නීති විරෝධී හා ව්‍යවස්ථා විරෝධී ලෙස දෝෂාභියෝගයට ලක් කිරීමට විරුද්ධ වූ අයට ද කුරිරු ආගමික ඉවසා නොදැරීමෙන් එල්ල වූ පහර දරා සිටි අයට දූෂණ හෙළිදරව් කළ අයට ද අපි ණයගැති වෙමු. අපි ඔවුන් උදෙසා අපගේ ඉමහත් කෘතඥතාව පළ කළ යුතු වෙමු.

ඔවුහු අප ත්‍රස්තවාදීන්, ද්‍රෝහීන් සහ චෞරයන් ලෙස හඳුන්වති. අපි අප පුරවැසියන් ලෙස හඳුන්වමු.

අපි තවමත් ක්‍රියා කරමු. අප එසේ කළ යුතු ය. මෙය වනාහි සිය ජනතාවගේ අභිලාෂය වූ ද අභිලාෂ විය යුතු වූ ද ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදය බවට පත් වීමට අප රට ලද අවස්ථාවයි. ඕනෑ ම රටක ප්‍රජාතන්ත්‍රවාදී සමාජය තුළ දී සිවිල් සමාජය ඉටු කරන කාර්යභාරය අපි අමතක නො කළයුතු වෙමු. අපි කිසි විටෙක අමතක නො කරමු. අපට කිසි විටෙක අමතක කළ නොහැකි ය.

[illegible]



ISBN 955-1800-0081

[illegible]